පහන් කණුව ධර්ම දේශනා

10 - වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පහන් කණුව
ධර්ම දේශනා

දස වන වෙළුම

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

ප්‍රකාශනය
කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
2016

ධර්ම දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2016 ජූලි

සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලු ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළ කිරීම් සපුරා තහනම්ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස නැවත පළ කිරීමට කටුකුරුන්දේ ඤාණානන්ද සදහම් සෙනසුන් භාරය වෙත විමසීම් යොමු කරන්න. ධර්ම ග්‍රන්ථ සහ දේශනා සඳහා පිවිසෙන්න

www.seeingthroughthenet.net

ISBN 978-955-3962-37-9

විමසීම්

කටුකුරුන්දේ ඤාණානන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථනය: 0777127454
knssb@seeingthroughthenet.net

මුද්‍රණය

කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථනය: 0114870333

ධර්ම දානයකි
මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

කතු හිමියන්ගේ දහම් පොත් ලබාගත හැකි ස්ථාන:

1. සුනිල් විජේසිංහ මහතා – 39/10, ශාන්ත රීටා පාර, ගල්කිස්ස.
2. හේමමාලා ජයසිංහ මහත්මිය
   29/8, පැඟිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.
3. චන්දන විජේරත්න මහතා
   23/79A, 1 වන පටුමග, ධර්මපාල පෙදෙස, තලවතුගොඩ.
4. ස්ටැන්ලි සූරියාරච්චි මහතා – 25, කඩ වීදිය, දේවාලේගම.
5. එස්. ඒ. ලයනල් මහතා
   140/19, රුහුණුසිරි උද්‍යානය, හක්මන පාර, මාතර.
6. සිරිමා විජේරත්න මහත්මිය – 15, ඇලපාත, රත්නපුර.
7. ඒ. ජී. සරත් චන්ද්‍රරත්න මහතා
   'සමන්', ඇරැවුල හංදිය, කන්ඩලම පාර, දඹුල්ල.
8. ජේ. ඒ. ඩී. ජයමාන්න මහතා
   ජයමාන්න වත්ත, ලබුයාය, කුරුණෑගල පාර, කුලියාපිටිය.
9. මහාචාර්ය කේ. එම්. විජේරත්න, දන්ත විද්‍යා පීඨය,
   පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
10. වෛද්‍ය පී. වීරසිංහ මහතා
    බණ්ඩාර බුලංකුලම, ලංකාරාම පාර, අනුරාධපුර.
11. ආර්. ඒ. චන්දි රණසිංහ මහත්මිය
    ස්ටුඩියෝ 'චායා', රෝහල හන්දිය, පොළොන්නරුව.
12. නේරා විජේසුන්දර මහත්මිය
    ඉළුක්පිටිය බෙහෙත් ශාලාව, ඉළුක්පිටිය, ගැටහැත්ත.
13. ඩී. සී. ඒ. නිශ්ශංක මහතා – 91A, වුඩ්වර්ඩ් පාර, ගාල්ල.
14. පියදාස සමරකෝන් මහතා
    සුදුවැලි පැලැස්ස, කිරින්ද, තිස්සමහාරාමය.

www.seeingthroughthenet.net
www.facebook.com/seeingthrough

සබ්බ පාපසස අකරණං
කුසලසස උපසම්පදා
සචිත්ත පරියොදපනං
එතං බුදධානසාසනං

- බුදධ වගග, ධමම පදය

හැම පවින් වැළැකුම
කුසල් වෙතටම එළැඹුම
සිත පිරිසිදු කැරුම
සස්න මෙයමැයි හැම බුදුන්ගෙම

පටුන

හැඳින්වීම	vi
ප්‍රකාශක නිවේදනය	viii
අමා ගඟ	ix
46. 'දුප්පබ්බජ්ජං මෙ දුරධිවාසා ගෙහා' (පහන් කණුව 155)	1
47. 'උභයෙනෙව සම්පන්නො' (පහන් කණුව 159)	25
48. 'ජීවිතෙ චාපි සප්පඤ්ඤා' (පහන් කණුව 181)	51
49. 'කුම්භ කාරෝ පුරෙ ආසිං' (පහන් කණුව 204)	73
50. 'සමාහිතො සම්පජානො' (පහන් කණුව 207)	99

හැඳින්වීම

දහම් දන හැමදන්ම පරදයි
දහම්රස හැම රසම පරදයි
දම් ඇලුම හැම ඇලුම් පරදයි
නිවන් සුව හැමදුක්ම පරදයි

අනුත්තර ධර්මරාජයාණන් වහන්සේගේ ධර්මවිජයට අරමුණුවූයේ දෙව් මිනිසුන්ගේ චිත්ත සන්තානයයි. අනාදිමත් කාලයක් තුළ මෝහයෙන් මුළාවී සසර දුක් ගින්නෙන් දැවෙමින් සිටින ලෝ සතුන්ගේ සිත් සතන් දහම් අමා දහරින් සිසිල් කර අමා මහ නිවනින් නිවා සුවපත් කිරීම ඒ මහා කාරුණිකයාණන් වහන්සේගේ ධර්මවිජය පරමාර්ථය විය. දුක් ගිනි වඩන දිග්විජය වෙනුවට දුක් ගිනි නිවන ධර්මවිජයක් බුදුපියාණන් වහන්සේ ලෝකයාට හඳුන්වා දුන්හ.

ධර්මදානය අන් හැම දනයකටම වඩා උතුම් වන්නේ සිතකට වැටෙන දහම් පදයකින් පූර්ණ ජීවිත පරිවර්තනයක් පවා සිදුවිය හැකි බැවිනි. බාහිර වස්තු දනයෙන් සැළසෙන තාවකාලික සහනය මෙන් නොව, එය සනාතන සැනසුමකට මඟ හෙළිකරයි. මොහොතකට දිවගට දැනී-නොදැනී යන ආමිස රසය මෙන් නොව, නිරාමිස දහම් රසය අසහනය දුරුකොට සිත් සනහන ගැඹුරු අර්ථ රසයකි. සසර වඩන ගේහසිත ඇලුම් මෙන් නොව, ලොවුතුරු දහමට ඇති ඇල්ම සසර ගමන කෙටිකරයි. තණ්හා පිපාසය සන්හිඳුවන අමා මහ නිවන සියලු සසර දුක් නිවාරණය කරයි. 'නිවනේ නිවීම' පොත් පෙළෙන් අප දියත් කළ ධර්මදාන වැඩ පිළිවෙළෙහි දෙවැනි අදියර වශයෙන් මේ 'පහන් කණුව ධර්ම දේශනා' පොත් පෙළ එළි දකී. මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි යෝගාවචර සඟපිරිස හමුවේ අප විසින් දේශනා කරන්නට යෙදුන දෙසුම් 33 ක් රැගත් යටකී පොත් පෙළට වඩා සරල අන්දමින්. ජන ජීවිතයේ එදිනෙද ගැටළුවලට එල්ල කොට දෙසන ලද බැවින් මෙම ධර්මදේශනා මාලාව බොහෝ දෙනෙකුට වැඩදයක වනු ඇතැයි සිතමු. සසරදුක් ලියලවන විවිධ විෂම දෘෂ්ටි මතවාදයන්ගෙන් ගැවසීගත් පොත් පත් සඟරා 'සහරාවක' අතරමංව සිටින වත්මන් පාඨක සමාජයට මේ තුළින් ලොවුතුරු මඟට යම් 'තරු සළකුණක්' හෝ ලැබෙතොත් අප දැරූ උත්සාහය සඵල වූ ලෙස සළකමු.

'ආනුපුබ්බී කථා' නම් වූ අනුපිළිවෙළ කථාමාර්ගයක් අනුගමනය කරමින් දහම් දෙසූ බුදු පියාණෝ එවැනිම 'අනුපිළිවෙළ කථාවක්' ධර්මදේශකයින්ට අනුදැන වදළහ. දන කථාව, සීල කථාව, සග්ග කථාව, කාමයන්ගේ ආදීනව හා නෙක්ඛම්මයෙහි ආනිසංස ඒ අනුපිළිවෙළ කථාවට අයත්වේ. ඒ සියල්ල තුළින් සකස් වූ, මෘදුවූ, පුබුදුවූ. පහන්වූ

සිතට චතුරාර්යසත්‍ය දේශනාව මැනවින් විෂය වේ. දේශනා විලාස වශයෙන් සළකන කල, බුද්ධ දේශනාවෙහි ඉස්මතුව පෙනෙන ආදර්ශවත් අංග සතරක්ද ඇත. එනම්, උපමා, නිදර්ශන, ආදියෙන් ධර්ම කරුණු සන්දර්ශනය කිරීම (සන්දස්සෙති) සිත් කාවදින අන්දමින් එත්තු ගන්වාලීම (සමාදපෙති) ඒවා ප්‍රතිපත්තියට නැංවීමෙහිලා උත්සාහවත් කිරීම (සමුත්තෙජෙති) සහ අසන්නන්ගේ සිත්සතන් ප්‍රසාදයට පත්කිරීමයි (සම්පහංසෙති).

ධර්මපදයෙන් තෝරාගත් ගාථා මාතෘකා කොටගෙන පැවැත්වෙන මෙම දෙසුම් පෙළෙහිදීද හැකිතාක් දුරට ඉහත සඳහන් මූලධර්ම අනුගමනය කිරීමට තැත් දැරුවෙමු. බුද්ධෝත්පාද කාලයක ලැබිය හැකි අග්‍රඵලය වන අර්හත් ඵලයෙන්ම දේශනාවක් කුළුගැන්වීමට උනන්දු වීමු. වෙනත් සුලභ ලෞකික පරමාර්ථ තුළ අසන්නන් සිරකොට නොතබා, බුදුපියාණන් වහන්සේ වදාළ අප්‍රමාද පදය සිහිගන්වමින් සංසාර විමුක්තිය දෙසටම ඔවුන් යොමු කරවීම අපගේ පරම අධ්‍යාශය විය. 'පහන් කණුවෙන්' විහිදෙන මෙම ධර්මාලෝකයෙන් ලෝකයාට නිවන් මඟ හෙළි පෙහෙළි වේවා!

දෙස් විදෙස් වැසි සැදැහැවත් පරිත්‍යාගශීලී විශාල පිරිසකගේ නොමසුරු ආධාරයෙන් 'අමා ගඟ' දිනෙන් දින පුළුල් වෙමින් ගලායයි. එයින් ජනිත පුණ්‍ය ශක්තිය ඔවුන්හට පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවා! පටිගත කල 'පහන් කණුව' දෙසුම් පිටපත් කරදීමේ සහ සෝදුපත් බැලීමේ කාර්යයන්ට සහාය වන පින්වත් සිරිමා විජේරත්න, කුසුමා විලේගොඩ, ගීතාංජලී සමන් දෙලගේ සහ ලිලියන් රත්නායක යන මහත්මීන්ටත්, අපගේ පොතපත ශෝභන ලෙස මුද්‍රණය කරදෙන කොලිටි ප්‍රින්ටර්ස් සමාගමේ සී. ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

'චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මාසම්බුද්ධ සාසනං'

මෙයට,
සසුන් ලැදි
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
කිරිල්ලවල වත්ත, දම්මුල්ල
කරඳන
(2560) 2016 ජූනි

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
ප්‍රකාශක නිවේදනය

'කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය' පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත සියලුම ධර්ම ග්‍රන්ථ හා දේශිත ධර්ම දේශනා පිරිසිදු ධර්ම දානයක් වශයෙන්ම ධර්ම පිපාසිත ලෝකයාහට ප්‍රදානය කිරීමේ උන්වහන්සේගේ අභිමතාර්ථය ඉටු කිරීමට ඇප කැප වී සිටියි. මේ අනුව ධර්ම ග්‍රන්ථ මුද්‍රණය සහ බෙදාහැරීම පිළිබඳ කාර්යභාරයත්, ධර්ම දේශනා සංයුක්ත තැටිගත කිරීම සහ www.seeingthroughthenet.net වෙබ් අඩවිය, www.facebook.com/seeingthrough සමාජ ජාල අඩවිය පවත්වා ගෙන යාමත් කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරයේ වගකීම වනු ඇත.

දෙස් විදෙස් වැසි ධර්මකාමී පාඨක ශ්‍රාවක විශාල පිරිසක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම පුළුල් ධර්ම දාන වැඩ පිළිවෙලට දායකවීමට කැමති පින්වතුන් හට පහත සඳහන් බැංකු ගිණුමට තම ආධාර මුදල් යොමුකිරීමට අවස්ථාව ඇත.

මෙම ධර්ම දාන වැඩපිළිවෙලට ආධාර එවීම පිළිබඳ සියලු විමසීම්:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවල වත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථන අංක: 0777127454
ඊමේල් ලිපිනය: knssb@seeingthroughthenet.net

ආධාර මුදල් යොමු කිරීම:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය (K.N.S.S.B)
ගිණුම් අංක: 007060000241
සම්පත් බැංකුව, SWIFT: BSAMLKLX
ශාඛා අංකය: 070
ශාඛාව: ආර්. ජී. සේනානායක මාවත, කොළඹ - 07.

අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන් බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ 'උතුරට' හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා 'එදා-වේල' සඳහා වත් වියපැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මගට නැමී ගත්හ. ලොවී-ලොවුතුරු මල් පල නළා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

'ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙළ සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ 'උතුරට' හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. 'නිවනේ නිවීම' පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී 'පහන් කණුව ධර්මදේශනා' පොත් පෙළෙහි 'බර පැන' දැරීමටත්, දෙස්-විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත-පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. 'දෙන දේ පිරිසිදුවම දීමේ' අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම 'නැවත මුද්‍රණ' පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

'පොත් අලෙවිය' පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන 'දහම් පඬුර' තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහාගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ, ඉනුදු නොනැවතී, ශක්ති පමණින් 'ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට' උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

"සබ්බදානං ධම්මදානං ජිනාති"

මෙයට,
සසුන් ලැදි
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම.
2000 ජූනි 05 (2544 පොසොන්)

පහන් කණුව ධර්ම දේශනා

10 – වෙළුම

ප්‍රථම මුද්‍රණය

ධර්ම දාන වශයෙන් පිටපත් 1000 ක මෙම ප්‍රථම මුද්‍රණය සුගත් දිසානායක, මානෙල් දිසානායක මහත්ම මහත්මීන් එළිදක්වන්නේ පරලෝ සැපත් තම ආදරණීය දෙමාපියන් ඇතුළු සියළුම ඥාති වර්ගයාට හා හිතවතුන්ට පුණ්‍යානුමෝදනා පිණිසත් ජීවත්ව සිටින සියළුම ඥාති වර්ගයාට හා හිතවතුන්ට ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලැබීමටත් හේතු වාසනා වේවායි පතමින් බැවින් මෙම ධර්ම දානමය කුසලය ඔවුන් සැමටම පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක් වේවායි පතමු.

– අනුශාසක
(2560) 2016 ජූලි

46 වන දේශනය

46 වන දේශනය

(පහන් කණුව ධර්ම දේශනා අංක 155)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

දුප්පබ්බජ්ජං මෙ දුරධිවාසා ගෙහා
ධම්මො ගම්භීරො දුරධිගමා භොගා
කිච්ඡා වුත්ති නො ඉතරීතරෙනෙව
යුත්තං චින්තෙතුං සතතමනිච්චත'න්ති

සැදැහැවත් පින්වතුනි,

අනිත්‍ය සංඥාව සියලුම කෙලෙස් මුලිනුපුටා දැමීමට සමත් භාවනාවක් හැටියට බුදුරජාණන් වහන්සේ වර්ණනා කරල තියෙනවා. අනිත්‍ය සංඥාව වැඩීමෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියන ත්‍රිලක්ෂණයම අවබෝධ කරගන්න මග සැලසෙනවා. නිරන්තරයෙන් අනිත්‍ය සංඥාව වැඩීමෙන් රහත් බව ලබා ගත්තු එක්තරා රහතන් වහන්සේ කෙනෙකුගේ ප්‍රීති වාක්‍යයක් තමයි අද අපි මාතෘකා හැටියට ඉදිරිපත් කර ගත්තේ. බුද්ධ කාලයේ මගධ රටේ ප්‍රාදේශීය රජ කෙනෙකුගේ පුතෙක් 'ජෙන්ත' නමින් කුඩා අවදියේදීම, ඒ පුණ්‍ය ශක්තිය නිසා පැවිද්දට නැඹුරු වූ නමුත්, සිතේ විචිකිච්ඡාවක් ඇති වුනා. පැවිද්ද බොහොම දුෂ්කරයි. ගිහිගෙයි වාසය කිරීමත් ඒ වගේම අසීරු දෙයක්, ධර්මය - මේ නිර්වාණ ධර්මය ප්‍රත්‍යක්ෂ කිරීමත් බොහොම ගැඹුරු දෙයක්. ධර්මය ගැඹුරුයි. අනික් අතට ගිහිගෙයි වාසය කරමින් ධනය ඉපයීමත් අපහසුයි. මොකක්ද කළ යුත්තේ කියලා ඔය විදියට දෙගිඩියාවෙන් කලක් පසුවෙලා, බුදුරජාණන් වහන්සේ හමුවෙන්න පැමිණිලා ධර්ම ශ්‍රවණය කරලා යම්කිසි ශ්‍රද්ධාවක් ඇති කරගෙන පැවිදි වුනා. පැවිදි වුන නමුත් යම් කිසි කාල සීමාවක් තුළ අර විදියෙ දෙගිඩියා විතර්ක, සිතේ බලපැවැත් වූ බව පේනවා. කෙසේ නමුත් බොහොම වීර්යය වඩලා අනිත්‍ය සංඥාව භාවනාවක් හැටියට දියුණු කරලා ඒ කර්මස්ථානය තුළින් අරහත් බව ලබා ගත්තා. රහත් වුනාට පස්සේ තමාගේ හිතේ තිබුණු ඒ දෙගිඩියාව ආදියත් මතක් කරමින් ප්‍රීති වාක්‍යයක් බොහොම සොම්නසින් යුක්තව ප්‍රකාශ කළා. ඒ ගාථාව තමයි අපි මාතෘකාව හැටියට ඉදිරිපත් කළේ.

'දුප්පබ්බජ්ජං මෙ දුරධිවාසා ගෙහා'

පැවිද්ද බොහොම දුෂ්කරයි. ගිහිගෙයි වාසයත් ඒ වගේම අපහසුයි.

'ධම්මො ගම්භීරො'

ධර්මය ගැඹුරුයි.

'දුරධිගමා භොගා'

භෝග සම්පත් ලබා ගැනීමත් අපහසුයි.

'කිච්ඡා වුත්ති නො ඉතරීතරෙනෙව'

පැවිදි වුනාට පස්සේ ඒ සිව්පසය - 'යථා ලාභ සන්තෝෂය' කියන ආකාරයෙන් පරිභෝග කළ යුතු වෙනවා. පිණ්ඩපාතයේ ගියාම ඇතැම් දිනක අඩුවෙන් ලැබෙනවා. ඇතැම් දිනක වැඩියෙන් ලැබෙනවා. ඇතැම් දිනක කටුකව ලැබෙනවා. ඇතැම් දිනක ප්‍රණීතව ලැබෙනවා. ඉතරීතර කියන්නේ දෙකෙන් එකක්. ඔන්න ඔය විදියේ තත්ත්වයක් පැවිද්ද තුළ තියෙන්නේ. ඒක නිසා 'කිච්ඡා වුත්ති නො ඉතරීතරෙනෙව' අපේ මේ පැවිද්දේ ජීවන වෘත්තියත් බොහොම දුෂ්කරයි. නමුත් ඒ ඔක්කොම විතර්ක ජය අරගෙන අන්තිමට ඒ සවාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා

'යුත්තං චින්තෙතුං සතතමනිච්චතං'

නිරන්තරයෙන් මේ අනිත්‍යතාව සිහිකිරීම කළ යුත්තක්. තමන් ඒකෙ ආනිශංස දුටු නිසා, මේකයි ඒ කථාන්තරය වශයෙන් කෙටියෙන් දැක්වෙන්නේ.

අපි මේක මුල් කරගෙන බුදුරජාණන් වහන්සේ අනිත්‍යතා ධර්මය පිළිබඳව ප්‍රකාශ කළ ධර්ම කාරණා ටිකක් මතු කර ගන්න බලමු. ඇත්ත වශයෙන් මේ අනිත්‍ය සංඥාවේ ඇති ප්‍රබල ශක්තිය ප්‍රකාශ කෙරෙන එක්තරා පාඨයක් බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා අමතලා වදාළා එක්තරා අවස්ථාවක. අපි ඒක සිංහලෙන් කිව්වොත් 'මහණෙනි, අනිත්‍ය සංඥාව වඩන ලද්දේ, බහුල වශයෙන් පුරුදු කරන ලද්දේ, සියලුම කාමරාගය කෙළවර කරයි. සියලුම රූපරාගය කෙළවර කරයි. සියලුම භවරාගය කෙළවර කරයි. සියලුම අවිද්‍යාව කෙළවර කරයි. සියලුම අස්මි මානය කෙළවර කරයි. මුලිනුපුටා දමයි.' කියල ඔය විදියට අනිත්‍ය සංඥාවේ ශක්තිමත් බව ආනිශංස සහිත බව එක් අවස්ථාවක ප්‍රකාශ කරලා, ඊළඟට සංඝයා වහන්සේලා අමතලා තව දුරටත් විස්තර කරනවා. කෙසේ වඩන ලද අනිත්‍ය සංඥාව ද ඒ තරම් ආනිශංස ලබා දෙන්නේ කියලා. සාමාන්‍ය වශයෙන් අනිත්‍ය සංඥා භාවනාව දක්වන තැන්වල - මේ පින්වතුන් විශේෂයෙන් ඔය ගිරිමානන්ද සූත්‍රය ආදියේදී දැකලත් ඇති දශ සංඥාවක් කියල තියන ඒ භාවනා මාතෘකා දහයක් ගිරිමානන්ද සූත්‍රයේ දක්වන කොට, එතනත්

මුලට දක්වල තියෙන්නේ ඔය අනිත්‍ය සංඥවයි. ඉතින් මෙතෙන්දිත් බුදුරජාණන් වහන්සේ පඤ්ච උපාදාන සකන්ධය පිළිබඳ අනිත්‍යතාව වැඩීම තුළින් සංඝයා වහන්සේලාට මේ ආනිශංස ලබාගත හැකි බව ප්‍රකාශ කර වදාලා.

රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන මේ ගොඩවල් පහ තමයි, මේ පින්වතුන් අහල තියනවා, පඤ්චුපාදානසකන්ධ නමින් හැඳින්වෙන්නේ. උපාදාන කියල කියන්නේ අල්ලාගන තියනවා. මේ අල්ලාගන තියන ගොඩවල් පහ, මේවායේ අනිත්‍යතාව නිතරම මෙනෙහි කරන එකයි බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන්නේ. ඒ මෙනෙහි කරන ආකාරයත් ඇතැම් තැන්වල මේ විදියට පෙන්නුම් කරනවා. දැන් මෙතනදීත් සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරන්නේ 'ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්‍ථංගමො' මේය රූපය, මේය රූපයේ හට ගැනීම, මේය රූපයේ ගෙවීයාම කියලා ඒ විදියටම තමයි මෙය වේදනාව, මෙය වේදනාවේ හට ගැනීම, මේය වේදනාවේ ගෙවීයාම, ඒ වගේම සඤ්ඤාව ගැන, සංස්කාර ගැන, විඤ්ඤාණය ගැන, නිරන්තරයෙන් යෝගාවචරයෙක් ඒ පඤ්චුපාදානසකන්ධය හිතට එන එන ආකාරයෙන් අනිත්‍යතාව මෙනෙහි කළ යුතු බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කර වදාලා. මෙන්න මේ ගොඩවල් පහ තමයි, අපි මේ බදගෙන ඉන්න ගොඩවල් පහ තමයි, මමය මගේය කියලා අපි මේ ප්‍රකාශ කරන්නේ.

මේකට ගොඩවල් කියල කියන්නේ මොකද කියන එකත් ධර්මයේ විග්‍රහ කරල තියනවා. බුද්ධ වචනයෙන්ම ප්‍රකාශ කරල තියනවා. එකොළොස් ආකාරයකට විග්‍රහ කරල තියනවා. මේ එක එක ගොඩක් අතීත, අනාගත, වර්තමාන, එතනම තුනක් තියෙනවා. අතීත රූපය වෙන්න පුලුවන් හිතට එන්නෙ. අනාගත රූපය වෙන්න පුලුවන්. එහෙම නැත්නම් වර්තමාන රූපය වෙන්න පුලුවන්. ඒ වගේම අජ්ඣත්ත බහිද්ධා, ඇතුළත රූපයක් තමා පිළිබඳ රූපයක් වෙන්න පුලුවන්, එහෙම නැත්නම් අනුන් පිළිබඳ රූපයක් වෙන්න පුලුවන්. සමහර විට තමා පිළිබඳ රූපයක් වෙන්නෙත් අනුන් පිළිබඳ රූපයක් එක්ක සංසන්දනය කරලා එයාට වැඩිය මම ලස්සනයි, එහෙම නැත්නම් අවලස්සනයි ඔය ආදී වශයෙන්. ඒවත් මේ අල්ල ගත්තු දේවල්. එතකොට අතීත අනාගත වර්තමාන, ඇතුළත පිටත, ඊළඟට ඒකට අදාළ තවත් දක්වනවා රළු හෝ සියුම් හෝ පහත් හෝ උසස් හෝ අවසාන වශයෙන් දක්වනවා දුර හෝ ළඟ හෝ, එතකොට එකොළහක් සම්පූර්ණයි. අතීත, අනාගත, වර්තමාන, ඇතුළත, පිටත, රළු, සියුම්, පහත්, උසස්, දුර, ළඟ කියන, ඔන්න ඔය එකොළොස් ආකාරයටයි 'ඛන්ධ' වචනය විග්‍රහ කරන්නේ. එතකොට ඒ වගේ රූප වේදනා හැම එකක් පිළිබඳව මේ ගොඩවල් තමයි. මේ ගොඩවල්

එක්කයි අපි ජීවත් වෙන්නේ, කර ගහගෙන යන්නේ, නිරන්තරයෙන් හිතට ගලාගෙන එන්නේ, එක්කො අතීත දේවල් අතීත රූප අනාගත රූප ඔය ආදී වශයෙන්, ඔන්න එතකොට මේ ගොඩවල් පහම ධර්මයේ හඳුන්වන්නේ සංඛත හැටියට සකස් කර ගත්තු දේවල් හැටියට.

මේ සකස් කර ගත්තු දේවල්වල සවභාවය මොකක්ද? මේවා අපට පේනවා නිත්‍ය හැටියට, ඒ සකස් කර ගැනීම තුළින්ම, ස්ථාවර දෙයක් හැටියට ඒකෙ පිහිටා සිටීමට අපි උත්සාහ කරනවා. ඒක නිසා මේකට කියනවා සංඛත කියල. 'සංඛාර' නමුත් සංඛත මේ පඤ්චුපාදනසක්ඛන්ධය සංඛතයි. සංඛත කියල කියන්නේ සකස් කර ගත්තු දේවල්. ඉතින් මේ සංඛතයේ ලක්ෂණ තුනක් බුදුරජාණන් වහන්සේ දක්වනවා. මහණෙනි මේ සංඛතයේ ලක්ෂණ තුනක් තියනවා. මොනවාද ලක්ෂණ තුන? මේ සංඛත හැම දේකම උපතක් දකින්න ලැබෙනවා. 'උප්පාදෙ පඤ්ඤායති', ඒ වගේම 'වයො පඤ්ඤායති'. ගෙවී යාමක් දකින්න ලැබෙනවා. උපතක් දකින්න ලැබෙනවා. ගෙවී යාමක් දකින්න ලැබෙනවා. තුන් වෙනුවයි කියන්නේ 'ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති' ඨිති කියල ස්තිථි කියල කියන - ස්ථාවර කියල හිතාගත්තු ඒ දෙය පිළිබඳව පවා 'අඤ්ඤථත්තං' කියල කියන්නේ අඤ්ඤථා භාවයක්, අඤ්ඤථාභාවයකට වෙනස් වීමකට භාජනය වෙනවා. ඉතින් බුදුරජාණන් වහන්සේ මේ පෙන්නුම් කරන්නේ ඇත්ත වශයෙන් පවත්නා තත්ත්වය - ඇතිවීම් නැතිවීම්.

නමුත් සංඛතය තුළ අපි හදගන තියනවා 'ඨිති' කියල තත්ත්වයක්. වර්තමානයක් හදගන තියනවා. මේ වර්තමානය අන්න නිරන්තරයෙන් වෙනස් වන බවයි දැන් පෙන්නුම් කරන්නේ. ඉතින් ඇත්ත වශයෙන් විදර්ශනාවේදී අතීත සංස්කාර, අනාගත සංස්කාරවලට වඩා වර්තමාන සංස්කාරයි උග්‍ර විදර්ශනාවේදී අරමුණු කර ගන්නේ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා එක් අවස්ථාවක මහණෙනි, අතීත රූපත් අනාගත රූපත් අනිත්‍යයයි. වර්තමාන රූපය ගැන කියනුම කවරේද, මතක් කරලා දෙනවා මේ ලොකුවට හිතන වර්තමානයත් ඒ වගේම අනිත්‍යයි කියල. ඒකත් වෙනස් වෙනවා 'අඤ්ඤථාභාවී'. නමුත් ඒ අඤ්ඤථාභාවී සවභාවයමයි ලෝකයා භව හැටියට අල්ලාගෙන උපාදන හැටියට එතන පැවැත්මක් හදගන්න බලන්නේ. එතකොට ඒ චිත්ත තත්ත්වය තුළ තමයි නොයෙකුත් සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස ආදී මේ පඤ්ච උපාදනසක්ඛන්ධය නිසා දුක් පැමිණෙනව කියල කියන්නේ. මොකද, ඔය අපි හදගත්තු පදනම දිරලා දෙදරුම් කනකොට, බිඳ වැටෙනකොට, අපි නොදැනුවත්වම බිඳ වැටෙන බව අමතක කරලා ඒක උඩ ඉන්න කොට කඩාගෙන වැටෙනවා ඒකත් එක්ක. ඔන්න ඕකයි එතකොට යථා තත්ත්වය. එතකොට මෙන්න මේ

සංඛතයේ ඔය කියපු ලක්‍ෂණ, ඇතැම් කෙනෙක් උප්පාද, ඨිති, භංග කියල ඒව සමාන හැටියට දක්වනවා. නමුත් මෙතන වැදගත් කාරණය බුදුරජාණන් වහන්සේ මතු කරල දෙන්නේ අපි ඨිති කියල හිතාගත්තු දෙය පවා නිරන්තරයෙන් වෙනස් වන බවයි. ඒක නිසාම 'භද්දෙකරත්ත' ආදී සූත්‍රවල දක්වනවා දැන් සාමාන්‍යයෙන් ලෝකයා තුළ තියනවා අතීත දේ පිළිබඳ අපේක්‍ෂාවක්. ගිය දේ, ෂා ෂා ඒක තිබුණා නම් හොඳ නේද කියලා. අනාගත දේ එනකම් බලාගෙන ඉන්නවා. එතකොට බුදුරජාණන් වහන්සේ වදාළා අතීත දේ 'යදතීතං පහීනං' අතීත දේ ගියා, ගිය දේ ගියා 'අප්පත්තඤ්ච අනාගතං' අනාගත දේ තාම ආවේ නැහැ. ඒ නිසා අතීත දේ ගැන අපේක්‍ෂාව නිශ්ඵල දෙයක්. අනාගත දේවල් තාම ආවේ නැති නිසා, ඒවා ගැන සතුටු වීමත් නිශ්ඵලයි. ඊළඟට 'පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්‍ථ තත්‍ථ විපස්සති' වර්තමාන දේ ඒ ඒ තැන දකින්න ඕන. ඒ ඒ තැන විදර්ශනා වශයෙන් දකින්න ඕන. ඒ ඒ තැන විදර්ශනා වශයෙන් දකින්න කියල කියන්නේ අන්න අර සංඛතය සකස් කරන සංස්කාර. සංඛතයක් කියල දෙයක් හඳගන්න උපකාර වන දේවල්වලට තමයි සංස්කාර කියල කියන්නේ. මේ වචන කොච්චර අහල තිබුණත් මේවායේ අර්ථ සමහර විට පැහැදිලි නැහැ. මේ සංස්කාර කියල කියන්නේ සකස් කිරීම්. මේ සකස් කිරීම් තුළින් තමයි සකස් වුනු දෙයක් හැදෙන්නේ.

නමුත් මේ සකස් කිරීම්වලට මුල් වෙන්නෙ මොකක්ද? අවිද්‍යාව. 'අවිජ්ජා පච්චයා සංඛාරා' කියන වචනය මේ පින්වතුන් අහල තියනවානේ පටිච්ච සමුප්පාද දේශනාවල. ඉතින් මූලිකම සකස් කිරීම තමයි බුදුරජාණන් වහන්සේ දක්වන්නේ - මේ අපි කය කියල අල්ලගෙන ඉන්න එක, සකස් වෙන්නේ ආශ්වාස ප්‍රශ්වාසය තුළින්. ඒකෙ අනිච්චතාවවත් තේරුම් ගන්න බැරුව තමයි අතීතයේ ඔය හින්දු යෝගීන් එහෙම මේක 'ප්‍රාණයක්' ආත්මය හැටියට ගත්තා. කොයි තරම් මෝඩ වැඩක්ද? මේ ප්‍රාණය කියල කියන්නේ ආශ්වාස-ප්‍රශ්වාසය - නිරන්තරයෙන් වෙනස් වෙනවා, ඒක තුළත් රැළි රැළි වශයෙන් විදර්ශකයාට වැටහෙනවා. එක ආශ්වාසයක් තුළත් ගොඩක් තියනවා කියලා. නමුත් අන්න සාමාන්‍ය ලෝකයා ඒ සංස්කාර දැඩිව ගන්නවා. ඉතින් කය සකස්වෙලා තියෙන්නේ ඔය ආශ්වාස ප්‍රශ්වාසයෙන්. මූලික සකස්වීම. තවත් ඉතින් ආහාර පාන ආදියත් වැටෙනව තමයි. ඒ වගේම වචනය, අපි මේ කථාකරන වචනය - ඒකත් ලොකුවට ගන්නවා, ඒක ගන්න වෙනව සාමාන්‍ය ජීවිතය තුළ. නමුත් ඒකෙ යථා තත්ත්වය පෙන්නුම් කරනවා, ඒව සකස් වෙන්නේ විතක්ක විචාරවලින්, විතක්ක විචාර කියල හිත තුළ කෙරෙන ඒ සිතිවිලි ධාරාව. ඒකත් නිරන්තරයෙන් වෙනස් වන දෙයක්. ඒ සංස්කාරවලින් තමයි වචනය සකස් වෙන්නේ. ඊළඟට අපි විචිත්‍ර හැටියට හිතන මේ සිත. අපි

ලොකුවට ගන්න හිත - ඒක සකස් වෙන්නේ සඤ්ඤවත් වේදනාවත් නිසා. සඤ්ඤ වේදනාවලට ඒක නිසා චිත්ත සංඛාර කියනවා. ඉතින් ඔය විදියට කාය සංඛාරෝ, වචී සංඛාරෝ, චිත්ත සංඛාරෝ කියල ඔය සංස්කාර ඊළඟට මේ සකස් කිරීම්වලින් කරන්නේ මොකක්ද? ඒ කෙරෙන ටික තමයි පටිච්ච සමුප්පාදයේ ඊළඟට තියෙන්නේ, විඤ්ඤණයත් නාමරූපයත්.

මේ විඤ්ඤණය කියන එක මායාවක් හැටියට බුදුරජාණන් වහන්සේ දක්වල තියනව. මේ විඤ්ඤණය නිරන්තරයෙන්ම පවතින්නේ නාම රූපයත් එක්ක. විඤ්ඤණය අරමුණ අල්ල ගන්නවා. ඒ අල්ලන අරමුණ නාම රූපය හැටියට දක්වනවා බුදුරජාණන් වහන්සේ. මේ නාම රූපය කියල කියන්නේ - මේ අපි කොච්චර හිතුවත් මේ රූපය ඒ ආකාරයෙන්ම අපට තේරුම් ගන්න බැහැ. ඒකට නාමයත් උපකාර වෙනවා. සිතට අරමුණු කර ගන්න බැහැ තනිකර රූපයක්, නාම රූප දෙක එකටයි යන්නේ. එතකොට ඒක නිසා සිතට එන අරමුණ 'නාම රූප' නමින් දක්වනවා, නැත්නම් බුදුරජාණන් වහන්සේට මේකට කියන්න තිබුන චිත්ත රූප කියලා. දැන් සාමාන්‍ය ලෝකයා හිතන්නේ 'සිතයි රූපයයි' කියල දෙකක් තියනවා කියලා. භෞතික විද්‍යාඥයින් ආදීනුත් හිතනවා රූපය කියලා වෙනම තියනවා කියලා. එහෙම නම් කියන්න තිබුනා බුදුරජාණන් වහන්සේට චිත්ත රූප කියලා. එහෙම නැත්නම් 'මනෝ රූප' කියලා කියන්න තිබුණා. ඒ වෙනුවට 'නාම රූප' කිව්වෙ මොකද? අන්න අර නාමයෙන් ලැබෙන නම් කිරීම තුළින් තමයි රූපය හඳුනාගන්න පුලුවන් වෙන්නේ. රූපයෙන් ඉදිරිපත් කරන ගැටීම තුළින් තමයි - ගැටීම කියන සංකල්පය, නාමයට එන්නෙ. ඉතින් ඔය දෙක අතීතයේ ඉඳලම මේ බෞද්ධ චින්තාවලිය පිළිගත්තු බව පෙන්නුම් කරන උපමාව තමයි මේ පින්වතුන් අහලත් ඇති අර ඇවිදින්න පුලුවන් අන්ධයාත් ඇවිදින්න බැරි ඇස් පේන කොරාත් යන ගමනක් වගෙයි. කොරා අන්ධයාගේ පිට උඩ නැගලා යන පාර පෙන්වනවා. ඒ වගේම රූපය අන්ධයි. නාමයට පෙනෙන නමුත් ඇවිදින්න බැහැ. අන්න ඒ දෙක නාම රූප දෙක හැටියට මේ කවුරුත් දන්නවා. විදර්ශකයින් සිතට එන අරමුණ නාම රූප හැටියට හඳුන්වනවා. ඉතින් ඒ නාම රූප සංස්කාර මෙනෙහි කිරීම තමයි විදර්ශකයාට අයිති. ඒක තුළින් අර අනිත්‍යතාව පුළුල්ව හිතාගත්තු අනිත්‍යතාව එතන, එතන වහ වහා දකින ශක්තිය ඒ නාම රූප ධර්ම තුළම තිබෙනවා.

නාම රූප ධර්ම කියල කියාපු එක විග්‍රහ කරල දක්වන්නේ - නාම ධර්ම හැටියට දක්වන්නේ වේදනා සඤ්ඤ චේතනා ඵස්ස මනසිකාර ධර්ම පහයි. අතේ ඇඟිලි පහ කියලා හිතා ගන්නත් පුළුවන්.

වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර. බොහෝ දෙනෙක් මේ කාලයේ විතරක් නොවෙයි. ඈත අතීතයේ ඉඳලම ඇතැම් උගතුන් මේ නාම ධර්ම සංග්‍රහය වෙනස් කරල දක්වන්න බලනවා. ඵස්ස මුලට දන්න යයි කියනවා. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියලයි බුද්ධ වචනයේ තියෙන්නේ. වේදනාව පළමුවෙනි එක. ඊළඟට සඤ්ඤාව චේතනාව ස්පර්ශය මනසිකාරය ඒ විදියට. නමුත් තර්කානුකූලව බලන කොට වේදනාවට කලින් 'ඵස්ස' තියන බව ඇත්ත. නමුත් 'ඵස්ස ඉස්සරහට' ගන්න නරකයි. අපට කියන්න තියෙන්නේ ඒකයි. ඵස්ස පස්සෙමයි තියෙන්න ඕන. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර. මොකද හේතුව, දැන් ටිකකට හිතල බලන්න. අපේ අත රත් වෙච්ච දේක ගැටෙනවා. ගැටුනට පස්සෙ එතන ස්පර්ශය ගැන නොවෙයිනෙ හිතන්නෙ. ඉස්සෙල්ලම වේදනාව ගැන. ක්‍රියාකාරී වෙන්නෙ වේදනාව තුළින්, එතකොට වේදනාව තුළිනුයි ඒ රූප ධර්ම හඳුනාගන්නේ. මූලිකවම ඒක ඉතින් අපි කිව්වට ලොකු වෙලාවක් යන එකක් නොවෙයි. ඒ සුළු වෙලාවක් තුළ රත් වෙච්ච දෙයක අත ගැටෙනවාත් එක්කම ඒ ක්‍ෂණයෙන්ම අත ඇදල ගන්නවා. ඒක තුළ තියනවා අර කියාපු නාම ධර්ම සමූහයම. වේදනාව තුළින් සංඥාව එනවා අත පිච්චෙනවා කියලා. සංඥාව තුළින් අත ඇදල ගන්න ඕන කියල චේතනාව එනවා. ඊළඟට පිච්චිච්ච තැනට. එතනටයි මනසිකාරය යෙදෙන්නේ. එතකොට වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාර කියන නාම ධර්ම තුළින් තමයි රූපය හඳුනාගන්නේ.

ඊළඟට රූපයට අයිති දේවල් තමයි - රූපය කියල කියන්නේ මේ පින්වතුන් අහල තියනවා මහා භූත ධර්ම කියල කියන පඨවි ආපො තේජො වායො කියන ඒ මහා භූත ධර්මයන්. ඒවාට මහා භූතයෝ කියල කියන්නේ තනි තනිව හඳුනාගන්න බැහැ. ඒවා මිශ්‍ර වෙලයි පවතින්නේ. නමුත් ඒවායේ ගති ලක්‍ෂණ අනුවයි අපි හඳුනාගන්නේ. අන්න ඒ ගති ලක්‍ෂණවලටයි නාම ධර්ම කියලා කියන්නේ. එතකොට රූපය අන්ධයි කිව්වේ ඒකයි. රූපය හඳුනාගන්නේ අර නාම ධර්ම තුළින්. නාම ධර්මවලට ගැටීම පිළිබඳ අදහස ලබා දෙන්නේ, ස්පර්ශ කියන අදහස ලබා දෙන්නේ, රූප ධර්මයි. ඔන්න ඔය කාරණය මේ ධර්මයේ ඉතාමත්ම ගැඹුරින් දක්වලා තියනවා. බුදුරජාණන් වහන්සේ ඵස්ස කියන වචනය කොටස් දෙකක් හැටියට 'අධි වචන සම්ඵස්ස' 'පටිඝ සම්ඵස්ස' කියලා. අධි වචන කියල කියන්නේ නාමය, එතකොට මේ ස්පර්ශය තුළ තියනවා නම් කිරීමකුත් ගැටීමකුත්, ඒ දෙකම එකකට එකක් උපකාරයි. අර උපමාව තුළින් මේ පින්වතුන්ට තේරුම් ගන්න පුලුවන්. මෙන්න මේ හැම කාරණයක්ම ධර්මය තුළින් පෙන්නුම් කරන්නේ මොකද, මේ විඤ්ඤාණ මායාවේ යථා සවභාවය තේරුම්

ගත්තු දවසට තමයි අර සංස්කාර පිළිබඳ කලකිරීම එන්නේ. සංස්කාර පිළිබඳ කලකිරීම නොඑන තාක්, සංස්කාරවලට ඇල්ම ඇතිවන තාක්, සංඛතය හැදීගන යනවා.

ඒක ඊළඟට දක්වනවා බුදුරජාණන් වහන්සේ. මේ සංඛතය කොහෙන්ද කොතනින්ද නිෂ්පාදනය කෙරෙන්නේ. මේ සංඛතය නිෂ්පාදනය කෙරෙන්නේ සළායතන කියල කියන ආයතන හයක, මේ කාලෙ ආයතන කියන අර්ථයත් ගත්තට කමක් නැහැ. එතෙන්දි ඕන නම් තමන්ට උපකාර වෙනවා නම් ආයතන හයක් තුළයි පඤ්ච උපාදන ස්කන්ධය සකස් කෙරෙන්නේ, නිර්මාණය වෙන්නේ, නිශ්පාදනය කෙරෙන්නේ. මොනවද හය - ඇස කණ නාසය දිව කය මන. චක්ඛු සම්ඵස්ස ආයතන කියල කියනවා. සෝත සම්ඵස්ස ආයතන, අන්තිමට මනෝ සම්ඵස්ස ආයතන. මේවට ආයතන කියල කියන්නේ මොකද? මේකට දෙකක් අයිතියි. ආයතනයක් වෙන්න ක්‍රියාකාරීත්වයක් තියෙන්න ඕන. ඇසත් රූපයත්. කණත් ශබ්දයත් ඔය විදියට ගිහිල්ලා අන්තිමට මනසත් සිතට එන සිතිවිලිත් මනෝ ධම්ම, අපි දිගටම නොකීවාට මේ පින්වතුන්ට සලකා ගන්න පුලුවන්නෙ, හය ගැනම. ඇසට රූපය, කණට ශබ්දය ඔය ආකාරයෙන් ගිහිල්ලා ඔන්න ගැඹුරුම කාරණය මේ හය වෙනුවට තියන මනසයි. මනසට එන අරමුණු හඳුන්වන්නේ 'ධම්ම' නමින්. 'මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා' කියලා අපිට නිතර මතක් කරන්න සිද්ද වෙනවා. ධම්ම පද ගාථාවෙන් බුදුරජාණන් වහන්සේ කියන හැටියට මේ ධම්මවලට, දේවල්වලට - අපි ලෝකයේ හිතන්නේ දේවල් වෙන වෙනම තියනවා කියලා. නමුත් ඇත්ත තත්ත්වය මොකක්ද, මේ 'දේවල්'වලට කලින් මනස තියනවා. ඊළඟට ඒ දෙක අතරින් මනසම ශ්‍රේෂ්ඨයි. අන්තිමට කියනවා 'මනෝමයා' ඒ දේවල් කියන එක මනසින්මයි සකස්වෙලා තියෙන්නේ. ඒක තමයි ලෝකයාට පිළිගන්න අමාරු. මේ අප ඉදිරියේ තියන දේවල් හිතෙන් සකස්වෙලයි කියන එක පිළිගන්න අමාරු තත්ත්වයක්. මහ ගැඹුරු කාරණයක් ඒක.

ඉතින් මෙන්න මේ කාරණය වඩාත් පැහැදිලි කරන්න මෙතන තියන අනිච්චතාවත්, බුදුරජාණන් වහන්සේ එක්තරා මහ ප්‍රබල සූත්‍රයකින් 'අනිච්චතා' නමැති සූත්‍රයකින් සංඝයා වහන්සේලාගේ සිත්වලට කාවද්දනවා මේ අනිත්‍ය සංඥාව. මහ පුදුම අන්දමින් ඉදිරිපත් කරනවා. ඒ සූත්‍රයේ මාතෘකාව 'ද්වයං' කියන එක. ද්වයං කියන්නේ දෙක. 'දෙක' පිළිබඳව. "මහණෙනි, දෙකක් නිසයි විඤ්ඤාණය ඇතිවන්නේ." අපි මේ හිතන්නේ විඤ්ඤාණය තනිව පවතිනවා කියලයි. නමුත් දෙකක් නිසයි විඤ්ඤාණය ඇතිවන්නේ. මොකක්ද දෙක? ඇසත් රූපයත්. එතකොට චක්ඛු විඤ්ඤාණය ඇතිවන්නේ ඇසත් රූපයත්

නිසා. සෝත විඤ්ඤාණය කණත් ශබ්දයත් නිසා. ඒ ආකාරයෙන් සලකාගන්න. අන්තිමට මනෝ විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය ඇතිවන්නේ මනසත් ධර්මයනුත් නිසා. මෙයින් පිට නිකම් විඤ්ඤාණය කියල දෙයක් නැහැ. එතකොට ධර්මානුකූලව විඤ්ඤාණ හයයි තියෙන්නේ. අපි අර කිව්වනේ විඤ්ඤාණයත් නාම රූපයත් අතර කෙරෙන අඤ්ඤමඤ්ඤ පච්චයතාව අන්‍යෝන්‍ය ප්‍රත්‍ය සම්බන්ධතාවයක් ඉහත ශීඝ්‍රව කෙරෙනවා, විඤ්ඤාණයත් නාම රූපයත් අතර. එතකොට මේ විඤ්ඤාණය කියල කිව්වේ ඔන්න ඔය හයයි. ඇස කණ නාසය දිව කය මන. ඒ එක් එක් විඤ්ඤාණය අනිත්‍යබව බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ කොහොමද. දෙකක් නිසා විඤ්ඤාණය ඇතිවෙනවා ඇසත් රූපයත් නිසා. ඊළඟට කියනවා සංඝයා වහන්සේලාට, මහණෙනි, ඇස අනිත්‍යයි. වෙනස් වන සුළුයි. අන්‍යාකාරයකට පත්වන සුළුයි. රූපයත් එහෙමයි. අනිත්‍යයි. වෙනස් වන සුළුයි. අන්‍යාකාරයකට පත්වන සුළුයි. මේ හැම එකකම එතන යෙදෙනවා 'චල' කියල වචනයක්. දැන් මේ කාලයේත් ඔය චලනය කියල කියන්නේ. මේ ඇසත් රූපයත් හැම එකක්ම චලනය වෙනවා. නිරන්තරයෙන් චලනය වෙනවා. නිරන්තරයෙන් ගෙවී යනවා. 'චලා චෙව වයාච අනිච්චා විපරිණාමිනො' විපරිණාමයට පත් වෙනවා. 'අඤ්ඤථාභාවිනො' අඤ්ඤථාභාවයට පත් වෙනවා. අන්‍යාකාරයකට පත් වෙනවා. සිතට කාවද්දන්නයි මේ කියන්නේ. එතකොට ඇසත් අනිත්‍යයි. නිරන්තරයෙන් සැලෙනවා, වෙනස් වෙනවා. රූපත් එහෙමයි. ඊළඟට කියනවා ඇසත් රූපත් එකතු වීමෙන් හැදෙන විඤ්ඤාණයත් ඒ වගේම අනිත්‍යයි. වෙනස් වෙනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගෙන් අහනවා ප්‍රශ්නයක්. 'කොහොමද මහණෙනි, අනිත්‍ය වූ දෙකක් එකතු වීමෙන් සැදෙන විඤ්ඤාණය නිත්‍යය වෙන්නේ?' එහෙම අහනවා. එතකොට ඒ චක්ඛු විඤ්ඤාණයත් අනිත්‍යයි. ඔන්න එතනින් නවත්වන්නේ නැහැ. ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඇසත් රූපයත් චක්ඛු විඤ්ඤාණයත් එකතු වූ තැන ස්පර්ශයයි. ඇසත් රූපයත් නිසා ඇතිවන චක්ඛු විඤ්ඤාණය ඒ තුනම එකතු කරල ගත්තු තැන ස්පර්ශය කියන අවස්ථාවක් එනව. ඒ චක්ඛුසම්ඵස්සයත් අනිත්‍යයි. ඒකත් වෙනස් වෙනවා. ඒකත් වෙනස් භාවයකට පත් වෙනවා. එතනදීත් අහනවා බුදුරජාණන් වහන්සේ යම් හේතු ප්‍රත්‍යයක් නිසා චක්ඛුසම්ඵස්සය හට ගත්තා නම් ඒ හේතු ප්‍රත්‍යයත් අනිත්‍යයි. වෙනස් වෙනවා. ඊළඟට අහනවා වෙනස් වෙන හේතු ප්‍රත්‍යය උඩ තියෙන දෙයක් කොහොමද නිත්‍ය වන්නේ? ඔන්න ඔය ආකාරයෙන් බුදුරජාණන් වහන්සේ මේ සළායතනයේ එක් එක් අංශයක්ම අනිත්‍ය බව සිත් තුළට කාවද්දන්න උත්සාහ කරනවා. එතකොට මේ අනිත්‍ය

කථාව විදර්ශකයා ප්‍රත්‍යක්ෂ කර ගන්නේ නිරන්තරයෙන් අනිත්‍ය සංඥවත් ඒ වගේම අර නාම ධර්ම තුළින් මනසිකාරය යෙදවීමෙනුත්. මෙනෙහි කිරීම වඩ වඩාත් සියුම්ව යොදන අවස්ථාවේදී අන්න අර 'පදනම' - අපි අර 'ඨිති' කියල ගත්තු තත්ත්වය - ඒක එන්න එන්නම පටු වෙනවා. ඇත්ත වශයෙන් වර්තමානය කියල කියන්නෙ ඒක මනින්න පුලුවන් දෙයක් නොවෙයි. අතීතයත් අනාගතයත් අතර තෙරපිලා තියන තත්ත්වයක්. කෙනෙකුගෙන් ඇහැව්වොත් 'දැන්' කියලා කියන්නේ මොකක්ද කියලා, උත්තර දෙන්න පුලුවන්ද? දැන් කියල කියන්නේ මොකක්ද? ඒකට අවස්ථානුකූලවයි උත්තර දෙන්න වෙන්නේ. දැන් කියන එක සමහර විට දීර්ඝ කාලයක් වෙන්න පුලුවන්. සමහර විට ඒ අවස්ථානුකූලව පටු එකක් වෙන්න පුලුවන්. එතකොට විදර්ශකයාට දැන් කියන එක එන්න එන්නම පටු වෙනවා, මනසිකාරය සියුම් වෙන කොට, මනසිකාරය ප්‍රබල වෙන කොට. එතකොට මේ විදර්ශනා මනසිකාරය තුළින්, යෝනිසෝ මනසිකාරය කියල කියන ඒ ඒ තැනම දැකීම - ඒක තුළින් අන්න අර නිත්‍ය සංඥව ගෙවී යනවා. නිත්‍ය සංඥව ගෙවී යන කොට සංඛතයක් එතන ගොඩ නැගෙන්නෙ නැහැ. මේ වචන කීපය තුළ විදර්ශනාවට අදාළ කාරණා රාශියක් මේ පින්වතුන්ට දැනගන්ට පුලුවන්.

ඔන්න ඊළඟට ඒකට දක්වනවා බුදුරජාණන් වහන්සේ දැන් මේ අනිත්‍යතාව ගැන කියාපු වචන ටිකට යොදන සාමාන්‍ය වචනය 'යථා භූත ඥණය' බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක ප්‍රකාශ කරනවා, මේ කියාපු ආයතන හය තුළින් නිවන මතු වෙන හැටි. එහෙම නැත්නම් පඤ්ච උපාදනස්කන්ධය වැඩෙනවා වෙනුවට ගෙවී යන හැටි. ඔන්න ඉස්සෙල්ලා දක්වනවා කොහොමද පඤ්චඋපාදනස්කන්ධයක් ගොඩ නැගෙන්නේ කියලා, යම් කෙනෙක් යථා භූත වශයෙන් ඇසත් දන්නෙ නැහැ. යථා භූත වශයෙන් රූපයත් දන්නෙ නැහැ. යථා භූත කියල කියන කොට තේරුම් ගන්න ඕන ඒක අනිත්‍ය බව දන්නෙ නැහැ. අනිත්‍ය බව නොදැන, අනිත්‍ය බව නොසලකා, ඇසත් රූපයත් නිසා ඇතිවන විඤ්ඤණයත් අනිත්‍ය බව නොසලකා, ඒ නිසා ඇතිවන ස්පර්ශයත් අනිත්‍ය බව නොසලකා, ඒ ස්පර්ශය නිසා ඇතිවන වේදයිතයත් - වේදනා ආදියත් - අනිත්‍ය බව නොසලකා, යථා භූත වශයෙන් දන්නේ නැත්නම්, ඒ තැනැත්තා ඒ පිළිබඳව ඇලීම ඇති කර ගෙන, තණ්හාව ඇති කර ගෙන, ඒ තණ්හාව ඇති කර ගැනීම තුළින් පඤ්චඋපාදනස්කන්ධයක් ගොඩ නැගෙනවා. ඒක කිඳ බහිනව. ඒ අවස්ථාව තුළ තිබෙන රූප ටික - යම් කිසි අවස්ථාවක් ගැන හිතල බලමු. කෙනෙක් ප්‍රිය කරන අවස්ථාවක්. ඒකට අදල රූප කොටස් එක්කහු වෙලා ගිහිල්ලා එයාගේ රූපඋපාදනස්කන්ධය හැදෙනවා. ඒකට අදල වේදනා ටික එකතු වෙලා ගිහිල්ලා මෙබඳු වේදනාවක් මම වින්ද

කියල අහවල් දවසෙ අහවල් අවසථාවෙ ඔන්න වේදනා උපාදනසකන්ධයක් හැදෙනවා. මම මෙහෙම රූපයක් ඇතිව සිටි කෙනෙක්. මෙහෙම වේදනාවක් ඇතිව සිටි කෙනෙක් ආදී වශයෙන් අනිත් ඒවා පිළිබඳවත් එහෙමයි. ඔන්න ඔය විදියට පඤ්චඋපාදනසකන්ධයක් බේරිලා හැදෙනවා අන්න අර සළායතනයෙන් ගලාගෙන ගිහිල්ල. සළායතනය නිත්‍ය වශයෙන් - සළායතනයේ එක් එක් කොටස් නිත්‍ය වශයෙන් ගැනීමෙන්, යථා භූත ඤාණය නොමැති කමින්. ඒකෙ අනිත් පැත්ත ඊළඟට බුදුරජාණන් වහන්සේ දක්වනවා, නිවන කරා යන එක. එතකොට අර සංඛතය හැදෙන්නේ අරමයි. පඤ්චඋපාදනසකන්ධය ගොඩ නැගෙන්නේ ඒ ආකාරයටයි.

පඤ්චඋපාදනසකන්ධය ගෙවී යන ආකාරයත් දක්වනවා. කොහොමද ඒ? විදර්ශකයෙක් ඒ ඒ තැනින්ම දකිනවා නම් ඇසත් අනිත්‍යයි වෙනස් වෙනවා. වෙනස් භාවයකට, අඤ්ඤතා භාවයකට පත් වෙනවා කියලා නිරන්තරයෙන් අවබෝධයෙන් යුක්තව ගත කරනවා නම් ඒ මොහොත තුළ ඒ අත් දැකීම් එතන එතනම ගෙවීයනවා මිසක් ඒව ගිහිල්ල ගොඩ ගැහෙන්නෙ නැහැ. උපාදන ස්කන්ධ වශයෙන් සංඛත වශයෙන් ගොඩ ගැහෙන්නේ නැහැ. ඒක ප්‍රබලව ගිය අවසථාවෙ තමයි සළායතන නිරෝධය කියන ඒ උතුම් නිර්වාණ තත්ත්වය පවා ප්‍රත්‍යක්ෂ කරගන්න පුලුවන්. සළායතන නිරෝධය කියන්නේ භව නිරෝධ තත්ත්වයයි. මේකයි නිවන කියල කියන්නේ. එතකොට ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කර වදාළේ 'මේ බඹයක් පමණ වූ ශරීරය තුළම' මම පෙන්නුම් කරනවාය ලෝකයත්, ලෝකයේ හට ගැන්මත්, ලෝකයේ නිරෝධයත්, ලෝක නිරෝධයට හේතු වන ප්‍රතිපදවත්, මේ සළායතන ආශ්‍රයෙන්ම බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. අනිත්‍යතාවෙ කෙළවර තමයි අනිමිත්ත කියන එක. දැන් ඔය නිවනට උපකාර වන දෙරටු තුනක් වගේ දක්වනවා. අනිමිත්ත, අප්පණිහිත, සුඤ්ඤත කියලා. අනිමිත්ත කියල කියන්නේ අනිත්‍ය සංඥවේ කෙළවර. අනිත්‍ය සංඥව ප්‍රබලවම වැඩූ අවසථාවේ නිමිත්තක් හිතට එන්නේ නැහැ. නිමිත්තක් හිතට ගන්න බැරි තත්ත්වයක් එනවා. අනිමිත්තයි එතකොට. ඒක නිවනටම නමක්. ඒ නිසාම යමක් අනිත්‍ය නම් එය දුක් සවභාවයයි. දුක් සවභාවය ඇති තැන ආශාවක් නැහැ. ප්‍රණිධි කියන්නේ ආශාව ප්‍රාර්ථනාව. අන්න අප්පණිහිත කියල කියන්නේ - දුක්ඛ අනිත්‍ය සංඥව වැඩීමෙන් ත්‍රිලක්ෂණයම වැඩෙනවා කියලා අපි කිව්වෙ මොකද ඒක ධර්මයේ දැක්වෙනවා 'යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා' කොතෙකුත් ඔය ධර්මයේ සඳහන් වන පාඨයක්. යමක් අනිත්‍ය ද එය දුක් සහිතයි. දුක් සහිත නම් ඒක ආත්මය වෙන්න බැහැ. මමය මගේය කියල වසයේ පවත්වා ගන්න බැහැ. එතකොට ඒ ත්‍රිලක්ෂණය තමයි

අන්තිමට ඉහළටම වැඩුවාම අනිත්‍යතාව ඉහළටම වැඩුවාම අනිමිත්ත තත්ත්වයට යනවා හිත. ඒක නිවන් දොරටුව වගේ.

ඊළඟට ප්‍රණිධිය කියල කියන ආසාව නැති වෙනවා. අර දුක් ස්වභාවය නිසා. ඒක අප්පණිහිත කියල කියනවා. ඊළඟට ආත්ම තත්ත්වයක් නැත්නම් - 'සුඤ්ඤත' ඒක ශුන්‍යයි. ආත්ම තත්ත්වයක් ඇති තැනයි 'දෙයක්' කියල ගන්නේ. ආත්ම තත්ත්වයක් නැති තැන ශුන්‍යයි. ඔන්න ඔය ශුන්‍යතා කතාන්තරයට ඇත්ත වශයෙන් කිට්ටු වෙනවා. අතීතයේ මේ ධර්මය ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කළ අවස්ථාවලදී ඒ කාලයේ සිටි ශාස්තෘන් වහන්සේලාගේ විවිධ ධර්ම, දෘෂ්ටි ඒවා මතු කරලා ඒවා එක්ක සංසන්දනය කරලා පෙන්නුවා. මේ ධර්මය ඔප් නගාල පෙන්නුවා. මේ ධර්මයේ විශේෂත්වය. අදත් ඒ විදියට අපට කථා කරන්න සිද්ධවෙලා තියෙනවා. මොකද හේතුව? මේ යුගයේ බොහෝ දෙනා කථා කරන, බොහෝ දෙනාගේ සිත ඇදී යන දෙයක් තමයි භෞතික විද්‍යාව. ඒ භෞතික විද්‍යාවේ සමහර මූලික උපන්‍යාසවල ඇති අඩුපාඩුකම් දැන් ඒ න්‍යෂ්ටික විද්‍යාඥයින්ටම තේරිලා තියෙනවා. ඒ අයට වෙච්ච වැරැද්ද මොකද? අපි අර මුලින් කිව්ව ධම්මපදයේ ගාථාව 'මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා' කියනවා වෙනුවට ඒ කට්ටිය හිතුවා මනසින් අන්‍ය වූ, සිතට අහුවෙන්නෙ නැති යම් කිසි දෙයක් වෙනම තියනවා කියලා. ඒක ඒ අයගේ මිථ්‍යාවක් පමණක් නොවෙයි. අතීතයේ ඉඳලා එන අදහසක්. ලෝකයේ යම් 'සත්' පදාර්ථයක් සත්‍යය වශයෙන් නිත්‍ය වශයෙන් පවතින පදාර්ථයක් ඇතැයි කියන මතය අතීතයේ ඉඳලම පැවතුනා. ඊළඟට 'පරමාණුවක්' කියල දෙයක් තියනවයි කියල යම් කිසි සත්‍ය තත්ත්වයක් තියනවා හිතින් තොරව. නමුත් අන්න බුදුරජාණන් වහන්සේගේ වචනය දැන් ඒ අයට තේරුම් ගිහිල්ලා තියන ආකාරය කොයි තරම් ද කියතොත් ඒ න්‍යෂ්ටික විද්‍යාඥයින්ම කියනවා ඔවුන්ගේ මේ මෑත යුගයේ ප්‍රධාන පෙළේ අයම කියනවා දැන් 'යමක් නොමනින තාක් ඒ දේකට ආරෝපණය කරන්න බැරිය ගුණ ලක්ෂණ ආදියක්' මේ මේ විදියේ දෙයක් කියලා. ඒ වගේම වෙන එකක් තබා යම් කිසි දෙයක් ඇතෙයි කියලා කියන්න බැරිය යමක් නොමනින තාක්. එයින් පෙන්නුම් කරන කාරණය තමයි, මේ පින්වතුන් කලින් අපේ දේශනාවලදීත් අහලත් ඇති නිවන කියල කියන්නේ 'අස්මි මාන සමුග්ඝාත' කියලා කියනව. මේ 'අස්මි' කියලා - 'මම වෙමි' කියලා ගත්තු දෘෂ්ටි කෝණය අනුව තමයි මේ පඤ්ච ඉන්ද්‍රියයන් ක්‍රියාත්මක වෙන්නේ. 'වෙමි' කියල ගත්තහම ඒකට අනුව මනිනවා. ඒ මනින බව ප්‍රකාශ කරන වටිනා සූත්‍රයක් බුද්ධ වචනයෙන්ම තියනවා. බුදුරජාණන් වහන්සේ වදාළ දෙයක් ආනන්ද හාමුදුරුවෝ එක් අවස්ථාවක සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරනවා. ලෝකය කියන වචනයට නිර්වචනයක්

- ලෝකය කියල කියන්නේ මොකක්ද? යමකින් ලෝකය පිළිබඳ සංඥවක් ඇති කර ගන්නවාද යමකින් ලෝකය පිළිබඳ මැනීමක් කරනවද එය මේ ආර්ය ශික්ෂණය තුළ ලෝකය නමින් හඳුන්වනවා. යමකින් ලෝකය පිළිබඳ හඳුනාගන්නවාද, යමකින් ලෝකය පිළිබඳ මැනීමක් කරනවාද එය මේ ශාසනයේ මේ ආර්ය විනයට අනුව ලෝකය කියලා කියන්නේ. කුමකින් ද මනින්නේ, ඔන්න මනින දේවල් කියනවා. ඇසෙන්. කණෙන්, නැහයෙන්, දිවෙන්, කයෙන්, අන්තිමට මනසින් මෙන්න මේ ආයතන හයෙන්. මේ මැනීම්වලින් තොරව ලෝකයක් නැහැ කියන එකයි ධර්මයේ දක්වෙන්නේ. එතකොට ඒ කථාව තමයි මේ කට්ටියට පිළිගන්න වෙලා තියෙන්නේ. මැනීමකින් තොරව, මැනීමක් නැති තැන, යමකට අස්ථිත්වයක් ආරෝපණය කරන්න බැහැ. තියනව කියල කියන්නත් බැහැ. ඒ වගේම ඒ තියන දේක ලක්ෂණයක් ගැන කියන්නත් බැහැ. කොයි තරම්ද කියතොත් මේ විද්‍යාව කරන පින්වතුන් අහල ඇති. මේ කොවාන්ටම් භෞතිකය කියල කියනවා. ඔය භෞතික විද්‍යාවේ උසස්ම හැටියට සලකන මෑත යුගයේ නවතම අංශය. ඒකෙ කොවාන්ටම් න්‍යාය පිළිබඳ ඉදිරිපත් වන දර්ශනිකයින්ටත් දැන් පිළිගන්න සිද්ධ වෙලා තියනවා 'නිරීක්ෂණයක් නැති තැන යමක් ඇතෙයි කියල කියන්න බැහැ. නිරීක්ෂණය නො කරන තාක් යමක් ඇතෙයි කියල කියන්න බැහැ' ඒ කියන්නේ නිරීක්ෂණයෙන් තොරව යමක් වෙනම තියනව කියල කියන්න බැහැ. සිතෙන් තොරව වෙනම ලෝකයක් තියනවා කියල කියන්න බැහැ. ඒ තත්ත්වය කොයි තරම් ද කිව්වොත් - ඇතැම් කෙනෙක් ඒ ප්‍රධාන පෙළේ න්‍යෂ්ටික විද්‍යාඥයින් කියනවා ඔවුන්ගේ ඒ නිරීක්ෂණ පරස්පර විරෝධී තත්ත්වයන්ට යනවිට නිරීක්ෂණයක් පාසා ඔවුන් බලාපොරොත්තු වන මේ වෙනම දෙයක් ඇතෙයි කියල ගත්තු ඒ ප්‍රස්තුතය නිෂ්ප්‍රභ වෙනකොට ඒ අයට කර කියාගන්න දෙයක් නැතිව අන්තිමට කියනවා, ඒ නිරීක්ෂණයේ ප්‍රතිඵල දැකලා මේ කොවාන්ටම් පිම්මෙන් බේරෙන්න බැරි බව කලින් දැනගත්තා නම්, මම මේකට අත ගහන්නේ නැතිය කියලා ඒ විද්‍යාඥයින් කියනවා. කර කියාගන්න දෙයක් නැති තත්ත්වයකට ඒ අය පත්වෙලා තියනවා වික්ෂිප්තව. පටන් ගත්තේ වැරදි කොනෙන්. සිතෙන් තොරව දේවල් තියනවා කියල හිතාගෙන. එහෙම දෙයක් තියනවා කියල තාමත් ඒ අදහස ඇතිවයි බලාගන යන්නේ. නමුත් අන්තිමට තේරෙනවා. ඒක නිසා ඒ අයට කියන්න සිද්ධ වෙනවා යමක් තියනවාද කියල - විශේෂයෙන් සඳහන් කරන්නේ ඉලෙක්ට්‍රෝන තියනවාද කියලා - අපි බැලීම පමණකින් ඒ ඉලෙක්ට්‍රෝනය කැළඹෙනවා නම් අපි කොහොමද ඒකෙ තත්ත්වය දැනගන්නෙ. එතකොට ඒකට හිත යොමු කිරීම් ප්‍රමාණයකින්වත් ඒක වෙනස් වෙනවා නම් අපි කොහොමද ඒකෙ තත්ත්වය කියන්නෙ? කියල අන්න ඒ විදියෙ උභතෝකෝටික ප්‍රශ්නයකට ඒ අයට මුහුණ

දෙන්නට සිද්ධ වෙලා තියනවා. මොකද ඒකට හේතුව? ඔන්න ඒකට අපේ බුද්ධ ධර්මයේ ඒකට ගැලපෙන හරිය අපි කියමු. බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියනවා, මේ සූත්‍ර දේශනාව අපි මීට කලිනුත් අවස්ථාවල ප්‍රකාශ කරල තියන නිසා අපේ දේශනා අහපු පින්වතුන්ට මේක අමුතු දෙයක් නොවෙයි.

බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක සංඝයා වහන්සේට වදාළා, 'මහණෙනි, අන්‍ය තීර්ථකයන් ඇවිල්ලා නුඹලාගෙන් මේවගෙ ප්‍රශ්න ඇහුවොත් නුඹල මොනවද මේවාට දෙන පිළිතුරු?' එයින් පෙන්නුම් කරනවා බුදුරජාණන් වහන්සේ අන්න සංඝයා වහන්සේලාගේ සිත් සකස් කරල තිවුව ඔය විදියෙ ප්‍රශ්න ආවහම පිළිතුරු දෙන්න. බුදුරජාණන් වහන්සේ කියනවා නුඹලාගෙන් අහන්න පුළුවන් මේ වගේ ප්‍රශ්න අන්‍ය තීර්ථකයින් ඇවිල්ල. මොකක්ද හැම දෙයකම මුල? හැම දේකම හට ගැන්ම මොකක්ද? හැම දේකම පැන නඟින තැන මොකක්ද? හැම දෙයක්ම යොමුවෙලා තියෙන්නේ කොහාටද? ඔන්න ඔය විදියේ ප්‍රශ්න රාශියක් තියනවා. අපි අවස්ථානුකූලව කෙටි කරල කියනවා මේකට අදාල අන්දමින්. ඊළඟට සංඝයා වහන්සේලා කියනවා අපට මේවට පිළිතුරු දෙන්න ශක්තියක් නැහැ. භාග්‍යවතුන් වහන්සේම කියල දෙන්න කියල. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ ඒ දේශනාව ප්‍රකාශ කරන්නේ "එහෙම ඇහුවොත් මහණෙනි, මෙන්න මෙහෙම කියන්න."

'ඡන්දමූලකා ආවුසො සබ්බෙ ධම්මා' ඇවැත්නි හැම දේකටම මුල ඡන්දයයි. ඡන්දය කියල කිව්වෙ කැමැත්ත, ඕනෑකම, යම්කිසි දෙයකට අපේ හිත යොමු වෙන්නේ ඉස්සෙල්ලාම ඒකට තියන කැමැත්ත නිසානේ. ඡන්දය තණ්හාවේ ලා පාට කියලා ගනිමු. එතකොට ඕනෑ කමක් තුළයි, අර විද්‍යාඥයින් පවා පර්යේෂණ වල යෙදෙන්නේ ඡන්දය නිසානේ. ඒ අය බලාපොරොත්තු වෙනවා මේ පරමාණුවත් එහෙම නැත්නම් ඒ පරමාණුව විශ්ලේශනය කරලා ඒකෙ තත්ත්වය දැනගන්න ලොකු ඕන කමක් තියනවා. ඒ ඡන්දය හැම දේකටම මුල ඡන්දයයි. ඊළඟට කියනවා 'මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා' හැම දෙයක්ම <u>හම්බවෙන්නේ</u> මනසිකාරයටයි. හිංගල කරල කිව්වොත් 'සම්භවා' කියන්නේ හැම දේකම හට ගැන්ම හැම දෙයක්ම අපට 'හම්බ වෙන්නේ' අපේ මනසිකාරය මෙනෙහි කිරීම ඒකට යොමු වෙන කොටයි. අන්න ඒ කාරණය තමයි අර නිරීක්ෂණය ගැන කිව්වෙ. අපි මේ නිරීක්ෂණය කිරීමෙන්ම අපි මේ නිරීක්ෂණයට භාජනය කරන දේ වෙනස් වෙනවා නම් අපි කොහොමද ඒකෙ තත්ත්වය දැනගන්නේ? අන්න ඒ අය අහන ප්‍රශ්නය. ඒකෙන් පෙන්නුම් කරනවා හිතෙන් තොර දෙයක් නැහැ. මේක මනොමයයි! 'මනො පුබ්බංගමා ධම්මා

මනො සෙට්ඨා මනොමයා' කියන පද තුන හරියට තේරුම් ගත්ත නම් ඒ විද්‍යාඥයින් ඔය තත්ත්වයට වැටෙන්නෙ නැහැ. වැරදි පැත්තෙන් පටන් ගත්තේ, දේවල් කියනවා කියලා.

ඊළඟට තවත් පැත්තක් තියනවා. 'ඵස්ස සමුදයා සබ්බෙ ධම්මා' හැම දෙයක්ම පැන නගින්නේ ස්පර්ශය තුළින්. මොකක්ද ස්පර්ශය කියල කියන්නේ? දැන් අපි කිව්වනේ සළායතනයක් ගැන. මේ එක් එක් ආයතනය හඳුන්වන්නේ චක්ඛු සම්ඵස්ස ආයතන, සෝත සම්ඵස්ස ආයතන, ඝාන සම්ඵස්ස ආයතන...නමින්. ඵස්ස සම්ඵස්ස කියන වචන දෙකම යෙදෙනවා. එතකොට මෙන්න මේ ආයතන තුළින් තමයි මේ ස්පර්ශය, ස්පර්ශය තුළිනුයි දෙයක් පැන නගින්නේ. මනසින් ස්පර්ශ කිරීමෙන් තමයි එතකොට ඒ දේවල් හැදෙන්නේ. 'මනො පුබ්බංගමා ධම්මා' කියන කාරණය මනෝ සම්ඵස්සයක් ඇති කල්හි තමයි ඒකට අරමුණ හැටියට ගන්න දේ මතු වන්නේ. ඵස්සය. එතකොට බුදුරජාණන් වහන්සේ කොයි තරම්ද කියතොත් මේ ස්පර්ශය කියන වචනය යොදල තියනවා බ්‍රහ්මජාල සූත්‍රයේ සියලුම දෘෂ්ටි නිශ්ප්‍රභ කරන්න. ඒ හැම දෘෂ්ටියක්ම දැන් මේ කාලයේ ඔය විද්‍යාඥයින් කරන හපන්කම්වලටත් වඩා අතීතයේ ඍෂිවරු සිත දියුණු කරලා අතීත ජාති පෙනෙන තරම් පඤ්ච අභිඥා - අභිඥා පහම දියුණු කරලා ඒ ලබා ගත්තු ප්‍රත්‍යක්ෂය තුළ පිහිටලා ඇති කර ගත්තු දෘෂ්ටි පවා බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කරන්නේ කොහොමද? 'ඒකත් ස්පර්ශය මුල් කර ගෙනයි.' 'ඒකත් ස්පර්ශය මුල් කර ගෙනයි.' එයින්ම නිශ්ප්‍රභ කරනවා. එතකොට ස්පර්ශය මුල් කරගෙන ඇතිවෙනවා කියල කියන්නේ මොකක්ද, ඒක මනසට සම්බන්ධයි. ඒක නිවැරදි එකක් නොවෙයි, සත්‍යතාව නොවෙයි කියන එකයි. අන්න ඒ කාරණය තමයි. ඉතින් ඒක තව දුරටත්, මේ කියාපු කාරණා පැහැදිලි කර ගන්න, පස්සේ දෙනවා උපමා දෙකක්. මේ පින්වතුන්ට නිතර දක්වපු. දැන් ඊට කලින් කියමු අන්න අර න්‍යෂ්ටික විද්‍යාඥයින් ප්‍රකාශ කරන තවත් එකක් තමයි කලින් සඳහන් කළ කාරණය. අපි යමක් පිළිබඳව සිත යොමු කිරීම් මාත්‍රයෙන්ම, අපි නිරීක්ෂණය කරන්න බලාපොරොත්තු වන දේ කෙරෙහි සිත යොමු කිරීම් මාත්‍රයෙන්ම, ඒක කැළඹෙනවානම් අපි කොහොමද ඒක දැනගන්නේ.

ඒ ප්‍රශ්නයට හොඳම පිළිතුර වෙනවා මීට කලින් අපි නාම රූප ධර්ම ගැන ප්‍රකාශ කරන අවස්ථාවල උපමා වශයෙන් දක්වූවා කාරණා දෙකක්. එකක් තමයි ඒදණ්ඩ උඩින් යන බල්ලෙක් තමන්ගේ ඡායාවට රැවටිලා වෙන බල්ලෙක් යයි හිතලා එක්කො තරහ නම් ගොරවනවා එහෙම නැත්නම් කැමති නම් වල්ගය වනනවා. එහෙම නැත්නම් කවුද මේ ඉන්නේ කියලා බල බලා ඉන්නවා. නමුත් ඒ ප්‍රශ්නය විසදෙන්නේ

මේ විදියටයි. අපි අර කෙටියෙන් සඳහන් කළා බල්ලා හිතන්නේ 'පෙනෙන නිසා බලනවා' කියලා. නමුත් 'බලන නිසයි පෙනෙන්නේ' එතකොට මේ බල්ලට වෙච්ච දේ තමයි මේ බොහෝ දෙනාට වෙන්නේ. අර ඒ දණ්ඩ උඩ බල්ලා ඒදණ්ඩෙ මැදට ගිහිල්ලා වතුරෙ වැටෙන ඡායාව දිහා බලන්නේ ඌ හිතනවා පෙනෙන නිසා බලනවා කියලා. නමුත් බලන නිසයි පෙනෙන්නෙ. අන්න බලනවා කියල කියන්නේ නිරීක්ෂණය. ඔන්න දැන් ඒ වචන ටික සම්බන්ධ කර ගන්න. එතකොට ඒක තුළින් හිතා ගන්න පුලුවන් මේ නාම රූපය සම්බන්ධව අර බැලීම තුළ තියන නාම ධර්මවලට අහුවෙලා ඉවරයි විද්‍යාඥයෝ පවා. සම්පූර්ණයෙන් සත්තාවක් වෙනම දකින්න බැහැ. 'මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා.'

එතකොට මේකට තවත් උපමාවක් මේ මෑතකදී දූක් වූවා ඒ නාම රූප ධර්ම ප්‍රකාශ කරන අවස්ථාවේදී, ඒ දක්වපු උපමාව බොහෝ දෙනාට නොයෙකුත් හේතූන් නිසා ජනප්‍රිය වෙච්ච බව පේනවා. මොකක්ද? පැරණි ග්‍රීක් කථාවක් ආශ්‍රයෙන් අපි පෙන්නුවා, කෙටියෙන් සඳහන් කරතොත් අතීතයේ දේව කථාවක් තියනවා නාසිසස් කියලා රූමත් ග්‍රීක තරුණයෙක්, කවදාවත් තමන්ගේ මූණ දැකලා නැහැ. කැලේ ඇවිදින අතරේ, පොකුණකට පහත් වෙන කොට මූණ හෝදන්න, තමන්ගේ රූපය දැකලා හිතුවා, වතුරෙ ඉන්න දෙවඟනක් කියල හිතාගෙන වැළඳ ගන්න උත්සාහ කළා. මුළු දවසෙමත් උත්සාහ කරලා, දවස් ගණනක්ම උත්සාහ කරලා අන්තිමට ජීවිතය පූජා කළා. එතකොට නාසිසස් දෙවඟන වැළඳ ගන්න වතුරට අත දන වාරයක් පාසා වතුර කැලඹෙනවා රැළි නඟනවා. අන්න දැන් හිතාගන්න අපේ මනසිකාරය තුළින්ම, අපි ඒක මොකක්ද කියල දැනගන්න උත්සාහය තුළින්ම කැලඹෙනවා කියල කිව්වෙ ඔන්න ඔය වගෙ කැලඹිල්ලක්. මොකක්ද එතකොට මේ බලන්නේ? නාම රූපයයි. මේ වෙනම දෙයක් කියල ගත්තට මොකද අපේ මනසට විඤ්ඤාණයට නිරන්තරයෙන්ම අරමුණු වෙන්නේ නාම රූපයයි. මේක නමට රූපයක්. නියම රූපය නොවේ. යථා තත්ත්වය නොවේ. අපි කිව්වනේ අර නාමය නිසා රූපයක්, රූපය හඳුනාගන්නේ නාමය තුළින්. නාමයට ගැටුම පිළිබඳ සංකල්පය දෙන්නේ රූපය තුළින්. ඒ දෙක යමකට ගුණ ලක්ෂණ ආදියක් ආරෝපණය කරන්න බැරිය කිව්වෙ මොකද? ඒකත් හොඳට බුදුරජාණන් වහන්සේ දක්වලා තියනවා ඉතාමත්ම ගැඹුරු සූත්‍රයක මහා නිදාන සූත්‍රය නමින්.

පටිච්ච සමුප්පාදයේ ඉතාමත්ම ගැඹුරු අංශයක් අර ස්පර්ශය කියන වචනය පිළිබඳව ඉතාමත්ම ගැඹුරු අංශයක් පෙන්නුම් කරන සූත්‍රයක් බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන් වහන්සේට

පියවරින් පියවරට දේශනා කොට වදළා. ඒකත් යම් යම් අවස්ථාවලදී අපි දක්වලා තියනවා කෙටියෙන් ගත්තොත් උන් වහන්සේ නාමයත් රූපයත් අතර ඒ දෙක තුළින් අර ස්පර්ශය දක්වලා තියෙන්නේ නාමය කියන කොටසට අයිති ධර්මයන් පිළිබඳව හඳුන්වන යම් ආකාර, යම් නිමිති, ලක්ෂණ තියනවා නම් ඒවායින් තොරව රූපයක් පිළිබඳව හැඳින්වීමක් පිළිබඳ අදහසක් දක්වන්නට බැරිය. ඒ කියන්නේ නාමයට අදාළ වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර කියන ඒ දේවලින් තොරව රූප ධර්ම පිළිබඳ හඳුනාගැනීමක් කරන්නට බැරිය. ඊළඟට මේ රූප ධර්මයන්ට අදාළ පඨවි, ආපො, තේජො, වායො, කියන ඒවයින් ඇතිවන ගැටීම් නැතිව නාම ධර්මයන්හි අර ස්පර්ශයක් පිළිබඳ, හැපීමක් පිළිබඳ, රූපපණයක් පිළිබඳව කථා කරන්න බැරිය. ඔන්න ඔය කාරණා දෙක දක්වලා තියෙනවා. අන්න එතනත් අර කියාපු ලක්ෂණ ආදියත් ආරෝපණය කරන්න පුලුවන් වෙන්නේ ඒකට හිත යෙදුවාට පස්සේ. ඒ මිසක් ඒවාටම අදල ඒවාටම ආවේණික ලක්ෂණ කියලා දෙයක් නැහැ. ඒවා හිතෙන් ආරෝපණය කරන බවයි එතන පිළිගන්න වෙන්නෙ. ඒ කාරණයත් බුදුරජාණන් වහන්සේ 'සුත්ත නිපාත' කියන ග්‍රන්ථයේ 'මහාවියුහ සූත්‍රය' නමින් වටිනා සූත්‍රයක් තියනවා. ඒ කාලයේ ඉන්දියාවේ තීර්ථකයන් අතර උග්‍ර වාද භේද පැවතුනා. මේ කාලයට වඩා පැවතුනා. ඒ වාද භේද සංසිඳවන විදියේ මහා පුදුම දේශනාවක් බුදුරජාණන් වහන්සේ දක්වලා තියනවා. ඒකෙදි එක් වටිනා ගාථාවක් එතන දක්වනවා.

> පස්සං නරො දක්ඛිති නාමරූපං - දිස්වාන වා ඤස්සති තානිමෙව
> කාමං බහුං පස්සතු අප්පකංවා - නහිතෙන සුද්ධිං කුසලා වදන්ති

අන්න ඒ ගාථාව මෙතන විශේෂයෙන් උද්ධෘත කරල දක්වූවෙ අර කියාපු අර න්‍යෂ්ටික විද්‍යාඥයින්ගෙ ප්‍රශ්නයටත් මේක අදල නිසා. 'පස්සං නරො දක්ඛිති නාමරූපං' යම් කිසි මනුෂ්‍යයෙක් මම දකිනවා කියල කිව්වොත් ඒ දකින්නේ නාම රූපයමයි. නාම රූපයෙන් බැහැර දෙයක් නැහැ. 'දිස්වාන වා ඤස්සති තානිමෙව' දකලා ඉවරවෙලා දැනගත්තෙත් ඒ නාමරූපයමයි. ඉන් පිට දෙයක් නොවේ. 'කාමං බහුං පස්සතු අප්පකංවා' ටිකක් දැක්කත් හුඟක් දැක්කත් ඒකෙන් ඇති වැඩක් නැහැ. 'නහිතෙන සුද්ධිං කුසලා වදන්ති' නුවණැත්තෝ ඒකෙන් සුද්ධියක් ඇතැයි කියා හෝ ඒක සම්පූර්ණයි කියල කියන්නේ නැහැ. ඔන්න ඒ කතාන්තරය එතකොට බුදුරජාණන් වහන්සේ ඒ බ්‍රහමජාල සූත්‍රයේ දෘෂ්ටි හැට දෙකක්ම ප්‍රතික්ෂේප කළේ යම්තාක් අතීතයේත් යම්තාක් අනාගතයේත් ඇති වන සියලු දෘෂ්ටි ප්‍රතික්ෂේප කළේ, මේ දේශනාව තුළින් ඒවා නිශ්ප්‍රභ වෙනව කියල පුදුම විදියේ උපමාවකින් බුදුරජාණන් වහන්සේ මේ බ්‍රහමජාල සූත්‍රය අවසන් කළා.

ඒ උපමාවත් මේ අවස්ථාවේදී පින්වතුන්ගේ හිතට නගන්න බලාපොරොත්තු වෙනවා. ඒකෙදි බුදුරජාණන් වහන්සේ මේකට බ්‍රහ්මජාල කියල කිව යුත්තේ මොකද කියල දක්වනවා. බ්‍රහ්මජාල කියන්නේ 'බඹ දැල'. එතකොට මේ 'බඹ දැලේ' කථාව බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන්නේ මෙහෙමයි. මහණෙනි, යම් කිසි දක්ෂ මසුන් මරන්නෙක් හෝ මසුන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ ඉතාමත්ම සියුම් ලෙස වියන ලද දැලක්, සියුම් දැල් ඇස් ඇති සියුම් දැලක්, කුඩා දිය පොකුණකට දානවා. මාළුවන් ඉන්න පොකුණක් වහනවා දැලෙන්. ඒ සියුම් දැලෙන් මාළුවන් ඉන්න විල වැහුවට පස්සේ ඒ මසුන් මරන්නා හරියාකාරයෙන්ම දන්නවා, මේකෙ ඉන්න තාක් මාළුවෝ මෙයින් උඩට නැගෙන වාරයක් පාසා අර දැලේ බැඳෙන බව. දැල් ඇසෙන් උඩට එන්න බෑ ඒ අයට, දැල් ඇසේ රැඳෙනවා. ඒ ඕනෑම දෘෂ්ටියක් මේ දැලට අහුවෙනවා කියන්නේ ඒකයි. එතකොට මොකක්ද මේ දැල් ඇස? දැල් ඇස තමයි අන්න '<u>ස්පර්ශය</u>' කියන එක. ඒක නිසා තමයි ඒ සූත්‍රයේ හැම දෘෂ්ටියක්ම නිශ්ප්‍රභ කරන්නේ. බුදුරජාණන් වහන්සේ අර හැට දෙකක්ම දෘෂ්ටි නිශ්ප්‍රභ කරන්නේ 'තදපි ඵස්ස පච්චයා, තදපි ඵස්ස පච්චයා, තදපි ඵස්ස පච්චයා,' ඒකත් ස්පර්ශය නිසයි, ඒකත් ස්පර්ශය නිසයි, ඒකත් ස්පර්ශය නිසයි. ඔන්න ඔය කථාවම තමයි මෙතෙන්දිත් අපට අර විද්‍යාඥයින් පිළිබඳ ප්‍රශ්නයේදීත් කියන්න තියෙන්නේ. ඒ අය යම් දවසක තේරුම් ගන්න ඕන තමන් නිරීක්ෂණය කරන දෙයින් වෙන්ව මේක දකින්න බැරි බව. ඒ අර නාමරූපයමයි ඒ අය දකින්නෙ. ඒ අය හිතන්නෙ එතන තියන දෙයක් දකිනවා කියල. ඒක නිසා තමයි අර කියන්නෙ මේ ඉලෙක්ට්‍රෝනය තියනවාද කියලා බැලීම තුළින්ම ඒක කැලඹෙනවා නම් අපි කොහොමද ඒකෙ තත්ත්වය දැන ගන්නේ කියල. අන්න හිත යෙදීම් ප්‍රමාණය මනසිකාරය තුළින්මයි මේවා හට ගන්නේ. ස්පර්ශය තුළිනුයි පැන නගින්නේ. ඒ පැන නගින තැන තමයි අර බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් මතු කරල දුන්නේ. අර කියාපු දෘෂ්ටි හැම එකක්ම සළායතනයන් ගෙන් ආයතන හයෙන් 'ඵුස්ස ඵුස්ස පටිසංවෙදෙන්ති' ඒ සළායතනයන් ගෙන් ස්පර්ශ කරමින් ඒවා තුළින් වේදනාව ඇති කර ගන්නවා. ඒ තුළින් සංඥාවල් තණ්හාවන් ඇති කර ගන්නවා. සංඥාව ඇති කරගෙන, තණ්හාව ඇති කරගෙන, නැවත භවයේ කරකැවෙනවා කියලා ඒ දෘෂ්ටි නිශ්ප්‍රභ කරනවා කියලා. සළායතනයන්ගේ ස්පර්ශ කිරීමෙන් තොරව ඒ අයට දැනගන්න බැහැ. ඒ සත්‍ය තත්ත්වය නොවෙයි ඒ දකින්නේ කියන එකයි බ්‍රහ්මජාල සූත්‍රයෙන් දක්වන්නේ.

එතකොට එහෙනම් මොකක්ද සත්‍යය? බුදුරජාණන් වහන්සේ සොයාගත් සත්‍යය මොකක්ද? ඒකම තමයි අපි අර කලින් කිව්වේ අනාත්ම දෘෂ්ටියේ අවසාන කෙළවර ශූන්‍යතාවයි. ශූන්‍යතාවයි

සත්‍යයය. එතකොට අසම් කියලා ඒ අටවා ගත්තු කූඤ්ඤයෙන් මනින දේවල් තුළයි ලෝකයා හිරවෙලා ඉන්නේ, ඒව තියනවා තියනවා කියලා. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල දුන්නා අසම් කියන කූඤ්ඤය ඉගිල්ලූ තැන කිසිවක් නැහැ. ඒ ටික ප්‍රකාශ කළේ 'සඝසතො විය ඛායති -පසසතො නත්‍ථි කිඤ්චනං' එක්තරා අවසථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව උදන ගාථාවක ලෝකය ශාස්වත හැටියට සදකාලික වගේ පේනවා. 'සසසතො විය ඛායති - පසසතො නත්‍ථි කිඤ්චනං' බලන කෙනාට කිසිවක් නැත. මේක සදකාලික වගෙයි පේන්නෙ. ඒකම තවත් අවසථාවක දක්වනවා 'ජානතො පසසතො නත්‍ථි කිඤ්චනං' ඥනය දර්‍ශනය හරියට ඇති කෙනාට මොකක්වත් නැහැ ලෝකෙ. ඒකත් ප්‍රත්‍යක්‍ෂයක්, වන අවසථාවක් තියනවා. ඒකම තමයි බුදුරජාණන් වහන්සේ වදළේ ලෝකයේ නිරෝධයත් මෙතන තියනවා කියලා. ලෝකයේ සමුදය තණ්හාව නිසා 'තණ්හා පොනොභවිකා' කියල කියන ඒ භවය සකස් වෙන්නේ තණ්හාවෙන්. බුදුරජාණන් වහන්සේ ඒක නොයෙකුත් ආකාරයෙන් ප්‍රකාශ කරල තියනවා අර අවිද්‍යා නීවරණය තුළින් මේවායේ අනිත්‍යතාවය වහනවා. තණ්හා ලාටුව තුළින් අලවනවා. ඒ අන්‍ධකාරය තුළ, ඒකම තමයි වර්‍තමානයේ අර එකක් තියනවා කියල හිතා ගන්නේ අර ස්ථිති කියල හිතා ගන්නෙ ඒ අවිද්‍යා අන්‍ධකාරය තුළ තෘෂ්ණාව කියල කියන ඒ තණ්හා වේගයෙන් සත්ත්වයා ඒ තණ්හා ලාටුව කියලත් දක්වනවා. ඒ තණ්හා ලාටුවෙන් අලවලයි මේ භවයක් හදගන්නේ. ඒ හදගත්තු ලෝකය තුළයි මේ සත්ත්වයා සංසාරයේ දිගට දිගට යන්නේ.

එතකොට මේ සසරින් මිදීමට බුදුරජාණන් වහන්සේ අන්න යථා තත්ත්වය දක්වනවා. යථාවබෝධය මොකක්ද? 'ජානතො පසසතො නත්‍ථි කිඤ්චනං' අර අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත කියල කියාපු ඒ ඔක්කොම නිවනට නම් - නිමිති නැතිවන ආශාවන් නැතිවන ආත්මය මමය මගේය කියල කියාපු සථාවරයක් නැතිවන තැනක් තියනවා. ඒක තමයි භව නිරෝධය කියල කියන්නේ මෙලොවම අත් දකින. එතකොට මනුෂ්‍යයා බලාපොරොත්තු වෙන, සත්ත්වයා බලාපොරොත්තු වෙන විමුක්තිය නම්, ඔය දෘෂටි කියල කියන්නේ - ඒක හිස රදයක් හැටියට බුදුරජාණන් වහන්සේ දක්වලා තියනවා. න්‍යෂටික විද්‍යාඥයින් ප්‍රකාශ කළේ, එක් අවසථාවක එක න්‍යෂටික විද්‍යාඥයෙක් ප්‍රකාශ කරනව මේ කාලකන්නි කෙවාන්ටම් පිම්මෙන් මිදෙන්න බැරි බව අපි දැනගෙන හිටියා නම් මේකට අත ගහන්නෙ නැතෙයි මේ කෙවාන්ටම් න්‍යායට කියල, එහෙමත් ප්‍රකාශ කරනව බැරි තැන. අන්න ඒ කාලකන්නි කියල කිව්වෙ මොකද? මේ නිරීක්‍ෂණය තුළ කෙරෙන්නේ අන්තිමට සසර වැඩෙන එක මිසක් යථා තත්ත්වය අවබෝධ වෙන්නෙ නැහැ. යථා තත්ත්වය අන්න බුදුරජාණන්

වහන්සේ දක්වනවා අර ශූන්‍යතාවයි අන්තිමට එන්නේ. මොකද මේ හැම සත්ත්වයෙක්ම ලෝකයක් හදගන්නවා තමාගේ සළායතන තුළින්. අපේ ලෝකය නොවෙයි අර බල්ලගේ ලෝකය. අනික් සතුන්ගේ ලෝකය මේ සළායතන තුළින් හදගන්න. ඒ ලෝකයමයි බුදුරජාණන් වහන්සේ දුක හැටියට දැක්වුවේ, ඒකේ තෘප්තියක් නැහැ. ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදියේ දුක් තියනවා. එයින් මිදෙන්න බලාපොරොත්තු වෙනවා නම් යන්න වෙන්නේ අර අනිත්‍යභාවයෙන් පටන් ගෙන. යමක් අනිත්‍ය නම් එය දුක බව තේරෙනවා. ප්‍රතිසංස්කරණය කිරීම් මේ සකස් කිරීම් හැම එකක්ම

අනිච්චා වත සංඛාරා - උප්පාද වය ධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසං වූපසමො සුඛො

මේ මරණ ගෙවල්වල කොතෙකුත් අහන්න ලැබෙන, මේකෙන් මේ පින්වතුන් අශුභ දෙයක් හැටියට හිතන්න පුලුවන්. ඒක තුළ මුලු මහත් සත්‍යයම තියනවා. 'අනිච්චා වත සංඛාරා' ඒකාන්තයෙන්ම සංස්කාර අනිත්‍යයි. 'උප්පාද වය ධම්මිනො' ඇතිවන නැතිවන සවභාවයෙන් යුක්තයි. 'උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති' උපදින්නේ නැසෙන්නමයි. 'තෙසං වූපසමො සුඛො' ඒ සංස්කාරයන් සංසිඳවීමමයි සැපත. එතකොට ඒක නිසා තමයි මේ පින්වතුන් අහල තියනවා නිවන හඳුන්වන්නේ 'සබ්බ සංඛාර සමථ' කියලා. සියලු සංස්කාර සංසිඳවීම. සංස්කාර සංසිඳෙනකොට සංඛතයක් හට ගැනෙන්නෙ නැහැ. සංඛතයක් ගොඩ නැගෙන්නේ නැතිවෙන කොට උපධි කියල කියන අල්ලගන ඉන්න පඤ්ච උපාදන සකන්ධයක් ගොඩ නැගෙන්නේ නැහැ. ඒ තත්ත්වය මේ ජීවිතයේදීම ප්‍රත්‍යක්ෂ කර ගන්න පුලුවන් බවයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ. ඒකම තමයි නිවනට 'අනුපාද පරිනිබ්බානං' කියල කියන්නේ. ඒ ඔක්කොම අතහැරිය අවසථාවේ සිතේ ඒ විමුක්ත තත්ත්වයයි වෙන අමුතු දෙයක් නොවෙයි, අල්ලගන්න දෙයක් නොවෙයි, ඒ සිත. මේ ග්‍රහණය මේ උපාදනය මේක තුළ ජාති ජරා ව්‍යාධි මරණ ඔක්කොම තියනවා නම් ඒවට වග කියනව නම් එතකොට මේක අතහැරිය අවසථාව තමයි විමුක්ති සුවය. ඒක තුළ තියන අවබෝධයයි අන්න අර 'ජානතො පසසතො නත්ථි කිඤ්චනං' කියල කිව්වෙ, මේ දකින කෙනාට ඇත්ත වශයෙන්ම මෙතන දෙයක් නැහැ. ඒ ඥාණ දර්ශනය ඉහළම මට්ටමට දියුණු වුනාට පස්සෙ අර තණ්හාවෙන් කෙරෙන භවයක් මවාදීම. ඇතැම් අවසථාවක බුදුරජාණන් වහන්සේ දක්වලා තියනවා තණ්හාව මැහුම් කාරියකට උපමා කරලා. මැහුමක්, මැෂිමක මැස්මක් වැටෙන හැටි හිතල බලන්න. ඉදිකටුව යට යන වාරයක් පාසා යටින් නූලක් ගිහිල්ලා ගැටයක් දනවා. ඕක තමයි 'තණ්හා පච්චයා උපාදනං' තණ්හාව නිසා,

උපාදනය, අල්ලා ගැනීම නිසා භවයක් ගෙතෙනවා. ඒක පිළිබඳව බුදුරජාණන් වහන්සේ දක්වලා තිබෙනවා ගාථාවකින්

යො උභනෙන විදිත්වාන - මජ්ඣෙ මන්තා න ලිප්පති
තං බ්‍රෑමි මහා පුරිසොති - සොධ සිබ්බනිමච්චගා

මහ පුදුම ගාථාවක් බුදුරජාණන් වහන්සේ දක්වනවා යම් කෙනෙක් කොන් දෙක හරියට තේරුම් අරගෙන 'යො උභනෙන විදිත්වාන - මජ්ඣෙ මන්තා න ලිප්පති' ප්‍රඥාවෙන් මැද නො ඇලේ ද 'තං බ්‍රෑමි මහා පුරිසොති' ඒ පුද්ගලයාට මම කියනවා මහා පුරුෂයෙක් කියලා. 'සොධ සිබ්බනිමච්චගා' ඒ පුරුෂයා අර මැහුම් කාරියගෙන් මිදුණා. මැහුම් කාරිය පන්නල ගියා. මැහුම් කාරියට අහුවුනේ නැහැ. එතකොට සාමාන්‍ය ලෝකයා මැහුම් කාරියට අහුවන හැටි දක්වනවා, බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මොකක්ද මේ කොන් දෙක, මොකක්ද මැද? එක කොනක් ස්පර්ශය, දෙවෙනි කොන ස්පර්ශයේ හට ගැනීම 'ඵස්ස සමුදය' මැදින් තියෙන්නේ ස්පර්ශ නිරෝධය. එතකොට මේ මැහුම් කාරිය කරන්නේ මොකක්ද තණ්හා ලාටුවෙන් අලවනවා මැද තියන නිරෝධය නොතකා හැරලා. ස්පර්ශයක් පාසාම නිරෝධයක් තියනවා. නමුත් තණ්හාව නිසා නිරෝධය අමතක කරලා ඒ ස්පර්ශ ටික එකතු කරලා තමයි අපි දෙයක් හදා ගන්නේ. ඒක අර විදර්ශකයා අර මනසිකාරය සියුම් කිරීම තුළින් ' ඵුස්ස ඵුස්ස වයං පස්සං එවං තත්ථ විරජ්ජති' කියලා පාඨයක් තියනවා. **ඵුස්ස ඵුස්ස වයං පස්සං** කියන්නේ ස්පර්ශයක් ස්පර්ශයක් පාසා ඒ ස්පර්ශයේ ගෙවී යාම දකිමින් ඒ විදියට විරාගය ඇති කර ගන්නවා. නො ඇල්ම ඇති කර ගන්නවා. නිරෝධය නොදකින තාක් තණ්හාවෙන් අර ලාටුවෙන් අලවලා ඔන්න භවයක්ම ගොතා ගන්නවා. ඒකයි භව මැස්ම. එතකොට අර කියාපු මහා පුරුෂයා මොකක්ද කරන්නේ? නිරෝධය දකිනවා. ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ මේ රූප ලෝකවල සිටින සත්ත්වයනුත් අරූප ලෝකවල සිටින සත්ත්වයනුත් නිරෝධය නොදැනීම නිසයි නැවත නැවත භවයට එන්නේ. පුනර්භවය කියල කියන්නේ මේ පින්වතුන් අහලත් ඇති තණ්හාව හඳුන්වල තියෙනවා - 'තණ්හා පොනොභවිකා' පුනර්භවයක් ඇති කරනවා. භවයෙන් භවය ගැටලනවා. නිරෝධය අමතක කරලා තණ්හාව තුළින් අර කියාපු ස්පර්ශය, ස්පර්ශය සමුදය නැවතත් ස්පර්ශයක් මතු කර ගන්නවා මිසක් ඒ ස්පර්ශයේ නිරෝධය නො තකා හරිනවා. ඔන්න ඔය විදියටමයි එතකොට බුදුරජාණන් වහන්සේ කරන්නේ අර ලෝකයාට අමතක වෙලා තිබුණ නිරෝධය මතුකර දීම. ඒකමයි නිවනට නිරෝධය කියලා කියන්නේ. අන්න අර සළායතන නිරෝධයෙන් කෙලවර වෙන ඒ උතුම් තත්ත්වයයි, බුදුරජාණන් වහන්සේ මතු කරල දුන්නේ. ඒක එදාට

පමණක් නොවෙයි. එද ශ්‍රමණ බ්‍රාහමණයින්ට පමණක් නොවෙයි. අද ඉන්න දර්ශනිකයන්ට විද්‍යාඥයින්ට පවා යමක් ඉගෙන ගන්න පුලුවන්. එතකොට අන්න ඒ කාරණය මේ පින්වතුන් හොඳින් කල්පනාවට ගන්න ඕන අනිත්‍ය සංඥාව. මොකද මේ භාවනා ආදිය පිළිබඳව අපි මෙච්චර දේශනා කළත් සමහරුන්ගේ හිත යන්නේ නවීන නවතම දර්ශනය කියල ගන්න ඔය විද්‍යානුකූල භෞතික දර්ශනයටයි. ඒකත් දර්ශනයක් කරගෙන ඒක තුළ අතරමං වෙච්ච අය මේ සාමාන්‍ය පුද්ගලයන් නොවෙයි. න්‍යෂ්ටික විද්‍යාඥයින් ඒ අතර ඉන්න බව පෙන්නුම් කරන්නයි ඔය වචන ටික කිව්වේ. මේ නවීනතම සංකල්පනා අනුව නවීනතම සොයා ගැනීම් අනුව එතකොට අපි නැවතත් එන්නේ ආපහු අර බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ 'මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා' ඒ ධම්ම පද පාඨයටමයි.

ඉතින් අද දවසේ මේ පින්වතුන් විදර්ශනාවට උපකාර වන අර කලින් සඳහන් කළ ආකාරයට මුළු මහත් කෙලෙස් සමූහයම විනාශ කරන්න පුලුවන් ඒ ප්‍රබල අනිත්‍ය සංඥාවට අදාළ යම් කිසි අංශු මාත්‍රයක් නමුත් මේ දේශනාව තුළින් එකතු කර ගන්න ඇතැයි කියල හිතනවා. අද දවසේ මේ පින්වතුන් පිරූ ශීලයත් කළ භාවනාවත් මේ ඇසූ ධර්ම දේශනාවත් උපකාර කර ගෙන මේ ජාති ජරා මරණාදී දුක් ගෙන දෙන මේ භවයෙන් මේ මුලු මහත් භවයෙන්ම මේ බඹයක් තුළ පිහිටා තිබෙන මේ ලෝකයෙන්ම මිදෙන්න මේ සෝවාන් සකදගාමී අනාගාමී අර්හත් කියන මාර්ග ඵල ප්‍රතිවේදයෙන් ඒ උතුම් නිර්වාණ තත්ත්වය ලබා ගැනීමට මේ ධර්ම දේශනයත් උපකාර වේවා කියල ප්‍රාර්ථනා කරමු. අවීචියේ සිට අකනිට්ඨා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මේ වගේ ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට බලාපොරොත්තු වෙනවා නම් ඒ අනුමෝදන් වීම තුළින් බලාපොරොත්තු වන ඒ උත්තමාර්ථයන් සාක්ෂාත් කර ගනිත්වා. ඒ හැම කෙනෙක්ම ඒ කුසල ශක්තිය තුළින් උතුම් අමා මහ නිවන ලබත්වා කියල ප්‍රාර්ථනා කරලා මේ ගාථා කියලා පින් දෙමු.

'එත්තාවතා ච අම්හෙහි...'

47 වන දේශනය

47 වන දේශනය
(පහන් කණුව ධර්ම දේශනා අංක 159)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

උභයෙනෙව සම්පන්නො රාහුල භද්දෝති මං විදූ
යඤ්චම්හි පුත්තො බුද්ධස්ස යං ච ධම්මේසු චක්ඛුමා

යං ච මෙ ආසවා ඛීණා යං ච නත්ථි පුනබ්භවො
අරහා දක්ඛිණෙය්‍යොම්හි තෙවිජ්ජො අමතද්දසො

කාමන්ධා ජාල පච්ඡන්නා තණ්හා ඡදනඡාදිතා
පමත්ත බන්ධුනා බද්ධා මච්ඡාව කුමිනාමුඛෙ

තං කාමං අහමුජ්ඣිත්වා ඡෙත්වා මාරස්ස බන්ධනං
සමූලං තණ්හමබ්බුය්හ සීතිභූතොස්මි නිබ්බුතොති

සැදැහැවත් පින්වතුනි,

මේ ශාසනයේ ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේලා අතර 'ඒතදග්ග' තනතුර ලබාගත්තු රාහුල ස්වාමීන් වහන්සේ සංඝයා වහන්සේලා අතර හැඳින්වුණේ 'රාහුල භද්‍ර' නමින්. උන් වහන්සේ සංඝයා වහන්සේලාට ඉතාමත්ම ප්‍රිය මනාප බව ඒ 'භද්‍ර' - 'යහපත්' කියන ගුණ පදයෙන් හැඟෙනවා. උන් වහන්සේ සංඝයා වහන්සේලාට එහෙම ප්‍රිය මනාප වුණේ බුදුරජාණන් වහන්සේගේ පුත්‍රයා වූ නිසාම නොවේ. උන් වහන්සේගේ ගුණ යහපත් කම නිසා, කීකරු නිහතමානී ශික්ෂාකාමී ගති පැවතුම් නිසාත්. ඇත්ත වශයෙන්ම රාහුල චරිතය කීකරු කම පිළිබඳ පරමාදර්ශයක්. උන් වහන්සේ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම බුද්ධ පුත්‍රයෙක්. ථෙර ගාථා පාලියේ දැක්වෙන ගාථා කීපයක් තමයි අපි අද මාතෘකා වශයෙන් දැක්වූයේ. ඒ ගාථා රාහුල ස්වාමීන් වහන්සේ අරහත්වය ලැබුවාට පස්සේ උදන ගාථා ප්‍රීති වාක්‍ය වශයෙන් ප්‍රකාශ කළ ඒවා හැටියටයි පිළි අරගෙන තිබෙන්නේ. ඒ ගාථාවලත් මේ රාහුල භද්‍ර නමින් උන් වහන්සේ හැඳින්වුනු බව කියවෙනවා.

'උභයෙනෙව සම්පන්නො රාහුල භද්දෝ'ති මං විදූ'

කාරණා දෙකකින් යුක්ත වූ නිසා මාව රාහුල භද්‍ර නමින් හැඳින්වුණා.

'යඤ්චම්හි පුත්තො බුද්ධස්ස යං ච ධම්මෙසු චක්ඛුමා'

එක කාරණයක් මා බුදුරජාණන් වහන්සේගේ පුත්‍රයා. අනිත් කාරණය ධර්මයන් පිළිබඳව අවබෝධ ශක්තිය ඇති දහම් ඇස මට තිබෙනවා.

'යං ච මෙ ආසවා ඛීණා යං ච නත්ථි පුනබ්භවො'

මගේ ආශ්‍රවයන් ක්ෂය කළ නිසාත්, මට පුනර්භවයක් නැති නිසාත්,

'අරහා දක්ඛිණෙය්‍යොම්හි තෙවිජ්ජො අමතද්දසො'

මම රහතන් වහන්සේ කෙනෙක්, දක්ෂිණා කියල කියන පූජා ලැබීමට, 'තෙවිජ්ජො' ත්‍රිවිද්‍යාවෙන් යුක්ත කෙනෙක්. 'අමතද්දසො' අමෘත නම් වූ නිර්වාණය දුටු කෙනෙක්.

'කාමන්ධා ජාලපච්ඡන්නා තණ්හා ඡදනඡාදිතා'

කාමයන්ගෙන් අන්ධ වූ කාම දැලෙහි පැටලුනාවූ තණ්හාව නමැති වැස්මෙන් වැසුනා වූ සත්ත්වයෝ

'පමත්තබන්ධුනා බද්ධා මච්ඡාව කුමිනාමුඛෙ'

කෙමෙහි අසු වූ මසුන් මෙන් මාරයාගේ දැලෙහි බැඳුනාහුය.

ඒ සත්ත්වයන් පිළිබඳවයි ඒ ප්‍රකාශ කරන්නේ. ඊළඟට තමන් වහන්සේ ගැන කියනවා.

'තං කාමං අහමුජ්ඣිත්වා' එබඳු වූ ඒ කාමය මම දුරු කරලා 'ඡෙත්වා මාරස්ස බන්ධනං' මාරයාගේ බන්ධනයන් කපලා 'සමූලං තණ්හමබ්බුය්හ' තණ්හාව මුලිනුපුටා දමලා, 'සීතිභූතොස්මි නිබ්බුතො'

සිසිල් වුයේ වෙමි. නිවුනේ වෙමි. එතකොට ඒ රාහුල ස්වාමීන් වහන්සේ අරහත්වයෙන් පසු ප්‍රකාශ කළ ගාථායි.

මේ පින්වතුන් කවුරුත් අහල ඇති සිද්ධාර්ථ කුමාරයාගේ මහබිනික්මනට ආසන්න හේතුව වුනේ 'පුතෙක් උපන්නා' කියන ආරංචිය බව. 'රාහුලයෙක් උපන්නා - බන්ධනයක් හටගත්තා' කියන ප්‍රතිචාරයෙනුයි පුතෙක් උපන්නා කියන ශුභ ආරංචිය සිද්ධාර්ථ කුමාරයා පිළිගත්තේ. එපමණක් නොවෙයි, එදා රෑම කාටවත් නොදන්වා පුත්‍ර ස්නේහය මැඩ පවත්වාගන උන් වහන්සේ අප හැම වෙනුවෙන් මහබිනික්මන් කළා. එතකොට පිය සෙනෙහස නො ලැබූ ඒ රාහුල කුමාරයාට පළවෙනි වරට පියාණන් දකින්ට ලැබුණේ බුදුරජාණන් වහන්සේ සම්බෝධි ලාභයෙන් වර්ෂයකට පමණ පස්සේ කපිලවස්තු පුරයට වැඩම කළ අවස්ථාවේදීයි. කපිලවස්තු පුරයට වැඩම කරලා, නිග්‍රෝධ නම් වූ ශාක්‍යයන් ගේ ආරාමයේ වැඩ වාසය කරන අතරේ එක දවසක් බුදු පියාණන් වහන්සේ ශුද්ධෝදන රජතුමා ගේ මාලිගයට වැඩම කළා. වැඩම කරලා පැනවූ අස්නෙහි වැඩ හුන්නා. රාහුල මාතාව යශෝධරා දේවිය රාහුල කුමාරයාට කියනවා. ඔය ඉන්නේ රාහුල ඔබේ පියා. ගිහිල්ලා දායාදය ඉල්ලා ගන්න. ඉතින් රාහුල කුමාරයාත් බුදු පියාණන් වහන්සේ ඉදිරියට ගිහිල්ලා 'මහණ ඔබේ සෙවනැල්ලත්, සෙවනත් මට සැපයි' කියමින් ප්‍රිය බස් දොඩන්ට පටන් ගත්තා. බුදු පියාණන් වහන්සේ නිග්‍රෝධාරාමයට ආපසු වැඩම කරන්න පිටත් වන අවස්ථාවේ රාහුල කුමාරයාත් පිටි පස්සෙන් පිටි පස්සෙන් එනවා. 'මහණ මගේ දායාදය දෙන්න, මහණ මගේ දායාදය දෙන්න' කිය කියා. ඉතින් බුදු පියාණන් වහන්සේ නිග්‍රෝධාරාමයට වැඩියට පස්සේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේට කියනවා. එහෙනම් සාරිපුත්ත රාහුල කුමාරයාව පැවිදි කරන්න කියලා. ඒ වෙනකොට සාමණේරයන් පැවිදි කිරිම පිළිබඳ ශාසනික ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. ඉතින් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අහනවා 'කොහොමද ස්වාමීනි මම රාහුල කුමාරයා පැවිදි කරන්නේ?' ඔන්න බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවේ විනය නීතියක් වශයෙන් පැනෙව්වා, සංඝයා වහන්සේලා රැස් කරලා ධර්ම කථාවක් කරලා, මම අනුදන වදාරණවා සරණාගමන පාඨය තුන් වරක් කීමෙන් සාමණේරයන් පැවිදි කරන්න කියලා. ඉතින් ඒ ආකාරයට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ රාහුල කුමාරයාව පැවිදි කළා.

ඒ පැවිදි කළ ආරංචිය දැන ගත්තු සුද්ධෝදන රජ්ජුරුවෝ බුදුරජාණන් වහන්සේ සොයාගෙන ඇවිල්ලා වැඳලා එකත් පසෙක ඉඳගෙන කියනවා 'ස්වාමීනි, මම එක වරයක් ඉල්ලන්න කැමතියි.' එතකොට බුදුරජාණන් වහන්සේ පිය රජ්ජුරුවන් ඇමතුවේ 'ගෞතමය' කියල. 'ගෞතමය, තථාගතවරු වර දීමේ සිරිත ඉක්මවලයි සිටින්නේ' 'නැහැ ස්වාමීනි කැප දෙයක් නිවැරදි දෙයක් මා ඉල්ලන්නේ' 'එහෙනම් කියන්න ගෞතමයිනි' කියල කිව්වා. ඔන්න එතකොට සුද්ධෝදන රජ්ජුරුවෝ කියනවා 'භාග්‍යවතුන් වහන්සේ පැවිදි වුනහම මට විශාල දුකක් ඇති වුණා. ඒ වගේමයි නන්ද කුමාරයා පැවිදි වුනහම, රාහුල කුමාරයා පැවිදි වුනහම ඊටත් වඩා දුකක් ස්වාමීනි, පුත්‍ර ප්‍රේමය සිවිය සිඳගෙන යනවා, සිවිය සිඳගෙන සම සිඳිනවා. සම සිඳගෙන මස් සිඳිනවා. මස් සිඳගෙන නහර සිඳිනවා. නහර සිඳගෙන ඇට සිඳිනවා. ඇට සිඳගෙන ඇට මිදුලු තුළට හැපී ගැවසී වැදී තිබෙනවා. ඒක නිසා ස්වාමීනි මවු පියන් විසින් නොඅනුදක්නා ලද පුතකු ආර්යයන් වහන්සේලා පැවිදි නොකරනවා නම් හොඳයි' කියලා. ඉතින් බුදුරජාණන් වහන්සේ ධර්ම කථාවක් කරලා ශුද්ධෝදන රජ්ජුරුවන් සනසලා යවලා සංඝයා වහන්සේලා රැස් කරලා විනය නීතියක් පනවනවා, මවු පියන් විසින් නොඅනුදත් දරුවකු පුතකු පැවිදි නොකළ යුතුයි. පැවිදි කළොත් යම් කිසි භික්ෂුවක් 'දුකුලා ඇවතක්' වෙනවා කියලා. ඉතින් ඔන්න ඔය විදියට බුදුරජාණන් වහන්සේ මේ රාහුල කුමාරයා පැවිදි කරලා ශාසන දායාදය, ධර්ම දායාදය දුන්න ආකාරයයි සූත්‍ර රාශියක සඳහන් වෙන්නේ.

අම්බලට්ඨිකා රාහුලෝවාද, මහා රාහුලෝවාද, චූල රාහුලෝවාද, රාහුල සූත්‍රය, රාහුල සංයුක්තය ආදී ධර්ම කොටස්වල ඊළඟට සඳහන් වෙනවා බුදුරජාණන් වහන්සේ ක්‍රමානුකූලව පියවරෙන් පියවරට අර රාහුල ස්වාමීන් වහන්සේට ධර්ම දායාදය හෙළි කරල දුන්න ආකාරය. වඩාත්ම කවුරුත් වගේ දන්න සූත්‍රයක් තමයි අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය. බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ වාසය කරන අවස්ථාවේ රාහුල ස්වාමීන් වහන්සේ ඊට සමීපයෙහි වූ අම්බලට්ඨිකා නමැති තැන කුටියක වැඩ වාසය කළා. බුදුරජාණන් වහන්සේ සවස් වරුවේ භාවනාවෙන් නැගිටලා රාහුල ස්වාමීන් වහන්සේ දකින්න වැඩම කළා. වඩින කොට ඈතදීම දැකල රාහුල හාමුදුරුවෝ ආසනයක් පිළියෙල කරලා පා

සේදීමට පැන් බඳුනකුත් තැබුවා. බුදුරජාණන් වහන්සේ පා සෝදාගෙන ඉවරවෙලා පැන් ටිකක් භාජනයේ ඉතිරි කරලා රාහුල ස්වාමීන් වහන්සේගෙන් අහනවා, 'රාහුල, පෙනෙනවද මේ භාජනයේ තිබෙන පැන් ටික.' 'එසේය ස්වාමීනි.' 'රාහුල යම් කෙනෙකුට දැන දැන බොරු කීමේ ලැජ්ජාවක් නැත්නම් ඒ අයගේ මහණකම මෙන්න මේ භාජනයේ තියෙන පැන් ටික වගේ ටිකයි.' ඊළඟට බුදුරජාණන් වහන්සේ ඒ පැන් ටික වීසි කළා. වීසි කරල රාහුල ස්වාමීන් වහන්සේගෙන් අහනවා, 'රාහුල, දැක්කද අර පැන් ටික වීසි කරපු හැටි.' 'එසේය ස්වාමීනි.' ඊළඟට බුදුරජාණන් වහන්සේ කියනවා 'යම් කෙනෙකුට දැන දැන බොරු කීමේ ලැජ්ජාවක් නැත්නම් ඒ අයගේ පැවිද්ද අන්න අර විසි කළ දිය ටික වගේ' කියල මහණකමත් ඉවත් කරලයි කියන එක, විසි කරලයි කියන එකයි ඒ ප්‍රකාශ කළේ. ඊළඟට බුදුරජාණන් වහන්සේ දිය බඳුන මුනින් නැමුවා. මුනින් නමලා රාහුල ස්වාමීන් වහන්සේගෙන් අහනවා, 'රාහුලය, පේනවද මේ පැන් බඳුන මුනින් නමලා තියනවා. යටිකුරු කරල තියනවා.' 'එසේය ස්වාමීනි.' 'යම් කෙනෙකුන්ට දැන දැන බොරු කීමේ ලැජ්ජාවක් නැත්නම් ඒ අයගේ මහණකමත් යටිකුරු වෙලයි තියෙන්නේ' කියලා අන්න ඒ විදියට ප්‍රකාශ කළා. ඊළඟට බුදුරජාණන් වහන්සේ තව උපමාවක් ප්‍රකාශ කරනවා, රාහුල ස්වාමීන් වහන්සේට. 'රාහුල යුද්ධයට ගෙනයන ඇතෙක් යුද භූමියේ දී ඉදිරි පාවලින් සටන් කරනවා. පසු පාවලින් සටන් කරනවා, හිසෙන් සටන් කරනවා, දළවලින් සටන් කරනවා, නමුත් හොඬය අකුලාගෙන ඉන්නවා. එතකොට ඇත් ගොව්වා කල්පනා කරනවා, මේ ඇතා තාම ජීවිතේ පරිත්‍යාග කරල නැහැ. යම් අවස්ථාවක අර ඇතා හොඬයෙනුත් සටන් කරන්න පටන් ගත්තොත්, ඇත් ගොව්වා කල්පනා කරනවා, දැන් ඉතින් මේ ඇතා ජීවිතය පරිත්‍යාග කරලා. මේ ඇතාට දැන් කරන්න බැරි දෙයක් නැහැ. අන්න ඒ වගේම රාහුල යම් කෙනෙකුට දැන දැන බොරු කීමේ ලැජ්ජාවක් නැත්නම් ඔහුට කරන්න බැරි පාපයක් නැත. එමනිසා රාහුල, විහිළුවටවත් බොරුවක් නොකියම්'යි එසේය හික්මිය යුත්තේ' කියල. ඔන්න බුදුරජාණන් වහන්සේ අර කුඩා සාමණේර කෙනෙකුට දෙන මූලික අවවාදයක් උපදේශයක් ඒ අවස්ථාවේ දුන්නා. ඒ වගේම බුදුරජාණන් වහන්සේගේ නිරන්තර උපදේශයන් සහිතව සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ උපාධ්‍යායභාවයෙන් ගුරු හරු කම් ඇතිව රාහුල

ස්වාමීන් වහන්සේ හැඩ ගැහුණ හැටි ධර්ම සාහිත්‍යයේ කොතෙකුත් තැන්වල සඳහන් වෙනවා.

එක සිද්ධියක් තමයි පොඩි රාහුල හාමුදුරුවෝ කරපු වැලි සෙල්ලම. මොකක්ද; උදෑසන නැගිටල වැලි දෝතක් අරගෙන උඩ දම්මා කියලා සඳහන් වෙනවා. 'මේ වැලි කැට ප්‍රමාණයට මට ශාස්තෘෘන් වහන්සේගෙනුත් අනිත් සබ්‍රහ්මචාරී සංඝයා වහන්සේලාගෙනුත් අවවාද උපදේශ ලැබේවා' කියලා. මේ අවවාදවලට කැමති ගුණය ගැන සංඝයා වහන්සේලා කථා කරනවා අහලා බුදුරජාණන් වහන්සේ තිපලත්ථ මිග ජාතකය, තිත්තිර ජාතකය ආදී ජාතක කථා දේශනා කළ බවත් ජාතක පොතේම සඳහන් වෙනවා. ඒ වගේම තවත් ඒ විදියේ දෙයක් විනය පිටකයේ සඳහන් වෙනවා. රාහුල ස්වාමීන් වහන්සේගේ ශික්ෂාකාමිත්‍වය, නිහතමානිත්‍වය පෙන්නුම් කරන. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ විනය නීතියක් පැනෙව්වා, උපසම්පන්න භික්ෂුවක් අනුපසම්පන්නයින් සමග ඒ කියන්නේ සාමණේර ආදීන් සමග එක වහළ යට සයනය නො කළ යුතු බව. ඒ විනය නීතිය පැනෙව්වට පස්සෙ කොසඹෑ නුවර බදිරිකාරාමයේ බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරන අවස්ථාවක සංඝයා වහන්සේලා පොඩි රාහුල හාමුදුරුවන්ට කීවා 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ මෙන්න මෙහෙම විනය නීතියක් පනවලා තියෙනවා. ඒක නිසා තමන්ට සැතපෙන්න තැනක් සොයාගන්න' කියලා. රාහුල ස්වාමීන් වහන්සේ බැලුවා, තැනක් නැහැ. අන්තිමට බුදුරජාණන් වහන්සේගේ වැසිකිළියේ එද රෑ ගත කළා කියලා සඳහන් වෙන්නේ. බුදුරජාණන් වහන්සේ එළිවන යාමයේ වැසිකිළියට වඩින අතරේ කවුරු හරි ඉන්නවද කියල දැන ගැනීමට විනය නීතියක් වශයෙන් තියෙන්නේ - චාරිත්‍රයක් වශයෙන් කාරනවා. එහෙම නැත්නම් උගුර පාදනවා. බුදුරජාණන් වහන්සේ කැරුවහම ඇතුළේ සිටිය රාහුල හාමුදුරුවෝත් කැරුවා. 'කවුද ඔතන ඇතුළෙ ඉන්නේ' කියල ඇහුවා. 'මම රාහුල ස්වාමීනි, මම රාහුල'. 'මොකද මේ මෙතන ඉන්නේ' කියලා ඇහුවා. ඔන්න රාහුල ස්වාමීන් වහන්සේ අර විස්තරය කිව්වට පස්සෙ බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා රැස් කරලා ධර්ම කථාවක් කරලා අර විනය නීතිය ලිහිල් කළා. අනුපසම්පන්න කෙනෙකුට රෑ දෙක තුනක් උපසපන් භික්ෂුවක් සමග වැඩ වාසය කරන්න පුළුවන් කියල. ඉතින් මෙන්න මේ විදියේ සිද්ධි රාශියක්

රාහුල ස්වාමීන් වහන්සේ සම්බන්ධයෙන් උන් වහන්සේගේ ශික්ෂාකාමීත්‍වය, නිහතමානීත්‍වය පිළිබඳව සඳහන් වෙනවා. දැන් මේ කාලයේ නම් ඔය සමහර පොඩි ළමයි නිලතල බලතල ඇති මව් පියන් ගැන මාන්නය ඇති කර ගෙන කවුරුවත් එක්ක පොඩ්ඩක් හරස් වුන හැටියේ 'ඉන්නවකො අපේ තාත්තට කියල හොඳ පාඩමක් උගන්නන්න' කියල එහෙම කියන සිරිතක් තියෙනවා. නමුත් මේ පොඩි රාහුල හාමුදුරුවෝ අනුන්ගේ කොන්කිරීම් අඩුපාඩුකම් පවා තමන් වහන්සේට පාඩමක් කර ගත්තා මිසක් බුදුරජාණන් වහන්සේට ගතු කියන්න, පැමිණිලි කරන්න කිසිදක ගිය බවක් පේන්න නැහැ ධර්ම සාහිත්‍යයේ.

ඊළඟට බුදුරජාණන් වහන්සේ, ක්‍රමානුකූලව හික්ම වූ ආකාරය මහා රාහුලෝවාද සූත්‍රයෙන් විශේෂයෙන්ම හෙළි වෙනවා. ඉතාමත්ම වැදගත් සූත්‍රයක් භාවනා කරන යෝගී සංඝයා වහන්සේලාටත්. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසද්දී උදෑසන පා සිවුරු අරගෙන පිණ්ඩපාතයේ වැඩම කලා. රාහුල ස්වාමීන් වහන්සේත් බුදුරජාණන් වහන්සේගේ පිටිපස්සෙන්ම පිණ්ඩපාතයේ වඩිනවා. බුදුරජාණන් වහන්සේ හැරිලා බලලා රාහුල ස්වාමීන් වහන්සේට කියනවා 'රාහුල යම්තාක් රූප තිබෙනවා නම් ඔන්න එකොලොස් ආකාරයකට එතන දක්වනවා - අතීත, අනාගත, වර්තමාන, තමා පිළිබඳ හෝ අනුන් පිළිබඳ, රළු හෝ සියුම්, පහත් හෝ උසස්, දුර හෝ ළඟ යම් තාක් රූපස්කන්ධයක් තිබෙනවා නම්, රූපයක් තිබෙනවා නම්, එය මගේ නොවේ, මම නොවේ, මගේ ආත්මය නොවේ කියලා යථාභූත වශයෙන් නුවණින් දැකිය යුතුයි.' එතකොට රාහුල ස්වාමීන් වහන්සේ අහනවා 'භාග්‍යවතුන් වහන්ස, සුගතයන් වහන්ස, රූපය පමණක්ද?' කියලා. 'නැහැ රාහුල' ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. 'රූපය වගේම වේදනාව, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන ඒ පඤ්චස්කන්ධයම ඒ විදියට අනාත්ම වශයෙන් නුවණින් දැකිය යුතුයි' කියලා. ඉතින් බුදුරජාණන් වහන්සේ පිණ්ඩපාතේ වැඩම කරනවා. රාහුල ස්වාමීන් වහන්සේ කල්පනා කරනවා 'භාග්‍යවතුන් වහන්සේ මුණගැහිලා මේ විදියට කමටහනක් ලබලා කවුද ගමට පිණ්ඩපාතේ වඩින්නෙ' කියලා පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කරලා ගහක් මුල ඍජුව භාවනාවෙ හිඳගත්තා. ඉඳගෙන භාවනා කරන්න පටන් ගත්තා. එතකොටම පිටිපස්සෙන් ආපු

සාරිපුත්ත ස්වාමීන් වහන්සේ, රාහුල හාමුදුරුවො දැකලා, ඒත් පොඩි උපදෙසක් දුන්නා. 'රාහුල ආනාපාන සතිය වඩන්න. ආනාපාන සතිය හොඳට වැඩූ කල්හි, බහුල වශයෙන් පුරුදු කළ කල්හි මහත්ඵල මහානිශංසස වෙනවා' කියලා. ඊළඟට රාහුල ස්වාමීන් වහන්සේ මුළු හවස් වරුවේම භාවනා කරලා හැන්දෑවේ බුදුරජාණන් වහන්සේ දකින්ට වැඩම කරලා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා 'ස්වාමීනි, ආනාපාන සති භාවනාව මහත්ඵල මහානිශංසස වන්නේ කොයි විදියට වැඩුවහමද' කියලා. ඔන්න බුදුරජාණන් වහන්සේ එතන ඉඳලා ආනාපාන සතියට පූර්වභාග වශයෙන් වැඩිය යුතු භාවනා ක්‍රම රාශියක් ගැන සඳහන් කරනවා. ඒක මේ යෝගාවචරයින්ට හොඳ පාඩමක්. ඔය ආනාපාන සතියෙන්ම එක පාරටම ආරම්භ කරන ඇතැම් අය ගිහිල්ලා හිරවෙන නිසා. එතනදී පළමුවෙන්ම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා; තමන්ගේ ශරීරයේ තිබෙන ධාතු හතර පිළිබඳව. ධාතු මනසිකාරය පිළිබඳ කමටහනක් වශයෙන් දෙනවා. රාහුල මේ ශරීරයේ යම් ගොරෝසු, රළු, තද කොටස් තිබෙනවා නම්, කෙස්, ලොම්, නිය, දත් ආදී, අසූචි දක්වා වූ කොටස් දහ නවයක් දක්වනවා. දැන් මෙතන සූත්‍රාගතව තිබෙන්නේ කොටස් තිස් එකයි. පසුකාලීනව හිස් මොළ කියන කොටසත් එකතු කරල විස්සක් හැටියට දක්වනවා. ඒ දහ නමයම අධ්‍යාත්මික පඨවි ධාතුවයි. ඊළඟට බාහිර පඨවි ධාතුව ගැන අමුතුවෙන් කියන්න ඕන නැහැ. බැහැර තිබෙන ඒ තද ද්‍රව්‍ය ආදිය. යම් අධ්‍යාත්මික පඨවි ධාතුවක් වේද, තමා පිළිබඳ පඨවි ධාතුවක් වේද, බාහිර පඨවි ධාතුවක් වේද, එය හුදෙක් පඨවි ධාතුවමැයි. අන්න ඒ නිසා මගේ නොවේ. මම නොවෙමි. මගේ ආත්මය නොවෙයි කියල නුවණින් දැකිය යුතුයි, කියල පළමුවෙනි උපදෙස දෙනවා. ඊළඟට ඒ විදියටම පඨවි ධාතුව වගේම අනික් ඒවා මේ පින්වතුන් සලකාගන්න. මේ කාරණා ගැන අපි සවිස්තරව කියල තියන නිසා ධාතු මනසිකාරය ගැන. ආපො ධාතුව පිළිබඳවත්, ශරීරයේ ආපො ධාතු කොටස් පිත්, සෙම්, කෙළ, මුත්‍රා ආදී දියාරු ස්වභාවයේ ඇති දේවල් අධ්‍යාත්මික ආපො ධාතු කොටස් හැටියට දක්වලා, බාහිර ආපො ධාතු කොටස් දෙකම එකක් හැටියට සළකලා, එය තනිකරම හුදු ආපො ධාතුව මැයි. ඒවා මගේ නොවේ. මම නොවේ. මගේ ආත්මය නොවේ. ඒ විදියටම තේජො ධාතුවත්, ශරීරයේ උෂ්ණයට අදාල කොටස්, බාහිරව තියන ගින්න ආදිය, ඊළඟට වායො ධාතුවත්, ශරීරයේ ආශ්වාස ප්‍රශ්වාස ඉහළට පහළට යන වාත

ආදියත්, බාහිර වායො ධාතුවත්, ඊළඟට අමුතුවෙන් තියනවා එතන ආකාශ ධාතුව පිලිබඳවත්, ශරීරයේ තිබෙන ආකාශ ධාතුව හැටියට දක්වන්නේ කන්වල නාස්වල තියන සිදුරු, ශරීරයේ ආහාර රඳන බඩවැල් තුළ තියන සිදුරු ආදිය. ඒවා තමයි අධ්‍යාත්මික ආකාශ ධාතුව. බාහිර ආකාශ ධාතුව හිතාගන්න පුළුවන් ඒකත් අර විදියටම. මෙය මගේ නොවේ. මම නොවේ. මගේ ආත්මය නොවේ කියලා ඒ විදියටම සලකන්න. ඉතින් ඔන්න ඔය විදියට ධාතු මනසිකාරය ආකාශ ධාතුවත් සමගම භාවනාවට නගන හැටි පෙන්නුවා.

ඊළඟට තවත් අමුතුම භාවනාවක් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. රාහුල පඨවි සම භාවනාව වඩන්න. 'පඨවි සම භාවනාව' කියන්නේ තමන් පෘථිවියට සමාන කරලා. ඒක අමුතුම භාවනාවක්. සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ දේශනාවලත් ඕක සඳහන් කරනවා. ඒ කියන්නේ මෙන්න මෙහෙම කල්පනා කරන්න. පෘථිවිය තමා පිට හෙලූ පිරිසිදු දේත් අපිරිසිදු දේත් ගැන වෙනසක් කරන්නේ නැහැ. කෙනෙක් අසූචි මළමුත්‍රා කෙළ සෙම් සොටු ආදිය පෘථිවියෙ දැම්මත් පෘථිවිය ඒ ගැන ලැජ්ජාවක් කලකිරීමක් ඇති කර ගන්නේ නැහැ. අන්න එසේම ඒ පෘථිවියේ ස්වභාවය අනුව තමනුත් පෘථිවිය වගේම උපේක්ෂාව ඇති කර ගන්න. එතකොට අර මනාප අමනාප ස්පර්ෂ පිළිබඳව සිත කනස්සල්ලට පත් වෙන්නේ නැතෙයි. ඒවා හිත දැඩිව ග්‍රහණය කරන්නේ නැතෙයි කියලා අන්න ඒ පඨවි සම භාවනාව. ඒ වගේම ආපො සම භාවනාව. අර විදියටම ශරීරයේ තියෙන ආපො ධාතුව ගැන හිතලා ඉස්සෙල්ල ඒ දෙකම සම කලාට පස්සෙ දැන් තියෙන්නෙ ජලය පිරිසිදු දේ සේදුවත් අපිරිසිදු දේ සේදුවත් ජලය ඒකෙ අමුත්තක් පෙන්වන්නේ නැතුව වගේ තමනුත් තමන් ජලය කියලා හිතා ගන්න. එතන පඨවි සම කියලා කියන්නෙ තමන් පෘථිවියයි කියලා හිතා ගන්නව. ඇයි අර ඉස්සෙල්ල කිව්වනේ තමන්ගේ ඇතුළත තියන පඨවියත් බාහිර තියන පඨවියත් හුදු පඨවි ධාතුවම බව. ඒක තර්කානුකූලවත් ගන්න පුළුවන්. ඊට පස්සෙ ආයි අධ්‍යාත්මික බාහිර භේදයක් නැතිව කල්පනා කරනවා. ඊළඟට ආදශී වශයෙන් ගන්නේ බාහිර හිත් පිත් නැති පඨවි ධාතුව. හිත් පිත් නැති ආපො ධාතුව. හිත් පිත් නැති තේජො ධාතුව. හිත් පිත් නැති වායො ධාතුව. හිත් පිත් නැති ආකාශ ධාතුව. අන්න ඒ විදියට හැසිරෙන්න කියන එකයි බුදුරජාණන් වහන්සේ කියන්නෙ. ඒ කියන්නේ හිත

උපේක්ෂාවට ගන්න ක්‍රමයක් ඒක. පෘථිවි ආදිය. ඊළඟට ගින්න ඕනෑම දෙයක් දවනවා. පිරිසිදු අපිරිසිදු භේදයක් නැතිව වාතය ඕනෑම දෙයක් හමනවා දුගඳ හෝ සුගඳ. ඒ විදියට හතර ගැනම මේ පින්වතුන් කෙටියෙන් සලකාගන්න. ආකාශය ගැන විශේෂයෙන් කියන්නේ ඒක අමුතු දෙයක්. ආකාශය කොතනක වත් පිහිටල නැතුව වගේ අන්න ඒකත් තමනුත් කොතනක වත් අල්ලාගන නැහැ. ඉතින් ඕක තව දුරටත් හිතේ තියන තමන්ගේ ශරීරය පිළිබඳවත් තණ්හා මාන ආදිය නැතිවෙන්න ආත්ම දෘෂ්ටිය නැතිවෙන්න කරන භාවනාවක් වශයෙනුයි එතන දක්වල තිබෙන්නෙ. ඔන්න එතකොට ඒ දෙවෙනි පියවර.

තව තුන්වෙනි පියවරකුත් දක්වනවා බුදුරජාණන් වහන්සේ. රාහුල මෛත්‍රී භාවනාව වඩන්න. ද්වේශය නැති කර ගන්න. කරුණා භාවනාව වඩන්න. හිංසාව නැති කර ගන්න. මුදිතා භාවනාව වඩන්න. අරති කියල කියන ශාසන ප්‍රතිපත්ති පිළිබඳව නොඇල්ම නැති කර ගන්න. උපේක්ෂා භාවනාව වඩන්න. පටිඝය යමක් පිළිබඳව දැඩිව නැවත නැවත ද්වේශ වශයෙන් හැපීම නතර කර ගෙන උපේක්ෂාවට ගන්න උපේක්ෂා භාවනාව. ඊළඟට ඒ වගේම අශුභ භාවනාව වඩන්න රාගය නැති කර ගැනීමට. අනිත්‍ය සංඥාව වඩන්න අස්මි මානය මුලිනුපුටා දැමීමට. ඔන්න ඒ පියවරත් කිව්වා.

ඒකටත් පස්සේ තමයි බුදුරජාණන් වහන්සේ අන්තිමටම ආනාපාන සති භාවනාව ප්‍රකාශ කළේ. අන්න එතනදී අවසාන වශයෙන් ආනාපාන සතියේ දහසය පියවරක්ම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. එයින් අපට පෙනෙන්නේ ඒ විදියට පරිවාර සහිතව ආනාපාන සතිය වැඩීම තුළින් තමයි එය මහත්ඵල මහානිශංස වන්නේ. ඒ සූත්‍ර දේශනාව අවසන් කරන්නේ බුදුරජාණන් වහන්සේ මේ විදියට ආනාපාන සතිය වැඩූ කෙනෙකුගේ අවසාන හුස්ම පවා අන්තිම ආශ්වාස ප්‍රාශ්වාසය පවා දැනුවත්ව නැති වෙලා යනවා. අවසාන හුස්ම පවා සිහි ඇතිවම නැති කර ගන්න පුළුවන් කියලා. දහසය පියවරවල් අපි මේ අවස්ථාවේ විස්තර කරන්නේ නැහැ. ඊට කලින් අපි යම් යම් දේවල් මේව ගැන කියල තියන නිසා. ඔන්න ඔය විදියට ආනාපාන සති භාවනාව මහත්ඵල මහානිශංස කර ගන්න ආකාරය බුදුරජාණන් වහන්සේ සවිස්තරව රාහුල ස්වාමීන් වහන්සේට පෙන්වා දුන්නා.

ඒ වගේම බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන්ම රාහුල ස්වාමීන් වහන්සේට අවවාද අනුශාසනා කළ ගාථා පංතියකුත් සඳහන් වෙනවා, සුත්ත නිපාතය නමැති ග්‍රන්ථයේ රාහුල සුත්ත නමින්. ඒ රාහුල සූත්‍රයේ කියවෙන හැටියට බුදුරජාණන් වහන්සේ පළමුවෙන්ම රාහුල ස්වාමීන් වහන්සේගෙන් අහනවා, මා හිතනවා නිතර ඇසුරු කිරීම නිසා නුඹ තමන්ගේ උපාධ්‍යයයන් වහන්සේට නිගරු කරන්නේ නැත, අවමන් කරන්නේ නැත කියලා. එතන බුදුරජාණන් වහන්සේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේව හඳුන්වන්නේ 'උක්කාධාරො මනුස්සානං.' උක්කාධාරො මනුස්සානං කියන්නේ මනුෂ්‍යයින්ට ආලෝක පන්දමක් පෙන්නුම් කරන්නාවූ, ප්‍රඥව තුළින් ආලෝකය දෙන්නා වූ කෙනෙක් හැටියටයි බුදුරජාණන් වහන්සේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේව ඒ අවස්ථාවේ හැඳින්වූයේ. රාහුල හාමුදුරුවෝත් කියනවා එසේය ස්වාමීනි, මම මගේ උපාධ්‍යයයන් වහන්සේට නිගරු කරන්නේ නැහැ. මම උන් වහන්සේට නිතරම ගරු කරනවා කියලා.

ඊළඟට තවත් ගාථා පෙළකින් බුදුරජාණන් වහන්සේ තව දුරටත් රාහුල ස්වාමීන් වහන්සේට හික්මෙන ආකාරය පෙන්නුම් කරනවා. රාහුල ඒ ප්‍රිය ස්වරූපය ඇති පංච කාමයන් අත හැරලා ශ්‍රද්ධාවෙන් පැවිදි වුනාට පස්සේ දුක් කෙළවර කර ගැනීමේ පරමාර්ථය ඉස්මතු කර ගන්න. ඊළඟට කළ්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්න. විවේක නිහඬ සෙනසුන්වල වාසය කරන්න. පමණ දන ආහාර ගන්න. ඒ වගේම චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍යය කියන ඒ සිව්පසය පිළිබඳව තණ්හාව දුරලන්න. රාගයට උපකාර වන්නා වූ රාගය හා සම්බන්ධ වූ සුභ නිමිති වර්ජනය කරන්න. අශුභ භාවනාවෙන් සිත එක්තැන් කරගෙන සමාධිමත් වන්න. ඊළඟට අනිමිත්ත සමාධිය. අනිමිත්ත සමාධිය කියල කියන්නේ අනිත්‍යතාව ගැඹුරින් මෙනෙහි කිරීම තුළින් නිත්‍ය සංඥව මැකී ගිහිල්ලා අනිමිත්ත කියන එක මතු වෙනවා. නිමිති නැති වන ස්වභාවය. අනිමිත්ත සමාධියක් වඩන්න. අනිමිත්ත සමාධිය වැඩීම තුළින් මානය දුරු කරන්න. අස්මි මානය දුරු කරන්න. අස්මි මානය දුරු කිරීමෙන් අවසානයේ ඔබ දුක කෙළවර කරන්නෙකු වෙනවා කියලා.

අන්න ඒ ගාථා කිපය තුළින් බුදුරජාණන් වහන්සේ නිතිපතා රාහුල ස්වාමීන් වහන්සේට අවවාද කළ බව පොත පතේ සඳහන්

වෙනවා. ඒක හඳුන්වන්නේ 'අභිණ්හොවාද' නමින්. අභිණ්හ කියන්නේ නිතිපතා කළ අවවාදයක් හැටියට. එතකොට එක පැත්තකින් ශාරිපුත්ත ස්වාමීන්වහන්සේ උපාධ්‍යායයන් වහන්සේ වශයෙන් උපදෙස් දෙනවා. ඒ එක්කම බුදුරජාණන් වහන්සේත් තමන්ගේ පුත්‍රයාගේ ශාසන හුරතලය දකිනවා. ඒ උපදෙස් දීම තුළින්, ඒ විදියට රාහුල ස්වාමීන් වහන්සේගේ ඇතුළත දියුණුව ගැන නිරන්තරයෙන් බුදුරජාණන් වහන්සේ සෙවිල්ලෙන් සිටි බව අපට පැහැදිලිව ප්‍රකාශ කෙරෙනවා.

මේ සම්බන්ධයෙන් දැක්වෙන අවසාන සූත්‍රය තමයි චූළ රාහුලෝවාද සූත්‍රය. චූළ රාහුලෝවාද සූත්‍රයේදී මෙහෙමයි කියවෙන්නේ. බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක පිණ්ඩපාතයේ වැඩලා පිණ්ඩපාතය වළඳලා ඉවර වෙලා දවල් වරුවේ රාහුල ස්වාමීන් වහන්සේට කියනවා රාහුල ඔය නිසීදනය ගන්න. අපි යමු අන්ධ වනයට දිවා විහාරය සඳහා. දිවා විහාරය කියල කියන්නෙ පින්වතුනි අතීතයේ සංඝයා වහන්සේලාගේ සිරිතක් තිබුණා දානය වැළඳීමෙන් පස්සෙ ඒ උෂ්ණ දවල් කාලය භාවනායෝගීව බොහෝ විට ගසක් මුල එළිමහනේ වාසය කරනව. ඒ තමයි දිවා විහරණය කියල කියන්නේ. දිවා විහරණය සඳහා අපි යමු අන්ධ වනයට කියලා බුදුරජාණන් වහන්සේගේ පිටි පස්සෙන් රාහුල ස්වාමීන් වහන්සේ වැඩම කරනවා. ඒ අවස්ථාවේ පොත පතේ සඳහන් වන ආකාරයට නොයෙක් දහස් ගණන් දේවතාවෝ අද භාග්‍යවතුන් වහන්සේ රාහුල ස්වාමීන් වහන්සේට අර්හත්වය දක්වා කර්මස්ථාන දෙනවා ඇතෙයි කියන ඒ ආරංචිය ගිහිල්ලා දේවතාවනුත් බුදුරජාණන් වහන්සේ පිටි පස්සේ ගමන් කළා කියල කියනවා. ඉතින් බුදුරජාණන් වහන්සේත් අන්ධ වනයට වැඩම කරලා ගසක් මුල පනවන ලද ආසනයේ වැඩ උන්නා. රාහුල ස්වාමීන් වහන්සේත් ඒ ලඟ වැඩ ඉඳලා වන්දනා කළා. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ මේ විදියටයි එතනදි ධර්ම උපදේශය දෙන්නේ.

'රාහුල මේ ඇස නිත්‍යද අනිත්‍යද?'

ප්‍රශ්නෝත්තර වශයෙන් මෙතන කෙරෙන්නේ මේ දේශනාව.

'අනිත්‍යයි ස්වාමීනි.'

'යමක් අනිත්‍ය නම් එය සැපද දුක්ද?'

'දුකයි ස්වාමීනි.'

'යමක් දුක නම්, වෙනස් වන ස්වභාවය ඇතිනම්, එය 'මෙය මගේය', 'මෙය මම වෙමි', 'මෙය මගේ ආත්මයයි' කියල ගැනීම සුදුසුද?'

'නැතමය ස්වාමීනි.'

ඊළඟට ඒ විදියටම අහනවා රූපයන් පිළිබඳව

ඇහැට ගොදුරු වෙන අරමුණු පිළිබඳව

'රූපය නිත්‍යද අනිත්‍යද?'

'අනිත්‍යයි ස්වාමීනි.'

'යමක් අනිත්‍ය නම් එය සැපද දුක්ද?'

'දුකයි ස්වාමීනි.'

'යමක් දුක් සහිත නම් වෙනස් වන ස්වභාවය ඇත්තේ නම් එය, මමය, මාගේය කියල ගැනීම සුදුසුද?'

ඔන්න ඔය විදියට මේ පින්වතුන්ට සළකා ගන්න පුළුවන් එතකොට එතන ඇස පිළිබඳවත්, රූපය පිළිබඳවත්, ඇසත් රූපයත් නිසා ඇතිවන චකබු විඤ්ඤාණය පිළිබඳවත්, චකබු විඤ්ඤාණය ආශ්‍රයෙන් ඇතිවන චකබු සම්ඵස්සය කියන ඇස පිළිබඳ ස්පර්ශය - ඒකත් චකබු සම්ඵසසයත් ඊළඟට චකබු සම්ඵස්සය නිසා ඇතිවන යම්තාක් වේදනාවල් - වේදනා ගතං, සංඥා ගතං, සඞකාර ගතං, විඤ්ඤාණ ගතං, කියල කියන මේ ඇසත්, රූපයන් ගැටීම නිසා ඇතිවන යම් වේදනා ගතයෙක්, සංඥා ගතයෙක්, සංස්කාර ගතයෙක්, විඤ්ඤාණ ගතයෙක්, උපදී නම් එහිදු කලකිරෙයි. දැන් මෙතන ගැඹුරු විදර්ශනාවටයි ඔය එන්නේ. සළායතන නිරෝධයයි නිවන කියල කියන්නේ. මේ ආයතන හයේ නිරෝධය ප්‍රත්‍යක්ෂ කිරීමයි නියම

නිවන. බුදුරජාණන් වහන්සේ සළායතන පෙරටු කර ගෙනයි මෙතෙන්දි මේ දේශනාව පවත් වන්නේ. අනුශාසනාව පවත් වන්නේ. පළමුවෙන්ම ඇස ගැන - එහි අනිත්‍ය ස්වභාවය, වෙනස් වන ස්වභාවය, අනාත්ම ස්වභාවය, රාහුල ස්වාමීන් වහන්සේට ඒත්තු ගැන්වූවා. ඊළඟට රූපයන් පිළිබඳව, ඇසත් රූපයත් නිසයි ඇස පිළිබඳ විඤ්ඤාණය ඇතිවන්නේ. ඒක කොතනකවත් තැන්පත් කරල තිබෙන දෙයක් නොවෙයි, මේ විඤ්ඤාණය. එතනමයි, මේ ධර්මයේ ගැඹුරු කොටස ඇසත් රූපයත් නිසයි. එතන ප්‍රතීත්‍ය සමුප්පන්න කියල කියන්නේ ඒකයි. ඇසත් රූපයත් නිසයි ඇස පිළිබඳ විඤ්ඤාණය ඇතිවන්නේ. ඊළඟට මේ කාරණා තුනම එකතු කරලා ගත්තු තැන කෙනෙක්, ඒ විඤ්ඤාණය තුළින් ඇස වෙන් කර ගන්නවා. රූපය වෙන් කර ගන්නවා. එතන ඉඳල තියෙන්නේ ස්පර්ශය පිළිබඳ කථාවක්. චක්ඛු සම්ඵස්සය. ඇසේ රූපය ගැටෙනවා කියන අදහස එනවා. ඒ චක්ඛු සම්ඵස්සයත් බුදුරජාණන් වහන්සේ අර විදියටම අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන්, රාහුල ස්වාමීන් වහන්සේට ඒත්තු ගන්වනවා. ඊළඟට ඒ විදියට චක්ඛු සම්ඵස්සය තුළින් ඇතිවන යම්තාක් වේදනාවල් ඇතිවෙනව නම්, යම්තාක් සංඥවන් ඇතිවෙනවා නම්, යම්තාක් සංස්කාර ඇතිවෙනවා නම්, චේතනා ආදී වශයෙන්, යම්තාක් විඤ්ඤාණයක් ඇතිවෙනවා නම් අවසාන වශයෙන් මේවා එකතුවෙලා ගොඩවල් පහකට වැටෙනවා.

මේක ටිකක් ගැඹුරු කාරණයක්. මේ භාවනා ගැන යමක් දන්න පින්වතුන්ට එකපාරම තේරුම් ගන්න පුළුවන් ඇති. අනික් අයට අමාරු වෙන්න පුළුවනි. ඒක ඉතාමත්ම ගැඹුරු කොටසක්. මොකද මේක පටිච්ච සමුප්පාදය හා සම්බන්ධයි. සාමාන්‍ය ලෝකය හිතන චින්තන ක්‍රමය නොවෙයි මෙතන තියෙන්නේ අමුතුම දෙයක්. එතකොට ඇසත් රූපයත් පිළිබඳ යථා තත්වය අනවබෝධය නිසා ඒවා අනිත්‍ය බව නොසලකා, නිත්‍ය හැටියට ගැනීම නිසා. ඒ නිසයි විඤ්ඤාණයක් ඇති වෙන්නේ. ඇසත් රූපයත් නිසා විඤ්ඤාණය ඇතිවෙනවා. විඤ්ඤාණය කියල කියන්නේ ඒ දෙක වෙන් කර ගන්නවා. ඒ වෙන් කර ගැනීම, වෙන් කර ගත්තු බව අමතක වීමෙන් ඇසත් රූපයත් විඤ්ඤාණයත් කියන තුන එකක් හැටියට ගැනීම ස්පර්ශයයි. එතකොට ඒ ස්පර්ශය. එතන ඉඳල තියෙන්නේ ස්පර්ශය නිසා වේදනාව. ඊළඟට වේදනාව හඳුනා ගැනීමේ ප්‍රයත්නය තුළින් සංඥව.

ඊළඟට සංඥාව තුළින් තමන්ගේ ඇතුළත වන ක්‍රියාකාරී ස්වභාවය තමයි - පෞද්ගලිකව වගේ කෙරෙන ක්‍රියාකාරී ස්වභාවයයි, සංස්කාර වශයෙන් දක්වෙන්නේ. කර්ම රැස් වෙන්නේත් ඒ අවස්ථාවේයි. ඊළඟට විඤ්ඤාණය කියල කියන්නේ ඒවා ඔක්කොම තැන්පත් වුණාට පස්සෙ, මේ මගේ හිතයි කියලනේ ගන්නේ. ඒක අර පඤ්චුපාදාන ස්කන්ධය කියන ඒ ගොඩවල් පහට එකතු වෙනවා. මේ ආයතන හය තුළින් කරන නිෂ්පාදන ගිහිල්ලා එකතුවෙලා පෙරිලා ඒවා තුළින් තමයි අපි මේ පඤ්ච උපාදානසකනධය කියන එක හදාගන්නේ සංසාරයේ. ඒක ඉතාම ගැඹුරු කාරණයක්. මේ එක් එක් ආයතනය ගැන ඔය ධර්මතාවමයි බලපවත්වන්නේ. මේවායේ අනිත්‍ය ස්වභාවය අමතක කරලා ඇස තියන තැන කුඤ්ඤයක් ගහලා, රූපය තියන තැන වෙනම කුඤ්ඤයක් ගහලා, මේක නිසා ඇතිවන මේ විඤ්ඤාණය, ඒක දැඩිව අරගෙන ආත්මය හැටියට එතන ඉඳල, ස්පර්ශයක්, මා ස්පර්ශ කරනවා. ඒ විදියට හැඟීමක් ඇති කරගෙන ඊළඟට ස්පර්ශය තුළින් දුක් හෝ සැප හෝ නොදුක් නොසුව වශයෙන් වේදනාවල් ඇති කර ගන්නවා. වේදනාවල් හඳුනා ගැනීම තුළින් විවිධ සංඥාවල් නිමිති ඇතිකර ගන්නවා. ඊළඟට ඒ සංඥා නිමිති අනුව ක්‍රියාකාරීවීමෙන් ඒ මුළාව තුළින් සංස්කාර රැස් කර ගන්නවා. ඒ සංස්කාර සියල්ලම ඊළඟට මායාත්මක විඤ්ඤාණයේ, තමන් හිතනවා ඒවා තැන්පත් කරගෙන තියනව කියලා. තැන්පත් කරගන්නව ඒවා මමය මගේය කියලා. ඉතින් මේ විදියට තමයි මේ අල්ලා ගත්තු ගොඩවල් පහ එහෙම නැත්නම් 'අල්ලා ගැනීම්' ගොඩවල් පහ පඤ්ච උපාදානසකනධය කියල කියන්නේ. මෙතනදි බුදුරජාණන් වහන්සේ ඇස පිළිබඳව කිව්ව වගේ, රූපය පිළිබඳව කිව්ව වගේ, ඇස පිළිබඳ විඤ්ඤාණය ගැන කිව්ව වගේ, ඇස පිළිබඳ චක්ඛු සමඵස්සය හෙවත් ඇස පිළිබඳ ස්පර්ශය ගැන කිව්ව වගේ, ඇස පිළිබඳ ස්පර්ශය නිසා ඇතිවන වේදනා - සංඥා ගැන කිව්ව වගේම, අනිත් ආයතනයන් ගැනත්, කණත් - ශබ්දයත්, නැහැයත් - ගඳ සුවඳත්, දිවත් - රසයත්, කයත් - ස්පර්ශයත්, අවසාන වශයෙන් මනසත් - ධර්මත් ගැන කියනවා. මෙතන තමයි ගැඹුරුම තැන. මෙතන ධර්ම කියන වචනය මේ පින්වතුන් හිතන්න පුළුවන් ඔය ධර්ම කියන කොට මේ අපේ සද්ධර්මය ගැන කියලා. නමුත් පින්වතුනි, මේ සූත්‍ර දේශනා ආදියේ බෞද්ධ දර්ශනයේ මේ 'ධම්ම' කියන වචනය අර්ථ රාශියකින් යෙදෙනවා. සළායතනය පිළිබඳව මේ ආයතන හය ගැන කියන කොට ඇසට

රූපය වගේ මනසට ධර්‍ම. මනසට එන අරමුණු හඳුන්වන්නේ ධම්ම නමින්. මෙතනදී අවසාන වශයෙන් බුදුරජාණන් වහන්සේ රාහුල හාමුදුරුවන්ගෙන් අහනවාඃ

'මනස නිත්‍යද අනිත්‍යද?'

'අනිත්‍යයි ස්වාමීනි.'

'යමක් අනිත්‍ය නම් එය සැපද දුක්ද?'

'දුකයි ස්වාමීනි'

'යමක් අනිත්‍ය නම්, දුක් සහිත නම්, වෙනස් වන ස්වභාවයක් ඇති නම්, මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි ගැනීම හරිද රාහුල?'

එතකොට රාහුල ස්වාමීන් වහන්සේ කියනවා

'එසේ නොවේය ස්වාමීනි.'

එසේම මනස ගැන කිව්ව වගේම අර කියාපු ධම්ම දැන් මෙතන තේරුම් ගන්න ඕන.

ධම්ම කිව්වෙ සිතට එන අරමුණු.

'සිතට එන අරමුණු නිත්‍යද අනිත්‍යද?'

'අනිත්‍යයි ස්වාමීනි.'

'යමක් අනිත්‍ය නම් එය සැපද දුක්ද?'

'දුකයි ස්වාමීනි.'

'යමක් අනිත්‍ය නම්, දුක නම්, වෙනස් වන ස්වභාවයට ඇති නම්, එය මගේය කියල ගැනීම හරිද?'

'නැහැ'යි කියා රාහුල ස්වාමීන් වහන්සේ එතෙන්දිත් පිලිතුරු දෙනවා.

අන්න එතෙන්දි තමයි ගැඹුරුම කොටස එන්නෙ.

මොකද මේ සිතට එන අරමුණු ගැන සාමාන්‍ය ලෝකයා සිතන්නේ අරමුණු වෙනම තියනවා, අපි හිතනවා කියලා. නමුත් ධර්මයේ තියන ගැඹුරුම කොටස තමයි ධම්ම පද ගාථාවලත් පලමුවෙන්ම කියවෙන්නේ. අපි බොහෝ අවස්ථාවල මතක් කරන්න ඇති දේශනාවල මාතෘකාවට අදාලව. ඒ ධම්ම පද ගාථාව තමයි මේ ධර්ම සාහිත්‍යයේ ආරම්භයත් අවසානයත්. ඒ කිව්වේ ධම්ම පද මුල් ගාථා දෙකේ කියවෙන 'මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා' කියන ඒ සිද්ධාන්තය තුළින් තමයි බුදුරජාණන් වහන්සේ දක්වන මේ පටිච්චසමුප්පාදයේ ඉතාමත්ම ගැඹුරු කොටස මතුවෙන්නේ. 'මනො පුබ්බංගමා ධම්මා' මනස පෙරටු වෙනවා ධර්මයන්ට. නමුත් ලෝකයාගේ ආකල්පය මේ පින්වතුන් වුනත් හිතල බලන්න. අපි යමක් ගැන හිතන්නේ 'දෙයක්' තිබෙන නිසානේ. දෙයක් තිබෙනවා කියලා අපි ඉස්සෙල්ලා ගන්නවා ගැම්මක්. ග්‍රහණයක්. ඊට පස්සේ තමයි ඒ ගැන සිතන්නේ. හිතනවා පමණක් නොවෙයි ඒ ගැන විතර්ක කරනවා. විතර්ක ප්‍රපඤ්ච බවට පත්වෙනව. ප්‍රපඤ්ච බවට පත්වෙලා අන්තිමට මුළාවට පත් වෙනවා. මේක බොහෝ විට අත් දකින්න පුළුවන් ඇතැම් කෙනෙක් ඔය අතීතය තුළ අතරමං වෙන හැටි, කොහෙද ගිහිං ඉන්නෙ කියල සමහර විට ඇඟ හොල්ලල අහන්න වෙනව. හිත අතීතයේ. අන්න එතකොට තමයි අවදි වෙන්නේ. ඒ විදියට අතීතයේ ගිහිල්ල රැදෙන්නෙ අර අතීතයේ ගත්තු නිමිත්ත. අතීතයෙන් ගත්තු නිමිත්ත ඒක දන්නෙ නැහැ අතිත එකක් බව. ඒ ගැන මුළා වෙලා ඒක 'දෙයක්' කරගෙන. ඒක තිබුණා නැතිවුණා. නමුත් අපි ඒක දෙයක් කරගෙන ඊළඟට ඒක තුළ හිරවෙලා ඉන්නවා. මේ වගේම තමයි අනාගතයේත්, නොයෙකුත් අපේ සැලසුම් නිසා අපි අනාගත නිමිත්තක් ගැන කල්පනාවට වැටිල ඉන්නවා, නිකටේ අත් ගසාගෙන අමුතු ලෝකයක. අන්න එතැනත් ඒ අපි හිතනවා ඒ අනාගතයේ තාම ආවෙ නැති දේ තිබෙනවා කියලා. ඔන්න ඕක තමයි ලෝකය තුළ තිබෙන මිථ්‍යාව. බරපතලම මිථ්‍යාව. ඉතින් ලෝකයා හිතන්නේ ධම්ම කලින් තිබෙනව, මනසයි පස්සෙ ඇවිල්ලා ඒක

තේරුම් ගත්තෙ කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ ඒක අනිත් පැත්තට හරවනවා. 'මනො පුබ්බංගමා ධම්මා' මනසයි පෙරටු වෙන්නේ ධර්මයන්ට. ධර්මය නොවෙයි පෙරටු වෙන්නේ. මනසයි පෙරටු වෙන්නේ. ඊළඟට තව ටිකක් තියනවා 'මනො සෙට්ඨා', ඒ දෙක අතරින් මනසයි ශ්‍රේෂ්ඨ. මොකද මනසයි ශ්‍රේෂ්ඨ කියල කිව්වෙ. 'මනොමයා' ඒ ධම්මා කියන එක. එතන ධම්මා කියල කියන එක තේරුම් ගන්න ඕනෙ අන්න අර කියාපු අර්ථයෙන්. දැන් බොහෝ දෙනා ඕවා තෝරන්නේ වෙන විදියකටයි. නමුත් මෙතන ධම්මා කියන එක තෝරන්න ඕනෙ මනසට එන අරමුණු කියන අර්ථයෙන්. ඒ මිසක් වෙන ධර්ම නොවෙයි. කුසල් අකුසල් ධර්ම ආදිය නොවෙයි, මනසට එන අරමුණු. ඒක කුසල් වෙන්නත් පුළුවන්. අකුසල් වෙන්නත් පුළුවන්. ඒක වෙනම දෙයක්, ආනුසංගික දෙයක්. නමුත් මූලික සිද්ධාන්තය ඒ ගාථා දෙකින්ම කියවෙන්නෙ, මේ පින්වතුන් කවුරුත් දන්නවා ධර්මය ගැන යමක් දන්න අය 'මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා' කියන එක මුල් ගාථා දෙකේම තියෙනවා. ඒකෙ ප්‍රතිඵලයක් හැටියට තමයි කුසල් අකුසල් ආදී කර්මවල බැඳෙන්නේ. මනස පෙරටු වෙනවා, ඒ වගේම මනස ඒ දෙක අතරින් ශ්‍රේෂ්ඨයි. තුන් වෙනුව කියනවා 'මනොමයා' ඒ කියන්නෙ ධර්මයන්, ඒ හිතෙන් හිතාගත්තු අරමුණු ඇතිවුණේ කොහෙන්ද? මනසින්මයි. මනසින්මයි ඇතිකර ගන්නේ. ඔන්න ඔතනයි අපි හිරවෙලා ඉන්නේ, හිතෙන් ම ඇති කරගත්තු දේවල් බව නොදැනීමෙනුයි. අපි ඒවා 'දෙයක්' හැටියට හිතාගෙන එතන අතරමං වෙලා සංසාරයේ දිගින් දිගට යන්නේ. ඔය ටිකයි බුදු කෙනෙක් මතු කරල දෙන්නේ 'මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා'.

එය නොතේරෙන්නේ මොකද, අර ලෝකයා ගත්තු නිත්‍ය සංඥාව නිසා. මනසත් නිත්‍යයි, ධර්මයනුත් නිත්‍යයි කියල ගත්තු නිත්‍ය සංඥාව තුළින්. නමුත් සිතුවිල්ලක් කියන එක ඇති වෙනවා නැති වෙනවා. නමුත් ඒක පිළිබඳව අර යම් මතක සටහනක් කියල අපි කියන්නෙ, ඒ විදියෙ දෙයක් අපි සත්‍ය හැටියට අරගෙන සිතෙන්ම හදගත්තු ටිකක්, ඒක අනුවයි අපි ඊළඟට මුළු ජීවිතයම ගෙවන්නේ. මේ සංසාරයේ කර්ම රැස් කරන්නේ, සංසාරයේ දිගින් දිගට යන්නෙත් ඕකයි. ඉතින් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ මනසයි පෙරටු වෙන්නේ. මනසින්මයි අරමුණ හැදෙන්නේ. නමුත් ඒ ගත්තු

අරමුණ මනසින් හැඳුනු එකක් බව නොතැකීමෙන් නොදැනීමෙන් ඒ පිළිබඳව ඇති මුලාවෙන් අපි මනස එකක්, ධර්මය වෙන එකක් කියල වෙන් කර ගන්නවා. අන්න ඒ වෙන් කර ගන්න අවස්ථාව තමයි මනෝ විඤ්ඤාණය පහළ වුණා කියන්නේ. එහෙම නැත්නම් මේක තැන්පත් කරල නැහැ. මනෝ විඤ්ඤාණය තැන්පත් කරල නැහැ. ලෝකයාගේ තිබෙන ලොකුම මුලාව තමයි මනස තුළ විඤ්ඤාණය තැන්පත් කරල තියනවයි කියන එක. සරල අන්දමින් උපමාවකින් දක්වනවා නම් ඇතැම් අවස්ථාවල අපිට ප්‍රකාශ කරන්න සිද්ධවුණා, ගිනි පෙට්ටියේ ගින්දර තියනවයි කියල හිතා ගැනීම වගෙයි කියල. ගිනි පෙට්ටියේ ගිනි කූරක් ගැහුවට පස්සෙනේ ගින්දර එන්නේ. නමුත් අපි 'ගිනි පෙට්ටිය' කියල ව්‍යවහාර කරනවා. ඒ වගේ අපි හිතනවා මේ මනසට අදාල මනින්ද්‍රිය කියල කියන මේ ශරීරය හා සම්බන්ධ, ඒක තුළ විඤ්ඤාණයක් තැන්පත් වෙලා තියනවා කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ විඤ්ඤාණය නිරන්තරයෙන්ම පටිච්චසමුප්පන්නයි. හේතු ප්‍රත්‍යයන්ගෙන් මිසක් විඤ්ඤාණයක් ඇති වෙන්නේ නැහැ. එතකොට මනසත් ධර්මයත් ගැටීමෙන් තමයි මනෝ විඤ්ඤාණය ඇතිවන්නේ. නමුත් මනෝ විඤ්ඤාණය ඇති වුණාට පස්සේ ඒ මනෝ විඤ්ඤාණය අර දෙක නිසා උපන් එකක් බව අමතක කරලා ඊළඟට පටන් ගන්නවා අර දෙක වෙන් කරගෙන, ඒ පටන් ගන්න හරඹය තමයි විතර්ක ප්‍රපංච ආදී වශයෙන් යන්නේ. ඒක තේරුම් ගත්තොත් මොකද වෙන්නේ. ඒක තේරුම් ගත්තොත් එතනම විඤ්ඤාණය ගිලා බසිනවා. සංස්කාර නිර්මාණය වෙන්නෙ නැහැ. අන්න එතනයි නිවන; කෙනෙකුට හිතා ගන්න බැරි දෙයක්. ඇත්ත වශයෙන් නින්ද ගියාක් වැනි අවදිවීමක් නිවන කියල කියන්නේ. නින්ද ගියාක් වැනි අවදිවීමක්. නින්ද ගියා කියල කියන්නේ ලෝක අර්ථයෙන් බලනවානම් ඒක නින්ද ගියා වගේ. මොකද අවදිය කියල කියන්නේ - ලෝකයා අවදිය කියල කියන්නේ ඇත්ත වශයෙන් සිහිනයක්. සිහිනයක් බව අපි කලින් කිව්වෙ අතීතය ගැන - ඒකත් එක්තරා සිහිනයක්. හිත ඇතුළෙ කෙරෙන අනාගතයත් සිහිනයක්. වර්තමානය හදගන්න ඒ සිතුවිලි පරම්පරාවත් එහි අනිත්‍යතාව පටිච්චසමුප්පන්න ස්වභාවය තේරුම් නොගන්නා තාක් ඒකත් සිහිනයක් වගේ. අන්න ඒ සිහිනයෙන් අවදි වුන අවස්ථාවයි අර, ඒ කියන්නෙ මේක පටිච්චසමුප්පන්න බව තේරුම් ගැනීම. ඒ අවබෝධයත් එක්කම විඤ්ඤාණය ගිලා බහිනවා. විඤ්ඤාණයට ක්‍රියාත්මක වෙන්න බැහැ.

හිතත් හිතට එන අරමුණුත් කියන දෙක ගැටීමෙනුයි මේ මනෝ විඤ්ඤාණය ඇති වුණේ කියන අවබෝධය එනවත් එක්කම මනෝ විඤ්ඤාණයට ක්‍රියාත්මක වෙන්න බැහැ. ඊට එහාට යන්න බැහැ. අන්න ඒකමයි 'විඤ්ඤාණ නිරෝධය' කියල කියන්නේ. විඤ්ඤාණ නිරෝධය ශාන්තයි ප්‍රණීතයි ආදී වශයෙන් දක්වන්නේ සංස්කාර සංසිඳීම කියල කියන්නේ ඔන්න ඕකයි. ඉතින් මේකයි නිවන. 'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාර සමථො' ඒ ඔක්කොම සංස්කාර සමනය වෙන්නේ ඒ අවස්ථාවේදී. අරක දෙකක් හැටියට අරගෙන මනසත් අරමුණත් දෙකක් හැටියට අරගෙන කෙරෙන හරඹය නැති වෙන්නේ, ඒ හරඹය කරන්න උපකාර වෙන මේ විඤ්ඤාණය, අර දෙක නිසාම ඇතිවන එකක් බව ප්‍රත්‍යක්ෂයෙන් වටහාගත්තු අවස්ථාවෙදි. ඒක මෙනෙහි කිරීම තුළින්මයි අවබෝධ කරන්න පුළුවන් වෙන්නේ. යම් අවස්ථාවක තේරුම් ගත්තානම් ඒ කියන සත්‍යය එතනම නිර්වාණය ප්‍රත්‍යක්ෂ වෙනවා.

නමුත් මේ සූත්‍රය අවසාන වෙන්නෙ කොහොමද? ඊළඟට බුදුරජාණන් වහන්සේ මේ එක එකක් ගැන ප්‍රකාශ කරල මේවා පිළිබඳව නිබ්බිදාව, විරාගය, මතු කරල දීල තියනවා. හරියාකාරව තේරුම් ගත්තට පස්සෙ මේවා ගැන, ඇස ගැන කලකිරෙනවා, රූපය ගැන කලකිරෙනවා, චක්ඛු විඤ්ඤාණය ගැන කලකිරෙනවා, චක්ඛු සම්ඵස්සය ගැන කලකිරෙනවා. ඒ විදියට කලකිරීම තුළින් සිත මෑත් කර ගන්නවා. 'නිබ්බිදා' කියන්නේ මේ යථාවබෝධය තුළින් ඇතිවන කලකිරීමයි. යථා තත්වය නොදැනීම තුළිනුයි, නිත්‍ය සංඥාව තුළිනුයි ලෝකයා මේවා ග්‍රහණය කරගෙන උපාදාන වශයෙන් අල්ලාගෙන ඉන්නේ. මේවා අනිත්‍ය බව පටිච්චසමුප්පන්න බව හේතු ප්‍රත්‍යයන්ගෙන් උපන්න බව තේරෙන අවස්ථාවෙදී ඒක තුළින් ඉබේටම නිබ්බිදා කියල කියන - අතීතයේ වටිනා වචනයක් මේ කාලේ මේවා එළියට ගන්නේ නැහැ. අපි මේ සසර කළකිරීම කියන එක අර කවුරුවත් බුම්මාගෙන ඉන්නකොට කියනව 'අනේ මොකද සසර කලකිරිල ඉන්නවද?' කියල. ඒක තමයි බුදුරජාණන් වහන්සේ දක්වන නිවන් දොර. හරියාකාරව ඇති වුනා නම් දිවි නසාගන්න විදියේ එකක් නොවෙයි. නමුත් හරියාකාරව මේ යථා තත්වය වැටහුනා නම් අනිවාර්යයෙන්ම නිබ්බිදාව ඇති වෙනවා. නිබ්බිදා කියල කියන්නේ නිර්වින්දනය. ඒකට නිර්වේදය කියලා කියනවා. මේ කාලයේ

නිර්වේදය කියන වචනය යෙදීම බොහොම භයානකයි. ඒක සමහරු අර කෘත්‍රිම එකත් එක්ක යොදගන්න නිසා. නිර්වේදය කියන වචනයයි නිබ්බිදව කියන වචනයයි එකට යොදල තියෙන්නේ. අන්න ඒ නිර්වේදය කියන එක කෘත්‍රිමව ඇති කරගන්න නිර්වින්දනයක් නොවෙයි. මෙතන විඳින්න දෙයක් නැහැ කියන අවබෝධය එනවා. ඒ නිසා තමයි සංස්කාර රැස්වෙන්නෙත් නැත්තෙ. ඒ නිබ්බිදව තුළින් ඇතිවෙන්නේ මොකක්ද, විරාගය, නොඇල්ම. ඒ නොඇල්ම තුළින් සිත මිදෙනවා. චිත්ත විමුක්තිය කියල කියන්නෙ. බුදුරජාණන් වහන්සේ මෙන්න මේ චූල රාහුලෝවාද සූත්‍රය තුළින් කියවෙන සළායතනය පිළිබඳව දක්වන ත්‍රිලක්ෂණය ආශ්‍රයෙන් කළ ඒ ධර්ම විග්‍රහය, ප්‍රශ්නෝත්තර වශයෙන් කළ ධර්ම විස්තරය අවසාන වනවාත් එක්කම, රාහුල ස්වාමීන් වහන්සේගේ සිත සියලු ආශ්‍රවයන්ගෙන් මිදිලා උතුම් අර්හත්වය ප්‍රත්‍යක්ෂ කර ගත්තා. එපමණක් නොවෙයි, ඒ එක්කම සඳහන් වෙනවා අර අහන් හිටිය දහස් ගණන් දේවතාවුන්ට දහම් ඇස පහළ වුනා කියනවා. 'යං කිංචි සමුදය ධම්මං සබ්බං තං නිරොධධම්මං' යම්තාක් දෙයක් හටගන්නා ස්වභාවය ඇත්තේද ඒ හැම දෙයක්ම නිරුද්ධවන ස්වභාවය ද ඇත්තේය කියන පටිච්ච සමුප්පාද මූල ධර්ම න්‍යාය ඒ දේවතාවුන්ට ඇති වුණා. බොහෝ තැන්වල සෝවාන් ඵලය ලැබුවා කියන එක හඳුන්වන්නේ ඔය කෙටි පාඨයෙන්. යමෙක් ලබන ගැඹුරුම ප්‍රත්‍යක්ෂය 'යං කිංචි සමුදය ධම්මං සබ්බං තං නිරොධධම්මං' කියන කෙටි පාඨයෙන් හකුළුවලා දක්වන්න පුළුවන්. යම්තාක් දෙයක් හටගන්නා ස්වාභාවය ඇත්තේද, ඒ හැම එකක්ම නිරුද්ධ වන ස්වභාවය ද ඇත්තේය කියන එක. ඒක ප්‍රත්‍යක්ෂයෙන් වටහා ගැනීම අර ධර්ම දේශනාවට හරියට හිත යොදගෙන අහන් ඉන්න කෙනාට යෝනිසෝ මනසිකාරයෙන් නුවණින් මෙනෙහි කරමින් පියවරෙන් පියවරට රාහුල ස්වාමීන් වහන්සේ උත්තර දෙනකොට බුදුරජාණන් වහන්සේගේ ප්‍රශ්නවලට, ඒවා හිතෙන් මවලා කිව්ව නොවේ. ඒවා ප්‍රත්‍යක්ෂ වෙන්න ඇති. ඇස නිත්‍යද අනිත්‍යද, අනිත්‍ය නම් මෙහෙම හිතනවද, ආත්මයක්යයි කියන්න සුදුසුද, බුදුරජාණන් වහන්සේ අහනවාට කිව්ව නොවේ. ඊට කලින් අර කියාපු භාවනාවන් ගැඹුරට ආනාපාන ආදී ඒ භාවනාවන් සියල්ල රාහුල ස්වාමීන් වහන්සේ වඩල තිබුණ නිසා තමයි බුදුරජාණන් වහන්සේට ඒ අවස්ථාවේ තේරුනේ දැන් රාහුලගේ පින මෝරලා, එහෙම නැත්නම් අපි කියන්නේ විමුක්ති පරිපාක වෙලා, විමුක්තියට උපකාර වෙන ධර්ම

මෝරලා කියලා. ඒ අවස්ථාවේ තමයි බුදුරජාණන් වහන්සේ මේ දේශනාව පැවැත්තුවේ. මෙයින් පේනවා ඒ සියල්ල හකුළුවලා දක්වනවා නම් අන්න සළායතන නිරෝධය කියන්නෙ නිවන බව අපට පේනව එයින්. මේ ආයතනයන්ගේ නිරෝධ ස්වභාවය - නිරුද්ධ ස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් වටහා ගත්තු නිසයි රාහුල ස්වාමීන් වහන්සේ එතෙන්දි ඒ දේශනාව අවසාන වෙන විට අර්හත්වය ප්‍රත්‍යක්ෂ කර ගත්තේ. එතකොට මේ රාහුල ස්වාමීන් වහන්සේට දුන්න ඒ ක්‍රමානුකූල කමටහන් සමූහය යෝගාවචර ඕනෑම පින්වතෙකුට යම්කිසි ප්‍රමාණයකට උපකාර කරගන්න පුළුවන්. අපි අර කලින් කිව්ව ආකාරයට ආනාපාන සති භාවනාව කියන එක ආශවාස ප්‍රාශවාසයට සිත යෙදීම පමණක් කියල හිතීම වැරදියි. ඒක එක්තරා දුරකට යන්න උපකාර උනත් ආනාපාන සති භාවනාව සමථ විපස්සනා වශයෙන් පරිපූර්ණව අර්හත්වය කරා යාමට නම් ඒ දහසය පියවරට කලින් අන්න අර බුදුරජාණන් වහන්සේ දැක් වූ ධාතු මනසිකාර, ඊළඟට ආපො සම, තේජො සම, ආදී භාවනා, මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂා, අශුභ, අනිච්චසඤ්ඤ ආදිය යම් පමණකට හෝ වැඩිය යුතුව තිබෙනවා. අර තරම් දීර්ඝ කාලයක් සංසාරයේ බුදුරජාණන් වහන්සේගේ පසුපස්සෙ සිටි කෙනෙක් වූ රාහුල ස්වාමීන් වහන්සේටත් රහත් වෙන්න ඔය ටික අවශ්‍ය වුනා නම් අප වැන්නවුන් ගැන කවර කථාද. ඒක නිසා එක කමටහනකම එල්ලිලා ඉන්නේ නැතිව මේකෙන්ම මම ලබනවා කියලා, තමන්ම කල්පනා කරලා අර කියාපු කමටහන් ගැනත් සිත යොදනවා නම් ඒක හොඳයි.

මේ කාලයේ සමහරු මේවා වෙන වෙනම නිකාය වාගේ නොයෙකුත් වාද ඇතිකරගෙන තියෙනවා. නමුත් අපට බුදුරජාණන් වහන්සේ දීපු ඒ උපදෙස් ආශ්‍රයෙන්, යමක් හිතාගන්න පුළුවන් ප්‍රායෝගිකව. ඒ විදියට මෝරපු විදර්ශනාවටයි අර වගේ දේශනා විෂය වෙන්නේ. නැත්නම් ඔය සූත්‍ර දේශනා කියවන ඕනෑම වෙලාවක කෙනෙකුට රහත් වෙන්න පුළුවන් කියලා හිතාවි කෙනෙක් මේ කාලයේ. නමුත් අතීතයේ ඒ දේශනා ඇහුවේ කොහොමද අන්න අර 'අට්ඨිකත්වා මනසි කත්වා සබ්බ චේතසො සමන්නාහරිත්වා ඕහිත සොතො ධම්මං සුණාති' කියපු ආකාරයට එයින් වැඩක් ඇත කියල හිතාගෙන මෙනෙහි කරමින් හොඳට කණ් යොමාගෙන, මුළු හිතම ඊට යොදගෙන අසන අවස්ථාව. ඒ වගේම අර විමුක්තියට උපකාර වන

කාරණා මෝරලා තිබුණ නිසා රාහුල ස්වාමීන් වහන්සේට කිසිම පැකිලීමක් නැතිව බුදුරජාණන් වහන්සේ ත්‍රිලක්ෂණය පිළිබඳව අසන ප්‍රශ්නවලට උත්තර දෙන්න පුළුවන් වුණා. අවසාන වශයෙන් ඒ දේශනාව ඉවරවෙනවත් එක්කම රාහුල ස්වාමීන් වහන්සේට ප්‍රත්‍යක්ෂ වුණා සළායතනයම අනිත්‍ය බව, දුක් සහිත බව, ඒ වගේම අනාත්ම බව. ඒක තුළින් තමයි අර්හත්වය ප්‍රත්‍යක්ෂ කළේ. එතකොට රාහුල චරිතය තුළින් අපි තේරුම් ගන්න ඕන අන්න අර කියාපු ශාසන හුරතලය වගේම බුදුරජාණන් වහන්සේ ධර්ම දායාදය දුන්න ආකාරය. ඒ තුළින් ලෝකයාට කොයි තරම් වටිනා ආදර්ශයක් දුන්නාද, පුංචි රාහුල හාමුදුරුවන්ගේ ගුණ සම්පත්තිය. ඒ හැම එකක්ම අපේ හිත්වලට ධාරණය කරගෙන තම තමන්ගේ චරිතවලට ළං කරගෙන, මේ තම තමන් කරන බණ භාවනා සාර්ථක කර ගැනීමටත් මේ දේශනාව උපකාර කර ගන්න මේ පින්වතුන් උත්සාහවත් වෙන්න ඕන. එහෙම උපකාර කරගෙන අමතර හැටියට හිතන්නෙ නැතිව අර කියාපු විවිධ කර්මස්ථාන හැම එකක්ම තමන්ගේ නිවනට උපකාර වන අන්දමින් පුරුදු කිරීමෙන් හැකිතාක් ඉක්මනින් කවුරුත් බලාපොරොත්තු වන ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී සියලු දුක් කෙළවර කොට ලබන උතුම් අමා මහ නිවන, සෝවාන් ආදී මාර්ගඵල ප්‍රතිවේදයෙන් ලබාගන්න මේ පින්වතුන්ට හේතු වාසනා වේවා'යි ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම අවීචියේ සිට අකනිටා දක්වා වූ යම්තාක් කෙනෙක් මේ ධර්ම දේශනාමය, ධර්ම ශ්‍රවණමය කුසලයන් අනුමෝදන් වීමට කැමති අයෙක් සිටී නම් අනුමෝදන් වීමෙන් ප්‍රාර්ථනීය බෝධියකින් අමාමහ නිවන ප්‍රත්‍යක්ෂ කර ගනිත්වා කියල ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියල පින් දෙන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

48 වන දේශනය

48 වන දේශනය

(පහන් කණුව ධර්ම දේශනා අංක 181)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

ජීවිතෙ වා'පි සප්පඤ්ඤො අපි විත්තපරික්ඛයො
පඤ්ඤායච අලාභෙන විත්ත වාපි න ජීවති
සබ්බං සුණාති සොතෙන සබ්බං පස්සති චක්ඛුනා
නච දිට්ඨං සුතං ධීරො සබ්බං උජ්ඣිතු මරහති
චක්ඛුමාස්ස යථා අන්ධො සොතවා බධිරො යථා
පඤ්ඤවාස්ස යථා මූගො බලවා දුබ්බලොරිව
අථ අත්ථෙ සමුප්පන්නෙ සයෙථ මතසායික'න්ති

\- මහා කච්චායන ථෙර ගාථා

සැදැහැවත් පින්වතුනි,

ධර්ම රාජවූ තථාගත සම්බුදුරජාණන් වහන්සේ අකනිටා බඹලොව දක්වා ධර්මචක්‍රය පෙරලූ දවස හැටියට අද දවස බෞද්ධ පින්වතුන්ට ඉතාමත්ම වටිනා දවසක්. එදා ඒ ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙන් බුදුරජාණන් වහන්සේ ලෝකයාට ඉදිරිපත් කර වදාළ චතුරාර්‍ය සත්‍යය තුළ මුලු මහත් සද්ධර්මයම ගැබ්වෙලා තියනවා. ඒ ගැඹුරු ධර්මය අවස්ථානුකූලව විවරණය කරන්න සමත් ශ්‍රාවකයන් වහන්සේලා පිරිසකුත් බුදුරජාණන් වහන්සේ ඇති කළා. කෙටියෙන් සැකෙවින් දේශනා කර වදාළ ධර්ම කොටඨාශයක අර්ථය ගැඹුරින් සවිස්තරව විග්‍රහ කර දැක්වීමේ දක්‍ෂ ශ්‍රාවකයන් වහන්සේලා අතර 'ඒතදග්ග' තනතුර - අග්‍රස්ථානය ලැබුණේ මහා කච්චායන මහ රහතුන් වහන්සේටයි. උන්වහන්සේ එක් අවස්ථාවක වදාළ ගාථා තුනක් තමයි අද අපි මාතෘකාව හැටියට ඉදිරිපත් කර ගත්තේ.

නිදාන කථාව වශයෙන් දක්වතොත්, අටුවා ආදී ග්‍රන්ථවල, කච්චායන ස්වාමීන් වහන්සේ පිළිබඳව, අතීත බුද්ධ ශාසනවල මේ කියාපු 'ඒතදග්ග' තනතුර සඳහා උන්වහන්සේ දීර්ඝ කාලයක් පාරමී ධර්ම පිරූ බව විස්තර කරනවා. ඊළඟට මේ බුද්ධෝත්පාදක කාලයේදී කච්චායන ස්වාමීන් වහන්සේ 'අවන්ති' රටේ චණ්ඩපජ්ජෝත රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහමණයාගේ පුත්‍රයා හැටියට උත්පත්තිය ලැබුවා. ශරීරය රන්වන් නිසා මව මේ දරුවාට 'කඤ්චන' කියන නාමය දුන්නා. ත්‍රිවේද ආදී වේද ශාස්ත්‍ර ඉගෙනගෙන පියාගේ ඇවෑමෙන් මේ මානවකයා පුරෝහිත පදවියට පත්උනා. කච්චායන කියන ගෝත්‍ර

නාමයෙන්ම හැඳින්වුණා. චණ්ඩපජ්ජෝත රජ්ජුරුවන්ට අහන්න ලැබෙනවා බුදු කෙනෙක් ලෝකෙ පහළ වෙලා ඉන්න බව. මේ පුරෝහිත බ්‍රාහ්මණයාට පැවරුවා ගිහිල්ලා අවන්ති රටටත් වඩින්නය කියලා ආරාධනා කරන්න කියලා. ඉතින් මේ කච්චායන පුරෝහිත බ්‍රාහ්මණයා තවත් හත් දෙනෙක් එක්ක ගියා බුදුරජාණන් වහන්සේ දකින්න. මහ දුර ගමනක් ගිහිල්ලා බුදුරජාණන් වහන්සේ හමුවෙලා බුදුරජාණන් වහන්සේගෙන් ඇසූ ප්‍රථම ධර්ම දේශනාවෙන්ම මේ අට දෙනාම සිව්පිළිසිඹියා රහත් භාවය ලබාගෙන ඒහිභික්ෂුභාවයෙන් පැවිදි වුන බව සඳහන් වෙනවා පොත පතේ. ඊළඟට මේ කච්චායන සවාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේට රජ්ජුරුවන්ගේ ආරාධනය සැළකළා. නමුත් බුදුරජාණන් වහන්සේ කිව්වා කච්චායන, මා යන්න අවශ්‍ය නැහැ. ඔබ ගියත් රජතුමා පැහැදේවි කියලා. ඉතින් ඒ අනුව මේ කච්චායන රහතන් වහන්සේත් අනෙකුත් හත් නමත් ආපසු අවන්ති රටට වැඩම කළා. ඒ රජතුමාගේ උයනේ ඉඳගෙන කිසියම් කාල සීමාවක් තුළ මේ කච්චායන සවාමීන් වහන්සේ අවන්ති රටේ බුද්ධ ශාසනය පිහිටෙව්වා රජතුමාත් පහදවාගෙන. පසුව නැවතත් බුදුරජාණන් වහන්සේ දකින්න වැඩම කළ බව සඳහන් වෙනවා. ඒ වගේම විටින් විට අවසථානුකූලව අවන්ති රටටත් වැඩම කරලා තියෙනවා.

ඉතින් උන්වහන්සේ එක් අවසථාවක වදාළ අවවාදාත්මක ගාථා පෙළක් ථෙර ගාථා පාළියේ සඳහන් වෙනවා. එයින් ගාථා තුනක් තමයි අපි මේ මාතෘකා හැටියට තබාගත්තේ. ඒ ගාථාවල අර්ථයත් ටිකක් විස්තර කරන්න වෙනවා.

'ජීවිතෙ වා'පි සප්පඤ්ඤො අපි විත්ත පරික්ඛයො'

ප්‍රඥාවන්ත පුද්ගලයා වස්තුව ධනය පිරිහුනේ වී නමුත් ජීවත් වෙයි.

'පඤ්ඤාය ච අලාභෙන විත්ත වා'පි න ජීවති '

අනික් අතට ප්‍රඥාව ලැබුනේ නැත්නම් යම් කෙනෙකුට ධනය තිබුණත් ඔහු ජීවත් වන්නේ නැත.

'සබ්බං සුණාති සොතෙන සබ්බං පස්සති චක්ඛුනා'

හැම දෙයක්ම කනින් අහනවා. හැම දෙයක්ම ඇසින් දකිනවා.

'න ච දිට්ඨං සුතං ධීරො සබ්බං උජ්ඣිතුමරහති'

දුටු හැම දෙයක්ම නුවණැති පුද්ගලයා අත නොහැරිය යුතුයි. අත් හැරිම සුදුසු නැහැ.

ඔන්න ඊළඟට විශේෂ ගාථාවක් තියෙනවා.

'චක්ඛුමාස්ස යථා අනෙධා'

ඇස් ඇත්තේ වී නමුත් අන්ධයෙක් මෙන් වන්නේය.

'සොතවා බධිරො යථා'

කන් ඇත්තේ වී නමුත් බිහිරෙකු මෙන් වන්නේය.

'පඤ්ඤවාස්ස යථා මූගො'

ප්‍රඥාව ඇතත් මෝඩයෙකු මෙන් වන්නේය.

'බලවා දුබ්බලොරිව'

ශක්තිය ඇතත් දුබලයෙකු මෙන් වන්නේය.

'අථ අතෙථ සමුප්පනෙන සයෙථ මතසායිකනති'

ඊට නිසි අවස්ථාවක් පැමිණි විට හරියට මැරුණු කෙනෙක් වගේ මර ඇඳේ වැඳහොත් කෙනෙක් වගේ ඉන්න ඕන. ඉතින් මේවා ටිකක් තෝරන්න වෙනවා.

'ජීවිතෙ වා'පි සප්පඤ්ඤො අපි විත්තපරික්ඛයො'

ධනය පිරිහුනත් ප්‍රඥවන්තයා ජීවත් වෙනවා කිව්වේ මෙන්න මේ අදහසින්. ඒ ප්‍රඥවන්තයා ධනය පිරිහුනත් ලද දෙයින් සතුටු වීමෙන් යුක්තව නුවණැති ක්‍රියා මාර්ගවලින් දුෂ්චරිතයට වැටෙන්නේ නැතිව ධාර්මික ක්‍රියා මාර්ගවලින් ජීවත් වෙනවා. ඒක නිසා ඒක නියම ජීවිතයක්. අනික් අතට 'පඤ්ඤයච අලාභෙන' ප්‍රඥාව නැති මෝඩ පුද්ගලයා කොච්චර ධනය තිබුනත් දුසිරිත්වලට වැටිලා මෙලොව පරලොව දෙකම විනාශ කර ගෙන ඒ ජීවිතය නැති වෙනවා. එයින් අපට පේනවා මේ ගාථාව තුළින් බුද්ධ කාලයේ දැන් මේ කාලය වගේ නොවෙයි. ධනාත්මක චින්තනය වෙනුවට ප්‍රඥාත්මක චින්තනය අගය කළ බව. මොකද? ඒකට අදාළ තව කොතෙකුත් සාධක කරුණු සූත්‍රවලින් සොයාගන්න පුළුවන්.

එක් දේවතාවෙක් 'කිංසු නරානං රතනං....?' මනුෂ්‍යයන්ට වටිනාම රත්නය මොකක්ද? කියලා ඇසුවාම 'පඤ්ඤා නරානං රතනං' මනුෂ්‍යයන්ට තියන රත්නය තමයි ප්‍රඥාව. ඒකයි පිළිතුර. ඒවගේම ආලවක යක්ෂයා ඇසූ ගාථාවට පිළිතුරු වශයෙන් බුදුහාමුදුරුවො ප්‍රකාශ කළා 'කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨං' කොයි විදියට ගත කරන ජීවිතයද ශ්‍රේෂ්ඨ කියල ඇසුවාම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ 'පඤ්ඤා ජීවිං ජීවිතමාහු සෙට්ඨං' ප්‍රඥාව අනුව ජීවත් වීමයි ශ්‍රේෂ්ඨ. එයින් අපට පේනවා ඒ කාලේ වටිනාකම් අනුව ධනයට වඩා ප්‍රඥාව අගය කළ බව. ඒකයි ප්‍රඥාවන්තයා ධනය නැතත් ජීවත් වෙනවා. ප්‍රඥාව නැති ධනවන්තයා මළා වගෙයි, ජීවත් වෙන්නේ නැහැයි කිව්වෙ.

මෙතනදී වැදගත් කාරණා ටිකක් කියවෙනවා. 'සබ්බං සුණාති සොතෙන' කෙනෙකුට කන්වලින් නොයෙක් දේවල් අහන්න ලැබෙනවා. ඒ වාගේම 'සබ්බං පස්සති චක්ඛුනා' සියල්ල ඇස්වලින් දකින්න ලැබෙනවා. 'න ච දිට්ඨං සුතං ධීරො සබ්බං උජ්ඣිතුමරහති' නුවණැති පුද්ගලයා ඒ දුටු ඇසූ හැම දෙයක්ම අත් හරින්නේ නැහැ. නමුත් ඔන්න අත්හැරිය යුත්ත මොකක්ද කියලා කියනවා 'චක්ඛුමාස්ස යථා අන්ධො' ඇස් ඇති නමුත් අවස්ථානුකූලව අන්ධයෙකු මෙන් හැසිරෙන්නේය. ඇතැම් අවස්ථාවල කෙනෙකුට සිද්ධ වෙනවා නොදුටු ඇස්ව ඉන්න. ඒ දැකීම තුළින් තමා තුළ කෙළෙස් උපදිනවා නම් එහෙම නැත්නම් එහි නොයෙකුත් ව්‍යාකූලතා ඇති වෙනවා නම් නොදුටු හැටියට ඉන්න ඕනෙ. 'චක්ඛුමාස්ස යථා අන්ධො' අන්ධයෙක් වගේ ඉන්න ඕනෙ - අවස්ථානුකූලව. ඒ වගේම 'සොතවා බධිරො යථා' ඇහුනත් බිහිරෙක් වගේ ඉන්න ඕනෙ. නැහුනා වගේ, නොදුටු ඇස්ව, නොදුටු කන්ව සිටින්නත් සිද්ධ වෙනවා. ඒ වගේම 'පඤ්ඤවාස්ස යථා මූගො' ප්‍රඥාව ඇතත් මෝඩයා වගේ ඉන්න ඕන. ප්‍රඥාව ඇති හැටියට කථා කරන්න ගියොත් අමාරුවේ වැටෙනවා. 'බලවා දුබ්බලා විය' ශක්තිය තිබුනත් දුර්වලයා වගේ ඉන්න ඕනෙ. 'අථ අත්ථෙ සමුප්පන්නෙ සයෙථ මතසායිකෙ' ඊළඟට අවස්ථානුකූලව යම් ක්‍රියා මාර්ගයක් තුළින් තමන්ගේ මෙලොව පරලොව දියුණුව වැළකෙනවා නම් මළා වගේ ඉන්න ඕනෙ නිශ්ක්‍රීයව. ඔන්න ඕකයි මහා කච්චායන ස්වාමීන් වහන්සේ ඒ ගාථාවලින් දුන්න අවවාදය.

ඉතින් උන්වහන්සේ අර කියාපු 'එතදග්ග' තනතුර ලබා ගත්තා වගේම සූත්‍ර දේශනා රාශියකම සඳහන් වෙනවා, ගිහි පැවිදි ශ්‍රාවකයින් කච්චායන ස්වාමීන් වහන්සේගෙන් කෙටියෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ යම්කිසි ධර්ම කොට්ඨාශයක අර්ථය විමසූ තැන්. ඔක්කොම කියන්න බැරිඋනත් එක් අවස්ථාවක මෙසේ සඳහන් වෙනවා. ඒත්

අවන්ති රටේ කුරරඝර කියන නගරයෙදිත් මහා කච්චායන සවාමීන් වහන්සේ ඒ කුරරඝර නුවර වැඩවාසය කරන අවස්ථාවක හාලිද්දකානි කියන ගෘහපතියා කච්චායන සවාමීන් වහන්සේ ළඟට ඇවිල්ලා එකත් පස්ව ඉඳගෙන මෙන්න මෙහෙම අහනවා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අට්ඨක වග්ගයේ මාගන්දිය පඤ්හ කියන ධර්ම කොට්ඨාශයේ මෙන්න මෙහෙම කෙටි ගාථාවක් වදාරා තියෙනවා. කෙටි ධර්ම කාරණයක්. මම ඒ ගාථාව සඳහන් කරනවා.

ඕකං පහාය අනිකේතසාරි
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න විග්ගය්හ ජනෙන කයිරා

මේ බුද්ධ වචනයක්. මෙතන ගැඹුරු අර්ථයක් තියන බව තේරිලා වෙන්න ඕන මේ ගෘහපතියා අහන්නේ. මේ කෙටියෙන් දේශනා කළ ධර්ම කොට්ඨාශයේ තේරුම කුමක්දැයි කච්චායන සවාමීන් වහන්සේගෙන් විමසුවා. ඒ විවරණය අහනකොට තමයි තේරෙන්නේ කෙටියෙන් අපි සාමාන්‍යයෙන් ගන්න තේරුමට වඩා ගැඹුරක් මේ ධර්ම කොට්ඨාශවල තියනවා. ඉතින් මේක කච්චායන සවාමීන් වහන්සේ තෝරන්නේ මෙහෙමයි. අපි අවස්ථානුකූලව කෙටි කළහොත් ඒකෙ සාමාන්‍ය අර්ථසාරය 'ඕකං පහාය' ඕකං කියන වචනය යෙදෙන්නේ පින්වතුනි, පාලි භාෂාවේ, ගෙදරට. 'ඕකං අනොකං ආගම්ම' ගෙදර අත හැරලා ගියා අනගාරිකව. මේක කච්චායන සවාමීන් වහන්සේ තෝරන්නේ මහා ගැඹුරු විධියට. උන්වහන්සේ තෝරනවා 'රූප ධාතු විඤ්ඤාණස්ස ඕකො' රූප ධාතුව අප රූපස්කන්ධය හැටියට ව්‍යවහාර කරන එක, රූපය විඤ්ඤාණයට ගෙදරක්. ඒ වගේම රූප ධාතු විඤ්ඤාණය පැළපදියම් වන තැන ඒකයි ගෙදරය කිව්වෙ. වේදනා ධාතු, සංඛාර ධාතු කියන ස්කන්ධවල තමයි විඤ්ඤාණය පැළපදියම් වන්නේ කියන අදහසින් 'ඕක' කියලා කිව්වෙ. නමුත් තථාගතයන් වහන්සේ ඒ කියාපු ගෙදර අතහැරලා, රජගෙදර නොවෙයි ඒ කියන්නේ මේ කියාපු විඤ්ඤාණය පැළපදියම් වන ඒ ගෙවල් අතහැරලා ඒ කියන්නේ රූප ධාතුව, වේදනා ධාතුව, සංඥා ධාතුව, සංඛාර ධාතුව, විඤ්ඤාණ ධාතුව කියන ස්කන්ධයන් පිළිබඳව ඒ රාග, ප්‍රේම, තණ්හා, පිපාසා ආදිය අතහැර ඉන්නවා කියන අදහසින් 'ඕකං පහාය' කියා කිව්වෙ. ඊළඟට 'අනිකේතසාරී' කියල කිව්වේ 'නිකේත' කියන්නේ නිවාසය. එතකොට 'නිකේතසාරි' කියන්නේ නිවෙස්වල හැසිරෙන, මෙතන කියන්නේ 'අනිකේතසාරි' නිවෙස්වල නොහැසිරෙන, මෙහිදී තෝරන්නේ මෙහෙමයි.

පින්වතුන් කොතෙකුත් අහල තියෙනවා මේ ආයතන හයට අරමුණුවන රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම කියලා. මේ ඇස කන නාසය දිව ශරීරය මන කියන ඉඳුරන්ට ගෝචරවන දේවල් නිමිති. අන්න ඒ නිමිති තමයි මේ නිකේත හැටියට හඳුන්වලා තිබෙන්නේ. ඒ නිමිති ඔස්සේ ඇදිලා යන්නේ නැත කියන අර්ථයෙන් 'අනිකෙතසාරි' තථාගතයන් වහන්සේ ඒ කියාපු ආයතනයන්ට තියන අරමුණු ඔස්සේ ඒවාට ඇල්ම, ප්‍රේමය, ඡන්දය, රාගය, දුරුකළ නිසා, ඒවාට ඇදිලා යන්නේ නැත කියන අර්ථයෙන් 'අනිකෙතසාරි' 'ඕකං පහාය අනිකෙතසාරි'.

ඊළඟට දෙවන පදය 'ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි' මුනිවරයා ඒ කියන්නේ භික්ෂුව ගමේ 'සන්ථව' කරන්නේ නැත. 'සන්ථව' කියන්නේ සම්බන්ධකම් පැවැත්වීම. 'මිත්‍ර සන්ථවය' කියන්නේ පින්වතුනි, ගමෙහි සම්බන්ධකම් පවත්වන්නේ නැත කියන්නේ ගිහියන් සම්බන්ධයෙන් නුසුදුසු විදියේ සම්බන්ධතාව. ගිහි සංසර්ගය කියල කියන්නේ ඒක නැතිකම. ඒක ධර්මයේ බොහෝවිට සඳහන් වන්නේ මෙහෙමයි. ගිහි සංසර්ගය ඇති භික්ෂුව ගැන සඳහන් වන්නේ - 'සහ නන්දි, සහ ශෝකි, සුඛිතෙ සුඛුකඛිතො, දුකඛිතෙ සුදුකඛිතො' ආදී වශයෙන්. ගිහියන් සතුටු වෙන විට භික්ෂුවත් සතුටු වෙනවා. ගිහියන් දුක් වෙනවිට භික්ෂුවත් දුක් වෙනවා. ගිහියන්ගේ සැප දුක් බෙදා ගන්නවා පැවිද්ද. එපමණක් නොවෙයි. ගිහියන්ගේ වැඩ කටයුතු 'කිච්ච කරණීයෙසු'. ඒවා පිළිබඳව 'යොගං ආපජ්ජති' ඒ භික්ෂුව ඒවාට හවුල්වෙලා ඒවා කරනවා. ඒවා කරන එක තමයි 'සන්ථවය'.

ඊළඟට 'කාමෙහි රිත්තො' රිත්ත යනු හිස් කියන එකයි. 'කාමෙහි රිත්තො' කියන්නේ කාමයන්ගෙන් හිස් තථාගතයන් වහන්සේ. ඒ පංචකාමයන්ගෙන් හිස්. ඒවා පිළිබඳව ඡන්ද, පෙම, රාග, යනාදිය ඉවත් කිරීම තුළින් පඤ්ච කාමයන් පිළිබඳව නිදහස් කියන නිසයි 'කාමෙහි රිත්තො'. ඊළඟට 'අපුරෙකඛරානො' කියන එකට ගැඹුරු අර්ථයක් තියෙනවා. ඒක දක්වන්නේ මෙහෙමයි. මට අනාගතයේදී මෙවැනි රූපයක්, වේදනාවක් ඇතිවේවා! මෙවැනි සංඥවක් ඇතිවේවා! ආදී වශයෙන් පඤ්ච උපාදනසකන්ධය පිළිබඳව අනාගත ප්‍රාර්ථනා ඇතිකර ගැනීමයි එතන පුරෙකඛරානො කියල කිව්වෙ. පෙරටු කරනවා භවය පෙරටු කර ගන්නවා. අනාගතයේ මට මෙවැනි රූපසකන්ධයක්, වේදනාසකන්ධයක්, සංඥසකන්ධයක්, සංඛාරසකන්ධයක්, විඤ්ඤණසකන්ධයක් ඇතිවේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒක භවය පැතීමක්. 'පුරෙකඛරානො' ඒ විදියට පෙරටු නොකිරීමයි 'අපුරෙකඛරානො' පෙරටු කරන්නේ නැහැ. යම් කෙනෙක්

එහෙම පෙරටු කරන්නේ නැතිනම් මෙතන හොඳ ප්‍රතිපත්තියක් හැටියට සළකනව. එවිට 'කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො'වෙනවා.

ඊළඟට කියන්නේ 'කථං න විග්ගය්හ ගනෙන කයිරා' ජනයා සමග විග්‍රහ කථාව කරන්නේ නැහැ. ඒක තෝරන්නේ මෙහෙමයි. ඒ කාලේ අන්‍ය ශ්‍රමණ බ්‍රාහමණයන් අතර සිරිතක් තිබුනා. රැස්වීම් ශාලාවල රැස්වෙලා එකිනෙකාට අභියෝග කරලා වාද කරනවා. ඉතින් එහි දී වාද කරන වචන කීපයක් මෙතන තිබෙනවා. ඔබ ධර්ම විනය දන්නේ නෑ. මමයි ධර්ම විනය දන්නේ. ඔබ යන්නේ මිථ්‍යා ප්‍රතිපදාවේය. මම තමයි යන්නේ සම්‍යක් ප්‍රතිපදාවේ. ඔබ කලින් කිය යුතු දේ පස්සෙ කියනවා. පස්සෙ කිය යුතු දේ කලින් කියනවා. ඔය විදියට වාග් මාලාවක් තියෙනවා. ඒ වාදවලදි එකිනෙකාට අභියෝග කරගන්නා ආකාරයේ. එතකොට ඒක තමයි 'කථං න විග්ගය්හ ජනෙන කයිරා' කියලා එහිදී දක්වන්නේ ජනයා සමග කථා කිරීමේදී එවැනි විග්‍රහ කථාවලට යන්නේ නැති බවයි. වාද අභියෝගවලට යන්නේ නැහැ. 'කථං න විග්ගය්හ ගනෙන කයිරා' කියලා මෙසේ ගැඹුරින් තෝරනවා කච්චායන ස්වාමීන් වහන්සේ අර කියාපු ගාථාව. මේ වගේ තව කොතෙකුත් තියනවා අවස්ථානුකූලව අපි සාකච්ඡා කරමු.

කච්චායන ස්වාමීන් වහන්සේ දුන්න අර්ථ කථන අතර ඉතාමත් විශිෂ්ඨ ඉතාමත් ගැඹුරු දත් කාලයේ උනත් ඉතාමත් වටිනා හැටියට සළකන අර්ථ කථනය තියෙන්නේ මැදුම් සඟියේ 'මධුපිණ්ඩික' සූත්‍රයේයි. අන්න ඒක පිළිබඳව අපි ටිකක් කියන්න බලාපොරොත්තු වෙනවා. ඒකෙ නිදාන කොටසේ ඉඳලාම. බුදුරජාණන් වහන්සේ එක අවස්ථාවක කපිලවස්තු නුවර නිග්‍රොධාරාමයේ වැඩ වාසය කළා. එක් දවසක් පිණ්ඩපාතය වළඳලා දිවාවිහරණය කියන්නේ, දවල් විවේකය ගත කිරීමට මහ වනයට ඇතුලු වෙලා, බෙලි ගහක් මුල වැඩ සිටියා. ඒ අවස්ථාවේ දණ්ඩපාණි කියන ශාක්‍යයා, දණ්ඩපාණි කියන නම දී තිබෙන්නේ ඒ ශාක්‍යයා යන යන තැන හැරමිටියක් හෝ බස්තමක් වැනි දෙයක් අරගෙන යන නිසයි, ඒ නම වැටිලා තියෙන්නෙ. දණ්ඩපාණි ශාක්‍යයා ව්‍යායාම වශයෙන් ඇවිදගෙන යන අතරේ බුදුරජාණන් වහන්සේ වැඩහුන්න මේ බෙලි ගහ ළඟට ගිහිල්ලා, වැඳුම් පිදුම් ආදියක් නැහැ. නමුත් සතුටු සාමීචි කථාවක් කරලා. ඊළඟට ප්‍රශ්නයක් අහනවා 'කිංවාදී සමණො කිමක්ඛායීති'. එහි තේරුම 'ශ්‍රමණය, ඔබගේ වාදය කුමක්ද, ඔබ මොකක්ද ප්‍රකාශ කරන්නේ' කියලා ඇහුවා.

එතකොට බුදුරජාණන් වහන්සේ අමුතු පිළිතුරක් දුන්නා. මේ ශාක්‍යයාට අල්ලා ගන්න බැරි විදියේ පිළිතුරක් දුන්නා. ඒක අපි සිංහලෙන් කියන්න උත්සාහ කරමු. දිග පාඨයක්. ඇවැත්නි කියා ආමන්ත්‍රණය කරන්නේ මේ කියූ ශාක්‍යයාටයි. ඇවැත්නි කියන්නේ යහලුවා යන්නයි. 'ඇවැත්නි, යම්බඳු වාදයක් දෙවියන් බඹුන් මරුන් සහිත මේ ලෝකයේ ශ්‍රමණ බ්‍රාහමණයන් දෙවියන් සහිත මේ ප්‍රජාවෙහි කිසිවෙකු සමගත් වාද නොකර සිටීද, ඒ වාගේම කාමයන්ගෙන් වෙන්ව සැක කුකුස් ඉවත් කරලා භව තෘෂ්ණාවෙන් මිදිලා ඉන්න ඒ බ්‍රාහමණයා එහෙම නැත්නම් ඒ රහතන් වහන්සේ තුළ සංඥාවක් අනුෂය වශයෙන් ලැග නොසිටීද, එබඳු වාදයක් මම ඉදිරිපත් කරමි. එබඳු ධර්මයක් මම ඉදිරිපත් කරන්නෙමි' කියලා අමුතු විදියේ පිළිතුරක් බුදුරජාණන් වහන්සේ දුන්නා. මේක ඒ ශාක්‍යයාට තේරුම් ගන්න බැරිව හිස සලා දිව සොලවලා නලල රැලි ගන්වා ගෙන පිටත් වෙලා ගියා.

ඊට පසුව කථාව මෙසේ කියවෙනවා. බුදුරජාණන් වහන්සේ සවස් වරුව ගත කරලා, ධ්‍යානයෙන් නැගිටලා, නිග්‍රොධාරාමයට වැඩම කරලා, සංඝයා වහන්සේලා අමතලා ප්‍රකාශ කළා, දණ්ඩපාණි ශාක්‍යයා ඇසූ ප්‍රශ්නයත් බුදුන් වහන්සේ දුන් පිළිතුරත්. ඒ අවසථාවේදී එක් භික්ෂුවක් ඒ කළ ප්‍රකාශයේ තේරුම කුමක්දැයි බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න කළා. එහිදී බුදුන් වහන්සේ කිසියම් විවරණයක් භික්ෂූන් හමුවේ තැබුවා. ඒක මේ විදියටයි.

මහණ, යම් හේතුවක්, යම් හේතුවක් හෝ කාරණයක් නිසා ප්‍රපංච සඤ්ඤාසඞ්ඛා පුරුෂයෙකු මැඩ පවත්වයිද, ඒ කරුණ පිළිබඳ කෙනෙකුට සතුටු විය යුත්තක් කියා පෑ යුත්තක් බැඳී සිටිය යුත්තක් නැත්නම් එතනම තමයි සියලුම රාග අනුශයන්ගේ කෙළවර, පටිඝ - ගැටීම පිළිබඳ අනුශයන්ගේ කෙළවර, දිට්ඨි අනුශයන්ගේ කෙළවර, විචිකිච්ඡා දෙගිඩියාවන් පිළිබඳ අනුශයන්ගේ කෙළවරත් එතනමයි. මාන අනුශයන්ගේ කෙළවරත් එතනයි. භවරාග කියන අනුශයන්ගේ කෙළවර එතනයි. අවිජ්ජා අනුශයන්ගේ කෙළවරත් එතනයි. එතනම තමයි සියලුම දඬුමුගුරු ගැනීම් කළහ විවාද එකිනෙකා සමග බහින් බස් වීම් ඒ ඔක්කොම පාපක අකුසල ධර්ම කෙළවර වන්නේත් එතනයි කියලා අමුතු විධියේ දේශනාවක් බුදුරජාණන් වහන්සේ දේශනා කළා. එතනත් යම් ගැටලුවක් ඉතිරි කරලා. අර ප්‍රපඤ්ච සංඥා සඞ්ඛා කියන්නේ මොකක්ද කියලා පැහැදිලි නැහැ. කොටින්ම කියතොත් යමක් හේතු කොට ගෙන පුරුෂයෙක් ප්‍රපඤ්ච සංඥාවලට යට වෙනවද, අන්න ඒ කාරණය පිළිබඳ යමෙක් සතුටුවන්නේ නැතිනම් ඒවා කියා පාන්නේ,

රැඳී සිටින්නේ නැත්නම් එතනම තමයි මේ කියාපු සප්තාකාර කෙලෙස් අනුෂය ධර්මවලත්, අනික් කලහ විවාද ආදියෙත්, කෙළවර කියලා බුදුරජාණන් වහන්සේ වදාළා. වදාරළා ඉවර වෙලා ආසනයෙන් නැගිටලා විහාරයට ඇතුලුවුනා. ඔන්න එතකොට සංඝයා වහන්සේලාට ඒකත් ගැටලුවක්. බුදුරජාණන් වහන්සේ සම්පූර්ණ පිළිතුර දුන්නේ නැහැ. ඔන්න ඉතින් සංඝයා වහන්සේලා කල්පනා කරනවා බුදුරජාණන් වහන්සේ කෙටියෙන් වදාළ ධර්මයේ අදහස අපි කොහොමද තේරුම් ගන්නේ කියලා කථා කරන අතර, මහා කච්චායන ආයුෂ්මතුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් බොහොම වර්ණනා කරලා තියනවා. ප්‍රශංසා කරලා තියනවා. අනෙකුත් සබ්‍රහ්මචාරීන් වහන්සේලාත් බොහොම ගරු කරනවා. සමහර විට කච්චායන ස්වාමීන් වහන්සේට පුලුවන් මේක තෝරලා දෙන්න කියලා. මේ පිරිස ගිහිල්ලා මහා කච්චායන සවාමීන් වහන්සේට ආරාධනා කළා. මෙන්න මෙහෙම දෙයක් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළා, අපට කරුණා කරලා මේක තේරුම් කරලා දෙන්නය කියා.

ඔන්න එතකොට සාමාන්‍ය සිරිතක් වශයෙන් උන්වහන්සේලාගේ නිහතමානීත්වය කොච්චරද කියතහොත් මහා කච්චායන ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා, හරියට අර ගහක අරටුව සොයා ගෙන යන පුරුෂයෙක් ඒ ගහේ මුලත් කඳත් තිබියදී කොළවල අරටුව සොයනවා වාගෙ වැඩක් ඔබවහන්සේලා කරන්නේ. මේ භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියදී මා ළඟට ඇවිත් මෙහි අර්ථය සොයන එක ඒ වගේ වැඩක් කියලා, ඒක බුදුරජාණන් වහන්සේගෙන්ම අහගන්නය කියලා කිව්වා. එතකොට මේ ස්වාමීන් වහන්සේලා කියනවා 'භාග්‍යවතුන් වහන්සේ විහාරයට වැඩම කළානේ, අපේ වේලාවත් ඉක්ම ගියානේ, කරදරයක් නැත්නම් අපිට මෙහි අර්ථය පැහැදිලි කරන්න'ය කියලා ඇවිටිලි කරලා මහා කච්චායන ස්වාමීන් වහන්සේට ආරාධනා කළාම ඔන්න ඒ අවස්ථාවේ තමයි දැන් බොහෝ දෙනාගේ හිත යොමු වෙලා තියන ඉතාමත්ම ගැඹුරු පාඨයකින් මහා කච්චායන ස්වාමීන් වහන්සේ අර බුද්ධ භාෂිතය විවරණය කරන්නේ. එහි සමහර තැන් පාළියෙන් විස්තර කරලා තියනවා. බුදුරජාණන් වහන්සේගේ පාඨය තේරුම් කරන මහා කච්චායන ස්වාමීන් වහන්සේ දුන් විවරණයත් ඉතාම ගැඹුරුයි. කෙසේ වෙතත් මේ විධියටයි කියන්නේ.

'ඇවැත්නි!' කියලා ඒ සංඝයා වහන්සේලා අමතලා ඔන්න ඒ ආයතන හය - මේ පින්වතුන් දන්නවා ඇස, කන, නාසය, දිව, ශරීරය, මන කියන ආයතනවලින් එකක් අරගෙන කිව්වම අනික් ආයතන

ගැනත් මේ පින්වතුන් සළකා ගන්න. මේ විදියටයි පටන් ගන්නේ 'චක්ඛුඤ්ච ආවුසො පටිච්ච රූපෙ උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං' - ඇවැත්නි! ඇසත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදිනවා. ඒ ටික තේරුම් ගන්න පුලුවන්නේ. ඊළඟට කියනවා 'තිණ්ණං සඞ්ගති ඵස්සො' - ඒ තුනෙහිම එකතුව ස්පර්ශයයි. ඒ තුන කිව්වේ ඇසයි, රූපයයි, ඒ දෙක නිසා ඇතිවන විඤ්ඤාණයයි. ඒ තුනෙහි එකතුවන අවස්ථාව, ඒ තුන එකට යන අවස්ථාව, ස්පර්ශය හැටියට දක්වූවා. ඊළඟට 'ඵස්ස පච්චයා' වෙදනා - ඒ ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන වේදනාව. ඔන්න අමුතු විදියකට ඊළඟට විවරණය කරන්නේ 'යං වෙදෙති තං සඤ්ජානාති' - යමක් විඳීද එය හඳුනාගනී. 'යං සඤ්ජානාති තං විතක්කෙති' - යමක් හඳුනාගනීද ඒ පිළිබඳව විතර්ක කරයි, සිතිවිල්ල යොදයි. 'යං විතක්කෙති තං පපඤ්චෙති' - යමක් පිළිබඳව විතර්ක කරයි ද ඒ පිළිබඳව ප්‍රපඤ්ච කරයි. ඒ වචන ඉදිරියේදී තේරුම් කරනවා. ප්‍රපඤ්ච කරයි කියලා හිතාගන්න. 'යං පපඤ්චෙති' - යමක් පිළිබඳව ප්‍රපඤ්ච කරයිද. ඔන්න ඊළඟට කියනවා 'තතො නිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති' - ඒ හේතු කොටගෙන අර කියාපු ප්‍රපඤ්චසඤ්ඤාසඞ්ඛා කුමක් හෝ වේවා අර පුරුෂයාව - අර ඉන්ද්‍රිය ධර්ම මෙහෙයපු පුරුෂයාව මැඩලනවා, යටපත් කරනවා. මොනවා පිළිබඳව ද 'අතීතානාගතපච්චුප්පන්නෙසු චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු'. අතීතයේ දුටු රූපත්, අනාගතයේ බලන්න තියන රූපත්, වර්තමානයේ රූපත්, පිළිබඳව ඇතිකර ගත්තු ප්‍රපඤ්චසඤ්ඤාසඞ්ඛාවන් වලට අර පුද්ගලයා යට වෙනවා. ඉතින් ඕකයි මහා කච්චායන සවාමීන් වහන්සේ දුන්න පිළිතුර.

ඒකට තව ටිකක් එකතු කරනවා අගට. ඒවා ඔක්කොම විස්තර කරන්න අවස්ථාව නැතත් ඒක සම්පූර්ණ වීමට කෙටියෙන් කියන්න තියෙන්නේ. ඊළඟට උන්වහන්සේ ප්‍රකාශ කරනවා. ඇසත් රූපයත් ඇස පිළිබඳ විඤ්ඤාණයත් ඇති කල්හි ස්පර්ශ කියලා ප්‍රඥප්තියක් ස්පර්ශ කියලා පැනවීමක් ඉඩ තියෙනවිට වේදනා ප්‍රඥප්තියකටත් ඉඩ තියෙනවා. වේදනා ප්‍රඥප්තියකට ඉඩ තියෙන කොට සංඥා කියලා ප්‍රඥප්තියකටත් පැනවීමකටත් ඉඩ තියෙනවා. සංඥා ප්‍රඥප්තිය ඇති කල්හි විතර්ක කියලා ප්‍රඥප්තියකටත් ඉඩ තියෙනවා. විතර්ක ප්‍රඥප්තිය ඇති කල්හි 'ප්‍රපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති' කියලා එකකුත් තියනවා. අනික් පැත්තටත් කියනවා.

යම් තැනක ඇසත් නැත්නම්, රූපයත් නැත්නම්, ඇස පිළිබඳ විඤ්ඤාණයත් නැත්නම්, එහෙනම් ස්පර්ශ කියලා පනවන්න ක්‍රියාවක් නැහැ. එහෙම නැති කොට වේදනාවක් පනවන්නත් බැහැ. සංඥාවත්

නැහැ. විතර්කත් නැහැ. ප්‍රපඤ්ච සඞ්ඛාත් නැහැ. ඔන්න ඔහොම දෙයකුත් කච්චායන ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළා. ඒ විවරණය කරලා ඉවර වෙලා මහා කච්චායන ස්වාමීන් වහන්සේ සංඝයා වහන්සේලාට කියනවා - 'ඇවැත්නි, මම නම් තේරුම් ගන්නේ මේකයි. තථාගතයන් වහන්සේගේ කෙටි දේශනයේ අර්ථය ඔබ වහන්සේලා ගිහිල්ලා භාග්‍යවතුන් වහන්සේගෙන් අහලා, යම් ආකාරයකින් උන්වහන්සේ විස්තර කරනවා නම් ඒ විදියට දරා ගන්න' කියලා.

ඉතින් මේ සංඝයා වහන්සේලා ඒ වේලාවේ නොවෙන්න පුලුවන්, යම් අවස්ථාවක බුදුරජාණන් වහන්සේට විවේක අවස්ථාවක් බලලා ගිහිල්ලා අර වාර්තාව ඉදිරිපත් කරනවා මුලු කථාන්තරයම. බුදුන් වහන්සේ වැඩම කළාට පසුව, අපි හැම මහා කච්චායන ස්වාමීන් වහන්සේට ආරාධනා කළා. උන්වහන්සේ අපට මේ විධියට විග්‍රහ කළා කියලා ඒ විවරණය සම්පූර්ණයෙන් ඉදිරිපත් කළා. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව, 'මහණෙනි, මහා කච්චායන පණ්ඩිතයි. මගෙන් ඇසුවත් ඔය ටිකමයි කියන්නේ. ඒ නිසා මේකමයි එහි අර්ථය. ඒ විදියට දරා ගන්න' කියලා බුදුරජාණන් වහන්සේ ඒක එහෙම පිටින්ම අනුමත කළා. ඒ අවස්ථාවේ ළඟ සිටි ආනන්ද ස්වාමීන් වහන්සේ එක දෙයක් කියනවා. අමුතු අදහසක් ප්‍රකාශ කරනවා. මේ ධර්ම කොටඨාශයේ - උපමාවට කියන්නේ මෙන්න මෙහෙමයි. ඉස්සර වෙලා උපමාව දෙනවා. 'ස්වාමීනි! යම් සේ දැඩි ලෙස කුසගින්නෙන් පීඩිත මනුෂ්‍යයෙකුට හමුවෙනවා මී පිඬක්, මී වදයක් වගේ දෙයක්. ඒ මී පිඬ යම් පැත්තකින් රස බැලුවා නම්, ලෙවකනවා නම්, උරාගන්නවා නම් නිමක් නැති ඒ මී පැණි ගලාගෙන එන්නේ යම් සේ ද, අන්න ඒ විධියට නුවණ ඇති භික්ෂුවක් මේ ධර්ම කොටඨාශය නුවණින් විමසලා බලනවා නම්, අර විධියට නිමක් නැති අර්ථ රස ගලාගෙන එනවා' කියලා ආනන්ද ස්වාමීන් වහන්සේ සතුට ප්‍රකාශ කරලා, 'භාග්‍යවතුන් වහන්ස, මේ ධර්ම කොටඨාශයට දෙන්න ඕන නම මොකක්ද?', කියලා ඇහුවා. ඒකට ඉගියක් දීලයි ඇසුවේ. 'එහෙනම් ආනන්ද, මේ ධර්ම කොටඨාශයට 'මධු පිණ්ඩික' කියලා කියන්න' කියලා කිව්වා. 'මී පිඬ' කියලා කිව්වා. අන්න ඒකෙන් පේනවා ආනන්ද ස්වාමීන් වහන්සේටත් මේක මහා අර්ථයක් ඇති දෙයක් බව තේරුණා. ඒකයි මී පිඬ උපමාව දුන්නේ. ඉතින් එම මී පිඬයි පින්වතුන්ට උරාගන්න දෙන්න බලන්නේ. මෙතන ඉඳලා 'මී පිඬ' විග්‍රහ කරන්නයි යන්නේ, ශක්ති ප්‍රමාණයෙන්. මී පැණි උරාගන්න බලන්න. මෙතන මහ ගැඹුරු ධර්මයක් තියනවා. ඉතින් මේක තමයි දැන් බොහෝ දෙනාගේ උගතුන්ගේ සැලකිල්ලට යොමු වෙලා තියන කොටසත්. පළමුවෙන්ම අපි තෝරමු අර කියාපු අමුතු වචනය.

'ප්‍රපඤ්චව' කියන වචනය ඉස්සර වෙලාම තෝරන්න බලමු. එදිනෙද ව්‍යවහාරයේ දැනටත් ව්‍යවහාරයේ තියන හැටියට 'ප්‍රපඤ්චව' කියන්නේ කිසියම් කෙනෙක් ප්‍රශ්නයකට උත්තර දෙන්නේ නැතිව වැල්වටාරම් කියනවා නම් මේ 'ප්‍රපඤ්චව' නැතිව කියන්න කියලා කියනවා. එතකොට මේ අනවශ්‍ය වැල්වටාරම් ආදියටත් ප්‍රපඤ්චව කියලා කියනවා. ඉතින් මෙතන කියන්නේ හිත පිළිබඳ ප්‍රපඤ්චවයක්. තව අනිත් වචන අවස්ථානුකූලව විවරණය කරන්නම්. මහා කච්චායන ස්වාමීන් වහන්සේ දුන් විවරණයේ විශේෂත්වය තියෙන්නේ - පළමුවෙන්ම පෙන්නුම් කරනවා; මෙතෙක් විඤ්ඤාණය කියන එක පටිච්චසමුප්පන්න බව. හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇතිවෙච්ච එකක් බව. සාමාන්‍ය අශ්‍රැතවත් ධර්මඥානය නැති පුද්ගලයා මේ ආත්මය හැටියට ගන්නේ මේ විඤ්ඤාණයයි. හිතයි. ඕකම තමයි අන්‍ය ආගමිකයන් හැම දෙනෙක්ම ආත්මය හැටියට දැඩිව ගන්නේ. දැන් මෙතනදී මනා සේ පෙන්වනවා ඇසත් රූපයත් නිසයි ඇස පිළිබඳ විඤ්ඤාණය ඇතිවන්නේ. 'චක්ඛුං ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං' විඤ්ඤාණය මේ ඇසෙත් නැහැ. රූපයෙහිත් නැහැ. මේ දෙක යම් අවස්ථාවක එකතු උනා නම් මනසිකාරය ඒකට යොමු වීම තුළින් මේ අවස්ථාවේ විඤ්ඤාණය කියලා දෙයක් ඇති වෙනවා. චක්ඛු විඤ්ඤාණය. නිකං ගින්නක් ඇතිවන්නේ නැතිව වගේ, නිකම් විඤ්ඤාණයක් ඇතිවන්නේ නැහැයි කියලයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ.

චක්ඛු විඤ්ඤාණය, සොත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ආදී හැම එකක්ම හේතු ප්‍රත්‍ය නිසා ඇති වන්නකි. 'අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවො' ප්‍රත්‍යයෙන් තොරව විඤ්ඤාණයක් පහළ වන්නේ නැතැයි කියන එකයි මේ ධර්මයේ වැදගත්ම කාරණය වශයෙන් පෙන්නුම් කරන්නේ. මෙතෙන්දි පැහැදිලිව පෙන්නුම් කරනවා ඇසත් රූපයත් නිසා විඤ්ඤාණය හට ගත්තා. ඒ විඤ්ඤාණයේ පිළිඹිබු වෙනවා ඇහැයි රූපයයි දෙකම. එතකොට ඇහැත් තියනවා, රූපයත් තියනවා. විඤ්ඤාණයත් තියනවා. මේ තුනම එකට ගත්තා. ඒ ගත්ත අවස්ථාව තමයි ස්පර්ශය කියන්නේ. මේ තුනෙහි එකතු වී යාම 'තිණ්ණං සඞ්ගති ඵස්සො' ස්පර්ශය කියන්නේ හරිම ගැඹුරු කාරණයක්. ස්පර්ශය කියන එක පටිච්ච සමුප්පන්න බවයි පෙන්නුම් කරන්නේ. කවුරුවත් ස්පර්ශ කළා නොවෙයි. ස්පර්ශය අර හේතු ප්‍රත්‍ය තුළින් පැන නැගුණු දෙයක්. ඊළඟට ප්‍රකාශ කරනවා 'ඵස්ස පච්චයා වෙදනා' ස්පර්ශය ප්‍රත්‍ය කරගෙන, එතනත් ප්‍රත්‍ය කථාව කියන්නේ. පටිච්ච සමුප්පන්න බවයි පෙන්නුම් කරන්නේ, කවුරුවත් ස්පර්ශ කළා නොවෙයි. ස්පර්ශය අන් හේතු ප්‍රත්‍යයන් තුළින් පැන නැගුණු දෙයක්. ඒ ස්පර්ශය ප්‍රත්‍ය කරගෙන,

වේදනාවක් තියෙනවා. නමුත් ඔතන ඉඳලා ඉස්සරහට යන කොට තියෙන්නේ 'වේදනාව' ආවාට පස්සේ තමයි හැංගිලා හිටිය ආත්මය අවදිවන්නේ. තවත් සූත්‍රයක සඳහන් පරිදි බුදු හාමුදුරුවන් අහනවා ආනන්ද! යම් තැනක වේදනාවක් කියන එකක් කොහෙත්ම නැත්නම් එතන ආත්මයකට ඉඩක් තියෙනවාද? නැත කියලා කියනවා. එයින් පෙන්නුම් කරනවා වේදනා අවස්ථාවට ආවාට පස්සේ, මහා කච්චායන සවාමීන් වහන්සේගේ විවරණය යන හැටි බලමු.

'චක්ඛුඤ්ච පටිච්ච රූපෙ උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා'. ඔතන ඉඳලා අමුතු විධියට යන්නේ. 'යං වෙදෙති තං සඤ්ජානාති' යමක් විඳීද එය හඳුනාගනී. එතකොට හඳුනාගන්නේ අර වේදනාව, යමක් විඳීද එය හඳුනාගනී. 'යං වෙදෙති තං සඤ්ජානාති' ඊළඟට 'යං සඤ්ජානාති තං විතක්කෙති' ඒ හඳුනාගත්ත දේ පිළිබඳවයි විතර්ක කරන්නේ, හිතන්නේ. 'යං විතක්කෙති තං පපඤ්චෙති' ඒ විතක්ක කරන්න ගියාම දන්නෙම නැතුව ඒ විතර්කවලින් ඉහ වහා ගිහිල්ලා - ඒ ඉහ වහා යන්නේ මොකද? ඒකත් බුදුහාමුදුරුවන්ගේ දේශනාවේ තියනවා.

යම් තැනක යම් හේතුවක් නිසා ප්‍රපඤ්ච සංඥ තියනවා නම් ඒ පිළිබඳ වචන තුනක් බුදුන් වහන්සේ යොදනවා අභිනන්දිතබ්බං, අභිවදිතබ්බං, අජ්ඣොසෙතබ්බං කියලා. සතුටු විය යුත්තක්, කියා පෑ යුත්තක්, බැඳී සිටිය යුත්තක් කියලා කිව්වේ. ඒ වචනවලින් හැඳින්වූයේ මේ පින්වතුන් වඩා හොඳට දන්නා තණ්හා, මාන, දිට්ඨි තුනයි. තණ්හාවෙන් සතුටු වෙනවා. මානයෙන් කියා පානවා. දිට්ඨියෙන් බැඳී සිටිනවා. අන්න ඒ නිසා තමයි ඒ වචන තුනම සම්බන්ධ වන්නේ. එතකොට අර කියාපු විතර්ක පිළිබඳව තණ්හා, මාන, දිට්ඨි ඇතිකර ගැනීම නිසා, ඒ ප්‍රපඤ්ච ඉහ වහා යනවා. ඒ සිතිවිලි ඉහ වහා ගොස් අන්තිමට වන්නේ මොකක්ද? අර ඒ විදියට ඥනය මෙහෙයවූ පුද්ගලයා යටවෙනවා. ඔතනයි තියෙන්නේ 'ප්‍රපඤ්ච සඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති' අර කියාපු පුරුෂයා මැඩලනවා, යට කරනවා.

ප්‍රපඤ්ච සංඥවෙන් ඇති කර ගත්ත 'සඞ්ඛා' කියන්නේ දන් 'සංඛ්‍යා' වචනය එදිනෙදා ව්‍යවහාර කරනවා ඉලක්කමට. ඒක කවුරුත් දන්නවා. ඇත්ත වශයෙන් හිතලා බලනකොට කියන්න තියෙන්නේ භාෂා ව්‍යවහාරය තුළ මනුෂ්‍යයින් අදහස් හුවමාරු කර ගැනීම තුළ ඉස්සෙල්ලාම පහසුවෙන්ම අදහස් හුවමාරු කරගන්න පාවිච්චි කරන්නේ ඉලක්කමනේ. ඇඟිලි ටිකවත් පෙන්නලා කියන්න පුලුවන් දෙක ද තුන ද කියලා. ඒ නිසා ඒ ගිණීම කියන වචනය බොහොම

ඈතට ගොස් තිබෙනවා. ගණන් කරනවාට කියනවා 'ගිණීම' කියලා. ඒ සංඛ්‍යාවල කරන ගිණීමම තමයි පස්සේ වචනවලින් කරන්නේ. ඉතින් ප්‍රපඤ්ච සඞ්ඛා කියන්නේ ප්‍රපඤ්චයෙන් ඇතිකර ගත්තු ගිණීම් නැත්නම් හැඳින්වීම්. මොකද හැඳින්වීම් කියලා කිව්වේ. තවත් තැනක තියෙනවා - බුදුරජාණන් වහන්සේගේ දේශනාවක් ආශ්‍රයෙන් මේ වචනයේ නිරුක්තිය සෙව්වොත් 'සඞ්ඛා' 'සමඤ්ඤා' 'පඤ්ඤත්ති' කියලා වචන තුනක් තියෙනවා. පර්යාය වචන, පර්යාය කියල කියන්නේ සමානාර්ථවත්, 'සඞ්ඛා' - ගිණීම, 'සමඤ්ඤා' - සම්මුතියක් ඇති කර ගැනීම. ඊළඟට 'පඤ්ඤත්ති' කියන්නේ 'පැනවීම්'. ඔරලෝසුව කියන එක මොන යම් ගිණීමකින් හෝ ප්‍රථමයෙන් ඉදිරිපත් කරපු එක. ඊළඟට සම්මත කර ගන්නවා. අපි කවුරුත් ඒකට ඔරලෝසුව කියලා කියනවා. වෙන නමක් කිව්වොත් පටලැවිල්ලක්. ඔන්න සම්මුතිය ආවා. ඉතින් ඔරලෝසුව සම්මුතියක් බවට පත්උනා. ඉස්සර වෙලා ගිණීම කළා. කැලි එකතු කරලා. ඒ අවසථාවේ ඔරලෝසුවැ'යි කියලා කියමු කියලා ඊට පස්සෙ සම්මත කර ගත්තා. ඊළඟට පනවනවා මේක ප්‍රඥප්තියක් උනාට පස්සේ කවුරුවත් සැක කරන්නේ නැහැ පිළිගත්තු නිසා. ඔය සඞ්ඛා කියන ගිණීම ඈතට යන එකක්. අර පුද්ගලයා අර සිතිවිල්ල තුළින් ඒ ගිණීම තුළින් ප්‍රපඤ්ච සඤ්ඤාසඞ්ඛාරවලට දන්නෙම නැතිව යට වෙනවා. 'සමුදාචරන්ති'. ඒ යට වීම නිසා කාලත්‍රයට යනවා. අතීත, අනාගත, 'පච්චුප්පන්නෙසු' අතීත අනාගත වර්තමාන කාලත්‍රය පටලවාගෙන අතීතයක් තියනවා. අතීතය වර්තමානයයි සිතනවා. අනාගතයත් වර්තමානයයි සිතා ගන්නවා. ඒකට තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ නුවණැති ශ්‍රමණ බ්‍රාහ්මණයින් මෙන්න මේ කාලත්‍රය පටලවා ගන්නේ නැත. අතීත දේට කියන්නේ 'විය' කියලා. අනාගත දේට 'වන්නේය' කියලා කියනවා. වර්තමාන දෙයට 'වෙයි' කියලා කියනවා. නමුත් සාමාන්‍ය ලෝකයා මේක පටලවා ගන්නවා. ඒක බොහෝ විට සිදු වන්නේ තණ්හා, මාන, දිට්ඨිවලට යටවීම නිසයි.

දැන් මේ කථාන්තරය මේ විධියට කියලා බොහෝ දෙනාට තේරෙන්නේ නැතිව ඇති. ඒ නිසා කාටත් හිත් වදින පුංචි කථාන්තරයක් කියමු. බුදුරජාණන් වහන්සේ කළෙත් ඒ වගේ දේවල් නේ. සමහරු අහලත් ඇති, බුද්ධ කාලෙ හිටියා සංඝරක්ඛිත කියලා ස්වාමීන් වහන්සේ නමක්. උන්වහන්සේ රහතන් වහන්සේ කෙනෙක්. උන්වහන්සේගේ බෑණා කෙනෙක් උන්වහන්සේ ළඟ මහණ උනා. ඒ නිසා ඒ හාමුදුරුවන්ට කීවා භාගිනෙය්‍ය සංඝරක්ඛිත කියලා. ඉතින් මේ පොඩි හාමුදුරුවෝ වස් වැසුවා. එක්තරා ඈත ගමක ආවාසයක. වස්

අවසානයේ වස්සාවාසික වස්ත්‍රයක් හැටියට ලැබුනා හත් රියන් රෙද්දකුත් අටරියන් රෙද්දකුත් සිවුරට ගන්න. මේ පුංචි හාමුදුරුවෝ කල්පනා කරනවා, මේ හත් රියන් වස්ත්‍රය මම පාවිච්චි කරනවා. අටරියන් වස්ත්‍රය මගේ ගුරු හාමුදුරුවන්ට පූජා කරන්න ඕනය කියලා ආපසු ආරාමයට ගියා. ලොකු හාමුදුරුවො පිණ්ඩපාතයට ගොස් සිටි නිසා, ලොකු පූජාවක් ගුරු හාමුදුරුවන්ට කරන්න කියලා. ඒ ස්වාමීන් වහන්සේ වැඩියට පස්සේ වස්ත්‍රය පා ළඟ තියලා මට ලැබුණු දේ ඔබ වහන්සේට පූජා කරනවාය කියලා පූජා කරලා, පවන් සළන්නට පටන් ගත්තා. ඉතින් මේ සංඝරක්ඛිත ස්වාමීන් වහන්සේ කිව්වා. ඔබ වහන්සේ ඒක තියාගන්න මගේ සිවුරු සම්පූර්ණය කියලා. නැවත නැවත කිව්වා මේ සිවුර ඔබ වහන්සේටම පූජා කරන්නයි හිතාගෙන හිටියේ කියලා. ඒත් සංඝරක්ඛිත මහතෙරුන් වහන්සේ ප්‍රතික්ෂේප කළා. ඒ නිසා භාගිනෙය්‍ය හාමුදුරුවන්ගේ සිත හොඳටම කළකිරුණා.

මේ පුංචි හාමුදුරුවෝ කල්පනා කරනවා, මගේ නෑ කමක් තිබුනත් ඒකට වත් සැලකුවේ නැහැ කියලා. දැන් ඉතින් මට මහණ කමින් වැඩක් නැහැ කියලා පවන් සලමින් සිතනවා. සිවුරු හරිනවා. සිවුරු හැරලා නිකම් ජීවත් වෙන්න බැහැ. මේ අටරියන් රෙදි කෑල්ල විකුණලා එළුදෙනක් ගන්නවා. ඉක්මනට පැටවු ලැබෙනවානේ. පැටවු විකුණලා ගෙදර බලාගන්න භාර්‍යාවක් ගේනවා. භාර්‍යාවට දරුවෙක් ලැබුනාට පස්සේ මාමාගෙ නම තියලා දරුවත් එක්ක රථයක නැගලා මාමා වන සංඝරක්ඛිත තෙරුන් වහන්සේ බැහැ දකින්න යනවා. ඒ යන අතරේදී මම භාර්‍යාවට කියනවා, දරුවා මගේ අතට දෙන්නය කියා. භාර්‍යාව කියනවා ඔබ රථය පදවන්න, මම දරුවා බලාගන්නම් කියලා. කොහොමහරි නොසැලකිල්ලෙන් දරුවා වැටුනා. රථයේ රෝදය දරුවාගේ උඩින් ගියා. මේ නිසා කේන්තියක් ඇතිඋනා. දරුවා බලාගන්න ඉල්ලුවාම දරුවා දුන්නේ නෑ කියලා තරහා ඇවිත් කෙවිටෙන් භාර්‍යාවට තැලුවා. ඒත් තැලුවේ කාටද? නායක හාමුදුරුවන්ගේ හිසට වට අත්තෙන් ගැසුවා. සංඝරක්ඛිත හිමියන්ට අනුන්ගේ හිත් පේන නිසා බැලුවා මොකද උනේ කියලා. 'හා! භාර්‍යාවට කියලා මහලු හාමුදුරුවන්ට නේද ගැසුවේ' කියලා කීවා. එවිට භාගිනෙය්‍ය හාමුදුරුවො 'මම විනාශයි' කියලා වට අත්තත් දාලා දුවන්න පටන් ගත්තා. අනිත් හාමුදුරුවරු ගිහිල්ලා අල්ලා ගත්තා. පසුව බුදුහාමුදුරුවන් ළඟට ගිහිල්ලා කාරණය කිව්වාම 'දූරං ගමං එක චරං' යන ධම්මපදයේ සඳහන් ගාථාව වදාළේ හිත දුර යන හැටි පෙන්වන්න.

ඒක දිග කථාන්තරයක් වුනත් ඒ අවසථාවේ වෙච්ච දේ ගැන හිතා බලන්න. කලකිරිම තුළ හිත බොහෝ දුරට යනවානේ. එවිට

අනාගතයත් වර්තමානය කර ගත්තා. ඊළඟට අර ප්‍රපඤ්ච සඤ්ඤා සඞ්ඛා වලට යටඋනා. හිතෙන්ම ඇතිකර ගත්තු ඒවා. එළුදෙනක් ගත්තෙත් නෑ. භාර්යාවක් ගත්තෙත් නෑ. දරුවෙක් ලැබුනෙත් නෑ. මොකවත් උනේ නෑ. නමුත් හිතෙන් අර ඔක්කොම අරගෙන ඒකට යටවෙලයි පටලැවිල්ල උනේ. ඕක කාටත් වගේ වෙන දෙයක් එක එක මට්ටමින්.

නමුත් මෙතෙන්දි 'සඞ්ඛා' කියන වචනය ගනිමු. ඒක භාෂාව සම්බන්ධ කාරණයක්. වචනයක් හැදුනාම අපි හිතනවා දෙයක් කියලා. ව්‍යාකරණය තුළ තිබෙනවා ලෝකයා මුලාකරණ ස්වභාවයක්. ඔතනයි අවිද්‍යාව හැංගිලා සිටින්නේ. දැන් නාම පදය, ක්‍රියා පදය, සාමාන්‍යයෙන් ක්‍රියා කාරක පද සම්බන්ධය, කර්තෘ කර්මාදී කරුණු තුළ සාමාන්‍ය ලෝකයා පහසුවෙන්ම මුලාවට පත් වෙනවා. ඒකයි මේ ධර්මය තේරුම් කරන්න අපහසු වන්නේ. මේ ලෝකයේ හැම පැත්තෙන්ම තියෙන්නේ මේ කරුණු. බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාදය දක්වීමේදී පෙන්වා දුන්නේ කන්දකින් ගඟක් ගලන විට ආරම්භය හිතලා බලන්න. සමහරවිට වහලින් එන වතුර බිංදුවලට අවටින් එන වතුර එක්වුණාම ඇලක් වෙනවා, දොළක් වෙනවා, ගඟක් වෙනවා. මහ හඬ නගාගෙන මුහුදට යනවා. අපි අරකට ඇලයි දොළයි ගඟයි කියනවා. වචනවලින් දෙයක් හිතා ගන්නවා. ලෝකය පවතින්නේ සන්තතියක් වශයෙන්. හේතු ප්‍රත්‍ය නිසා ඇති වෙනවා, කොයි පැත්තෙන් ගලාගන ආවත් අපි ඒකට නමක් දීලා තියෙනවා. කැළණි ගඟ, මහවැලි ගඟ හරි කියලා. ඒ මොකුත් නෑ. අර වචනයට යට වෙනවා. අන්න එහෙම දෙයක් තියෙනවා භාෂාව තුළ. අන්න ඒක තුළයි අර අවිද්‍යාව හැංගිලා ඉන්නේ. ඒකට නිදසුනක් 'තමයි' 'පපඤ්ච සඤ්ඤා සඞ්ඛා'. අන්න අර 'සඞ්ඛා' ඒකට අපි නිදසුනක් කියහොත් දිග කථාන්තර නැතත් කෙටියෙන් සළකා ගන්න.

බටහිර සාහිත්‍යයේ ඔය විදියේම සිද්ධියක් සඳහන් වෙනවා. රත්තරං බිත්තර දමන තාරාවිය පිළිබඳ කථාවක් තිබෙනවා. එක තාරාවියක් හිටියා දවසකට රත්තරං බිත්තරය බැගින් දන. අයිතිකාර පුද්ගලයා හිතුවාලු දැන් එක දවසට එක බැගින් දන එකේ මට ඔක්කොම එක වරම ලබාගන්න පුලුවන් කියලා අර තාරාවියගේ බඩ පලලා බලනකොට නැහැ බිත්තර. මොකද අනාගතයේ ඇතෙයි කියලා හිතුවා. අනාගතය වර්තමානයයි කියලා හිතා ගත්තා. ඔන්න ඔහොම දෙයක් නිරන්තරයෙන් වෙනවා.

මේක ඉතාම ගැඹුරු සූත්‍රයක්. එක පැත්තකින් හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇතිවන බව නොතකා හැරීම. එතකොට විඤ්ඤාණය

පවා මෙතන පෙන්නුවේ නිකම්ම විඤ්ඤාණය කියා දෙයක් නෑ. මේක තේරුම් කරනවා නම් ගිනිපෙට්ටිය කිව්වාම ගිනිපෙට්ටියෙත් නෑ, ගිනිකූරෙත් නෑ 'ගින්නක්'. එහෙත් ගැටුණු අවස්ථාවේදී හේතු ප්‍රත්‍ය නිසා ගින්න පැන නැගුණු දෙයක්. බුදුරජාණන් වහන්සේ කියන්නේ විඤ්ඤාණයත් ඒ වගේ දෙයක්. හේතු ප්‍රත්‍යයන් නිසා ඇතිවීමක්. නමුත් ඒක අමතක වීම තුළින්, ඊළඟට ඒවා දේවල් කරගෙන ඇස වෙන්කර ගන්නවා. රූපය වෙන්කර ගන්නවා. ඔන්න ඔය විදියේ දෙයක් වෙන්නේ. මේක ගැඹුරු කාරණයක්. කෙටියෙන් නමුත් විස්තර කරන්න උත්සාහ කරන්නේ.

ඇතැම් අවස්ථාවල බුදුරජාණන් වහන්සේ පුදුම විදියේ උපමා දී තිබෙන්නේ මෙන්න මේ කියාපු 'ද්වයතාවය' පිළිබඳව. ඇසයි රූපයයි දෙකක් සේ ගැනීම පිළිබඳව. ඇතැම් අවස්ථාවල දක්වනවා මැහුම් කාරියකගේ උපමාවක්. මැහුම් කාරිය තමයි 'තණ්හා' ගැට දන්නේ. මැහුම් කාරිය කොන් දෙකක් අල්ලා ගැට දනවා. එක් කොනක් තමයි අතීතය. අනෙක් කොන අනාගතය. මැහුම්කාරිය අතීතයයි අනාගතයයි අල්ලා ගැටදනවා. වර්තමානය නොසළකා හරිනවා. මේකයි උනේ භාගිනෙය්‍ය සංඝරක්ඛිත හාමුදුරුවන්ට. අතීතයයි අනාගතයයි ගැට දැම්මා. පවන් සලන එක අමතක උනා.

ඊළඟට තවත් තැන්වල දක්වනවා අධ්‍යාත්මික ආයතනයයි බාහිර ආයතනයයි මැදින් තියනවා විඤ්ඤාණය. මේ විඤ්ඤාණය නොසළකා ගැටලනවා. මිරිඟුව ගැන හිතලා බලන්න. ස්මරණය තුළින් මුවා අර ඈත පෙනෙන දේ වතුර කියලා සළකන්නෙ මොකද? අර තණ්හාව නිසාත් මානය නිසාත් අතන වතුර තියනවා. මෙතන මම ඉන්නවා. කියලා හිතාගෙන වතුර සොයාගෙන යනවා. නමුත් හේතු ප්‍රත්‍යයන් තුළින් ඇතිවන දර්ශනයක් ඒ මිරිඟුව හැටියට පෙනෙන්නේ. අන්න ඒ විධියට ලෝකයා අර දෙකොනයි මැදයි අතර හිරවෙලා ඉන්නේ. ඒ දෙකොන ගැටලන්න උත්සාහ කරනවා. ඒ උත්සාහ කිරීමේදී අර තණ්හාව තමයි ඉදිරිපත් වෙන්නේ. ඒක තමයි 'තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභි නන්දනී' ඒ ඒ තන්හි සතුටුවන ස්වභාවයක් තණ්හාවේ තියනවා. නැවත ඇති කරන ස්වභාවයක්. ඉතින් මේ තණ්හාව ලාටුවක් හැටියට දක්වලා තියෙනවා. ඔය නොයෙකුත් ආකාරයෙන් දක්වන්නේ මොකද? තණ්හාව තුළ අවිජ්ජාවෙන් වැහෙන ස්වභාවයකුත්, තණ්හාවෙන් අලවන ස්වභාවයකුත් තිබෙනවා. ඉතින් ඔන්න ඔය මිත්‍යාව මෙතෙන්දි හෙලිවන්නේ. අර හේතු ප්‍රත්‍යයන්ගෙන් ඇතිවුණු බව නොතකා හැරලා

අර පුද්ගලික වේදනාව ඇතිඋනාට පස්සේ ආ! මේ මගේ වේදනාව දූන් මං හඳුනාගත්තා.

ඊළඟට ඒ හඳුනාගත්ත හැඳිනීම පිළිබඳ විතර්ක කරනවා. මේ පුද්ගලයා කරගෙන යන්නේ ඒක. විතර්ක කරගෙන ගිහිල්ලා යම් අවස්ථාවක් එනවා. ඒ විතර්කවලින් ඇතිකර ගත්තු ප්‍රපඤ්ච සඤ්ඤ සංඛා විතර්ක තුළින් ඇතිකර ගත්ත ගිණීම්, එහෙම නැත්නම් ඒ තමන්ම හදගත්ත හැඟීම්වලට ඒ පුද්ගලයා දන්නෙම නැතිව යට වෙනවා. ඉතින් මේකට තවත් කථාන්තර ගොඩක් කියන්න වෙනවා.

තවත් පුංචි කථාන්තරයක්. ඒකත් භාරතීය සාහිත්‍යයේ තියන එකක්. මන්ත්‍රකාරයෝ තුන් දෙනෙක් හිටියා. ඒ අය තමන්ගේ ආචාර්යවරුන්ගෙන් මන්ත්‍රශාස්ත්‍රය ඉගෙනගෙන ආපසු ගෙදර යන අතරේ කැලයක් මැදින් යන්නේ. ඉතින් තමන්ගේ දක්ෂකම් පෙන්වන්න හොඳ අවස්ථාවක් ආවා. ව්‍යාඝ්‍රයෙකුගේ ඇටකටු අතන මෙතන විසිරිලා තියනවා. ඉතින් එයින් එක්කෙනෙක් පළමුවැන්නා, තමාගේ දක්ෂකම් පෙන්වන්න ව්‍යාඝ්‍රයාගේ ඇටකටු එකතු කරලා ආයිත් හැදුවා ව්‍යාඝ්‍ර රූපය. ඇට සැකිල්ල හැදුවට පස්සේ දෙවෙනි එක්කෙනා, එයාගෙ හපන්කම් පෙන්වන්න ඒ ඇට සැකිල්ලට මස් ආදිය පිරෙව්වා. ඒ උගත් මන්ත්‍ර ක්‍රමය. තුන්වෙනි එක්කෙනා කළේ මොකක්ද, ව්‍යාඝ්‍රයාට පණ දුන්නා. ඊට පස්සෙ මොකද තුන් දෙනාට උනේ. ව්‍යාඝ්‍රයා පැනලා තුන් දෙනාම කාලා දැම්මා. ඔය උපමාව මෙතෙන්ට හොඳට ගැලපෙනවා. අර තමන්ම ඇතිකර ගත් ප්‍රපඤ්ච සඤ්ඤ සඛ්‍යාවන්ට මේ පුද්ගලයෝ යටත් උනා. තව නොයෙකුත් උපමා තියනවා හැම සාහිත්‍යයකම වලන් කදේ කථාව වගේ. මේ ප්‍රපඤ්චයේ ස්වභාවය පෙන්නුම් කරන, එදිනෙදා ජීවිතයේ. අමුතු කථාන්තර ඕන නැහැ. තමතමන්ට අත්දකින්න පුළුවන්. ලොකු බලවත් තණ්හාවක් ආශාවක් ආපු වේලාවේ කාටහරි ළඟින් ඉන්න කෙනෙකුට අල්ලලා හොල්ලන්න වෙනවා. මේ කොහේද ඉන්නේ කියලා. ඒ අතරතුර යන්නේ අර 'ප්‍රපඤ්චයට' ගිහිල්ලා ගිහිල්ලා තමන් ඒකෙන් අර හාමුදුරුවන්ට උනාවාගේ මහා ව්‍යසනයකට පත්වන තුරු දන්නේ නැහැ.

ඉතින් මේකට හේතුව මොකක්ද? යථාර්ථය නොදැනීමෙන්, යෝනිසෝ මනසිකාරය, ධර්මයේ යෝනිසෝ මනසිකාරය කියන්නේ ආපසු පටන් ගත්තු තැනට ඒම. අයෝනිසෝ මනසිකාරය තමයි අර මිරිඟුව පස්සේ දිවීම. අන්න එහෙම හිතන්න. යෝනි කියන්නේ ප්‍රභවය පටන්ගන්නා තැන. ඒක තමයි අර කිව්වේ ඇසත් රූපයත් නිසයි ඒ

ඇස පිළිබඳ විඤ්ඤාණය ඇති වන්නේ. ඒ තුනම එකට ගැටීම කියන්නේ, ඇත්ත වශයෙන්ම තුනක් කර ගන්නවා. ඊළඟට තුනක් හැටියට ගණිනවා. අමතක කර ගන්නවා විඤ්ඤාණය ඇති උනේ මේ දෙක නිසයි කියලා. ඒ ගණින අවස්ථාවේ ඒක ස්පර්ශයක් හැටියට ගන්නවා. හරිම ගැඹුරු කාරණයක්. අන්න ඒක තමයි කච්චායන ස්වාමීන් වහන්සේගේ දේශනාවේ අග හරියේ තිබෙන්නේ. අපි ඒ ටිකත් සඳහන් කරමු. යම් තැනක ඇසක් තිබෙනවා නම්, රූපයක් තිබෙනවා නම්, චක්ඛු විඤ්ඤාණයක් තිබෙනවා නම්, එතන 'ඵස්ස' කියලා පැනවීමක් තියෙනවා. ඒක නිසාම වේදනාදී අනික් පැනවීම් තියනවා. යම් තැනක ඒවා නැත්නම් 'ඵස්සයක්' නැහැ. වේදනාවක් නැහැ. තණ්හාවක් නැහැ. විතර්කයක් නැහැ. 'ප්‍රපඤ්ච, සඤ්ඤා, සඞ්ඛා' කියන මොනවත් නැහැ. ඒ කියන්නේ මොකක්ද? ඒක අපි කිව්වේ නැහැ කලින්. ඒක තමයි 'නිවන' අසංඛත ධාතුව කියන්නේ, ඒ මොකද, යම් අවස්ථාවක අර යොනිසො මනසිකාරය තුළින් ඒ යොනිසො මනසිකාරයේ අන්තිම කෙළවර තමයි 'ප්‍රඥාව' කියන්නේ. ප්‍රඥාවේ මූල බීජයයි යොනිසො මනසිකාරය. යොනිසො මනසිකාරයේ ඊළඟ අවස්ථාවට පත්උන අවස්ථාවේ තමයි විඤ්ඤාණය කිඳ බහිනවා. 'සබ්බ සඞ්ඛාර සමථ' සියලු සංස්කාර කිඳ ගියා. ඒ එක්කම විඤ්ඤාණයත් කිඳ බහින්න ඕන. සංස්කාර නිසානේ විඤ්ඤාණය පවතින්නේ. අන්න එතකොට ඒ විඤ්ඤාණය කිඳ බැස්ස අවස්ථාව තමයි ප්‍රඥාවේ උදව. එක පැත්තකින් ප්‍රඥාවේ ආලෝකය පහළ වෙන කොට විඤ්ඤාණ මායාවේ යථා තත්වය තේරිලා. එතනමයි සන්සිඳීම. ඒක තමයි උතුම් අමා මහ නිවන කියලා කියන්නේ.

එතකොට වෙලාවේ හැටියට මේ ඩිංග කිව්වා. මේ පින්වතුන් තව කා ළඟට ගිහිල්ලා හරි විස්තර අහගන්න. ඒක හුඟක් වටිනා මී පිඬක් හැටියට හිතාගන්න. මේ මී පිඬ හොඳට ඉරුවොත් මේ පින්වතුන්ට නිවන් රසය මේ තුළින් මතු කරගන්න පුලුවන් බව මතක් කර දෙමින්, මේ වටිනා ඇසළ පෝය දවස බුදුරජාණන් වහන්සේ ලෝකයාට සද්ධර්මය ඉදිරිපත් කළ දවස. පළමු දේශනාවේදී, කවුරුත් දන්නවා අඤ්ඤා කොණ්ඩඤ්ඤ ස්වාමීන් වහන්සේ පමණයි ඒ ගැඹුරු ධර්මය ඒ ප්‍රමාණයෙන් තේරුම් ගත්තේ. නමුත් අනතුරුව සංඝයා වහන්සේලා විශාල පිරිසක් අර්හත්වය සාක්ෂාත් කර ගත්තා. ධර්මය විස්තාර කිරීම තුළින් මේ පින්වතුන් තමන් ඉපදෙන්න ඕන නෑ කියලා කල්පනා කරනවා ඇති. ඉතින් ඒ ප්‍රාර්ථනා ඉෂ්ඨ කරගන්න මේ විධියට තම තමන් ගත් ශීලය උපකාර කර ගෙන බණ භාවනාවල යෙදිලා සමථ විපස්සනා කියන දෙකම සම්පූර්ණ කරගෙන යම් අවස්ථාවක මෙන්න මේ සූත්‍රයෙන්

ප්‍රකාශ කළ ආකාරයට අර 'සළායතන' නිරෝධ කියන උතුම් තත්ත්වය මේ ජීවිතයේදීම ප්‍රත්‍යක්ෂකර ගැනීමෙන් - භව නිරෝධය මේ ජීවිතයේදීම ප්‍රත්‍යක්ෂකර ගැනීමෙන් සියලු සංසාර දුකින් අත්මිදුනු උතුම් අමාමහ නිවන අත්පත් කර ගැනීමටත් මේ ධර්ම දේශනාව හේතු වාසනා වේවායි ප්‍රාර්ථනා කරනවා. මෙතෙක් කළ දේශනාව තුළින් අවීචියේ සිට අකනිටා දක්වා යම් සත්ත්ව කෙනෙක් මෙබඳු දේශනාවෙන්, ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින්, ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමාමහ නිවන සාක්ෂාත් වේවායි ප්‍රාර්ථනා කරනවා. මේ පින්වතුන්ටත් ඉක්මනින්ම මේ බුද්ධ ශාසනය තුළදීම සෝවාන් ආදී මාර්ග ඵල සාක්ෂාත් කර ගැනීමට මේ කුසලය හේතු වාසනා වේවායි ප්‍රාර්ථනා කරලා මේ ගාථා කියන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

49 වන දේශනය

49 වන දේශනය

(පහන් කණුව ධර්ම දේශනා අංක 204)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

කුම්භ කාරෝ පුරෙ ආසිං වෙහලිඞ්ගෙ ඝටීකරෝ
මාතා පෙත්තිභරෝ ආසිං කස්සපස්ස උපාසකො
විරතො මෙථුනා ධම්මා බ්‍රහ්මචාරි නිරාමිසො
අහුවා තෙ සගාමෙය්‍යො අහුවා තෙ පුරෙ සඛා

සැදැහැවත් පින්වතුනි,

බුදු කෙනෙක් ලෝකයේ පහළ වීම කියන අති දුර්ලභ ආශ්චර්යවත් සිද්ධිය ඉබේම අපේ සිහියට නැගෙන දවස තමයි මේ උතුම් වෙසක් පොහොය දවස. කලාතුරකින් සිදුවෙන සිද්ධියක් නමුත් බුදු කෙනෙක් ලෝකයේ පහළ වෙන්නෙ යම්කිසි ධර්මතාවක් අනුවයි කියන එක බෞද්ධයින් හැටියට අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම අපේ බුදුරජාණන් වහන්සේ අතීත බුදු වරුන් ගැන ප්‍රකාශ කරපු සූත්‍ර දේශනා තුළින් ඒ කාරණය අපිට හොඳින් පැහැදිලි වෙනවා. මැදුම් සඟියේ එන ඝටීකාර සූත්‍රය ඒ වගේ සූත්‍ර දේශනාවක්. ඒ සූත්‍ර දේශනාවට ප්‍රස්තාවනාව හැටියට අපි සංයුත් සඟියේ දේවතා සංයුක්තයත් දේව පුත්ත සංයුත්තයත් කියන දෙකෙහිම දකින්න ලැබෙන ගාථාමය ඝටීකාර සූත්‍රයෙන් උපුටා ගත්තු ගාථා දෙකක් තමයි අපි මාතෘකාව හැටියට ඉදිරිපත් කළේ. බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන අවස්ථාවක රාත්‍රි කාලයේ ඝටීකාර බ්‍රහ්මරාජයා - මේ බ්‍රහ්මරාජයින් දේවතා නමිනුත් හැඳින්වෙනවා. දේව පුත්ත නමිනුත් හැඳින්වෙනවා. එතකොට ඝටීකාර බ්‍රහ්මරාජයා රාත්‍රි කාලයේ ඇවිත් බුදුරජාණන් වහන්සේට වැඳලා එකත්පස්ව හිටගෙන බුදුරජාණන් වහන්සේට යම් ආරංචියක් ප්‍රවෘත්තියක් දැන්නුවා. මොකක්ද ඒ, මේ ශාසනයේ ඉඳලා අපවත් වෙච්ච අනාගාමි භික්ෂූන් වහන්සේලා හත් නමක් අවිහ බ්‍රහ්ම ලෝකයේ උපන්න හැටියේම අරහත් ඵලය ලබාගෙන විමුක්තිය ලැබුවාය කියන කාරණයයි. ඒ භික්ෂූන් වහන්සේලා හත් දෙනාගේ නම් මෙහෙම සඳහන් වෙනවා. උපක, පලගණ්ඩ, පුක්කුසාති, භද්දිය, භද්දදේව, බාහුදන්ති, පිංගිය කියන ඒ හත් නම ඒ අවිහ බ්‍රහ්ම ලෝකයේ උපන්

හැටියෙම රහත් වුණාය කියන එකයි මේ බ්‍රහ්මරාජයා ඇවිල්ල ප්‍රකාශ කළේ. ඒ එක්කම ඒ ගාථා සංවාදයක් වගේ යන අතරේ මේ ඝටීකාර බ්‍රහ්මයා තමන්ගේ අතීත ප්‍රවෘත්ති අපි කලින් ප්‍රකාශ කළ ගාථා දෙකෙන් සඳහන් කළා.

'කුම්භ කාරො පුරෙ ආසිං වෙහලිඞ්ග ඝටීකරො'

අතීතයේ මම වේහලිංග ගමේ ඝටීකාර කම් වූ කුඹල් කාරයෙක් වීමි.

'මාතා පෙත්තිභරො ආසිං' මව් පියන් පෝෂණය කළ කෙනෙක් වීමි.

'කස්සපස්ස උපාසකො' කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ උපාසකයෙක් වීමි.

'විරතො මෙථුනා ධම්මා බ්‍රහ්මචාරි නිරාමිසො' මෛථුන සේවනයෙන් ඉවත් වුණ නිරාමිස බ්‍රහ්මචාරි කෙනෙක්.

'අහුවා තෙ සගාමෙය්‍යො' ඔබ වහන්සේත් එක්ක එක ගමේ වාසය කළ කෙනෙක් මම.

'අහුවා තෙ පුරෙ සඛා' අතීතයේ ඔබ වහන්සේගේ මිත්‍රයෙක් මම.

එහෙම කිව්වට පස්සෙ බුදුරජාණන් වහන්සේත් ඒ කාරණය අනුමත කළා. ඔව් අපි පරණ යාළුවෝ තමයි කියලා. එතකොට ඒ පරණ යාළුකම හෙළිවෙන්නේ අපට අර කියාපු මැදුම් සඟියේ එන ඝටීකාර සූත්‍රයෙනුයි. ඒ සූත්‍රයේ නිදානය හැටියට මෙන්න මෙහෙමයි සඳහන් වෙන්නේ පොතේ.

එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ විශාල සඟ පිරිසක් එක්ක කොසොල් රටේ චාරිකාවේ වැඩම කරන අතරේ එක්තරා තැනකදී නතර වෙලා මගින් ඉවත්වෙලා යම් ප්‍රදේශයකදී මඳ සිනහවක් පහළ කළා. ආනන්ද ස්වාමීන් වහන්සේ කල්පනා කරනවා මොකද භාග්‍යවතුන් වහන්සේට මේ අවස්ථාවේ මෙතෙන්දි මේ සිනහවක් පහළ

වුණේ කියලා. හේතුවක් නැතිව තථාගත වරුන්ට එහෙම සිනහවක් පහළ වෙන්නෙ නැහැ කියලා, සිවුර ඒකාංශ කරලා වැඳලා බුදුරජාණන් වහන්සේගෙන් අසා සිටියා, මොකද හේතුව? මොකද ප්‍රත්‍යය? භාග්‍යවතුන් වහන්සේට මේ සිනහවක් පහළ වෙන්න හේතුව කියලා. එහෙම ඇහුවහම බුදුරජාණන් වහන්සේ යම්කිසි ප්‍රවෘත්තියක් හෙළි කරනවා.

ආනන්ද, අතීතයේ මේ ප්‍රදේශයේ තමයි වේහලිංග කියන නියම් ගම තිබුණේ. ඒ නියංගම ඇසුරු කරගෙන තමයි කාශ්‍යප බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කළේ. ආනන්ද මෙතනමයි කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ආරාමය තිබුණේ. මෙතන ඉඳගෙනයි කාශ්‍යප බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට අවවාද දුන්නේ. එහෙම කිව්වහම ආනන්ද සවාමීන් වහන්සේ දෙපට සිවුර සඟල සිවුර සිව් ගුණයක් කරල නමලා ආසනයක් පණවලා බුදුරජාණන් වහන්සේට ආරාධනයක් කළා. එහෙනම් භාග්‍යවතුන් වහන්ස මේ ආසනයේ වැඩ හිඳින සේක්වා. එමගින් මේ සථානය බුදුවරුන් දෙදෙනෙකු පරිභෝග කළ සථානයක් බවට පත්වෙනවා ඇති. බුදුරජාණන් වහන්සේත් ඒකට එකඟවෙලා එතන වැඩ උන්නා. ඒ කථාන්තරය තව දුරටත් කියාගන යනවා. ඒ වේහලිංග ගම ඇසුරු කරගෙනයි කාශ්‍යප බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කළේ. මෙතනයි ඒ ආරාමය තිබුණේ. ඒ කාශ්‍යප බුදුරජාණන් වහන්සේට හිටියා ඝටීකාර කියලා අග්‍ර උපසථායකයෙක්, කුඹලෙක්. කුඹල් කාරයෙක් ඝටීකාර නමින්. ඒ ඝටීකාර කුඹල් කාරයාට හිටියා ඉතාමත්ම ප්‍රිය මනාප මිතුරෙක් ජෝතිපාල කියලා. ඉතින් ආනන්ද එක් අවසථාවක මේ ඝටීකාර කුඹල් කාරයා මේ ජෝතිපාල මානවකයාට කියනවා. 'එන්න ජෝතිපාල අපි බුදුරජාණන් වහන්සේව දකින්න යමු. බුදුරජාණන් වහන්සේලා වගේ අය දැකීම සාධු සම්මතයි. එන්න යන්න' කිව්වහම මේ ජෝතිපාල මානවකයා කියනවා. 'වැඩක් නැහැ ඝටීකාර, ඔය මුඩු මහණයා දැකීමෙන් මට ඇති වැඩක් නැහැ' කියලා ප්‍රතික්ෂේප කරනවා. දෙවන වරටත් තුන්වෙනි වරටත් ඝටීකාර කුම්භකාරයා ඉල්ලා හිටියා. නමුත් කැමති වුණේ නැහැ ජෝතිපාල මානවකයා බුදුරජාණන් වහන්සේව දකින්න යන්න. එතකොට ඝටීකාර කුම්භකාරයා මේ ජෝතිපාල යාළුවට කියනවා 'අපි එහෙනම් යමු ගඟට නාන්න. ඔය නාන උපකරණත් අරගන්න' කියලා ගඟ ළඟට ගියා. එතෙන්දිත් ඝටීකාර කුම්භකාරයා යාළුවාට කියනවා 'ජෝතිපාල මේ

ළඟමයි ඒ භාග්‍යවතුන් වහන්සේගේ ආරාමය, එන්න ජෝතිපාල යන්න භාග්‍යවතුන් වහන්සේ දකින්න'. එතකොට ආයිමත් ජෝතිපාල මානවකයා කියනවා 'වැඩක් නැහැ ඝටීකාර ඔය මුඩු මහණා දැකලා ඇති වැඩක් නැහැ' කියලා, තුන් වරක්ම ප්‍රතික්ෂේප කළා. ඔන්න ඒ අවස්ථාවේදී ඝටීකාර අල්ලා ගත්තා ජෝතිපාල මානවකයාගේ ඉණ කඩින්ම. අල්ලාගෙන, 'එන්න යන්න බුදුරජාණන් වහන්සේ දකින්න.' ඒ උනත් ජෝතිපාල මානවකයා ඒ ඉණ කඩත් මුදාගෙන 'වැඩක් නැහැ ගිහිල්ලා' කියලා නව වෙනි වරටත් ප්‍රතික්ෂේප කළා. තුන් සැරයක් එහෙම කිව්වා. ඊළඟට දෙන්නා එක්ක ගඟේ නෑවා. නාල ඉවරවෙලා ගොඩට ආවට පස්සෙ මේ ඝටීකාර කුම්භකාරයා ජෝතිපාල මානවකයාගේ කෙස් වල්ලෙන් අල්ලා ගත්තා. කෙස් වැටියෙන් අල්ල ගෙන කියනවා 'එන්න ජෝතිපාල මෙතනමයි මේ ළඟමයි ආරාමය, එන්න යන්න භාග්‍යවතුන් වහන්සේ දකින්න.' ඔන්න ඒ අවස්ථාවේදී මේ ජෝතිපාල මානවකයා කල්පනා කරනවා, මේ මම බ්‍රාහ්මණ කෙනෙක්. මේ ඝටීකාර කුම්භකාරයා පහත් කුලයක උපන්න නමුත් මේ විදියට නෑවට පස්සේ මගේ කෙස් වැටියෙන් අල්ල ගත්තෙ මොකක් නමුත් මෙතන තියනවා වටින දෙයක් කියලා, යම් අවදි වීමක් ඇතිවෙලා කියනවා 'එහෙනම් මගේ කෙස් වැටිය අතහරින්න. මම එන්නම් බුදුරජාණන් වහන්සේ දකින්න' කියලා ඔන්න ඊළඟට කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා ඝටීකාර කුම්භකාරයා බොහොම ශ්‍රද්ධාවෙන් වැඳලා එකත් පසෙක හිඳ ගත්තා. ජෝතිපාල මානවකයා සතුටු සාමීචි කථා කරලා පැත්තක ඉඳ ගත්තා. ඝටීකාර කුම්භකාරයා යාළුවාව හඳුන්වා දුන්නා. 'ස්වාමීනි මේ ජෝතිපාල මගේ බොහොම ප්‍රිය සහායකයෙක්. මෙයාට බණ ටිකක් කියන්න' කියලා ධර්මය ප්‍රකාශ කරන්නය කියලා. බුදුරජාණන් වහන්සේ ඝටීකාර කුම්භකාරයාටත් ජෝතිපාල මානවකයාටත් දෙන්නටම ධර්ම කථාවක් කරලා සතුටු වෙන විදියේ ධර්මානුශාසනාවක් කළා. ඒක අහල මේ දෙන්නා නැගිටලා භාග්‍යවතුන් වහන්සේට වන්දනා කරලා යන අතරේ ජෝතිපාල මානවකයා අහනවා මේ ඝටීකාර කුම්භකාරයාගෙන් 'ඇයි ඝටීකාර ඔබ මේ වගේ ධර්මයක් අහලා මහණ නොවී ඉන්නෙ.' එතකොට ඝටීකාර කුම්භකාරයා කියනවා 'ඇයි ඔබ දන්නෙ නැද්ද ජෝතිපාල මම මේ අන්ධ මහළු මව්පියන් පෝෂණය කරන කෙනෙක්නෙ.' එතකොට ජෝතිපාල කියනවා 'එහෙනම් මම මහණ වෙනවා.' ඔන්න ඒක කිව්වට පස්සේ ආයෙමත් එක්කගෙන ගිහිල්ලා කියනවා 'මේ මගේ

යාළුවා, මේ ජෝතිපාල, මහණ වෙන්න බලාපොරොත්තු වෙනවා, භාග්‍යවතුන් වහන්සේ මොහු මහණ කර දෙන සේක්වා' කියලා. ඔන්න බුදුරජාණන් වහන්සේත් මේ මානවකයා මහණ කරලා උපසම්පද කළා.

ඒ මහණ උපසම්පද කර්මයෙන් දෙසතියකට පස්සේ බුදුරජාණන් වහන්සේ සඟ පිරිසත් එක්ක බරණැස බලා චාරිකාවේ වැඩම කළා. බරණැසට වැඩම කරලා, ඔන්න බලන්න මේ පුදුම සිදුවීම්. බරණැස ඉසිපතන මිගදයේ මහා කාශ්‍යප බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරනවා. ඒ කාලයේ කසී රජුගේ නම තියෙන්නේ කිකී කියලා. කිකී නමැති කසී රජුට අහන්න ලැබුනා භාග්‍යවතුන් වහන්සේ දැන් බරණැසට වැඩම කරලා ඉසිපතනයේ වැඩ සිටිනවා කියලා. රජතුමා සහපිරිවරින් ආවා. රජතුමා දකින්න ඇවිල්ලා වැඳලා පුදලා ඉඳගත්තහම බුදුරජාණන් වහන්සේ ධර්ම කථාවකින් ඒ රජතුමාව සතුටු කළා. කිකී රජතුමා ආරාධනා කළා භික්ෂු සංඝයා සහිතව රජ ගෙදරට වඩින්නය හෙට දවසට දානය සඳහා කියලා. බුදුරජාණන් වහන්සේත් ඒ ආරාධනය පිළිගත්තා. පස්සෙන්ද දාන මාන සූදානම් කරලා රජු පණිඩිඩ ඇරියහම බුදුරජාණන් වහන්සේ සඟ පිරිසත් එක්ක රජ ගෙදරට වැඩම කළා. බුදුරජාණන් වහන්සේටත් සංඝයා වහන්සේලාටත් රජතුමා දානය සියතින්ම පූජා කරලා දානය අවසානයේදී බුදුරජාණන් වහන්සේ ළඟ ඉඳගෙන කියනවා, භාග්‍යවතුන් වහන්ස, 'මේ වස් කාලය බරණැස ගත කරන්න. මම මේ විදියට සංඝයාට උපස්ථාන කරන්න සූදනම්' කියලා වස් ආරාධනාවක් කළා. එතකොට කාශ්‍යප බුදුරජාණන් වහන්සේ කියනවා මහරජ, මේ අපි වස් ආරාධනාවක් බාර අරගෙනයි තියෙන්නේ. ඒක නිසා මේක පිළිගන්න බැහැ කිව්වහම රජතුමා දෙවන තුන්වන වරටත් කිව්වා. රජතුමාගේ හිතේ දෙම්නසක් ඇති වුණා ආරාධනාව ප්‍රතික්ෂේප කිරීම ගැන. රජු අහනවා මට වැඩිය උපස්ථායකයෙක් ඉන්නවාද භාග්‍යවතුන් වහන්සේට.

බුදුරජාණන් වහන්සේ වදාරණවා, ඉන්නවා වේහලිංග ගමේ ඉන්නවා ඝටීකාර නමැති කුඹල්කාරයෙක්. එයා තමයි මගේ අග්‍ර උපාසක. මහරජ, ඔබේ හිත දෙම්නස් වුණා මම මේක ප්‍රතික්ෂේප කළා කියලා. නමුත් මේ ඝටීකාරකුමහ කරුවාගේ හිත කවදවත් මා කෙරෙහි එහෙම අප්‍රසාදයක් දෙම්නසක් ඇති වෙන්නේ නැහැ කියලා එතන

ඉඳලා සටීකාර කුමහකාරයාගේ ගුණ රාශියක් කාශ්‍යප බුදුරජාණන් වහන්සේ අර මහරජ තුමාට ප්‍රකාශ කරනවා. මහරජ, මේ සටීකාර කුමහකාරයා මේ උපාසක මහත්තයා කොහොම කෙනෙක්ද කියතොත් ඔහු බුදුන් සරණ ගිහිල්ලා, දහම් සරණ ගිහිල්ලා, සඟුන් සරණ ගිහිල්ලා, ඊළඟට ප්‍රාණඝාතාදියෙන් වෙන් වෙලා පඤ්ච ශීලය රකිනවා හොඳ අවබෝධයෙන් යුක්තව බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයෙන්. 'අවෙච්චප්පසාද' කියලා කියන්නේ මාර්ගඵල අවබෝධයෙන් ධර්මාවබෝධයෙන් තුණුරුවන් කෙරෙහි පිරිසිදු ශ්‍රද්ධාව ඇතිවුණහම කියන්නේ අවෙච්චප්පසාද, බුදුරජාණන් වහන්සේ කෙරෙහි අවබෝධයෙන් ඇතිවුණ අවෙච්චප්පසාදයෙන් යුක්තයි. ධර්මය කෙරෙහි ද එබඳු ප්‍රසාදයකින් යුක්තයි. සංඝයා කෙරෙහි ද එබඳු ප්‍රසාදයකින් යුක්තයි යනුවෙන් ඒ පැත්ත කියලා තව දුරටත් මෙහෙම කියනවා. මේ සටීකාර කුමහකාරයා ඒ වගේම දවසට එක වේලයි ආහාර ගන්නේ. 'එක භත්තිකො' බ්‍රහමචාරීව ජීවිතය ගෙවනවා. එපමණක් නොවෙයි ඊළඟට තවත් ගුණ කියනවා. මේ සටීකාර කුමහකාරයා මුදල් රන් රිදී මුතු මැණික් පරිහරණය කරන්නෙ නැහැ. ඒ වෙනුවට කරන්නෙ මොකක්ද? එතකොට මේ කුඹල් කරුවෙක් වෙනකොට මැටි ලබාගන්න එපායැ. ඒ වෙනුවට මහ පුදුම දෙයක් කරන්නේ මේ සටීකාර කුමහකාරයා, සියතින් පොළොව බිදින්නෙත් නැහැ. ගඟේ කඩා වැටුණු ඉවුරුවල මැටි, ඒ වගේම මීයන් නැගූ මැටි කඳකින් ගෙනල්ලා භාජන හදලා තලලා ඒත් මුදලට නොවෙයි විකුණන්නේ. ඒවා හදල ගෙදර ඉස්සරහ තියලා, මිනිස්සුන්ට කියනවා මේ භාජන අරගෙන අපට පාවිච්චි කරන්න සහල් මුං ඇට කඩල වගේ දෙයක් තියල යන්න කියලා. ඔන්න වෙළඳම. ඒ වගේ පුදුම විදියේ ධාර්මික ආජීවයක් තියන කෙනෙක්. ඒ වගේම අන්ධ මව් පියන් පෝෂණය කරනවා. ඒ වගේම අන්තිමට ප්‍රකාශ කරනවා මේ සටීකාර කුමහකාරයා ඕරම්භාගිය සංයෝජන කියල කියන මේ සංසාරයේ පහළට අදින ඒ සංයෝජන පහ නැති කරලා අනාගාමී තත්ත්වයට පත්වෙලා ඉන්න කෙනෙක් කියලා.

එතනින් නතර කළේ නැහැ බුදුරජාණන් වහන්සේ. ඊළඟට අමුතු විදියේ යම් යම් සිද්ධි ප්‍රකාශ කරනවා. මේ පින්වතුන්ට පුදුම හිතේවි. ඊළඟට අහන්න ලැබෙන සිද්ධි බුද්ධොත්පාද කාලයක අමුතුම නැවුම් සුවඳක් ඇති පුදුම විදියේ සිද්ධි. එවැනි සිද්ධි කීපයක් ප්‍රකාශ

කරනවා. මහරජ, එක අවස්ථාවක මම වේහලිංග නියම් ගමේ වාසය කරන වෙලාවක පිණ්ඩපාතයේ වඩින අතරේ මේ ඝටීකාර කුම්භකාරයාගේ නිවසට ගියා. එතකොට අන්ධ මව් පියොනෙ ඉන්නෙ, ගිහිල්ලා මම ඇහුවා 'කෝ මේ භගව කොහේද ගියේ.' බුදුරජාණන් වහන්සේ ඝටීකාර කුම්භකාරයාට අමතන්නේ භගව කියලා. මේ අන්ධ මව් පියෝ කියනවා 'ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේගේ ඒ උපස්ථායකයා මේ වෙලාවේ ගෙයින් පිට ගිහිල්ලා තියෙන්නේ, අන්න හැලියේ තියනවා බත්, සූප භාජනයේ තියනවා සූප. අරගෙන වළඳන සේක්වා' මේ බුදුරජාණන් වහන්සේට කියන්නේ. මම එතකොට ඒ මව්පියන් එහෙම අවසර දුන්නට පස්සේ හැලියෙන් බත් අරගෙන සූප භාජනයෙන් සූපත් අරගෙන එතන ඉඳගෙන මම වැළඳුවා. වළඳලා නික්ම ගියාට පස්සේ ඝටීකාර කුම්භකාරයා ගෙදරට ඇවිල්ලා මව් පියන් ගෙන් අහනවා. 'කවුද මේ බත් හැලියෙන් බත් අරගෙන සූප භාජනයෙන් සූප අරගෙන අනුභව කරල තියෙන්නේ.' එතකොට කියනවා 'පුතේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ඇවිල්ලා, මෙහෙම මෙහෙම ඇහුවහම අපි අවසර දුන්නා, උන්වහන්සේ වැළඳුවා' කියලා. එතකොට ඝටීකාර කුම්භකාරයා කියනවා 'මට ලොකු ලාභයක් විශාල ලාභයක්. භාග්‍යවතුන් වහන්සේ මා කෙරෙහි මෙතරම් විශ්වාසයක් තියනව' කියලා. ඒ සිද්ධිය නිසා ඇතිවුණු ප්‍රීතිය තුළින්. මහරජතුමාට ප්‍රකාශ කරනවා. ඒ ප්‍රීතිය නිසා සති දෙකක්ම ඝටීකාර කුම්භකාරයාත්, සතියක් ඝටීකාර කුම්භකාරයාගේ අන්ධ මව් පියෝ දෙදෙනාත් ඒ ප්‍රීති සුඛය වින්ද. ඔන්න ඒ වගේ තවත් සිද්ධියක් කියනවා. තවත් දවසක මම ඒත් පිණ්ඩපාතේ යන අතරේ ඝටීකාර කුම්භකාරයාගේ ගෙදරට ගිහිල්ලා, මව් පියන් ගෙන් ඇහැව්වා 'කෝ මේ භගව' කියලා. ඒ අවස්ථාවෙත් ගෙදරින් පිටට ගිහිල්ලා. 'අන්න මුට්ටියේ තියනවා කොමු පිඬු, සූප භාජනයේ සූප තියනවා. අරගෙන වළඳන්න' කිව්වා. මම ඒ කොමු පිඬු අරගෙන සූප භාජනයෙන් සූපත් අරගෙන වළඳලා නික්ම ගියා. ආයෙමත් අර ඝටීකාර කුම්භකාරයා ඇවිල්ලා 'මේ කොමු පිඬු එහෙම අරගෙන තියනවනේ කවුද?' කියල ඇහැව්වහම භාග්‍යවතුන් වහන්සේ ඇවිල්ලා ගෙනිච්ච බව කිව්වහම 'වටිනා දෙයක් ලාභයක් මට ලැබුනේ. මෙතරම් විශ්වාසව භාග්‍යවතුන් වහන්සේ මගේ නිවසට ඇවිල්ලා වැළඳුව'යි කියලා. එතනත් කිය වෙන්නේ ඒ සතුට නිසා අඩ මසක්ම සති දෙකක්ම ඒ කුම්භකාරයා ප්‍රීති සුඛය වින්දය. මව් පියනුත් සතියක් ප්‍රීති සුඛය වින්දය කියලා.

ඔන්න තව අමුතුම සිද්ධියක් බුදුරජාණන් වහන්සේ වදාරණවා කිකී රජ්ජුරුවන්ට. 'මහරජ තවත් අවස්ථාවක මම මේ වේහලිංග ගමේ වාසය කරන කොට මගේ කුටියේ වහළය තෙමෙන්න පටන් ගත්තා වැස්සට. මම භික්ෂූන් වහන්සේලාට කිව්ව ඝටීකාර කුම්භකාරයාගේ ගෙදර තණකොළ තියනවද කියලා සොයන්නය කියලා. එතකොට භික්ෂූන් වහන්සේලා කියනවා 'ස්වාමීනි, ඝටීකාර කුම්භකාරයාගේ නිවසේ තණකොළ නැහැ. හැබැයි වහළෙ සෙවිලි කළ තණකොළ තියනවා.' 'එහෙනම් ගිහිල්ල ඒ තණකොළ අරගෙන එන්න.' භික්ෂූන් වහන්සේලා ගිහිල්ලා ඒ නිවසේ සෙවිලි කරපු තණකොළ ගන්නවා. ඔන්න ඔතන අදහස්වල පොඩි වෙනසක් තියනවා. මේ කාලයේ පරිවර්තන ආදියේ දක්වන්නේ නිවසේ වහළය නොවෙයිය, කුම්භකාර ශිල්ප ශාලාවේ වහළය කියලා. නමුත් අටුවා ආදියේ පෙන්වන්නේ නම් නිවසේ වහළය බවයි. කොහොම හරි මේක හරි පුදුම සිද්ධියක් සිද්ධවුණේ. සංඝයා වහන්සේලා වහළෙ තණකොළ ගන්න කොට අඳ මව් පියො අහනව 'කවුද මේ වහළෙ තණකොළ ඉවත් කරන්නෙ.' එතකොට කියනවා 'අපි මේ භික්ෂූන් වහන්සේලා. භාග්‍යවතුන් වහන්සේගේ කුටිය තෙමෙනවා. ඒකට ගෙනියන්න' කියලා. 'ගෙනියන්න ගෙනියන්න' කියලා අඳ මව් පියන් බොහොම සතුට ප්‍රකාශ කළහම සංඝයා වහන්සේලා අර වහළේ තිබුණු තණකොළ අරගෙන ගිහිල්ලා බුදුරජාණන් වහන්සේගේ කුටිය සෙවිලි කළා. ඝටීකාර කුම්භකාරයා ගෙදරට ආවට පස්සේ - මේ තාම කථා කරන්නේ බුදුරජාණන් වහන්සේ රජ්ජුරුවන්ට - අහනවා මව් පියන්ගෙන් 'මොකද මේ වහළෙ හෙවිල්ල නැත්තෙ.' එතකොට කියනවා 'භික්ෂූන් වහන්සේලා මේ තණකොළ අරගෙන ගියා.' ඒ වෙලාවෙත් ඝටීකාර කුම්භකාරයා කියනවා 'මහා ලාභයක් මට මේ වෙලා තියෙන්නේ. ඒ තරම් විශ්වාසයක් භාග්‍යවතුන් වහන්සේ මා කෙරෙහි තබල තියනවා.' එතනදීත් කියවෙනවා කුම්භකාරයා අඩ මසක්මත් මව් පියන් සතියක් පමණත් ඒ ප්‍රීති සුඛය වින්ද බව. එපමණක් නොවෙයි මෙතන ආශ්චර්යයකුත් කියවෙනවා. තුන් මාසයක්ම ඒ ඝටීකාර කුම්භකාරයාගේ නිවසේ වහළ හැටියට තිබුණේ අහස. හැබැයි වැස්සට තෙමුනේ නැහැයි කියල කියනවා. ඒ කියන්නේ වහළක් නැහැ. නමුත් වැස්සට තෙමුනෙත් නැහැ. ඕක පිළිබඳව මහා ආශ්චර්යයවත් දේවල් අටුවාවේ සඳහන් වෙනවා. ඒ කෙසේ වෙතත් ඔය සිද්ධි බුදුරජාණන් වහන්සේ රජතුමාට ප්‍රකාශ කළා. එහෙම

කිව්වහම රජතුමා කියනවා විශාල ලාභයක් මේ ඝටීකාර කුමභකාරයාට ලැබිලා තියෙන්නේ. විශාල ලාභයක් කියලා ප්‍රසාදය පළ කරල රජතුමා තමන්ගේ ප්‍රසාදය හෙළි කරන්න රත්හැල් ගැල් පන්සියයක් ඒකට ගැළපෙන ව්‍යංජන උපකරණ සහිතව වේහලිංග නියම් ගමට යැව්වා රාජ පුරුෂයන් අත. ඒක ගෙනිච්ච රාජ පුරුෂයෝ සවාමීනි, රජතුමා මේවා ඔබතුමාට බාර දෙන්නය කියලා කිව්වහම, ඝටීකාර කුමභකාරයා කියනවා, රජවරු බොහොම වැඩ කටයුතු බහුල අයනෙ. ඒවා රජතුමාටම වේවා. මට වැඩක් නැහැ කියලා ප්‍රතික්ෂේප කළා. බුදුරජාණන් වහන්සේ වදරණවා අන්න ඒ වගේ කෙනෙක් ඝටීකාර කුමභකාරයා කියලා.

ඊළඟට දේශනය අවසන් කරන්නේ, ඒ ඝටීකාර සූත්‍රය ඉවර වෙන්නේ මෙහෙමයි. ආනන්ද, සමහරවිට ඔබ සිතාවි ඒ ජෝතිපාල මානවකයා කියන්නේ වෙන කෙනෙක් කියලා නමුත් ආනන්ද ඒ ජෝතිපාල මානවකයා තමයි මම. මම තමයි ඒ ජෝතිපාල මානවකයා. මේක මහ පුදුම කථාවක්. අහනකොට කෙනෙක් පුදුම වෙන්න පුළුවන්. ඊළඟ සැරේ බුදු වෙන්න ඉන්න මේ බෝධිසත්ත්වයින් වහන්සේ අර වගේ නව සැරයක්ම අර යාළුවා කියද්දී එන්න යන්න බුදුරජාණන් වහන්සේ දකින්න කියලා, මේ මුඩු මහණ දැකීමෙන් වැඩක් නැහැ කියල කිව්වා. බෝධිසත්ත්වයන් වහන්සේ කෙනෙකුට වුණත් මේ විදියේ අකුසල්වලට කියන්නේ ආර්යෝපවාදී කර්ම කියලා. බුදු කෙනෙකුට නිග්‍රහ කිරීම කියන එක ලොකු අකුසලයක්. ඒකට හේතුව හැටියට දක්වන්නේ ඒ බ්‍රාහමණ මානය නිසා හෝ වෙන හේතුවකින් හරි ඒක කියවුණා නව සැරයක්ම. ඔක පිළිබඳව නොයෙකුත් නොයෙකුත් මති මතාන්තර තියනවා. අපදන පාළි කියන ග්‍රන්ථයේ තියනවා 'පුබබ කමම පිලොතිකාපදන' කියලා පරිච්ඡේදයක්. ඒ පරිච්ඡේදයේ දැක්වෙන හැටියට අපේ බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක සංඝයා වහන්සේලාට තමන් වහන්සේගේ ජීවිතයට බලපාපු අතීත පාප කර්ම ගැන විස්තරයක් කියනවා. ඒ අවස්ථාවේ එතන දැක්වෙනවා මේ ජෝතිපාල නමැති මානවකයෙක්ව ඉඳලා, ඒ කාලයේදී මම කාශ්‍යප බුදුරජාණන් වහන්සේට කළ නිග්‍රහය නිසා තමයි මට අවුරුදු හයක්ම සම්බෝධි මාර්ගය ආවරණය වෙලා ඒ අවුරුදු හයම දුෂ්කර ක්‍රියා කරන්න සිදධ වුණේ. ඒ දුෂ්කර ක්‍රියා කරන්න මගේ හිත පෙළඹුනේ. දැන් අපි දන්නවා හැම බුදු වරයෙක්ම දුෂ්කර ක්‍රියා කළා නොවෙයි. හය

අවුරුද්දක්ම දුෂ්කර ක්‍රියා කරන්න සිදධ වුණේ ඒ මැදුම් මඟ සොයා ගන්න තුරු නිසණ්ඨ මතය අනුව ඒ පැත්තට ගිය නිසයි. ඒක සිදධ වුණේ. අර ග්‍රන්ථයේ සඳහන් වෙන හැටියට කාශ්‍යප බුදුරජාණන් වහන්සේට කරපු නිග්‍රහයේ විපාක හැටියටයි. ඇතැම් කෙනෙක් කියනවා බුදුවරුන්ට බලපාන්නේ නැතෙයි කියලා. නමුත් මේ පින්වතුන් දන්නවා බුදුරජාණන් වහන්සේටත් - ඒ වගේම මුගලන් මහ රහතන් වහන්සේට අර මව් පියන් මැරූ නිසා අච්චර සෘද්ධිමත් කෙනෙක් ඇට කුඩු වෙනකම් ඒ අවසාන අවසථාවේ - ඔය විදියට නොයෙකුත් සිද්ධි ගැන සඳහන් වෙනවා. රහත් වුණත් ඒ ඉතිරි කර්ම බරපතල අන්දමින් ගෙවන්න වෙනවමයි. මොකද මේ ශරීරයටයි ආකර්ෂණය, කුසල් ශක්තිය වගේම අකුසල් ශක්තියත් මේ ශරීරයටයි ආකර්ෂණය. රහතන් වහන්සේලාට පවා ලාභ-අලාභ ලැබෙනවා - ඒ අෂ්ටලෝක ධර්මය පොදුයි. අන්න එහෙම හිතාගන්න ඕන.

මේ කථාව තුළින් අපට ඉතාමත් වැදගත් කාරණයක් මේ පින්වතුන්ට හොඳ ආදර්ශයක් ලබාගන්න පුළුවන්. ඇත්ත වශයෙන් මේ ඝටීකාර කුමභකාරයාගේ ජීවිතය, ඒක මහ පුදුම ජීවිතයක්, බ්‍රහම ලෝකයෙන් කෙළවර වුණා. ඒ අවසථාවේ මව් පියන් රැක බලාගන්න තිබුණා. ඒ පරිත්‍යාගය නිසයි මහණ වුණේ නැත්තේ. අර ජෝතිපාල මානවකයාට කිව්වේ මේ වගේ ධර්මයක් අහලා මහණ වුණේ නැත්තේ, ඒ මව් පියන් පෝෂණය කරන්න කියලා කොහොමද ජීවත් වුණේ. මහ ආශ්චර්යයමත් ජීවිතයක්. කොයි තරම් පිරිසිදු ආජීවයක්ද මේ කාලේ උපාසක පින්වතුන්ට හිතන්නවත් බැරි විදියේ. ඒ කියන්නෙ මිල මුදල් පරිහරණයකුත් නැහැ. පොළොව හැරුවෙත් නැහැ සියතින්, ඊළඟට වෙළඳමක් කියලා වංචනික වෙළඳම් කළෙත් නැහැ. මව් පියන් පෝෂණය කළේ අර විදියටයි. හිතාගන්න මව් පියන් පෝෂණය කරන අතරේ බුදෙධාපසථානයත් කරන නිසා තමයි ඒ ඝටීකාර කුමභකාරයා අග්‍ර උපසථායක තනතුරට පත් වුණේ. දැන් අපේ නම් බුදුරජාණන් වහන්සේට සංඝයා වහන්සේ කෙනෙක් නිතරම උපසථායක වුණේ. මහ පුදුම සිද්ධියක් මේක. කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපසථායක මේ ගිහියෙක්. ඊළඟට ඝටීකාර කුමභකාරයාගේ අර කියාපු ගුණවලට අමතරව හිතල බලන්න කොයිතරම් වටිනා කල්‍යාණ මිත්‍රයෙක්ද, නව සැරයක් එපයි කියද්දී අර මිත්‍රයා එක්ක කලහ කරන්නෙත් නැතිව නැවත නැවතත් කියලා අන්තිමට කෙස්

වල්ලෙනුත් ඇදගෙන ගිහිල්ලා තමයි ඔන්න ජෝතිපාල මානවකයා පැවිදි ජීවිතයට යොමු කළේ. ඒ තරම් වටිනා කල්‍යාණ මිත්‍රයෙක්. ඒ කල්‍යාණ මිත්‍රකම අපේ පොත පතේ එන හැටියට බුද්ධාන්තරයක් ගිහිල්ලා අන්තිමට බ්‍රහ්ම ලෝකෙ ඉඳගෙනත් ඒ කල්‍යාණ මිත්‍රකමම කළ බවයි කියවෙන්නේ.

ජාතකට්ඨකථා නිදාන කථාවේ එන ප්‍රවෘත්තියක්, මේ පින්වතුන් කොතෙකුත් අහල ඇති. අපේ බුදුරජාණන් වහන්සේ සිද්ධාර්ථ කුමාරයන් හැටියට අභිනික්මන් කරලා අර අනෝමා නදී තීරයේ එහා පැත්තට ගිහිල්ලා, එතෙන්දි මහණ වෙන්න හිතලා, අන්න අර කෙස්වල්ල අල්ල ගත්ත වගේ දෙයක් - සියතින්ම කඩුවෙන් තමන්ගේ කෙස් කපලා මහණ වෙන්න හිතන කොට අට පිරිකර අරගෙන ආවෙත් අර කල්‍යාණ මිත්‍රයයි, කියලයි පොත පතේ සඳහන් වෙන්නේ ඝටීකාර බ්‍රහ්මරාජයා. එතකොට මේ පින්වතුන්ට තේරෙන හැටියට විශාල ආදර්ශයක් ඒ ඝටීකාර චරිතය. ඒ එක්කම අපිට පේනවා බුදුරජාණන් වහන්සේ පක්ෂපාති වුණේ නැහැ. රජ කෙනෙක් කළ ආරාධනාව, රජ කෙනෙකුගේ වස් ආරාධනාව භාර ගත්තා නම් භික්ෂූන් වහන්සේලාට බුදුරජාණන් වහන්සේට බොහොම වාසියි. ඒවා ඔක්කොම ප්‍රතික්ෂේප කළා. ගුණයටයි බුදුවරු සළකන්නේ. ගුණයටයි, බලයට තිලයට නොවෙයි. ඒක නිසා අර දුප්පත් කුම්භකාරයා කළ වස් ආරාධනාව පිළි අරගෙන රජතුමාගේ ආරාධනාව ප්‍රතික්ෂේප කළා. ඊළඟට අර ඝටීකාර කුම්භකාරයාගේ ඒ ශ්‍රේෂ්ඨත්වය බලන්න. රජතුමා අර තරම් කරත්ත ගණන් යවපු රත්හැල් ඔක්කොම ප්‍රතික්ෂේප කළා. අමාරුවෙන් මැටි සොයාගෙන ඇවිල්ලා වළං හදල ජීවත් වෙනවා. බලන්න ඒ වගේ කර්මාන්තයක් කරපු කෙනෙක්, එක පැත්තකින් අඳ මව් පියන් පෝෂණය කිරීමේ මහා භාරදූර කාර්යය. අනික් පැත්තෙන් බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපස්ථායක හැටියට ඒ උපස්ථාන කිරීම. ඒ ඔක්කොමත් තියෙද්දී මේ පුද්ගලයා කොහොමද ජීවත් වුණේ. අන්න අර විදියට ඉතාමත්ම දැහැමි ආජීවයක් ඇතිව, ඒ අතර සීලයත් රකිමින් මහ පුදුම ආශ්චර්යවත් ජීවිතයක්. අපි තව ටිකින් ටික ගැඹුරට ගියොත් මේ කථාව ආශ්‍රයෙන් ධර්ම පැත්තට, දැන් මෙතෙන්දි කියවුණා ඝටීකාර බ්‍රහ්මරාජයා ඇවිල්ල දුන්න පණිවිඩය ඔස්සේ අපි හිත යොදවමු.

මේ අනාගාමි කියන්නේ රහත් තත්ත්වයට මෙහායින් තියන තත්ත්වයක් බව මේ පින්වතුන් අහල තියනවනෙ. ඒක ගැන යමක් කියනව නම්, දැන් ඔන්න මේ සංසාරයට බැඳිල තියන බැමි සංයෝජන දහයක් ගැන මේ ධර්මයේ කියවෙනවා. ඒවායින් පහළට අදින සංයෝජනවලට කියන්නේ ඕරම්භාගිය සංයෝජන. සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ කියන ඒවා. ඒ සංයෝජන පහ පහළ පැත්තට අදින ඒවා. ඒවා ඉක්මවලා අනාගාමි වුණාට පස්සෙ තියෙන්නේ උද්ධම්භාගිය සංයෝජන, උඩපැත්තට අදින ඒවා. මොනවාද ඒ - රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා. ඒ පහක්, ඒත් ඉතිරිව තියනවා. ඒවා බොහොම සියුම්. ඒ නිසාමයි අනාගාමි අය රහත්වෙලා නැහැ, නමුත් ඒ තත්ත්වයෙන් ඉන්නවා. ඊළඟට අනාගාමි කියන්නේ මොකද මව් කුසයකට යන්නෙ නැහැ. කිසිසේත් මව් කුසයකට යන්න තරම් ශක්තියක් නැහැ. ඒ වෙනුවට ගිහිල්ල උපදින්නේ සුද්ධාවාස කියලා, ලෝක පහක් තියනවා. සමහරු අහල ඇති - අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨ කියලා. එතකොට භවාග්‍රය හැටියට සළකන්නේ අකනිටා නෙ. ඒ පහ තමයි සුද්ධාවාස හැටියට දැක්වෙන්නේ. එයිනුත් මේ අකනිටා කියන වචනයත් බොහෝ දෙනාට ගැටළුවක්. අපට තේරෙන හැටියට නම් මේ උද්ධම්භාගිය සංයෝජන නිසාම ඒ අනාගාමි අය හඳුන්වන්නේ 'උද්ධම්සොතො' නමින්. දැන් සාමාන්‍යයෙන් දිය වැලක් පහළට ගලාගනනෙ යන්නෙ. දිය වැලකට අහුවුණහම පහළට ඇදී යන එකයි සිරිත. නමුත් මෙතන උද්ධම්සොතො කියල කියන්නේ මොකක්ද ඒ පරිනිර්වාණය කරා යන ගමනක්. ඒක නිසා තමයි භවාග්‍රය හැටියට සළකන්නෙ අකනිටා කියන එක. දැන් අපි අවීචියේ සිට අකනිටා කියල කියන්නෙ.

ඔන්න ඊළඟට ඒ කියාපු බ්‍රහ්ම ලෝක ගැනත් අනාගාමි අය රහත්වෙන අවස්ථාව ගැනත් විශේෂ දේශනාවක් බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙනවා අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ සත්ත පුරිස ගතියො කියල. සත්ත පුරිස ගතියො කියල කියන්නේ එතන අනාගාමි පුද්ගලයන් හත් දෙනෙක් රහත් වන අවස්ථාව අමුතු විදියේ උපමාවලින් බුදුහාමුදුරුවෝ දක්වලා තියනවා මෙන්න මෙහෙම. අපි ඒ උපමා ටික ඉස්සෙල්ල කියල හිටිමු. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා යම් සේ මුළු දවසක් තිස්සේ තලන යකඩ කබලක් - දැන් ඔය කම්මලක යකඩ කබලක් කිණිහිරිය උඩ තියල තලනකොට ගිනි පුළිඟු

මතු වෙනවනෙ, ගිනි පුළිඟු පැන නගිනවනෙ. ඒකට අපි කියමු පතුරක් කියල, සියුම් පතුරක්. ඔන්න **පළමුවෙනි** අවස්ථාවේදී තියෙන්නෙ ඒ යකඩ කබලක් තලනකොට යම් කිසි ගිනි පුළිඟුවක් පතුරක් මතුවෙලා මතුවුණ හැටියෙම ඒක පැන නැගුනු හැටියෙම එතනම නිවෙනවා. ඒ පළමු අවස්ථාව. ඊළඟට **දෙවෙනි** අවස්ථාව මෙහෙම දක්වනවා. උපමා ටික අපි ඉස්සෙල්ල කියනවා. ඒ කම්මලේ යකඩ කබල තලන කොට ඒ ගිනි පුළිඟුව පැන නැඟිල අහසෙ උඩට ගිහිල්ලා උඩදි නැතිවෙලා යනවා. **තුන්වෙනි** අවස්ථාව ඒ ගිනි පුළිඟුව ඉහලින් ගිහිල්ල පොළවට පහත්වෙලා පොළවේ වදින්න කලින් ඒක නිවිලා යනවා. ඔන්න අවස්ථා තුන. ඔය අවස්ථා තුන දක්වන්නේ පින්වතුනි, දැන් අනාගාමි පුද්ගලයින් හඳුන්වන කොට ඔය සූත්‍රයේ පමණක් නොවෙයි, අනෙක් තැන්වලත් අනාගාමි අය රහත්වන අවස්ථාව අනුව ගණ පහකට කොටස් පහකට බෙදල තියනවා. අපි ඒක ඉස්සෙල්ල කියල ඉඳිමු.

මෙහෙමයි සඳහන් වෙන්නේ. අන්තරා පරිනිබ්බායි, උපහච්ච පරිනිබ්බායි, අසංඛාර පරිනිබ්බායි, සසංඛාර පරිනිබ්බායි, උද්ධංසොතො අකනිට්ඨ ගාමි කියල ගණ පහකට බෙදල තියනවා. නමුත් ඔය ගණ පහ හතක් හැටියට මෙතන දැක්වෙන්නේ. දැන් අපි ඒ කියාපු ගණ තුනම දක් වෙන්නේ අන්තරා පරිනිබ්බායි කියන එකට. අතරතුර පිරිනිවන් පෑවා. දැන් හිතාගන්න අර ගිනි පුළිඟුව තමයි අර අනාගාමි පුද්ගලයා අරගෙන එන කර්ම වේගය. එහෙම නැත්නම් ඒ සංස්කාර බලය. ඒ සංස්කාර ශක්තිය. මෙතනින් මරණයට පත් වුණාට අපවත් වුණාට පස්සේ කොච්චර ඉක්මනින්ද කියන එක පෙන්වන්න තමයි අර යකඩ කබලක් තලනකොට ගිනි පුළිඟුවක් මතු වුණා. මතු වුණත් එක්කම ඒක නිවිල ගියා. දෙවන අවස්ථාවේදී ඒක ටික දුරක් ගිහිල්ල නිවිල ගියා. තුන්වන අවස්ථාවේදී අහසින් ගිහිල්ල පොළවට වැටෙන්න කලින් නිවිල ගියා. ඒ අවස්ථා තුනම අන්තරා පරිනිබ්බායි කියන එකට අයිතියි. ඊළඟට කියනවා අර යකඩ පතුරක් අහසින් ගිහිල්ල පොළවට වැටුනට පස්සෙ නිවෙනවා. ඒක දක්වන්නේ උපහච්ච පරිනිබ්බායි. එතකොට ටිකක් පරක්කු වෙලයි රහත් වෙන්නේ. ඊළඟට බුදුරජාණන් වහන්සේ දක්වන උපමාව ඒත් අර යකඩ කපන අතරේ කෑල්ලක් පතුරක් ගිනි පුළිඟුවක් කියමු. ඒක අහසින් ගිහිල්ලා වැටෙන්නේ කුඩා දැව පිඩක නැත්නම් තණකොළ පිඩක. වැටිලා ඒක දවලා තවත් ඉන්ධන නො ලබා ඒක නිවිලා යනවා. ඒක දැක්වෙන්නේ අසංඛාර

පරිනිබ්බායි. බොහොම සියුම් ප්‍රභේද වගයක් තියෙන්නෙ. ඔන්න ඊළඟ අවස්ථාව දක්වෙන්නේ ලොකු තණ පිඩකට, දව පිඩකට වැටෙනවා අර ගිනි පුළිඟුව. එහෙම වැටිලා ඒක දවලා ඊට පස්සේ ඒ ලොකු තණ පිඩ හරි දව පිඩ හරි දවලා අවසාන වෙලා නිවිල යනවා. ඒකට කියන්නේ සසංඛාර පරිනිබ්බායි කියල. ඊළඟට කියනවා අන්තිම අවස්ථාව ලොකු තණ පිඩක හරි දව පිඩක හරි වැටිලා ඒක සම්පූර්ණයෙන් දවලා එතනින් ඉවර වෙන්නේ නැහැ. ඒ ළඟ තියන පඳුරු දවනවා. උයන් වතු දවනවා. ඔහොම දව දවා ගිහිල්ලා යම් කිසි වතුරක් ළඟට, පර්වතයක් ළඟට, පාරක් ළඟට ගිහිල්ලා, ඉන්ධන නො ලබා නිවිල යනවා. අන්න ඒ අන්තිම අවස්ථාව තමයි උද්ධංසොතො අකනිට්ඨගාමි කියන්නෙ. ඒ කියන්නේ ඒ අනාගාමි පුද්ගලයා අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී කියන ඒ බ්‍රහ්ම ලෝක පාස් කරමින් ගිහිල්ල අන්තිමට අකනිට්ඨ බඹ ලොව දී අරහත් ඵල විමුක්තිය ලබාගන්න අවස්ථාව දක්වීමටයි ඔය උපමාව කිව්වෙ. මෙතනදී අපට දක්වූ ඔය ගිනි පුළිඟුවේ උපමාවෙන් හිතා ගන්න තියෙන්නේ බුදුරජාණන් වහන්සේ නිවන කියල කිව්වේ නිවීම බවයි. මේ මුළු භවයම දවෙනවා. ඒක තව දුරටත් අපේ උපමාවම ආශ්‍රය කර ගත්තොත් - ටිකකට හිතන්න අපේ පටිච්ච සමුප්පාද දේශනාවල මතුකර දුන්නා මේ භවයේ මේ රහස තියෙන්නේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර බව. ඒක ඔප්පු වෙනවා අපි කලින්ම මාතෘකා කර ගත්තු ගාථා පෙළේ එක තැනක සඳහන් වෙනවා ඝටීකාර බ්‍රහ්මරාජයා අර භික්ෂූන් වහන්සේලා හත් නම රහත් වුණ අවස්ථාව දක්වන්නේ මෙන්න මේ විදියේ කියමනකින් ගාථාවකින්.

'යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති'

යම් තැනක නාමයත් රූපයත් උපරෝධනය වෙනව නම්,

'තං ධම්මං පරිඤ්ඤාය අච්ඡිදුං භව බන්ධනං'

ඒක තේරුම් අරගෙන භව බන්ධනය කැපුවයි කියන එකයි ඒ ගාථාවේ කියවෙන්නේ. එයින් පේනවා භව බන්ධනය තියෙන්නේ මේ නාමරූපයත් විඤ්ඤාණයත් අතර බව. අපි කලිනුත් කිව්ව වගේ එතකොට ටිකකට හිතා ගත්තොත් අර උපමාව තේරුම් ගන්න අර යකඩ කබල තලනව වගේ එකක් තමයි විඤ්ඤාණයත් නාමරූපයත්

අතර ගැටුම. ඒක තුළින් තමයි ඔක්කොම සළායතන, අපි කලිනුත් කිව්වේ අවිද්‍යාව නිසා ඇතිවන සංස්කරණයෙන් ඊළඟට ඒ ශක්තිය තුළින් භවය ගොඩ නැගෙනවා. කර්මාදිය ගොඩ නැගෙන්නෙත් ඒකෙන්. අවසාන වශයෙන් අපට තේරෙනවා අර බ්‍රහම රාජයින් ගැන කියාපු කාරණාවලින් අපට තේරෙනවා, ඒ පොත පතේ කියවෙන හැටියට අනාගාමි බ්‍රහමරාජයින් පවා සමහර විට අරහත්‍වයෙන් පස්සේ කල්ප ගණන්, මොකද ඒ බ්‍රහම ලෝකවල ආයුෂ ඉතා දීර්ඝයි. ඒකයි බොහෝ අවස්ථාවල කියන්නේ මනුෂ්‍ය ලෝකය රහත් වෙන්න හොඳම තැන කියලා. ඒ තැන්වල රහත් වෙලත් ඒත් කිසිම තේරුමක් නැති පැවැත්මක් තියෙන්නෙ. මොකද හේතුව, මේ ශරීරයට ආකර්ෂණය වෙන, මේ පැවැත්මට ආකර්ෂණය වෙන කර්ම ඉතාම සියුම් කර්ම ගෙවා දන්න සිදු වෙනවා ජීවිතේන්ද්‍රිය නැති වෙන තාක්. ඒ නිසා කල්ප ගණන් ආයුෂ ඒවායේ තියනවාය කියනවා. රහත් වුණත් සමහර විට ඒ බ්‍රහම රාජයින්ට ඉන්න සිදධ වෙනවා. ඒ නිසා මනුෂ්‍ය ලෝකයේ ආයුෂ බොහොම කෙටි වීම නිසා තමයි එතනම ඉවර වෙන්නෙ. ඒ කටයුතු ඉවරයි ඔක්කොම. ඒකනෙ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියන්නේ ඒකනෙ මම මරණය පතන්නෙත් නැහැ. ජීවිතය පතන්නෙත් නැහැ. වැඩේ කරල වැටුප එනකම් ඉන්නවා කියල කියන්නෙ. මරණය එනකම් ඉන්නවා. ඒකනෙ බුදුරජාණන් වහන්සේගේ ශරීරය තිබුණ නිසානෙ අර අවසාන අවස්ථාවෙ මහාපරිනිර්වාණ සූත්‍රයේ සඳහන් වෙන්නෙ අර තරම් ශ්‍රේෂ්ඨ බුදුරජාණන් වහන්සේට වතුර ටිකක්වත් ලැබුණෙ නැහැ. ඒත් යම් යම් කර්ම භේද කොතෙකුත් ඒ අෂ්ටලෝක ධර්මයට අදාළ මහා දුක්ඛස්කන්ධ කන්දරාවක් මැදයි බුදුරජාණන් වහන්සේගේ ජීවිතය පවා ගෙවිල තියෙන්නේ. අනිකුත් රහතන් වහන්සේලා පිළිබඳවත් මේ පින්වතුන් අහල තියනවා. අච්චර මනුෂ්‍යයින් මැරූ අංගුලිමාල. උන්වහන්සේ ගැන පොතපතේ සඳහන් වෙලා තියනවා අංගුලිමාල සූත්‍රයේ. උන්වහන්සේ රහත් වුණාට පස්සේ පිණ්ඩපාතේ යනකොට ගෙදරවල් වල උපාසක අම්මලා වලන් කෑලි, වීසි කරන අරව මේවා වැදිලා ඔළුව පලාගෙන ලේ හලාගෙන එන්නේ, සමහර දට පිණ්ඩපාතෙ ගිහිල්ලා. මොකද ඒ කර්ම ආකර්ෂණය. හිතල නොගැහැව්වත් කොල්ලො ගල් වීසි කළහම ඒවා ගිහිල්ලා අර අංගුලිමාල හාමුදුරුවන්ගේ ඔළුවට වදිනවා. ඒ නිසා හිතන්න ඕන මේ භවයේ තියන භයානක බව. මේ ශරීර කූඩුව තියනතාක් බුදු, පසේබුදු, රහතන් වහන්සේලාට, ඔක්කොම ඒ කර්ම විපාක ගෙවන්න වෙනවා. ඒ

තරම් භයානකයි ඒ කර්ම චක්‍රය. එබඳු කර්ම චක්‍රයක් තුළයි අර ජෝතිපාල මානවකයා මොන වැරදීමකින් හරි මාන්නයකින් හරි අර විදියට නව සැරයක් ප්‍රතික්ෂේප කළේ. ඒකෙන් අකුසලයක් නොවුනයි කියල සිතන්න බැහැ. පොත පතේ දැක්වෙන විදියට බුදුරජාණන් වහන්සේම සංඝයා වහන්සේලාට යම් අවස්ථාවක ප්‍රකාශ කළා මේ මේ කර්ම නිසයි මම මේ විදියේ ජීවිතේ දුක් වින්දේ කියලා. අපි ඒක පාඩමක් හැටියට ගන්න ඕනෙ. හය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කළෙත් ඒක නිසයි කියල කියනවා. ඒ එක පැත්තක්.

අනික් පැත්තෙන් කල්පනා කරල බැලුවත් අපි කිව්වනේ අනාගාමි තත්ත්වය ගැන. අකනිට්ඨා කියල කියන්නේ මොකද? භවයෙ නම් දිව්‍ය ලෝකෙන් හරි බ්‍රහ්ම ලෝකෙන් හරි චුත වුණොත් ඊට පහළ එකකට යන්නෙ. දැන් මෙතන මහ පුදුම වැඩක් වෙන්නේ. අපි හිතමු අවිහ බ්‍රහ්ම ලෝකෙදිම රහත් වුණේ නැහැ කියලා. ඊළඟට අර ගිනි පුළිඟු උපමාව ගැන හිතාගන්න. ගිනි පුළිඟුව වැටුණු හැටියෙම නිවුනෙ නැත්නම් නිවුනයි කියන්නෙ රහත් වුණා. එහෙම නැත්නම් අහසෙදි නිවුණෙ නැත්නම්, වැටිල නිවුනෙ නැත්නම් ඊළඟට අඩු ගානේ අර දැව පිඬුවල... ඔන්න ඔහොමයි කථාන්තරය තියෙන්නෙ. මොකද අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සි, අකනිට්ඨා කියන ඒ බ්‍රහ්ම ලෝකවල ක්‍රම ක්‍රමයෙන් උපත ලබනවා. ඒකට හේතුව අපිට කියන්න බැරි තරම් සියුම් අන්දමින් ඒ ඒ පුද්ගලයින්ගේ ප්‍රඥා ශක්තිය අනුව මේ ඔක්කොම ප්‍රඥාවෙන්නෙ වියල දෙන්නෙ. මේ සංස්කාර ශක්තිය අනුව එතකොට ඒ ප්‍රඥා ශක්තිය හරියට දියුණුවෙන තාක් අනාගාමි පුද්ගලයා පවා. ඒකනෙ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ එක් අවස්ථාවක අසූචි ටිකක් නමුත් ගඳ වගේ මම භවය මොහොතකටවත් වර්ණනා කරන්නෙ නැහැ කියලා. ඒ තරම් භයානකයි භවය. ඒ වගේ තමයි මේ පින්වතුන් කල්පනා කරල බලන්න සංස්කාරවල තියන භයානක කම බුදුරජාණන් වහන්සේගේ වෙන දේශනාවක දී කියා දීල තියනවා, මතු කරල දීල තියනවා. ධම්මපදයේ ගාථාවක් සඳහන් වෙනවා. ඇතැම් අය ඒක බොහොම ලිහිල්ව තෝරන්නෙ.

ජිගච්ඡා පරමා රොගා - සංඛාරා පරමා දුඛා
එතං ඤත්වා යථාභූතං - නිබ්බාණ පරමං සුඛං

අපි ඒක එක අවස්ථාවකදී තේරුම් කරල දුන්නා. 'ජිගච්ඡා පරමා රොගා' කියනකොට දෙස්තරල විරුද්ධ වෙන්න පුළුවන්. ඒක තෝරන්න ගියොත් කියන්න වෙන්නෙ ලෝකෙ තියන ලොකුම ලෙඩේ බඩගින්නය කියලා. කවුද ඕක පිළිගන්නෙ. වෙන දේවල් නෙ කියන්නෙ. නමුත් ලෝකෙ තියෙන ලොකුම ලෙඩය කිව්වෙ, පරම කියල කිව්වෙ, අනිත් ලෙඩ ඔක්කොම නැති කළත් මෙන්න මේ අපි පෙන්නල දුන්න මේ සියුම් ලෙඩේ, මේ ජඨරාගනිය කියන ලෙඩේ තමයි සත්ත්වයින්ට තියන මහ භයානකම ලෙඩේ. 'ජිගච්ඡා පරමා රොගා' ඒකනෙ ඔය කීමටත් කියන්නෙ 'ඉබේ කෙදිරි ගැවෙන ලෙඩකි බඩගිනි' කියලා බඩගින්න කියන එක ඒ තරම් භයානකයි. අන්න ඒකට උපමා කරල තමයි ගන්න තියෙන්නේ.

'ජිගච්ඡා පරමා රොගා සංඛාරා පරමා දුඛා' සංස්කාර තමයි ලොකුම දුක. අපි හිතන්නේ නැහැ අපි හිතන්නෙ අපිට තියන කරදර තමයි ලෙඩ රෝග දුක් කරදර තව නොයෙකුත් විපත්ති, ඕව තමයි අපි හිතන්නෙ ලොකු දුක කියලා. නමුත් බුදුරජාණන් වහන්සේලා කියන්නේ 'සංඛාරා පරමා දුඛා' සංස්කාරමයි දුක. සංස්කාර ඇති වන්නේ අවිද්‍යාව නිසා. ඒ මොකද අවිද්‍යා අන්ධකාරයේ ඉන්න තාක් සංස්කාර සකස් වෙනවා. සමහර ඒවා ගොරෝසු සමහර ඒවා සියුම්. සමහර ඒවා කර්ම විපාක ගෙන දෙන ඒවා. සමහර දේවල් ඒ භවය දිගට පවත්වන ඒවා. ඒවට කියන්නේ භව සංස්කාර. නිමා නොවුණු භව සංස්කාර නිසයි ඒ අනාගාමි අය වෙනම ලෝකයක ඉපදිලා අර විදියට කල්ප ගණන් ගෙවන්නේ. මහා පුදුම දෙයක් හිතල බලන කොට. අපි මේවාට උපමා දුන්නා, මේ පින්වතුන්ට තේරුම් ගන්න. ඔය බ්‍රහ්ම ලෝකවල පැවැත්ම බඹරයක් ගැහැවුහම හෙල්ලෙන්නෙ නැතුව වගෙයි ඇතට පෙනෙන්නෙ. නමුත් ඒක කරකැවෙනවා වේගයෙන්. අන්න ඒ වගේ මේ සංස්කාර වේගය තුළිනුයි පැවැත්මක් තියෙන්නේ. ඒ බ්‍රහ්ම ලෝකවල ඒක තේරුමක් නැති පැවැත්මක් නමුත් ඒවා ගෙවා දන්න සිද්ධ වෙනවා. ඒ අරහත්වයත් අනාගාමිත්වයත් අතර වෙනස සූත්‍රවල තියනවා. ඒ පාඨ ආශ්‍රයෙන් අපි තේරුම් කරන්න ගියොත් මෙන්න මෙහෙම කියවෙනවා. සමහර වෙලාවට 'අස්මිමාන සමුග්ඝාතං පාපුණාති දිට්ඨෙව ධම්මෙ නිබ්බානං' රහත් වීම ගැන කියන කොට කියනවා 'අස්මිමාන සමුග්ඝාතං' අස්මිමානය කියන එක මුලින් උපුටා දමනවා කියලා. අස්මිමානය කියන එක මුලින් උපුටා

දමන තාක් සංසාර දුක කෙළවර කරන්නෙ නැහැ. එතකොට අස්මිමානය කියන ඒ මානය අනාගාමි පුද්ගලයා තුළ තවත් ඉතිරිව තියනවා. ඒක තවත් විදියකින් කියවෙනවා ඇතැම් තැන්වල ඒ අනාගාමි පුද්ගලයාට ධම්මරාග ධම්මනන්දි කියල කියනවා. ධර්මයට තියන ඇල්ම ඒකත් අන්තිමට බන්ධනයක් වෙනවා. 'තෙනෙව ධම්මරාගෙන තයො ධම්මනන්දියා' නැවත මෙලොවට එන්නෙ නැහැ අනාගාමි වෙනව කියල කියන්නෙ. එයින් පේනවා අර ඉතාමත්ම සියුම් බැඳීම් තමයි ඒවා ලෝකයේ තියන.

ඒක තවත් හෙළි වෙනවා අපි කලිනුත් මේ දේශනාවලදී මතක් කළ සූත්‍රයක් තමයි ඛෙමක සූත්‍රය. ඛෙමක ස්වාමීන් වහන්සේගේ සැප දුක් සොයන්න භික්ෂුවක් එව්වහම කිව්වා. 'මගේ රූප වේදනා ආදී එක ස්කන්ධයක්වත් මේ මම වෙමි, මේ මගේ ආත්මයයි කියලා මම දකින්නෙ නැහැ. හැබැයි මම රහත් වෙලත් නැහැ.' ඔහොම කිව්වහම අර සංඝයා වහන්සේලා හැට නම ඒක විශ්වාස කළේ නැහැ. මේක කොහොමද වෙන්නෙ කියලා ඒ පඤ්චස්කන්ධය මමය මාගේය කියලා දකින්නේ නැත්නම් රහත් වෙන්න එපායැ. බැරිම තැන හැරමිටියත් අරගෙන ගිහිල්ලා ඛෙමක ස්වාමීන් වහන්සේ සංඝයා වහන්සේලාට තේරුම් කරලා දුන්නේ උපමා දෙකකින්. ඒ උපමා දෙක නැවත මතක් කර ගනිමු. පුදුම උපමා දෙකක් දෙන්නෙ. ඔන්න යම් කිසි මලක සුවඳක් එනවා. ඒ සුවඳ තියන බව අපි දන්නවා. නමුත් ඒ සුවඳ එන්නේ කොහෙන්ද, පෙත්තෙන්ද, කෙමියෙන්ද, රේණුවලින්ද කියල අපිට කියන්න බැහැ. අන්න ඒ වගේ දෙයක් මේ ස්වාමීන් වහන්සේ කියනවා මට මේ එක ස්කන්ධයක්වත් ආත්මය හැටියට පේන්නෙ නැහැ. නමුත් අස්මි කියන අනුසහගත ඉතාම සියුම් මානයක් මා තුළ ඉතිරිව තිබෙනවා කියලා, ඒ මලේ උපමාව කියනවා. ඒ වගේම තවත් සියුම් උපමාවක් ඛෙමක ස්වාමීන් වහන්සේ ඒ අවස්ථාවේදී දෙනවා. යම් සේ රදවෙක් කිළිටි වස්ත්‍රයක් සෝදනවා. ඒ කාලේ තිබුණා අපි පාවිච්චි කරන සබන් වගේ දෙයක් යොදලා අපි උපමාවට කියමු සබන් කියලා. සබන් වැනි දෙයක් යොදල රෙද්දෙ ඒ කිළිටි ඉවත් කරලා ස්වාමියාට ඒක බාර දෙනවා. රෙද්ද සෝදලා ඒ කිළිටි නැති වුණාට මොකද සබන් සුවඳ තාම තියනවා, සබන් සුවඳ තාම තියනවා. ස්වාමියා යම් කිසි අල්මාරියක හරි තැන්පත් කරල තිබුණහම කලකට පස්සේ ඒ සුවඳත් නැතිව යනවා. එතනින් පෙන්නන්නේ කොතරම්

සියුම්ද කියන එක. එතන ඉඳලා යන ගමන රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා කියන ඉතාම සියුම් සංයෝජන. ඒවායේ ක්‍රියාකාරිත්වය තුළින් තමයි අර සුද්ධාවාස පවතින්නේ, ඒවා මෙතෙන්දි මේ ජීවිතයේදීම කෙළවර නොකොළොත් - උපක, පුක්කුසාති ආදීන් සංසාරයේ දීර්ඝ කාලයක් සිත් දියුණු කළ අය, අනාගාමි අය. අවිහ බ්‍රහ්ම ලෝකයේ උපන්න හැටියෙම රහත් වුණ බවයි, ඒ අවස්ථාවේදී ඝටීකාර බ්‍රහ්මරාජයා ප්‍රකාශ කළේ. නමුත් ඇතැම් බ්‍රහ්ම රාජයින් අර විදියට කල්ප ගණන් ගත කළා. නමුත් පහළට යන ගමනක් නොවේ.

පහළට යන ගමනක් නම් කර්ම ශක්තිය කර්ම වේග අනුව යන ගමනක්. මේක එහෙම නොවේ. ඊට වඩා සියුම් සංස්කාර වේගයක්. ඕවා බොහෝ දෙනා පටලවාගෙන කථා කරන්නේ. නමුත් අවිද්‍යාව තුළින් ඇතිවුණ සංස්කරණයෙන් තමයි අපි පෙන්නල දුන්න විඤ්ඤාණ නාමරූප දෙක භ්‍රමණය වෙන්නේ, හරියට වතුර යන්ත්‍රයක වගේ. ඒ භ්‍රමණය වීම තුළින් තමයි සළායතන ආදී කර්ම නිෂ්පාදනය වෙන්නේ. අන්න ඒක සළකා ගන්න. නාම ධර්ම ගැන අපි කිව්වනෙ. වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර ගැන බලන්න. අර මැද ඇඟිල්ල හැටියට අපි ගන්නේ චේතනාවනෙ. 'චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි' කියනකොට පින්වතුන් කල්පනාවට ගන්න ඕන. ඒ නාම ධර්ම තුළ තියනවා කර්ම සකස් වෙන අවස්ථාව. ඒ විඤ්ඤාණ නාමරූප දෙකේ ඝට්ටනය තුළිනුයි අර අනාගත ජීවිත රාශියකට බලපාන කර්ම සකස් වෙන්නේ. ඒවත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා. 'නාහං භික්ඛවෙ කථානං පතිචානං කම්මානං අප්පටිතිං සංවිදිත්වා ව්‍යනති කිරියං වදාමි'

කර්මයන්ගේ, කර්මයේ තියන භයානකත්වය එතන බුදුරජාණන් වහන්සේ දක්වනවා, මහණෙනි මම කියනවා රැස් කරන ලද කර්ම, විපාක නොදී ගෙවෙන්නෙ නැහැ. විපාක නොදී ගෙවෙන්නෙ නැහැ කියනකොට කෙනෙකුට බය හිතෙනවා. නමුත් බුදුරජාණන් වහන්සේ ඒක තවත් විස්තර කරනවා සියුම් අන්දමින්. අර නිගණ්ඨයො කියනව වගේ කරන හැම කර්මයකටම විපාක විඳින්න ගියොත් සංසාරයෙන් කවමදකවත් බේරෙන්න බැහැ. නමුත් එතන බුදුරජාණන් වහන්සේ දක්වන්නේ පුදුම විග්‍රහයක්. මීට කලින් අපි ඕවා සවිස්තරව කියල තියනවා. නිගණ්ඨයො කියන්නේ කරන කරන ආකාරයෙන්ම විඳින්න

ඕන. නමුත් බුදුරජාණන් වහන්සේ කොටස් තුනකට වෙන් කර දක්වනවා. ඇතැම් කර්ම දිට්ඨධම්ම වේදනීය වශයෙන් මෙලොවදීම විඳල කෙළවර කරනවා. තවත් කර්ම උපපජ්ජ වේදනීය වශයෙන් ඊළඟ ජාතියේ ගෙවල කෙළවර කරනවා. තවත් කර්ම තියනවා අපරාපරිය වේදනීය වශයෙන්.

ඔන්න ඔහොම කර්ම විපාක දෙන ආකාරය අනුව ඔක්කොම කර්ම ගෙවෙනවා කියල කිව්වෙ ගැඹුරු අර්ථයෙන්. නමුත් ඒවා ගෙවන ආකාරය වෙනස් වෙනවා. ඇතැම් කුසල කර්ම තුළින් - අපි කලින් අවස්ථාවෙ 'මෙත්තා චෙතො විමුක්තිය' ගැන කිව්වෙ ඒකයි. ඒවායේ තියන පුළුල් ශක්තිය තුළින් කර්ම ගෙවාදන ඒ හැකියාව තිබෙන බවයි. ඒකයි මේ ශාසනය තුළ කෙනෙකුට සසර දුක් කෙළවර කරල නිවන් දකින්න පුළුවන්. නමුත් ඒ කිව්ව පමණින් අපි හිතන්න නරකයි මේක ලේසි වැඩක් කියලා. එක පැත්තකින් අර කර්ම චක්‍රය භයානක අන්දමින් ක්‍රියාත්මක වෙනවා. මෙහෙම හිතමු. අපි සිල් රකින්නය කිව්වත් මේ හැම එකක්ම කිව්වත් මනුෂ්‍යයා ලෝකයේ ජීවත් වන තාක් ඒවා කරන්නය කියන එක නොවෙයි මේ කියන්නේ. ඉදිරිපත් වෙන අවස්ථාවල දන්නෙම නැතිව අර ජෝතිපාල මානවකයා වගේ, හිතලද, ඊළඟට බුදුවෙන්න ඉන්දැද්දි ඒ වචන කටින් පිටවුණා නම සැරයක්. එය තුළ ලොකු අකුසලයක් රැස්වුණා. ඒ වගේ මේ පින්වතුන් තේරුම් ගන්න. අපි කාටත් අවිද්‍යාව තියන තාක් සංස්කාර රැස් වෙනවා, සංස්කරණයක් කෙරෙනවා. ඒ සංස්කරණය තුළින් අර කියාපු විඤ්ඤාණ නාමරූප දෙකේ ඝට්ටනය ඉතාම වේගයෙන් සිද්ධ වෙනවා. දැන් බොහෝ දෙනා 'ලහු පරිවත්තං චිත්තං' කියන එක බොහොම සරලව තෝරන්නේ. හිත කරකැවෙනවා කියන එක කෝට්ටක් අරගෙන කරකවනවා වගේ දෙයක් කියල. එහෙම නොවෙයි අපි පෙන්වල දුන්නා 'ලහු පරිවත්තං චිත්තං' කියන්නේ පරිවර්තනයක්. මොකක් අතර පරිවර්තනයක්ද, විඤ්ඤාණයත් නාමරූපයත් අතර පරිවර්තනයක්. ඉතාම වේගයෙන් ඒ විඤ්ඤාණය නාමරූපය අල්ලනවා අතහරිනවා. තව එකක් අල්ලනවා අතහරිනවා. ඔය වේගය තුළ ඒ අමුතු අමුතු වටිනාකම් ඒ තුළින් ලැබෙනවා. ඒ කියන්නේ හිතාගන්න බැරි තරම් වේගයෙන්. වේගය නිසාම අපට එකක් හැටියට පේනවා. ඒක නිසාම තමයි ඝන සංඥාව ආදිය තුළින් ආවරණය වෙලයි මේ ලෝකයේ යථා තත්ත්වය. විදර්ශනාව තුළින් යෝනිසෝ මනසිකාරය

තුළින් ක්‍රමක්‍රමයෙන් නාමරූප ධර්ම අවබෝධ කරගෙන මේ ගැටළුවෙ අන්තො ජටා බහි ජටා හැටියට යන මේ තත්ත්වය අවබෝධ කරගන්න ඕන.

කලින් අවස්ථාවක මේවා විග්‍රහ කරල තියනවා. නාමයත් රූපයත් අතර තියෙන්නේ අන්තො ජටා කියලා මහ පුදුම ජටාවක්. මහා භූත ධර්මයන් හඳුනාගන්නේ අර කියාපු නාම ධර්ම තුළින් වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර තුළින්. මේ මහා භූත ධර්ම හඳුනා ගන්නවත් බැරි දේවල්, අපි ඒ ලබන ආත්මභාව අනුව තිරිසනෙක් වෙන විදියකට හඳුනා ගන්නේ. මනුෂ්‍යයෙක් තව විදියකට හඳුනා ගන්නේ. දෙවියෙක් තව විදියකට හඳුනා ගන්නේ මේ මහා භූත ධර්ම. අන්න එබඳු ඒ මහා භූත ධර්මත් එක්ක යන එකක් මේ නාම ධර්ම. ඒකයි නාම රූපයේ තියන භයානක කම. ඒ නාම රූපය ඒ පැත්තෙන් අන්තො ජටාවක්. ඊළඟට නාම රූපයේ විඤ්ඤාණය. අපි කිව්වනේ නාම රූපය විඤ්ඤාණයේ පිළිඹිබු කරන සවභාවයක් තියනවය කියල. ආයෙ මතක් කර දීමක් මේ කරන්නේ. විඤ්ඤාණයේ පිළිඹිබු වෙන එක තමයි මේ නාම රූපය කියන්නේ. ඒකයි අපි නොයෙකුත් අවස්ථාවල මේ කාලෙ බොහොම ශාස්ත්‍රීය විදියට විග්‍රහ කරන්න යන රූප ධර්ම ගැන ලේඛන ඉදිරිපත් කරනවා. ඒ උනාට අපි ඉතාම සරල විදියට පෙන්වා දුන්නා. මේ රූපය කියන්නේ රූප සංඥවක්. අර නාම ධර්ම තුළින් මහා භූත ආශ්‍රයෙන් හිතේ ඇති කර ගන්න රූප සංඥවක් පමණයි. නාසිසස් ගැන කියපු කථාව ඔන්න මතක් කර ගන්න. ඒ හෙවනැල්ලත් එක්ක කරන පෙරළියම තමයි මේ මුළු මහත් සංසාරයේම යන්නේ. නාසිසස් තමන්ගේ වතුරේ තියන පිළිඹිබු කරන සවභාවය නොදැනීම නිසා නැවත නැවතත් දෙවඟන වැළඳ ගන්න ගිහිල්ලා මරණයට පත්වුණා. අපිත් විඤ්ඤාණයේ තිබෙන පිළිඹිබු කරන සවභාවය දන්නෙ නැතුව, අපට මේ ඉදිරිපත් වෙන දේවල් ඒවා දේවල් විදියට අරගෙන මිරිඟුව ඔස්සේ යනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ඒකයි. ඒ තත්ත්වය තුළින් ඇතිවන බරපතල කර්මයි එක පැත්තකින් සියුම් අන්දමින් යන්නේ. අන්න අර රූප රාග ආදිය ඔය විදියට ඒවා භවාග්‍රය දක්වා යනවා. අකනිටා බ්‍රහ්ම ලෝකය දක්වා යනවා. ඒකමයි බුදුරජාණන් වහන්සේ 'සංඛාරා පරමා දුකඛා' කිව්වේ. ලෝකයේ තියන සියුම්ම, සියුම්ම දුක තමයි සංස්කාර. එතකොට සංස්කාර නැති කරන්නෙ කොහොමද, අවිද්‍යාව නැති කිරීමෙන්. මේ

පින්වතුන් කල්පනාවට ගන්න අපේ නිවන දේශනාවල මාතෘකාව හැටියට ගත් ඒ පාඨය 'එතං සනතං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං' ඒක මේ කියාපු ගිනි පුළිඟුවේ උපමාවටත් ඇහැකි එකතු කරන්න. මේක ශාන්තයි මේක ප්‍රණීතයි. මොකක්ද සබ්බසංඛාරසමථො, සියලු සංස්කාර සමනය නො කළ නිසයි අර බ්‍රහ්ම ලෝකවල යන්නේ. සබ්බ සංඛාර සමතයත් එක්කම සබ්බූපධි පටිනිස්සග්ගො, උපධි කියන්නේ වත්කම් හැටියට මේ සංසාරයේ ගොඩනගා ගත්තු පඤ්ච උපාදානස්කන්ධයයි. ඒ වත්කම් ටිකයි ඒවා අතහරින තාක් අරවා විඳින්න වෙනවා දුක. එතකොට සබ්බූපධි පටිනිස්සග්ගො කියන්නේ අතීත සංස්කාර, අනාගත සංස්කාර, වර්තමාන සංස්කාර. ඒවා ඔක්කොම අතහරින්න වෙනවා. ඒවා ඔක්කොම අතහැරිය අවස්ථාවයි සබ්බූපධි පටිනිස්සග්ග. ඒ එක්කම යන එකක් තමයි තණ්හක්ඛයො තෘෂ්ණාව ක්ෂය කිරීම. විරාගො අරව ඔක්කොම සේදිල ගිහිල්ලා. විරාග කියන්නේ නොඇල්ම, පූර්ණ නොඇල්ම. ඒ එක්කම භව නිරෝධය. මෙච්චර මේ කරකැවෙමින් තිබුණ මේ චක්‍රය එතනින්ම ඉවර වෙනවා. ඒක අවසාන වෙන්නේ නිවීම නිබ්බානං ඒක තමයි 'නිබ්බානං පරමං සුඛං' මේ පින්වතුන් බොහොම අමාරු අවස්ථාවක මේ ඉදිරියට යන්නේ.

මේ පින්වතුන් නොයෙකුත් විදියට අප ගැන ආශිර්වාද කළාට වැඩි කල් ජීවත් වෙන්නෙ නැති බව අපිට මතක් කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ අවස්ථාවේ තම තමන්ගේ වැඩ ටික කරගන්න උත්සාහවත් වෙන්න ඕන. අද දිනත් මේ දේශනාවෙන් යම් ශක්තියක් මේ පින්වතුන්ටත් ලැබුනා නම් මේ වෙසක් දවසේ ඒක නිකම් අහලා අහක දන්නෙ නැතිව තම තමන්ගේ ප්‍රතිපදාවට උපකාර කර ගෙන අර සටීකාර උපාසක මහත්තයාගේ ජීවිතය ආදර්ශ ස්ථානයේ තබාගෙන තමන් මේ ධර්ම ගමන යන්න උත්සාහ කළොත් අවම වශයෙන්, අවම වශයෙන් අනාගාමිවත් වෙන්න පුළුවන් බව හොඳට විශ්වාස කරන්න ඕන. කවුරු කොහොම කිව්වත් අද දින මේ දේශනාව විශේෂයි. මේක මුල් කරගෙන තම තමන්ගේ ඉදිරි ධර්ම ගමන ශක්තිමත් කරගෙන, මේ පින්වතුන් අද දින මේ රැක්ක ශීලයත්, විශේෂයෙන් උතුම් දවසක් වෙසක් දවස ඒ ශීලයත් උපකාර කරගෙන ඉදිරි වර්ෂය තුළ වඩ වඩාත් උනන්දුවෙන් තම තමන්ගේ බණ භාවනා සඵල කරගෙන

බලාපොරොත්තු වන උත්තමාර්ථයන්ට ළඟා වීමට හැම දෙනාටම ශක්තිය ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා.

අවීචියේ සිට අකනිටා දක්වා කිසියම් සත්ත්ව කෙනෙක් සිටිනවා නම් මේ ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට කැමති එසේ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන සාක්ෂාත් කර ගනිත්වා කියා මේ ගාථා කියන්න.

'එත්තාවතා ච අමෙහහි...'

50 වන දේශනය

50 වන දේශනය
(පහන් කණුව ධර්ම දේශනා අංක 207)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

සමාහිතො සම්පජානො සතො බුද්ධස්ස සාවකො
ආසවෙ ච පජානාති ආසවානඤ්ච සම්භවං
යත්ථ චෙතා නිරුජ්ඣන්ති මග්ගඤ්ච ඛයගාමිනං
ආසවානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතොති

සැදැහැවත් පින්වතුනි,

අරහත් ඵලයේ ඇති විශේෂම ලක්ෂණය තමයි ආශ්‍රවයන් ක්ෂය වීම. ඒ නිසාම තමයි රහතන් වහන්සේලා ඛීණාසව නමින් හැඳින්වෙන්නේත් නිවන ආශ්‍රවක්ෂය නමින් හැඳින්වෙන්නේත්. නිර්වාණගාමී ප්‍රතිපදාව තුළ ආසව කියන වචනයට ලැබෙන වැදගත්කම ඒ අනුව හිතාගන්න පුළුවන්. අද අපි දේශනාවට මාතෘකාව හැටියට ඉතිවුත්තක පාළියෙන් උපුටා ගත්තු ගාථා දෙක ඇත්ත වශයෙන්ම ආසව කියන පදය පිළිබඳ අර්ථ විවරණයකට ප්‍රස්ථාවනාවක් වගෙයි. ඒ සූත්‍රය ආරම්භ කෙරෙන්නේ බුද්ධවචනය උධෘත කරල දක්වතොත් මේ ආකාරයෙන්.

'වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං, තයො මෙ භික්ඛවෙ ආසවා කතමෙ තයො? කාමාසවො, භවාසවො, අවිජ්ජාසවො. ඉමෙ ඛො භික්ඛවෙ තයො ආසවාති.'

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදරන ලදැයි මවිසින් අසන ලද්දේය. 'මහණෙනි, මේ ආසවයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක් ද? කාමාසවය, භවාසවය, අවිජ්ජාසවය, මේය මහණෙනි, ආසවයෝ තිදෙන.' ඉතින් මෙන්න මේ විදියට ආරම්භ කරලා, බුදුරජාණන් වහන්සේ එතෙන්දි ඒ ප්‍රකාශ කල අර්ථය මේ සූත්‍රයේ දක්වන්නේ ගාථා දෙකකින්. ඒ දෙක තමයි අපි මාතෘකා කළේ.

සමාහිතො සම්පජානො - සතො බුද්ධස්ස සාවකො
ආසවෙ ච පජානාති - ආසවානඤ්ච සම්භවං

යස්ස චෙතා නිරුජ්ඣන්ති - මග්ගඤ්ච ඛයගාමිනං
ආසවානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො

මේකෙ අර්ථය - සමාධිමත්ව, සම්පජඤ්ඤය කියන මනා නුවණින් යුක්ත වූ සතිමත් බුද්ධ ශ්‍රාවකයා ආශ්‍රවයන් දැනගන්නවා. ඒ වගේම ආශ්‍රවයන්ගේ හට ගැනීම දැනගන්නවා. යම් තැනක ආශ්‍රවයන් නිරුද්ධ වෙනව නම් එයත් දැනගන්නවා. ඒ නිරුද්ධවීම කරා යන මාර්ගයත් දැනගන්නවා. ආශ්‍රවයන් ගේ ක්‍ෂය වීමෙන් භික්‍ෂුව තෘෂ්ණා කුසගින්න නොමැතිව පිරිනිවියේ වෙයි. මේ ඒ ගාථාවල අර්ථයයි. මේ ගාථා ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන් බුද්ධ ශ්‍රාවකයකු විසින් අවශ්‍යයෙන්ම ආශ්‍රවයනුත්, ආශ්‍රවයන්ගේ හට ගැන්මත්, එහි නිරෝධයත්, එහි නිරෝධගාමිනී ප්‍රතිපදාවත් දැනගතයුතු බව.

ඒවගේම අපට හමු වෙනවා මැදුම් සඟියේ සම්මා දිට්ඨි සූත්‍රය. ඒ සම්මා දිට්ඨි සූත්‍රයේ දී පින්වතුනි, අපේ අග්‍ර ශ්‍රාවක ශාරීපුත්ත මහ රහතන් වහන්සේ සම්මා දිට්ඨිය හඳුන්වන දහසය ආකාරයක් දක්වනවා. සරල එකේ ඉඳල ගැඹුරින් ගැඹුරට යන දහසය ආකාරයකින් සම්මා දිට්ඨිය විග්‍රහ කරනවා. විග්‍රහ කරල අවසානයේදී දහසයවෙනි සම්මා දිට්ඨි විග්‍රහය හැටියට ඉදිරිපත් කරන්නේ ආශ්‍රවයන් පිළිබඳවයි. මේ ආකාරයටයි සාමාන්‍යයෙන් සිංහලෙන් කිව්වොත් ශාරීපුත්ත මහ රහතන් වහන්සේ ඉදිරිපත් කරන්නේ 'යම් අවස්ථාවක ආර්ය ශ්‍රාවකයෙක් ආශ්‍රවයන් දන්නවා නම්, ආශ්‍රවයන්ගේ හට ගැනීම දන්නවා නම්, ආශ්‍රවයන්ගේ නිරෝධයද දන්නවා නම්, ආශ්‍රවයන්ගේ නිරෝධගාමිනී ප්‍රතිපදාව දන්නවා නම්, එතෙකිනුත් ආර්ය ශ්‍රාවකයෙක් සම්මා දිට්ඨිය ඇත්තෙක් වෙනවා.' එහෙම කියල ඊළඟට තේරුම් කරනවා මොනවද මේ ආශ්‍රව තුන - කාමාසවො, භවාසවො, අවිජ්ජාසවො. ඊළඟට ආසව සමුදය දක්වන්නේ 'අවිජ්ජා සමුදයා ආසව සමුදයො' අවිද්‍යාව හටගැනීමෙනුයි ආශ්‍රව හටගන්නේ. ඊළඟට ආසව නිරෝධය කියන එක තෝරන්නේ අවිජ්ජා නිරෝධා ආසව නිරොධො. අවිද්‍යාව නිරෝධ වීමෙනුයි ආශ්‍රව නිරුද්ධ වන්නේ. ආසව නිරෝධගාමිනී ප්‍රතිපදාව හැටියට දක්වන්නේ ආර්ය්‍ය අෂ්ටාංගික මාර්ගයයි. එයින් අපට සම්මා දිට්ඨියට අවශ්‍ය කාරණය ඒ ආශ්‍රව පිළිබඳව ප්‍රකාශ වුණා.

දැන් කෙළින්ම අපි ආසව කියන වචනය දිහා බලමු. ඇතැම් වචන තේරුම් ගැනීමේදී අපට නිරුක්තිය දක්වාම යන්න සිද්ධ වෙනවා. මේ ආසව කියන වචනය හැදිල තියන හැටි බැලුවොත් 'ආසවන්තීති ආසවා.' 'ගලාගෙන එන' කියන අර්ථයෙන් ආශ්‍රව කියල කියනවා. සාමාන්‍ය ව්‍යවහාරයේ ආසව කියන වචනය එනවා, මද්‍ය සාරය පිළිබඳව - මත්පැන් පිළිබඳව. ඒක තුළින් අපට අර්ථ දෙකක් මතුකරගන්න පුළුවන් මේකට අදාළව. මද්‍ය සාරය ගැන හිතල බලන කොට ඒවායේ තියනවා මත් කරන සවභාවයක්. ඒ වගේම එකතැන පල්වීමෙන් පැසවීමෙන් ඇතිවෙන මත්වෙන ගතිය ආසව ලෙස හැඳින්වෙනවා. ඒ වගේම ඒ ආසව එහෙම නැත්නම් මද්‍ය සාරයේ සාරයට, එහෙම නැත්නම් රොඩ්ඩට, ශක්තියක් තියනවා තවත් ඒ වගේම මද්‍ය සාර නිපදවන්න, ඒකට තවත් එකතු කරන දේවල්වලට ගලාගන ගිහිල්ලා, ඒවත් මත්වෙන සවභාවයට පත්කරවන ශක්තියක් මද්‍ය සාරවල තියනවා. මේ අනුව කල්පනා කරල බලනකොට ලෝකයා මත්වෙන ලොකුම මත්වීම් තුනයි බුදුරජාණන් වහන්සේ මේ කාමාසව, භවාසව, අවිජ්ජාසව වශයෙන් දක්වලා තියෙන්නේ. දීර්ඝ කාලයක් කාමයන් තුළම පැළඹීම තුළින් කාමයන් තුළම මත්වෙලා ඒ තුළ පල්වෙලා පැසවලා ඒ ඇතිවන ආශ්‍රවයන් තමා කාමාසව. භවය කියල කියන පැවැත්ම - සිතින් මවා ගත්තු මේ මමය කියල මාගේය කියල සිතාගත්තු ඒ පැවැත්ම තුළ පැළඹිලා ඒ විදියට මත්වෙලා, පල්වෙලා ඇතිකරගත්තු ආශ්‍රව භවාසව. අවිද්‍යාව තුළම අන්ධකාරය තුළම අන්ධකාරයටම කැමැත්තෙන් ඒක තුළම දීර්ඝ කාලයක් පල්වෙලා ආව ආශ්‍රව අවිජ්ජාසව කියලා හිතාගන්න. සාමාන්‍යයෙන් සරල වශයෙන් ගත්තොත් අපට කියන්න තියෙන්නේ මෙන්න මේ ගලාගන ඒම පිළිබඳ අර්ථය මෙතන වැදගත් වන බවයි. ඒකට හේතුව මේ දේශනාව තව ඇතට යනකොට තේරුම් ගන්න පුළුවන්. ඒ වගේම මැදුම් සඟියේ දෙවන සූත්‍රය හැටියට සබ්බාසව සූත්‍රය සංග්‍රහ කරන්න සංගීති කාරක මහ රහතන් වහන්සේලා තීරණය කළේ මොකද, මේ ආසව යන පදය ඒ තරම්ම වැදගත් නිසයි.

සබ්බාසව සූත්‍රය මැදුම් සඟියේ දෙවන සූත්‍රයයි. ඒක ආරම්භ කරන්නේ බුදුරජාණන් වහන්සේ මෙන්න මේ පාඨයෙන්. 'සබ්බාසව සංවර පරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි.' මහණෙනි මම නුඹලාට සියලුම ආශ්‍රවයන් සංවර කරන පරියාය - ක්‍රමය - කියා දෙනවා.

එතකොට මැදුම් සඟියේ පළවෙනි සූත්‍රයේ - මූලපරියාය සූත්‍රයේ තියෙන්නේ 'සබ්බධම්මමූලපරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි' කියලා ඒ සූත්‍රය ආරම්භවන්නේ මහණෙනි, මම හැම දේකම, හිතට එන හැම අරමුණකම මුල් ආකෘතිය, මුල් ක්‍රමය පෙන්නනවා. දේශනා කරනවා කියලා මූලපරියාය සූත්‍රය දේශනා කළා. මෙතෙන්දී සියලු ආශ්‍රවයන් සංවර කිරීමේ ක්‍රමය දේශනා කරනවා කියලා සබ්බාසව සූත්‍රය වදාරණවා. ඊළඟට තව වැදගත් කාරණයක් ආරම්භයේදීම ප්‍රකාශ කරනවා. මේ ආශ්‍රව සංවර කිරීම හෝ ක්ෂය කිරීම ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මෙහෙමයි.

'ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි. නො අජානතො නො අපස්සතො' මහණෙනි, මම කියනවා දන්නහුට දකින්නහුටමයි ආශ්‍රවයන් ක්ෂයවීමක් ඇත්තේ. නොදන්නහුට නොදකින්නහුට නොවේ. අන්න ඒක තුළින් හිතාගන්න පුළුවන් අර අවිද්‍යාවට ඇති සම්බන්ධතාව. අවිද්‍යාව නිසා නම් ආශ්‍රව ඇතිවන්නේ දැනගැනීම දැකගැනීම තුළිනුයි ආශ්‍රව ක්ෂය කරන්න පුළුවන්. අන්න ඒ ටික අපට හිතාගන්න පුළුවන්. ඊළඟට කියවෙනවා 'කිඤ්ච භික්ඛවෙ ජානතො කිඤ්ච පස්සතො ආසවානං ඛයං වදාමි.' කුමක් දැන ගැනීමෙන්ද කුමක් දැකගැනීමෙන්ද ආශ්‍රවයන් ක්ෂයවන්නේ. ඔන්න වැදගත් කාරණයක් එතෙන්දි එළියට එනවා. 'යොනිසො මනසිකාරඤ්ච අයොනිසො මනසිකාරඤ්ච' එතකොට දැනගතයුතු වන්නේ ප්‍රධාන වශයෙන් ආර්ය ශ්‍රාවකයා යොනිසො මනසිකාරයත් අයොනිසො මනසිකාරයත් අතර වෙනසයි. ඒකට හේතුව බුදුරජාණන් වහන්සේ දක්වනවා. ඉස්සෙල්ල කියන්නේ අයෝනිසෝ මනසිකාරයයි. ඒ වචනය අපි මේ පින්වතුන්ට කියල දීල තියන නිසා අමුතුවෙන් විග්‍රහ කරන්න ඕන නැහැ. සාමාන්‍යයෙන් සලකා ගන්න පළමුවෙනි වරට අහන අය. අයෝනිසෝ මනසිකාරය කියන එක තමයි ලෝකයා තුළ වැඩියෙන්ම තියෙන්නේ. 'අනිසි ලෙස මෙනෙහි කිරීම' කියල හිතාගන්න. යෝනිසෝ මනසිකාරය නිසියාකාරයෙන් මෙනෙහි කිරීම. ඔන්න ඉස්සෙල්ල කියනවා අයෝනිසෝ මනසිකාරය ගැන. 'අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙ ව ආසවා උප්පජ්ජන්ති උප්පන්නා ච ආසවා පවඩ්ඪන්ති' අනිසි ආකාර මෙනෙහි කිරීම තුළින් සිදුවන්නේ කුමක්ද? නූපන්නාවූ ආශ්‍රවයන් උපදිනවා. උපන්නාවූ ආශ්‍රවයන් වැඩෙනවා. අනික් පැත්තට. 'යොනිසො ච ඛො

භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙ ව ආසවා න උප්පජ්ජන්ති උප්පන්නා ච ආසවා පහීයන්ති' නිසි ආකාර මෙනෙහි කිරීම තුළින් නූපන්නාවූ ආශ්‍රව උපදින්නෙ නැහැ. උපන්නාවූ ආශ්‍රව ප්‍රහීණ වෙනවා. ඔන්න ඕක තුළ යෝනිසෝ මනසිකාරය අයෝනිසෝ මනසිකාරය කියන වචන දෙකේ වැදගත් කම ගැන, ඉතාමත්ම වැදගත් කාරණයක් මෙතෙන්දි මතු කරනවා. ඇත්ත වශයෙන් ඒ කාරණය ධර්මය පිළිබඳ ප්‍රශ්න කරන බටහිර උගතුන් ඇතුළු බොහෝ දෙනාට ගැටළුවක්. දැන් බැලූ බැල්මට පරස්පර විරෝධී කියමනක්, අර ශාරීපුත්ත ස්වාමීන් වහන්සේගේ ප්‍රකාශය තුළ තියනවා, මොකක්ද? උන්වහන්සේ ආශ්‍රව හඳුන්වා දෙන්නේ කාමාසව, භවාසව, අවිජ්ජාසව යනුවෙන්. එතනත් අවිද්‍යාව කියන වචනය සඳහන් වෙනවා. එතකොට අවිද්‍යාවත් ආශ්‍රවයක්. ඊළඟට ඒ ආශ්‍රවයන්ගේ සමුදය හටගැනීම දක්වනකොට කියනවා 'අවිජ්ජා සමුදයා ආසව සමුදයො' අවිද්‍යාව ඇතිවීමෙන් ආශ්‍රව ඇතිවෙනවා. කල්පනා කරල බලන්න පින්වතුනි, බැලූ බැල්මට උභතෝකෝටික ප්‍රශ්නයක්නෙ, ගැලපෙන්නෙ නැති කියමනක්නෙ. ආශ්‍රවවලිනුත් එකක් අවිද්‍යාව. එහෙම තියෙද්දිත් කියනවා ආශ්‍රවයන් හටගන්නෙත් අවිද්‍යාව නිසා. ඒක ටිකක් ගැඹුරු කාරණයක්. නමුත් අපි කියාපු පල්වීම පිළිබඳ කාරණයත්, දැනගැනීම පිළිබඳ කාරණයත් අනුවයි මෙය විසඳගත යුත්තේ.

මේක නිසාම තමයි සබ්බාසව සූත්‍රයේ පළමුවෙන්ම මේ දර්ශනය මේ දැකීම පිළිබඳව පෙන්නුම් කරන්නේ. මේක විසඳගන්න අමාරු මහ පුදුම ගැටළුවක්. කොනක් සොයාගන්න බැරි අවිද්‍යාවක් ඇවිල්ල තියනවා. නමුත් අවිද්‍යාව තුළ පල්වීම තුළින් අර කියාපු ආකාරයට දිගටම ඇදිල යන ගතියක් තියනවා. ඒක දිගටම ඇදිල යාම වළක්වන සංවර කරන එකම ක්‍රමය තමයි බුදුරජාණන් වහන්සේ මතු කරල දුන්න යෝනිසෝ මනසිකාරය. අපි කලිනුත් කියල තියනවා මේ පින්වතුන්ට, යෝනිසෝ මනසිකාරය ඇත්ත වශයෙන් ගැඹුරින් ගත්තොත් ප්‍රඥාවේ මුල බීජයයි. කෙනෙකුට කියන්න පුළුවන් අපි පෘතග්ජනයො අපට ඇති ප්‍රඥාවක් නැහැ. ප්‍රඥාව තියෙන්නේ රහතන් වහන්සේලාටයි, ආර්යයන් වහන්සේලාටයි කියලා. නමුත් කා ළඟත් තියනවා මනසිකාරය. අපි ඕවා ගැන හුගක් විස්තර කියල තියනවා අපේ පටිච්චසමුප්පාද දේශනාවල. හැම කෙනෙකුටම අයෝනිසෝ කියන එක යෝනිසෝ කර ගන්න පුළුවන්. යෝනිසෝ මනසිකාරය

තමයි ප්‍රඥාවේ මූල බීජය. අන්න ඒ නිසා තමයි බුදුරජාණන් වහන්සේ මතු කරල දක්වන්නේ ආර්ය ශ්‍රාවකයා පළමුවෙන්ම දැනගන්න ඕනෑ දේ, දැක ගන්න ඕනෑ දේ ඒ යෝනිසෝ මනසිකාරයත් අයෝනිසෝ මනසිකාරයත් අතර වෙනසයි. මොකද යෝනිසෝ මනසිකාරය තුළින් තමයි අවිද්‍යාවේ පිටකොන්ද බිඳින්නේ. අපි එහෙම කියමු. මොකද නූපන් අවිද්‍යා ආශ්‍රව නූපදින හැටියටත් උපන් අවිද්‍යා ආශ්‍රව ප්‍රහීණ කිරීමටත් අපට උපකාර වන්නේ යෝනිසෝ මනසිකාරයයි. ඔන්න එතන ඉඳල යමු.

මේ දේශනාව හිතන්න හිතන්න ගැඹුරු පුදුම දේශනාවක්, මැදුම් සඟියේ සඳහන් මේ දෙවෙනි දේශනාව, මුල් දේශනාව වගේම. එතෙන්දි බුදුරජාණන් වහන්සේ තව දුරටත් කියනවා දෙන්නෙක් පිළිබඳව. අශ්‍රැතවත් පෘතග්ජනයා කියන්නේ ධර්මඥනය නැති පුද්ගලයා. ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා කියන එක්කෙනා අනිත් පැත්තෙන්. ඔන්න ඉස්සෙල්ල කියනවා අශ්‍රැතවත් පෘතග්ජනයා පිළිබඳව. අශ්‍රැතවත් පෘතග්ජනයා මෙනෙහි කළ යුතු ධර්ම දන්නෙ නැහැ. නොමෙනෙහි කළ යුතු ධර්ම දන්නෙත් නැහැ. මෙනෙහි කළ යුතු ධර්ම නොදැනීම නිසාත් නොමෙනෙහි කළ යුතු ධර්ම නොදැනීම නිසාත් නොමෙනෙහි කළ යුතු ධර්ම මෙනෙහි කරනවා. මෙනෙහි කළ යුතු ධර්ම මෙනෙහි කරන්නෙ නැහැ. ඊළඟට ඒකෙ ආදීනවත් පෙන්නුම් කරනවා. අර කලින් කියාපු ආකාරයට නොමෙනෙහි කළ යුතු ධර්ම මෙනෙහි කිරීම තුළින් නූපන්නාවූ කාමාශ්‍රව, භවාශ්‍රව, අවිද්‍යාශ්‍රව උපදිනවා. උපන්නාවූ ආශ්‍රව වැඩෙනවා. කෙටියෙන් සලකාගන්න, කලින් කියාපු ආකාරයට එතකොට යෝනිසෝ මනසිකාරය තුළින් නූපන්නාවූ ආශ්‍රව උපදින්නෙත් නැහැ. උපන් ආශ්‍රව වැඩෙන්නෙත් නැහැ. අන්න ඒකයි ආනිශංසය. එතකොට යෝනිසෝ මනසිකාරය නොදැනීම නිසා අශ්‍රැතවත් පෘතග්ජනයා 'අයෝනිසො' වැරදි විදියට මෙනෙහි කරනවා.

ඊළඟට වැරදි විදියට මෙනෙහි කරන ක්‍රම දක්වල තියනවා ඒ සූත්‍රයේ. හුඟක් කියන්න තියන නිසා කෙටියෙන් කියන්න උත්සාහ කරනවා. මේවා ගැන යම් යම් අවසථාවල සඳහන් කරලත් තියන නිසා, බුදුරජාණන් වහන්සේ අශ්‍රැතවත් පෘතග්ජනයාගේ චින්තන ක්‍රමය ගැන මෙහෙමයි දක්වන්නේ. ඒ තැනැත්තා අනිසි ආකාරයට මෙනෙහි කරන්නේ කොහොමද? මම කියන සංකල්පය ඉස්සරහට දගෙන.

ඔන්න අතීතය ගැන අශ්රැතවත් පෘතග්ජනයා මෙහෙම හිතනවා. 'මම අතීතයෙහි වූයෙම් ද, අතීතයෙහි නො වූයෙම් ද, අතීතයෙහි කවරෙක් වූයෙම් ද, අතීතයෙහි කෙසේ වූයෙම් ද, කවරෙක් වී කවරෙක් වූයෙම් ද' මම කියන කථාව ඉස්සරහට දලයි මේ විදියට තර්ක විතර්ක මෙනෙහි කරන්නේ. ඊළඟට අනාගතය ගැනත් මෙහෙමයි මෙනෙහි කරන්නේ. මම අනාගතයෙහි කවරෙක් වන්නෙම් ද, අනාගතයෙහි මම නො වන්නෙම් ද, අනාගතයෙහි කෙසේ වන්නෙම් ද, අනාගතයෙහි කවරෙක් වී කවරෙක් වන්නෙම් ද? ඒ අනාගතය පිළිබඳව. වර්තමානය පිළිබඳවත් ඇතුළතින් සැකයක් උපදවා ගන්නේ මේ විදියටයි. මම ඉන්නවද, මම නැද්ද, මම කවරෙක්ද, මම කෙසේ කෙනෙක්ද. ඊළඟට තියෙන්නේ මේ සත්ත්වයා කොහෙන්ද ආවෙ, කොහාටද යන්නෙ - මම කියල කියන එක ආත්මය බව පේනවා - මේ ඔක්කොම වෙන්නේ මම කියන එක ඉස්සරහට දල අයෝනිසෝ මනසිකාරයෙන් තර්ක කරන්නට පටන් ගත්තු නිසා. ලෝකයා තුළ - අනෙක් හැම ආගමකම තියෙන්නේ ඔය අයෝනිසෝ මනසිකාරයෙන් හදගත්තු දේයි.

බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා ඒ විදියට අතීතය පිළිබඳවත් අනාගතය පිළිබඳවත් වර්තමානය පිළිබඳවත් මෙනෙහි කිරීම තුළින් දෘෂ්ටි හයකින් එකකට වැටෙන බව. මොනවද ඒ දෘෂ්ටි හය. එක්කො දැඩිව ගන්නව 'මට ආත්මයක් තිබේ.' එහෙම නැත්නම් මට ආත්මයක් නැත - අත්‍ථි මෙ අත්‍තා. නත්‍ථි මෙ අත්‍තා. ඒක දැඩිව ගන්නවා. සත්‍ය දෘෂ්ටියක් හැටියට. එහෙම නැත්තම් හිතනවා මම ආත්මයෙන් ආත්මය හඳුනගන්නවය. එහෙමත් නැත්තම් අනාත්මයෙන් අනාත්මය හඳුනගන්නවය. එහෙමත් නැත්තම් අනාත්මයෙන් ආත්මය හඳුනගන්නවය. අන්තිම හයවෙනි එක වශයෙන් දක්වන්නේ කථා කිරීමේ, විඳීමේ ශක්තිය ඇති මේ සසර හොඳ නරක කර්ම විපාක විඳින මේ මගේ ආත්මය - අන්න ආත්මය කියන එක පැහැදිලි කරන ආකාරය - සදාකාලිකයි, සථිරයි, ශාස්වතයි, වෙනස් වෙන්නේ නැහැ. අන්න දැඩිවම ආත්ම දෘෂ්ටියේ පිහිටියා. ඒ ආකාරයට දෘෂ්ටි හයකින් එකකට වැටෙනවා. ඒ අශ්‍රැතවත් පෘථග්ජනයා.

ඊළඟට ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාගේ චින්තනය. එයා මෙනෙහි කළ යුතු ධර්ම දන්නවා. නො මෙනෙහි කළ යුතු ධර්මත් දන්නවා. නො මෙනෙහි කළ යුතු ධර්ම මෙනෙහි කිරීම නිසා ඇතිවන ආදීනවත්

දන්නවා. ඒවා ගැන අපි කෙටියෙන් සලකා ගනිමු. මෙනෙහි කළ යුතු ධර්ම මොනවද කියලා. ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්වනවා. කොහොමද එයා මෙනෙහි කරන්නේ, මෙය දුකයි කියල 'ඉදං දුක්ඛන්ති' මේ දුකට හේතුවයි කියල මෙනෙහි කරනවා. මේ දුක්ඛ නිරෝධයයි කියල මෙනෙහි කරනවා. මේ දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාවයි කියල මෙනෙහි කරනවා. කොටින්ම කියතොත් චතුරාර්යසත්‍යය අනුව මෙනෙහි කිරීමයි. මමය, පුද්ගලයාය යන කථාන්තර නැතිව චතුරාර්යසත්‍යය අනුව මෙනෙහි කිරීමයි යෝනිසෝ මනසිකාරය. ඒ මෙනෙහි කිරීමේ අවසාන කෙලවර වශයෙන් බුදුරජාණන් වහන්සේ දක්වන්නේ ඒ මෙනෙහි කිරීම තුළින් ඒ ආර්ය ශ්‍රාවකයා - ඒක පිළිබඳව කාල සීමාවක් නැතත් - ඇතැම් විට ක්ෂණිකව ඇතැම් විට පහුවෙලා හරි ඒ මෙනෙහි කිරීම තුළින්ම සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස කියන සංයෝජන තුන කඩා ගන්නවා. ඒ ආර්ය ශ්‍රාවකයා පිළිබඳව. ඔන්න එතකොට ඒ දර්ශනය. ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා සංවර ක්‍රම හය. 'අත්ථි භික්ඛවෙ ආසවා දස්සනා පහාතබ්බා,' මහණෙනි, ආශ්‍රවයන් තියනවය දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු. අපි කෙටියෙන් සඳහන් කරමු. සංවර කිරීම තුළින් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන් තියනවා. පටිසේවනය කියල කියන්නේ පාවිච්චි කිරීම. එහෙම නැත්නම් ප්‍රතිසේවනය කිරීම තුළින් සංවර කළ යුතු ආශ්‍රවයනුත් තියනවා. අධිවාසනා කියල කියන්නේ ඉවසීම තුළින් සංවර කළ යුතු ආශ්‍රව තියනවා. ඊළඟට පරිවජ්ජන කියන වර්ජනය කිරීම - මග හැරීම - තුළින් ජය ගත යුතු, සංවර කර ගත යුතු, ආශ්‍රවත් තියනවා. ඊළඟට 'විනොදනා' කියන දුරු කිරීම තුළින් සංවර කර ගත යුතු ආශ්‍රවත් තියනවා. අවසානයට කියනවා භාවනාව තුළින් සංවර කර ගත යුතු ආශ්‍රවත් තියනවා. ඔය එක එකක් අපි කෙටියෙන් සළකා ගනිමු.

දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස කියන ඒවායි. ඒවා අර කියාපු මනසිකාරය තුළින් ප්‍රහාණය කළ යුතු වෙනවා. ඒ නිසාමයි බුදුරජාණන් වහන්සේ වදාළේ - මේ පින්වතුන් සිහිපත් කර ගන්න, 'සහාවස්ස දස්සන සම්පදාය තයස්සු ධම්මා ජහිතා භවන්ති' කියලා. ඊළඟට මතක් කර ගන්න 'දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනෙන සම්පන්නො' ඒ ඔක්කොම දර්ශනයේ ඇති වටිනාකම, දර්ශනයෙන්

ප්‍රහාණය කරනව මිසක් වෙන ක්‍රමයකින් ප්‍රහාණය කරන්න බැහැ. අල්ලල ඉවතට දන්න බැහැ. සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස ප්‍රහාණය කළ යුත්තේ දැකීමෙන්මයි. අර කියාපු චතුරාර්ය සත්‍යය අනුව මෙනෙහි කිරීමෙන්මයි. වැරදි දෘෂ්ටිය ගැන කියන කොට බුදුරජාණන් වහන්සේ යොදන වචන ටික සඳහන් කරන්න බැරි වුණා. අශ්‍රැතවත් පෘථග්ජනයා මේ චින්තනය කෙළවර කරන හැටි බුදුරජාණන් වහන්සේ මහ පුදුම වචන මාලාවකින් කියනවා. මහණෙනි මේක අන්තිමට දිට්ඨිගතං, දිට්ඨිගහනං, දිට්ඨිකන්තාරං, දිට්ඨිවිසූකං, දිට්ඨිවිප්ඵන්දිතං, දිට්ඨිසංයෝජනං ... ඔහොම වචන රාශියක් තියනවා. ඒ තැනැත්තා අර දෘෂ්ටි තුළින් ගිහිල්ලා දෘෂ්ටි කාන්තාරයක වනලැහැබක අතරමං වෙනවා. ඒ තැනැත්තා කවදාවත් ජාති, ජරා, මරණවලින් මිදෙන්නෙ නැහැ, අර කියාපු අශ්‍රැතවත් පෘථග්ජනයා. ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා, 'මම' ඉස්සරහට ගන්නෙ නැතුව බුදුරජාණන් වහන්සේලා පමණක් සාමුක්කංසික දේශනා වශයෙන් ඉදිරිපත් කළ චතුරාර්‍ය සත්‍යය අනුව මෙනෙහි කිරීමෙන් මෙතෙක් කඩා ගන්න බැරි වුණ සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස කඩාගන්නවා.

ඊළඟට 'සංවරයෙන් ප්‍රහාණය කළ යුතු' කියන තැනදී කෙටියෙන් සළකා ගන්න. 'ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා' ඒ කියන්නේ ඉන්ද්‍රියයන් සංවරය පිළිබඳවයි. 'විඝාතපරිළාහ' කියන යෙදුම මේ සංවරය ගැන කියනකොට දැක්වෙනවා, යම් විදියකට වැරදි මෙනෙහි කිරීම් තුළින් 'විඝාතපරිළාහ' කියන වචනයත් එතන යෙදෙනවා. ඉන්ද්‍රියයන් අසංවර කිරීම තුළින් යම් වෙහෙස පරිළාහ දැවිලි ඇතිවෙනවා නම් සංවර කිරීම තුළින් ඒවා නැතිවෙනවා. ටිකක් හිතල බලන්න, ඇස සංවර නොකිරීම තුළින් යම් ආශ්‍රව එන්න පුළුවන් නම් වෙහෙස දැවිලි ඇතිවෙන, ඇස සංවර කිරීම තුළින් ඒවා නැතිවෙනවා. ඒ වගේම ඇස, කන, නාසය, දිව, කය, මනසත් ඇතුළුව ඒ ආයතන හය ගැන ඒ ආකාරයට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඔන්න ඒ 'සංවරා පහාතබ්බා' ගැනයි. ඒ යම් ආශ්‍රවයන් ඉන්ද්‍රිය අසංවර කර ගැනීම තුළින් ගලාගන එනවා නම් සංවර කර ගැනීම තුළින් ඒවා නැති වෙනවා. ඒවා ආශ්‍රය කර ගෙන ඇතිවෙන 'විඝාතපරිළාහ' කියන ඒ වෙහෙස දැවිලි ආදිය නැති වෙනවා. ඒ සංවරා පහාතබ්බා.

ඊළඟට 'පටිසෙවනා පහාතබබා' ප්‍රතිසේවනය කියල කියන්නේ පින්වතුනි, අපේ වචනයෙන් කියනවා නම් පාවිච්චි කිරීම. එතනදී දක්වන්නේ බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාට ජීවත් වීම සඳහා ඇත්තවශයෙන් අවශ්‍ය අවම ටික තමයි. වස්ත්‍රය, ආහාරය, සේනාසනය, ගිලන්පස. ඇත්තවශයෙන් මේ හැම සංවරයක් ගැන සඳහන් වන තැන්වල 'පටිසඞ්ඛා යොනිසො' කියන වචනය සඳහන් වීම වැදගත්. යෝනිසෝ මනසිකාරය කියන වචනයට දීපු වැදගත් කමම තමයි, 'යොනිසො' කියන්නේ නුවණින් සළකා බලමින්. ඉන්ද්‍රිය සංවරය ගැන කියන කොටත් 'පටිසඞ්ඛා යොනිසො' නුවණින් සළකා බලමින් ඇස වහගන්නවා. ඇත්තවශයෙන්ම ඉන්ද්‍රිය සංවරය ගැන කියන කොට ඇහැ, කන, නාසය වහගන ඉන්න බැහැනෙ. ඒ වෙනුවට අපි පෙන්වා දුන්නා නියම වචනය. 'ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා' ඉන්ද්‍රියයන් පිළිබඳ දොරටු පාලයෙක්, රක්නා ලද දොර ඇති බව කියන්නේ අවසථානුකූලව දොර වහගන්න පුළුවන් වෙන්න ඕන. ඒකයි සංවරය. සංවරය වෙන්නෙ ඒක අනුවයි. ඒක 'පටිසඞ්ඛා යොනිසො' නුවණින් සළකා බලා අවසථානුකූලව ඇහැ, කන, නාසය වහගන්නවා අර කියාපු කෙලෙස් අරමුණුවලින්.

ඒ වගේම දැන් මෙතෙන්දි අපි හිතමු වස්ත්‍රයක් අවශ්‍යනෙ ඒකෙ අවම ප්‍රයෝජනය සලකාගෙන ප්‍රත්‍යවේක්ෂා පාඨයේ කියන ආකාරයට '**පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවාමි යාවදෙව සීතසස පටිඝාතාය උණහසස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසප සමඵසසානං පටිඝාතාය යාවදෙව හිරිකොපීන පටිචඡාදනත්‍ථං**' ඔය විදියට සීතල උෂ්ණය මැසි මදුරු ආදීන්ගෙන් සිදුවන පීඩා වැලැක්වීමටත් ඒවගේම 'හිරිකොපීන පටිචඡාදනත්‍ථං' විලි වසාගැනීම සඳහා කියලා අවම ප්‍රයෝජනය ගැන සලකාගෙන චීවරය පරිහරණය කරනවා. ඊළඟට පිණ්ඩපාතය පිළිබඳව 'පටිසඞ්ඛා යොනිසො' ඒව ගැන අපි කොතෙකුත් කියල තියනවා. මේ පින්වතුනුත් යම් ප්‍රමාණයකට කරනවත් ඇති. ඒ ප්‍රත්‍යවේක්ෂාව ආහාරය පිළිබඳව. නුවණින් කල්පනා කරලා මේ ආකාරයට මම මේ ආහාරය ගන්නේ '**නෙව දවාය න මදය, න මණ්ඩනාය, න විභූසනාය**' ආදී වශයෙන් සාමාන්‍ය පුද්ගලයින් ගන්නවා වගේ නොවෙයි. විනෝද වීමට, ශරීරය වඩා ගැනීමට නොවෙයි. 'යාවදෙව ඉමසස කායසස ඨිතියා.' 'හුදෙක්' අන්න හුදෙක් වචනය ඉස්සර වෙනවා. හුදෙක් මේ කය පවත්වා

ගැනීම සඳහා **ඨිතියා යාපනාය** යැපීම සඳහා **විහිංසූපරතියා** බඩගිනි වේදනාව නැති කරලා බ්‍රහ්මචරියාවට අනුග්‍රහයක් හැටියට, ආහාර නොගෙන ඉන්න බැරි නිසා ගන්නවා. මේ විදියට පැරණි වේදනාව නැතිකර ගන්නවා මේ ආහාර ගැනීමෙන්. වැඩිපුර ආහාර ගැනීමෙන් හට ගන්නා අලුත් වේදනා ඇති කර ගන්නේ නැහැ. මගේ පහසු විහරණය සැලසීම සඳහා කියලා භාවනාවට ගැලපෙන විදියට සලකලා ඒ ආහාරය ගන්නවා. ඊළඟට සේනාසනය පිළිබඳවත් වස්ත්‍ර ගැන කිව්ව ආකාරයටයි තියෙන්නේ. සීතල, උෂ්ණ, මැසි, මදුරු ආදී පීඩනයන් ගෙන් බේරීම සඳහාත් 'යාවදෙව උතුපරිස්සය විනොදනං.' ඍතුවලින් ඇතිවන පීඩනයන් වලක්වා ගැනීම සඳහාත්. අවම වශයෙන් ගිලන්පස ගැන කියන්නෙත් ඒ විදියටමයි. 'උප්පන්නානං සාරීරිකානං වෙයාබාධිකානං වෙදනානං' උපන්නා වූ ශාරීරික වේදනා දුරුකර ගැනීම සඳහා, ඒවා නො ගෙන හිටියොත් අර කියාපු දැවිලි ඇතිවන නිසා බේත් හේත් ගන්නවා. ඒවා තමයි 'පටිසෙවනා පහාතබ්බා' ප්‍රතිසේවනයෙන් පාවිච්චියෙන් දුරු කර ගත යුතු ආශ්‍රව.

ඊළඟට කියනවා 'අධිවාසනා පහාතබ්බා' ඉවසීම තුළින්, මොනයම් හේතුවකින් හරි අර කියාපු අවම අවශ්‍යතා අපට නො ලැබුනා නම් ඒකට කෑ කෝ ගහල හිත දූෂ්‍ය කරගන්නේ නැතුව ඉවසන්න පුරුදු වෙන්න ඕන. ඉවසන දේවල් ගැන සඳහන් කරන්නේ මෙහෙමයි. යම්කිසි භික්ෂුවක් පිළිබඳව 'ඛමො' හොති. ඒ ඉවසීමේ ශක්තිය තියනවා. සීතල, උෂ්ණය, කුසගින්න, පිපාසය, මැසි මදුරු ආදී කරදර ආවොත් ඒව නවත්ත ගන්න බැරිනම්. ඒ වගේම රෝග පීඩා, බරපතල වේදනා ආදිය, ඒවා ඉවසීමේ ශක්තිය ඇතිකර ගන්නවා. 'දුරුත්තානං, දුරාගතානං වචනපථානං' අනික් අය කියන අපවාද ආදිය දරා ගැනීමේ ශක්තිය ඔන්න ඔය විදියට යම් යම් දේවල් දරා නො ගැනීම නිසා නො ඉවසීම නිසා උපදින්න පුළුවන් නම් වෙහෙස දැවිලි ආදිය ඉවසීම තුළින් ඒක නැති වෙනවා. අන්න 'අධිවාසනා පහාතබ්බා.'

ඊළඟට කියනවා 'පරිවජ්ජනා පහාතබ්බා' වර්ජනය කිරීම් මගහැරීම් තුළින් ඒකට නිදර්ශන හැටියට දක්වන්නේ මේ ආකාරයටයි. යම්කිසි භික්ෂුවක් චණ්ඩ ඇතුන්, අසුන්, බල්ලන්, ඒ විදියෙ සතුන් මගහරිනවා. ඊළඟට කටුමුල් ආදිය මගහරිනවා. එපමණක් නොවෙයි

තමන්ට අපකීර්තිය එන්න පුළුවන් පාපක මිත්‍රයින් ඇසුරු කිරීම්, අගෝචර ස්ථාන ඇසුරු කිරීම් ඒ විදියේ දේවල් දුරු කරනවා. දුරින්ම දුරු කරනවා. මොකද ඒවා දුරු නො කිරීම තුළින් තමන්ට අපවාද ආදී නොයෙකුත් කරදර එන්ට පුළුවන් නිසා 'විඝාතපරිළාහ' ආදිය එන්ට පුළුවන් නිසා. ඒවා වර්ජනය තුළින් ජයගන්න පුළුවන්. ඒකත් සංවර ක්‍රමයක්.

ඊළඟට කියනවා 'විනොදනා පහාතබ්බා.' විනෝදන කියන්නේ දුරු කිරීම විනෝදවීම නොවෙයි. අන්න එතෙන්දි දක්වන්නේ සාමාන්‍යයෙන් ගිරිමානන්ද සූත්‍රයේ පහාන සඤ්ඤා හැටියට දක්වන කාරණාමයි. මොනවද ඒ යම්කිසි භික්ෂුවක් 'උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති අනභාවං ගමෙති' ඔය විදියටයි කියන්නේ. කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක, උපන්න උපන්නාවූ පාපක අකුසල ධර්ම ඒවා පිළිබඳව ගත යුතු ප්‍රතිපත්තිය මොකක්ද, දුරු කරනවා. ඒ දුරු කිරීම පිළිබඳ යෙදෙන වචන සමූහයත් ඉතාම වැදගත්. ටිකක් ගැඹුරින් කල්පනා කරල බැලුවොත්, නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, කියන ඒ වචන අපි පුංචි උපමාවකින් කියමු. අපි හිතමු මේ පින්වතුන්ගේ ගෙදරට වැදගත් වැඩක් කරගෙන ඉන්න අතරේ කවුරු හරි වැදගැම්මකට නැති බේබද්දෙක් එනවා. අපි කියනවා තමුසෙ මෙතෙන්ට ඕන නැහැ යනවා කියලා. මෙයා ඒක අහන්නෙ නැහැ. ඇතුළු වෙන්න හදනවා. තල්ලු කරල දනවා එළියට. ඒ වුණාට මිනිහා ආපහු එන්න හදනවා. ඊළඟට මොකද කරන්නේ තව ඈතට තල්ලු කරගෙන තල්ලු කරගෙන ගිහිල්ලා මේ බේබද්ද ගේට්ටුව ළඟටම ගෙනියනවා. ඊළඟට ගේට්ටුවෙනුත් එළියට තල්ලු කරලා ගේට්ටුව වහනවා. අන්න ටිකක් හිතන්න ඒ විදියට නාධිවාසෙති කියන්නේ නො ඉවසයි. පළමුවෙන් කියාපු පියවර. තමුසේ මෙතෙන්ට අවශ්‍ය නැහැ යන්න කියනවා. 'නාධිවාසෙති, පජහති' - ආයෙත් යන්න කියනවා. විනොදෙති - තල්ලු කරගෙන යනවා. බ්‍යන්තීකරොති - කියන්නේ අන්න වත්තෙ කෙළවරටම තල්ලු කරගෙන ගිහිල්ලා ගේට්ටුවෙන් එහා පැත්තට දලා, අනභාවං ගමෙති - එන්න බැරි විදියට යතුරු දනවා. ඔය පොඩි උපමාවකින් කිව්වෙ. අන්න ඒ විදියට කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක, පාපක අකුසල ධර්ම දුරු කිරීම තුළින් සංවර විය යුතුයි. මොකද එසේ සංවර නො කිරීම තුළින්

යම් වෙහෙසක්, දැවිල්ලක් ඇති වෙනවා නම් සංවර කිරීම තුළින් ඒවා නැති වෙනවා.

අන්තිමට තියෙන්නේ භාවනා. 'අත්ථි භික්ඛවෙ ආසවා භාවනා පහාතබ්බා.' වැඩීම තුළින් දුරු කළ යුතු ආශ්‍රව තියනවා. ඒවා මොනවාද, එතෙන්දි කෙලින්ම දක්වන්නේ සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා කියන ඒ බොජ්ඣඞ්ග ධර්ම. ඒවත් නිවනට නැඹුරු කරලා වඩන හැටියට. 'ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවේකනිස්සිතං, විරාග නිස්සිතං, නිරොධ නිස්සිතං, වොස්සග්ගපරිණාමිං' ඒ විදියට අනිත් ඒව ගැනත් සිතාගන්න. සති, ධම්මවිචය ආදී බොජ්ඣඞ්ග, 'විවෙක නිස්සිතං' ආදී ඒ වචන හතරෙන්ම කියන්නේ නිවනයි. විවේක නම් වූ නිරෝධ නම් වූ නිවන ආශ්‍රය කරගෙන නිවනට එල්ල කරගෙන සති, ධම්මවිචය ආදී බොජ්ඣඞ්ග වඩනවා. එතෙන්දිත් කියන්නේ ඒවා නො වැඩීම තුළින් යම් වෙහෙස දැවිලි ආදිය ඇති වෙනව නම් වැඩීම තුළින් ඒවා නැති වෙනවා. ඔය සාමාන්‍ය හැඳින්වීම. මේවා තෝරන්න ගිහිල්ලා දස්සන කියන එක මුලට එන නිසා කෙනෙක් හිතනවා එහෙනම් සෝවාන් වෙන්න ඒ දර්ශනය ඇතිකර ගන්න බණ ඇහැව්වම ඇති. අනිත් ඒවා ඕන නැහැ. අර කියාපු ආහාර ප්‍රත්‍යවේක්ෂා ආදී අනෙක් කටයුතුත් ඕන නැහැ. භාවනාවකුත් ඕන නැහැ. ඒ වැරදි අදහසක්. බුදුරජාණන් වහන්සේ යම් දේශනාවක් ඉදිරිපත් කළා නම් හරි ක්‍රමානුකූලයි. අර දර්ශනය වැදගත්. 'සම්මා දිට්ඨි පුබ්බංගමා' සම්මා දිට්ඨිය පෙරටු වෙනවා. අපි කිව්වනේ අවිද්‍යා ආශ්‍රවය, දිට්ඨි ආශ්‍රවය, ඒවා මර්දනය කරල ඕනෑ අනිත් ඒවා ඔක්කොම කරන්න. ඒක ඉබේ පහලවෙන දෙයක් නොවෙයි. ඒවට අදාළයි අනික් ඒවත්. ඒක නිසා එහෙම හිතන්න නරකයි. අර අනික් ඒවත් භාවනාවටම අදාල දේවල් තමයි. නමුත් අවසානයේ ක්‍රමානුකූලව දැක්වූවා. භාවනා පහාතබ්බා අන්තිමට බොජ්ඣඞ්ග භාවනාව ඒ විදියට කෙටියෙන් සලකාගන්න.

අපි සබ්බාසව සූත්‍රයේ සාරාංශ වශයෙන් අර කියාපු ආශ්‍රව ප්‍රහාණ ක්‍රම හතක් දැක්වූවා. ඒක අවසාන කරන්නේ බුදුරජාණන් වහන්සේ යම් කිසි භික්ෂුවක් යම් ආශ්‍රවයන් දර්ශනයන්ගෙන් ප්‍රහාණ කළ යුතුද, ඒ ආශ්‍රවයන් දර්ශනයෙන් ප්‍රහාණ කළාද, යම් ආශ්‍රවයන් සංවරය තුළින් ප්‍රහාණය කළ යුතුද, ඒ ආශ්‍රවයන් සංවරය තුළින් ප්‍රහාණය

කළාද පටිසේවන කියල කියන්නේ පාවිච්චිය තුළින් ප්‍රහාණය කළ යුතුද, පාවිච්චිය තුළින් ප්‍රහාණය කළාද, යම් ආශ්‍රවයන් ඉවසීම තුළින් ප්‍රහාණය කළ යුතුද, ඒ ආශ්‍රවයන් ඉවසීම තුළින් ප්‍රහාණය කළාද, යම් ආශ්‍රවයන් මග හැරීම තුළින් ප්‍රහාණය කළ යුතුද, ඒවා මග හැරීම තුළින් ප්‍රහාණය කළාද, යම් ආශ්‍රවයන් දුරු කිරීම තුළින් ප්‍රහාණය කළ යුතුද, ඒවා දුරු කිරීම තුළින් ප්‍රහාණය කළාද, යම් ආශ්‍රවයන් වැඩීම - භාවනාව - තුළින් ප්‍රහාණය කළ යුතුද, ඒවා වැඩීම - භාවනාව - තුළින් ප්‍රහාණය කළාද, ඒ භික්ෂුව තණ්හාව ක්ෂය කළා. ඔක්කොම නීවරණ, ඔක්කොම සංයෝජන අනිත් පැත්ත හැරෙව්වා. රහත් වුණා. එතකොට අරහත්වයයි මේ සබ්බාසව සූත්‍රයේ කෙළවර.

ඊළඟට අපි දැන් මේ සූත්‍රය ගැන තව ටිකක් හිතන්න බලමු. ඒකෙ තව ගැඹුරට යන්න දේවල් තියනවා. දැන් මේ ආසව ගැනයි අපි කථා කළේ. ආසව කාමාසව, භවාසව, අවිජ්ජාසව, ඇතැම් තැන්වල දිට්ඨාසව කියල එකකුත් තියනවා. අපි කලින් සඳහන් කළානේ මත් කරවන ගතිය තුළ ඉදිරියට ගලාගෙන යන ස්වභාවයක් ඇති බව. කාමයන් තුළ පෙළඹීම් තුළ අර මත් වන ගතිය ඒකට තවත් පෙළඹවීම් එන ගතිය තියනවා. ඊළඟට දිට්ඨිය පිළිබඳවත් එහෙම තමයි. දීර්ඝ කාලයක් දිට්ඨිවල ඉන්න එක්කෙනෙක් ඒවායින් මුදගන්න බැහැ. ඒ තරමට ඒවායේ පටලැවිලා. ඇතැම් තැන්වල දිට්ඨාසව කියලත් කියනවා. නමුත් ඒක සාමාන්‍යයෙන් අවිද්‍යාවටම අයිතියි. භවාසව කියල කියන්නේ භවයේ පැවැත්ම කියන එකයි. පැවැත්ම පිළිබඳ තියන තෘෂ්ණාව භව තෘෂ්ණාව බොහොම බරපතල එකක්නේ. ඊළඟට අවිද්‍යාව අන්ධකාරයට කැමති බව, ආලෝකයට අකමැති බව අන්ධකාරයෙන් තමයි සතුටු වන්නේ. ආලෝකයට කැමති නැහැ. ඔය කියාපු කාමාසව, භවාසව, අවිජ්ජාසව, ඇතැම් තැන්වල දිට්ඨාසව කියලත් කියන බව සලකා ගන්න.

ඔන්න ඊළඟට තියනවා 'ඕඝ' කියලා වචනයක්. ඒක ඔය කිට්ටුවෙන් යන වචනයක්. ඔය දෙක අතරේ වෙනසත් අපි පෙන්නුම් කරන්න ඕන. මීට කලින් අවස්ථාවක යම්තමින් පෙන්නුම් කළා. දැන් මේ ඕඝ යන වචනයේ වටිනාකම කොයි තරම්ද කියනව නම්, ඒත් අර සංගීති කාරක මහ රහතන් වහන්සේලා කොතෙකුත් සූත්‍ර තියෙද්දිත් සංයුත් සඟියේ පළමුවෙනි සූත්‍රය හැටියට ඉදිරිපත් කළේ ඕඝ තරණ

සූත්‍රයයි. මෙහෙමයි කෙටියෙන් කියතොත්. රාත්‍රියේදී දේවතාවෙක් ඇවිල්ල බුදුරජාණන් වහන්සේගෙන් අහනවා, කෙසේද නිදුකාණෙනි - මාරිස - ඔබ මේ සැඩ වතුරෙන් එතර වුණේ? සැඩ වතුරු හතරක් තියනවා. කාමෞස, භවෞස, දිට්ඨෞස, අවිජ්ජෞස කියලා. කාම සැඩ වතුරු, භව සැඩ වතුරු, දිට්ඨි සැඩ වතුරු, අවිජ්ජා සැඩ වතුරු කියලා හතරක්. මේ ඕඝ හතරෙන් කොහොමද එතර වුණේ කියලා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා. බුදුරජාණන් වහන්සේ කියනවා, ඒක හරි ප්‍රහේලිකා විදියේ ගාථාවකින් පුංචි පිළිතුරක් දෙන්නේ. මම 'අප්පතිට්ඨං අනායූහං' මේක සිංහලට නැඟුවොත් 'මම නොනවතිමින් නොදඟලමින් සැඩ වතුරින් එතර වුණා.' මොකද එහෙම කිව්වෙ කියල ඇහුවහම දේවතාවට තව විස්තර කරනවා. මම මේ සැඩ වතුරේ නැවතුනහොත් ගිලා බහිනවා. දඟලුවොත් ගසාගෙන යනවා. ඒක නිසා මම නවතින්නෙත් නැතුව දඟලන්නෙත් නැතුව සීරුවෙන් එතර වුණා. ඒකයි සූත්‍රය. නමුත් මහ ගැඹුරු අර්ථයක් මෙතන තියෙන්නේ. අපි කලින් අවස්ථාවකත් පෙන්වා දුන්නා. මෙතනම මැදුම් පිළිවෙත තියනවා. මධ්‍යම ප්‍රතිපදාව. ඒකයි අපි ප්‍රායෝගික සාපේක්ෂක ආදී වචනවලින් පෙන්නුවේ. මේ කථාව ඕඝ පිළිබඳවයි.

දැන් අපි ආසව කියන වචනය මේකට කිට්ටු කරන්න බලමු. දොළපාරක් ළඟට ගියහම අපට පේනවා ඔහේ ගලාගන යන සැඩ වතුර පාරක්. අපට ඕනෑ වෙනවා මෙතනින් එතර වෙන්න. එතර වෙන්න මේකට අඩිය තිබ්බට පස්සේ අපට මේක ඕඝ හැටියට <u>ගලායන</u> වතුර හැටියට නොවෙයි පෙනෙන්නේ, <u>ගලාඑන</u> වතුරක් හැටියට. හිතල බලන්න. අපි අඩිය තිබ්බ හැටියේ අපේ තිබ්බ අඩියවත් විශ්වාස නැහැ. ගසාගන යනවා. ඊළඟ අඩිය තියන්නත් බැහැ. ඔහේ වතුර පාරට ගහගෙන යනවා. එතකොට අර එකම ඕඝය දිහා බලන්නේ ගලාගෙන යන වතුරක් හැටියට නොවෙයි. ගලාගෙන එන වතුරක් හැටියටයි. අන්න ආසව පදය. ආර්ය ශ්‍රාවකයා මේ සැඩ වතුර හතරෙන් එතර වීමේදී මේ කියන ප්‍රවාහයෙන්, කොටින්ම අර මත් කරවන ගතිය කිව්වෙ දීර්ඝ කාලයක් මේ ගලාගන යන්නේ ඒකෙ තියන ප්‍රවාහ ශක්තිය නිසා. ඒ ප්‍රවාහ ශක්තියෙන් බේරෙන්න පහසු නැහැ. මේ පින්වතුන් දන්නවනෙ බුදුරජාණන් වහන්සේ අන්ත දෙකක් ගැන වදළා මුලදී කාමසුඛල්ලිකානුයෝගයේ යෙදිලා - මේ පින්වතුන්ට අමුතුවෙන් කියන්න දෙයක් නැහැනෙ. ඊළඟට නිගණ්ඨ මතය තිබුණ

නිසා 'දුක්ඛෙනෙව සුඛං අධිගන්තබ්බං' කියලා දුකෙන්මයි සැප ලබන්නේ කියලා කයට දුක් දෙන්න හය අවුරුද්දක් අර විදියට දුෂ්කර ක්‍රියා කළා. ඒ අන්තයට ගියා. ඒ දෙකට මැදිනුයි බුදුරජාණන් වහන්සේ මේ සොයා ගත්ත මැදුම් පිළිවෙත. එතකොට මෙතන නැවතීම තමයි කාමසුඛල්ලිකානුයෝගය ඒක තුළ ගිලා බහිනවා - අපාය දක්වාම. ඊළඟට අර නිගණ්ඨයින් කළා වගේ, බුදුරජාණන් වහන්සේටත් අන්තිමට තේරුනා දැගලුවා, දැගලීම තුළින් ගසාගෙන ගියා. ඒ වෙනුවට සීරුවෙන් එතර වෙන්න ඕන. අන්න ඒ ටිකයි පින්වතුනි මේ සබ්බාසව සූත්‍රය තුළ තියෙන්නේ.

එතකොට මේ 'සබ්බාසව සංවර පරියාය' කිව්වෙ මොකද, වතුරට බැස්සට පස්සේ එතර වීමේදී - සමහර දේවල් ලෝකය පිළිබඳව කල්පනා කරල බලන කොට ඇතුවත් බැරි නැතිවත් බැරි තත්ත්වයක් තියෙන්නේ. ටිකක් හිතල බලන්න. මුල ඉඳලම කල්පනා කරල බැලුවොත් යම්කිසි දර්ශනයක් අවශ්‍යයි අපේ ජීවිතයට. අර කියාපු දෘෂ්ටි අල්ල ගත්තොත් හැමදමත් ඒක තුළ කරකැවෙන්නෙ. බුදුරජාණන් වහන්සේ කියල තියෙන්නේ සක්කාය දිට්ඨියට යටවුණු පුද්ගලයා ගැන බල්ලගේ උපමාවෙන්. දැන් මේ බල්ල ගැට ගැහුවොත් එහෙම මොකක් හරි ලීයක ලණුවකින් මේ බල්ල කරකැවෙනවා. කරකැවෙනවා. ඌට ඉන් එහාට යන්න බැහැ. ඒ වගේ තමයි 'අස්සුතවා පුථුජ්ජනොසා ගද්දුල බද්ධො,' බල්ලෙක් කණුවක බැන්දහම ඒක වටේම කරකැවෙනවා මිසක්, ඉන් මිදීමක් නැතුව වගේ සක්කාය දිට්ඨිය ගත්තු කෙනාට මිදීමක් නැහැ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ ඒ වෙනුවට වෙන සථාවරයක් දැක්වූවා. චතුරාර්‍ය සත්‍යය. ඒකමයි පින්වතුනි සම්මා දිට්ඨි පුබ්බංගමා සම්මාදිට්ඨිය පෙරටු කර ගෙන අපි මේ ගමන යන්නේ. ඒ තමයි දිට්ඨිය මුල් වෙන හැටි. ඊළඟට එතන ඉඳල යන ගමනේදී අර වතුර පාරෙන් බේරෙන හැටි ඊළඟට හිතල බලන්න. මේ පින්වතුන් 'සංවරා' අපට ඇස් දෙක වහගෙන ඉන්න බැහැ. ඇතැම් බ්‍රාහමණයින්ගේ එහෙම මතයක් තිබුණා. ඉන්ද්‍රිය සංවරයයි කියන්නේ ඇසින් බලන්නෙ නැහැ. කනින් අහන්නෙ නැහැ. බුදුරජාණන් වහන්සේ ඒවා හාස්‍යයට ලක්කළා. එහෙම ඉන්න බැහැනෙ.

ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ කිව්වා නියම දෙරටු පල්ලෙක් වෙන්න, අවශ්‍ය තැනදී - ඒක තමයි 'පටිසඞ්ඛා යොනිසො.' නුවණින් කල්පනා කරල ඇස සංවර කර ගන්න. කන සංවර කර ගන්න, අන්න එහෙමයි ඒ මැදුම් පිළිවෙත. ඒ වගේම ආහාරය පිළිබඳව ඒත් බුදුරජාණන් වහන්සේ අන්තයට ගියානෙ. කොයිතරම් අර ශරීරය කෘශ වෙනකම් සම්පූර්ණයෙන් ආහාරය ප්‍රතික්ෂේප කරලා මහා දුෂ්කර ක්‍රියා කරලා තේරුම් ගත්තා මේක හරියන්නෙ නැහැ. ඒ වෙනුවට අපට ආහාර ගන්න වෙනවා. අන්න අවම අවශ්‍යතා සලකලා. ඒ සිව්පසය පිළිබඳව. දැන් කලින් සඳහන් කළ ඉන්ද්‍රිය සංවරය වගේ මේකට කියන්නේ ඥාන සංවරය කියලා. අතීතයේ ආචාර්යවරු දක්වනවා. නුවණින් සංවර වෙනවා ප්‍රත්‍යවේක්ෂා කිරීම තුළින්, ආහාර තෘෂ්ණාව, රස තෘෂ්ණාව, ආදියට ගසාගෙන යන්නෙ නැතිවෙන්න. මේ මගේ කය පවත්වාගන යාම සඳහා 'හුදෙක්' අන්න 'යාවදෙව' පදය. හුදෙක් මේ බ්‍රහමචරියාවට උපකාරයක් වශයෙන් මම මේ ආහාරය ගන්නේ කියලා ඒකත් භාවනාවකට හරවලා. ඒක තමයි 'පටිසෙවනා' එතනදීත් හිතාගන්න ආහාර නොගෙන බැහැ. මේ නිවන් ගමන යන්න ඕන අර විදියට යම්කිසි දර්‍ශනයක් පෙරටු කරගෙන. අන්න ඒක චතුරාර්‍ය්‍ය සත්‍යයෙන් දුන්නා. ඊළඟට ඒ ගමන යාමේදී අපට සිව්පසය අවශ්‍ය වෙනවා. චීවරය, ආහාරය, සේනාසනය, ගිලානප්‍රත්‍යය. අවම වටිනාකම ගැන සලකලා, අවශ්‍යතාව සලකලා පටිසඞ්ඛා නුවණින් මෙනෙහි කරමින් ගන්නවා. ඒ ආහාරය පිළිබඳව. ඊළඟට අනික් ඒව ගැනත් ඒ විදියට සලකන්න. අපි හිතමු පිණ්ඩපාතෙ ගියා. ලැබුණෙ නැහැ. සංඝයා වහන්සේලාගේ ජීවිතයට එල්ල කරල බුදුරජාණන් වහන්සේ කියන්නේ. මොන හේතුවකින් හරි අපට සේනාසනයකුත් නැහැ. තවත් අඩුපාඩුකම් තියනවා. ඒවාට දයකයොත් එක්ක රණ්ඩුවෙන්න ගිහිල්ලා තමුසෙලා මොකද මේ මහණවුණු අපව තමුසෙලා බලාගන්න එපායැ. එහෙම කියන්නෙ නැතිව ඒව දරාගන්න ශක්තියක් තියෙන්න ඕන. අන්න අධිවාසනා. පටිසෙවනා ඉවසීමත් අවශ්‍යවෙනව ඒකට. ඒ ඉවසන්නේ සීතල, උෂ්ණය, කුසගින්න, පිපාසය, මැසි මදුරු කරදර කැලෑවේ ඉන්නකොට ඒව හැම එකක්ම. එපමණක් නොවෙයි මේ මනුෂ්‍යයින් කියන ඇනුම්, බැනුම් තවත් නොයෙකුත් දේවල්, ඒවා දරාගන්න වෙනවා. මොකද ඒවා දරා නොගැනීමෙන් කෙලෙස් උපදිනවානම් 'විඝාතපරිළාහ' වෙහෙස දැවිලි උපදිනවා. ඒවා නැති කර ගැනීමට ඒ ඉවසීම පිළිබඳව. 'අධිවාසනා,'

හිතාගන්න අර කියාපු දේවල්ම තමයි විශේෂයෙන් ඉන්ද්‍රිය සංවරය ගැන කියනකොට මතක් කර ගන්න සාමාන්‍යයෙන් සඳහන් වෙනවා 'චක්ඛුන්ද්‍රියංඅසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසල ධම්මා' දැඩි විෂම ලෝභයටත් දෙම්නසටත් අදාළ පාපක අකුසල ධර්ම ගලා ඒම වැලැක්වීමටයි ඇස, කන, නාසය, ආදිය සංවර කර ගන්නේ. ඒ වගේම මෙතෙන්දිත් ඉවසීම, ඒවා අපි සාමාන්‍යයෙන් අපි බලාපොරොත්තු වන දේවල් නමුත් බලාපොරොත්තු වන දේවල් නැති වුණහම ඒක තුළින් සිතේ 'විඝාතපරිළාහ' කියල කියන්නේ දෙම්නසට අදාළ බලාපොරොත්තු කඩ වීම් තුළින් ඇතිවෙන වෙහෙස දැවිලි නැති කරන්නයි ඒවා දරා ගැනීමේ ශක්තිය, ඒ අධිවාසනා. ඒ වගේම සමහර දේවල් 'පරිවජ්ජනා' දන් කැලෑවට යන්න ඕන භාවනා කරන්න, කැලෑවට යන්න වුණ පලියට මම යෝගාවචරයි කියලා අලි, කොටි, වලසුන් ඉස්සරහට යන්නෙ නැහැ. හැකිතාක් ඒ උවදුරු වලින් බේරිලා ඉන්න උත්සාහ කරනවා. එපමණක් නොවෙයි පාපක මිත්‍රයින් වර්ජනය කරනවා. අගෝචර සථාන වර්ජනය කරනවා. මොකද අපකීර්තිය එන්න පුළුවන් නිසයි. ඒ නුවණින් සලකලයි. ඒ පරිවජ්ජනා පහාතබ්බා.

ඊළඟට විනොදනා පහාතබ්බා. ඒකත් පහසුවෙන් සලකගන්න පුළුවන්. සිතට එන සිතුවිලි ධාරාවන් ගැන කල්පනා කරලා ඒවායේ ආදීනව සලකලා ඒවා දුරු කිරීම තුළින්. අන්තිමට කියන්නේ භාවනා පහාතබ්බා, සති, ධම්මවිචය, විරිය, පීති ආදී බොජ්ඣඞ්ග ධර්ම නොවැඩීම තුළින් යම් ආශ්‍රවයන් ඇති වෙනවා නම්, වැඩීම තුළින් ඒවා නැතිවෙනවා. මේ ඔක්කොම කියන්නෙ මොකටද අර චතුරෝඝයෙන් එතර වීමට. චතුරෝඝයෙන් එතර වීම කියල කියන්නේ නිකම් බලාගෙන ඉන්න එකක් නොවෙයි. ඒකට බැහැලා එතර වන පුද්ගලයාටයි මේ ප්‍රශ්න තියෙන්නේ. ඒ ප්‍රශ්නවලට බුදුරජාණන් වහන්සේ පිළිතුර සබ්බාසව සූත්‍රයෙන් පෙන්නුවා. ඒවා සංවර කරගන්න ක්‍රම. ඊළඟට මතක් කර ගන්න, අපි කලිනුත් කියූ දෙයක්. බුදුරජාණන් වහන්සේ මේ දක්වන මැදුම් පිළිවෙත පිළිබඳව තියන ගැඹුර. මනසිකාරය කියන එක. අපි කලින් අවසථාවල මේ පින්වතුන්ට කියල තියනවා නාමරූප-විඤ්ඤාණ ගැන කථාවේදී - ඒක මේ ධර්මයේ තිබෙන දෙයක් නොවේ - වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර කියන ඒ පස් දෙනාගෙන් මනසිකාරය බුදුරජාණන් වහන්සේගේ මැදුම් පිළිවෙතට උපකාර කර ගත්ත බව. අපි අර

උපමාවට කිව්වේ යම් කිසි නඩුවකට සාක්කිකාරයෙක් නැත්නම් වග උත්තර කරුවන්ගෙන් කෙනෙකුට සමාව දීලා රජයේ සාක්කිකාරයෙක් කරගෙන ඒ කතන්දරය අහගන්නවා වගේ බුදුරජාණන් වහන්සේ කළේ නාම ධර්මවල මේ හැංගිලා ඉන්න මේ මනසිකාරයා - එයාම තමයි ලොකුම හොරා - අයෝනිසෝමනසිකාරයා හැටියට වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, ඕව එකතු කරගෙන මෙච්චර කාලයක් අපව සංසාරේ අරගෙන ආවා. බුදුරජාණන් වහන්සේ එයාගෙම බෙල්ලෙන් අල්ලගෙන කිව්වා තමුසේ අපේ සාක්කිකාරයා වෙනවා. හැබැයි තමුසේ අයෝනිසෝ කම අත් හැරලා අද ඉඳලා යෝනිසො වෙන්න ඕන. අපි තමුසෙට සමාව දෙනවා කියලා අන්තිමට ඔන්න මිනිහගෙන් තමයි අපි ඔක්කොම එළිකර ගන්නේ. ඒ යොනිසෝමනසිකාරය තමයි අපි කිව්වේ ප්‍රඥාවේ මූල බීජයයි කියලා. ඒක නිසාම තමයි ඔය 'දස්සනා පහාතබ්බා' ඒ ආකාරයට අයොනිසො, යොනිසො කියන එක වෙන් කරල අරගෙන ඒ ආශ්‍රයෙන් තමයි බුදුරජාණන් වහන්සේ ප්‍රතිපදාවේ යෙදීමට අවශ්‍ය ධෛර්යය අපට මතු කරල දුන්නේ. එහෙම නැත්නම් සථාවරයක් නැහැ. මෙතනින් පටන් ගන්න බැහැ. මොකද අපි කලින් කියාපු කාරණය නැවත මතක් කර ගන්න.

ආශ්‍රව වලින් එකක් අවිද්‍යාවයි. නමුත් අවිද්‍යාව නිසයි ආශ්‍රව ඇතිවන්නේ. ඒ ඇතිවෙන එක මට්ටු කරන්නයි අපි මිච්ඡා දිට්ඨි වෙනුවට සම්මා දිට්ඨි පෙරටු කරගෙන යෝනිසෝමනසිකාරයෙන්ම මේ ගමන යන්නේ. ඔන්න ඔය විදියට මේ ආශ්‍රවයන්ගේ ප්‍රතිපදාවට අදාල වටිනාකම් මේ ආශ්‍රයෙන් අපිට හිතාගන්න පුළුවන්. ඒ මත් වීමේ ගතිය තුළ ලෝකයා දිගින් දිගටම කාම, භව, දිට්ඨි නැත්නම් අවිජ්ජා ඒවා තුළම ඒ පෙළඹවීමේ ශක්තිය වැඩියි. ඒවා කඩා ගන්නයි බුදුරජාණන් වහන්සේ මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය ඉදිරිපත් කළේ. ඒකත් ආරම්භ වන්නේ සම්මා දිට්ඨියෙන්. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා ආදී වශයෙන් සම්මා සමාධියෙන් කෙළවර වෙන ඒ ප්‍රතිපදාව. ඒකයි කිව්වෙ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයමයි ආශ්‍රව ක්ෂය කිරීමේ ප්‍රතිපදාව හැටියට ගන්න තියෙන්නේ. මේ ආසව වගේම ඕඝ කියන වචනයෙත් තියෙන්නේ දීර්ඝ කාලයක් සංසාරයේ ආපු ඒ සත්ත්වයාගේ සාංසාරික පුරුදු ප්‍රවාහයන් කියල හිතාගන්න. සාංසාරික පුරුදු ප්‍රවාහයකටයි මේ ආශ්‍රව ඕඝ ආදී වචන යෙදිල තියෙන්නේ. ඒ ප්‍රවාහයෙන් මිදීම සැඩවතුරෙන් මිදීම වගෙයි. හරි අමාරුයි. ඒකයි කිව්වෙ ඒකට බැස්සට

පස්සේ එක්කො ගහගන යනවා. එක්කො ගිලා බසිනවා. ඒ අන්ත දෙක බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ තියන ගැඹුරුම කාරණය. මැදුම් පිළිවෙත කියන්නේ ඒකයි. බුදුරජාණන් වහන්සේත් අත්දැකීම් තුළින් තේරුම් ගත්තා. එක අන්තයක ඉඳලා අනික් අන්තයට වැටුණා. අන්තිමටම තේරුම් ගත්තා. මේ ලෝකයේ යථා තත්ත්වය තේරුම් ගත්තට පස්සේ මේ සිව්පසය හා අනිකුත් දේ මේවා ඇතුවත් බැහැ නැතුවත් බැහැ. අන්න එතනදී යෝනිසෝ කියන වචනය නුවණින් මෙනෙහි කිරීම. ඒක තුළින් තමයි යම් අවස්ථාවක සීරුවෙන්. නොනවතිමින් නොදැගලමින් වේගයෙන් ගලාගන යන වතුර පහරකට බැහැලා හරියටම ඔට්ටු අල්ලල කියන්න බැහැ මම මෙතන ඉඳලා හරියටම ඉරක් ඇන්ද වගේ අතනට යනවා කියලා. ඒකට බැස්සට පස්සේ වතුරටත් ඉඩ දෙමින් ටික ටික යන්න ඕන. පින්වතුන් මේව ගැන හොඳට කල්පනා කරල බලන්න. දිය පහරකින් එතර වන කෙනෙක් ඒකට ඉඩ දෙමින් යන්න ඕන. නමුත් ගමනත් යන්න ඕන. ඒක කපා ගෙන යන්න ඕන. අන්න ඒ ශක්තියයි මේ ධර්මය තුළ තියෙන්නේ. බුදුරජාණන් වහන්සේ මේ ටික නොයෙක් විදියට ධමම පද ගාථා ආශ්‍රයෙන් පෙන්නුම් කරල තියනවා. මේ ආශ්‍රවයන්ගේ ඕඝයන්ගෙන් මිදුනහම කොතෙන්ටද යන්නේ. ඒක තමයි නිවන දිවයිනක් හැටියට දක්වල තියෙන්නේ. ඒ දිවයින, අර ඕඝයන්ගෙන් එතර වූ තැන හැටියට දක්වනවා 'දීපං කයිරාථ මෙධාවී - යං ඕඝො නාභිකීරතී'. 'මහණෙනි, නුඹලා දිය පහරවලට අහුවෙන්නෙ නැති දිවයිනක් හදගන්න'. දිය පහරවලට අහුවෙන්නෙ නැතිව ඕඝ කපාගෙන එතරට ගියා නම් යම් වේලාවක ඒ තැනැත්තා ඉන්නෙ දිවයිනක. ඒ දිවයින මොකක්ද අරහත්ඵල විමුක්තිය. අපි නොයෙකුත් දේශනාවල මේ ගැන මතු කළා. මේ ගැන සඳහන් වන ඇතැම් සූත්‍ර තියනවා. 'එවං සමමා විමුතතසස භිකඛවෙ භිකඛුනො චෙපි චකඛු විඤ්ඤෙයයා රූපා ආපාථං ආගචෙඡයයුං අමිසසිකතමේවසස චිඤ්ඤණං හොති ඨීතං ආනෙඤජපපතතං.' ඒ විමුකත සිත ඇති භික්ෂුවට ඇසින් දැකිය හැකි රූප රාශියක් 'ආපාථය' කියන ඇසට පෙනෙන මානයට ආවේ වී නමුත් ඒවා තුළ ඒ සිත මිශ්‍ර වෙන්නෙ නැහැ. අර ආශ්‍රව වලින් මිශ්‍ර වෙන්නෙ නැහැ. 'අමිසසිකතමෙව ඨිතං ආනෙඤජපපතතං' ඒවට ගසාගෙන යන්නෙ නැහැ. 'අනෙජො' කියන වචනයෙන් කියන්නේ රහතන් වහන්සේලා හෙල්ලෙන්නෙ නැහැ - 'තාදි' ඒ වෙන්නේ අර දිවයිනට ගියාට පස්සෙ. මොකද අර

සළායතනයන්ගෙන් ගලාගන එන අරමුණු ජය ගන්න තැනට හිත යොදල තියනවා. ඒකම තමයි 'සබ්බ සංඛාර සමථ' ආදී වශයෙන් අරහත් ඵල සමාධිය ගැන කියල තියෙන්නේ. සමහර තැන්වල ඒ රහතන් වහන්සේලා ගැන කියල තියෙනවා.

යස්සාසවා පරික්ඛීණා - ආහාරෙච අනිස්සිතො
සුඤ්ඤතො අනිමිත්තොච - විමොක්ඛො යස්ස ගොචරො
ආකාසෙව සකුන්තානං - පදං තස්ස දුරන්නයං

ඔය ධම්මපදයේ ගාථාවක් අරහන්ත වර්ගයේ 'යස්සාසවා පරික්ඛීණා' යම් රහතන් වහන්සේ කෙනෙකුගේ ආශ්‍රවයන් ක්ෂය වෙලාද 'ආහාරෙච අනිස්සිතො' ආහාරය පිළිබඳ ඇල්මක් නැද්ද 'සුඤ්ඤතො අනිමිත්තොච විමොක්ඛො යස්ස ගොචරො' ආහාරය පිළිබඳ ඇල්මක් නැත්තේ මොකද 'ගොචරො' කියල කියන්නේ ගොදුරු බිමනෙ. රහතන් වහන්සේලාගේ ගොදුරු බිම මොකක්ද ආහාරය නොවේ. 'සුඤ්ඤතො අනිමිත්තොච' සුඤ්ඤතාව හා අනිමිත්තභාවය. අහල තියනවනෙ. සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත කියන ඒ විමොක්ඛ තුන - එතනයි නිවන තියෙන්නේ. අර කියාපු අරමුණුවලින් මිදුණු තැන. 'සුඤ්ඤතො අනිමිත්තොච' ඒකයි උන්වහන්සේලාගේ නියම ගොදුරු බිම. රහතන් වහන්සේලා, බුදුරජාණන් වහන්සේලා ඉන්නේ ඒ ගොදුරු බිමේ. ජීවත් වීම අවශ්‍ය නිසා පමණක් පිණ්ඩපාතෙ අරගෙන එන භික්ෂුව හැර වෙන භික්ෂුවක් මා හමුවෙන්න එන්න එපා කියලා බුදුරජාණන් වහන්සේ කැලේට ගිහිල්ලා තුන් මාසයක් ඉන්නේ. මොකක්ද ගොදුර අර කියාපු සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත. ඒ අවස්ථාවේදී එතනයි අර කිවුව දිවයින. එතන උපමාවක් දෙනවා. 'ආකාසෙව සකුන්තානං - පදං තස්ස දුරන්නයං' අහසේ පක්ෂියෙක් පියෑඹුවහම ඒ පක්ෂියා ගිය පාර හොයාගන්න පුළුවන්ද? ඒ වගේ රහතන් වහන්සේලාගේ හිත කොහෙද යන්නෙ කියල හිතාගන්න බැහැ. අරමුණක් නැහැ. ඒක තමයි 'අනාරම්මණං චිත්තං' කියන්නේ. ඇතැම් තැන්වල අපේ දේශනාවල සඳහන් කරල තියනවා, දෙවියන්, ශක්‍රයින්, බ්‍රහ්මයින් ඇවිත් වඳිනවලු බුදුරජාණන් වහන්සේට මේ ආකාරයට

නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම
යස්ස තෙ නාභිජානාම - යම්පි නිස්සාය ඣායසි

පුරිසෝත්තමයන් වහන්ස, අජානීය පුරුෂයන් වහන්ස, නමස්කාර වේවා. ඔබ වහන්සේ යමක් නිසා ධ්‍යාන වඩනවද ඒ අරමුණ අපට පෙනෙන්නෙ නැහැ. මොකද අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත - නිමිත්තක් නැහැ. ප්‍රණිධියක් කියන්නේ ආශාවක් නැහැ. සුඤ්ඤත කියන්නේ ආත්ම සංඥවක් නැහැ. අන්න ඒ විමුක්ත තත්ත්වය තමයි දිවයින. එතකොට හිතාගන්න සැඩ වතුරු හතරෙන් එතර වෙලා අර ආශ්‍රව ශක්තියෙන් බේරිලා ගිහිල්ලා අන්තිමට රහතන් වහන්සේලා ගොඩ වැදෙන්නේ ඒ දිවයිනටයි. ඒ දිවයින තමයි උන්වහන්සේලාගේ විමුක්තිය කියල කියන්නේ. මොකද හේතුව මෙලොවම භව නිරෝධයක් අත් දුටුවා. අරව සේරම භවය හා සම්බන්ධ දේවල්. ඔය වගේම වටිනා ගාථාවල් අතන මෙතන තියනවා. අපි එකක් විතරක් කියමු. සුන්දරීක භාරද්වාජ කියලා සූත්‍රයක් සුත්ත නිපාතයේ තියනවා. ඒකෙ සඳහන් වෙනවා

භවාසවා යස්ස වචීඛරා ච
විධූපිතා අත්ථගතා න සන්ති

ඒ රහතන් වහන්සේ ගැන කියන්නේ. මේ බුද්ධ වචනයක් 'භවාසවා යස්ස වචීඛරා ච' ඒ රහතන් වහන්සේගේ භවාශ්‍රවයන් ක්ෂය වෙලා. ඒ වගේම අමුතු වචනයක් තියනවා 'වචීඛරා' කියල. වචීඛරා කියන එක අටුවාවෙ තෝරන්නෙ පරුෂ වචනය කියලා. නමුත් අපේ අදහස නම් වචීඛරා කියන්නේ මේ භාෂා ව්‍යවහාරයට භවයට ලෝකයට අයිති දෙයක්. එයිනුත් මිදෙන්න වෙනවා. 'වචීඛර' කියන්නේ වචන රොඩ්ඩ. මේ භාෂා ව්‍යවහාරයේ තියන පපඤ්ච. වචන රොඩ්ඩෙනුත් රහතන් වහන්සේලා මිදිලා.

ඒක තමයි උන්වහන්සේලා 'පපඤ්ච සඤ්ඤා සංඛා පහාන' කියල කියන්නේ. අපි මේ සඳහන් කරන්නේ කෙටියෙන්. ඇතැම් අවස්ථාවල උන්වහන්සේලා හිත යොදනවා අර ලෝක ව්‍යවහාරවලින් මිදුණු ඒ අනිමිත්ත තත්ත්වයට. එතන පඨවි, ආපො, තෙජො, වායො මොකුත් නැහැ. ඉර හඳ තාරකා නැහැ. යාමක් නැහැ, ඒමක් නැහැ. උපතක් නැහැ, මරණයක් නැහැ. ඔය කියන නිවන පිළිබඳ විස්තර මෙච්චර කාලයක් තෝර ගන්න බැරි වුනේ අර කියාපු දිවයින තේරුම් ගන්න බැරිවුන නිසයි. ඒ වෙනුවට ඒ කට්ටිය දිවයින කිව්වෙ අර සියදෝරිස් නිවනට - මරණින් මතු වෙන එකක්. අපි පෙන්නල දුන්නා

රහතන් වහන්සේලා මෙලොවම අත්විඳින අර කියාපු ප්‍රත්‍යක්‍ෂ තත්ත්‍වයයි. භවාශ්‍රවවලින් කොටින්ම කියතොත් භාෂා ව්‍යවහාරය තුළ පවා තියන මිනිසුන් මුලා කරවන තත්ත්‍වයෙන් රහතන් වහන්සේලා මිදිලා. සමහර තැන්වල මෙහෙම සඳහන් වෙනවා. ඒ රහතන් වහන්සේලාගේ විමුක්තිය පිළිබඳව 'සො කායෙති පි න හොති, සො වාචාති පි න හොති, සො මනොති පි න හොති, ඛෙත්තං තං න හොති, වත්‍ථුං තං න හොති, ආයතනං තං න හොති, අධිකරණං තං න හොති, යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං' ඇතුළතින් සැප දුක් ඇති වන කයක් කියන හැඟීමක් නැති වෙනවා. වචනය කියන හැඟීමත් නැති වෙනවා. මනස කියන හැඟීමත් නැති වෙනවා. එතකොට කය, වචනය, මනස තුළයි - මේ කාලෙ වචනෙන් කියනව නම් - ඔක්කොම 'ක්‍රියාකාරකම්' තියෙන්නේ. රහත් සිතේ එතකොට කයට තැනක් නැහැ, වචනවලටත් තැනක් නැහැ. මනසටත් තැනක් නැහැ. ඒ ටික තමයි අර නොයෙකුත් නඤර්‍ථවත් වචන රාශියකින්, ප්‍රතිෂේධාර්‍ථවත් වචන රාශියකින්, නිවන ගැන සූත්‍ර රාශියක දක්වල තියෙන්නේ. ඒ විමුක්තිය වචනවලින් ප්‍රකාශ කරන්න බැරි මොකද? ලෝකයා භවය හා සම්බන්‍ධයි. යමක් ගැන ඇහුවොත් කියන්නේ ඒ භවයට අදාළ වචනවලින්. යම් අවස්ථාවක පූර්ණ විමුක්තිය වෙන්නේ මේ සියල්ලෙන් මිදුණු අවස්ථාවේදීයි.

භාෂා ව්‍යවහාරය වාග් ව්‍යවහාරය බුදුරජාණන් වහන්සේ පාවිච්චි කරනවා. ඒක තමයි අපි බොහෝ අවස්ථාවල කිව්වෙ - තථාගතයන් වහන්සේ තමන් වහන්සේ පිළිබඳව පොට්ඨපාද සූත්‍රය අවසානයේ සඳහන් කරන්නෙ. 'ඉතීමා ඛො චිත්ත ලොක සමඤ්ඤා ලොක නිරුත්තියො ලොක වොහාරා ලොක පඤ්ඤත්තියො යාහි තථාගතො වොහරති අපරාමසං' චිත්ත කියල ඒ පුද්ගලයාට අමතන්නේ, චිත්ත මේ ඔක්කොම ලෝක සමඤ්ඤා, ලෝක සම්මුති, ලෝක නිරුක්ති, ලෝක ව්‍යවහාර, ලෝක ප්‍රඥප්ති තථාගතයන් වහන්සේ ඒවා පාවිච්චි කරනවා. ඒවා ව්‍යවහාර කරනවා. නමුත් පරාමර්‍ශනය කරන්නේ නැහැ. දැඩිව ගන්නෙ නැහැ. ඒක තමයි අපි කියන්නෙ වැඩිහිටියො බබාගෙ භාෂාව පාවිච්චි කරන්න වගේ ලෝකයාගෙ භාෂාව පාවිච්චි කරනවා කියල. එතකොට ඒ භාෂාවට ගිය කල එහෙම තමයි රහත් සිතේ සවභාවය. සාමාන්‍ය ලෝකයා අරමුණ හැටියට හිතන හැමදෙයක්ම ඉර, හඳ, තාරකා ඇතුලු පැවැත්ම

පිළිබඳ ඇතිවීම්, නැතිවීම්, චුති, උපපත්ති, දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක ආදිය පමණක් නොවෙයි. කොටින්ම කියතොත් පඨවි, ආපො, තෙජො, වායො ආදී මහා භූත ධර්ම පවා - මනසින් මකා හැරියා.

දැන් ඔය විද්‍යාඥයින් මේ දඟලන්නේ මේ හතර මොකක්ද කියල දැනගන්නයි. මනසින් ඇත් කරලා සිතින් ඇත් කරලා අන්තිම කෙළවරට ගිහිල්ලා කරගන්න දෙයක් නැතුව ඒ විද්‍යාවටත් මේ කාලකන්නි විද්‍යාව කියල නිග්‍රහ කරන අවසථාවක් මේ ඇවිල්ල තියෙන්නෙ. අන්න විද්‍යාවේ කෙළවර. ඒ විද්‍යාවෙ අවසාන කෙළවර බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල දුන්න. 'මනො පුබ්බංගමා ධම්මා' ආදී වශයෙන්. අවසාන පරිච්ඡේදයෙන් බලනකොට ඒ රහතන් වහන්සේලාගේ භව නිරොධ විමුක්තිය අපට හිතාගන්න බැරි දෙයක්. මොකද එහෙම විමුක්තියක් නැත්නම් සැකයෙන් සැකය තුළනෙ රහතන් වහන්සේලා - ටිකකට හිතාගන්න මේක මරණින් මතු නිවනක් නම් මැරෙන වෙලාවෙ සැකයෙන්නෙ ඉන්න වෙන්නෙ. බුදුරජාණන් වහන්සේලා රහතන් වහන්සේලා මෙලොවම අත් දුටුවා භව නිරොධ තත්ත්වයක් අර කියාපු විදියට. භවයට අදාළව යම්තාක් දේවල් තියනවා නම් පඨවි, ආපො, තෙජො, වායො, ආදී මහා භූත ධර්මත් ඇතුලුව ඒ හැම එකක්ම මනසින් මකාහැරලා ඒකට කියන්නේ 'විරාජිතා' ඒ පඨවි, ආපො, තෙජො, වායො කියන ඒ සංකල්ප පවා ඒවා නිසා ඇතිවන නොයෙකුත් දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝක යාම් ඊම් ඒ හැම එකකම ඒවායේ හිස් බව ශූන්‍යත්වය බුදුරජාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂ කරගත්තා. ඒක තමයි විමුක්තිය කියන්නේ. අරහත් ඵල විමුක්තිය.

ඒක නිසා දැන් මතක්කර ගන්න අර ධම්ම පද ගාථාව අර්ථවත්ව මෙනෙහි කර ගන්න. 'දීපං කයිරාථ මෙධාවි - යං ඔඝො නාභිකීරති' නුවණැති පුද්ගලයා දිවයිනක් හදා ගන්න, අර සැඩ වතුරු පහරට අහුවෙන්නෙ නැති. අපි කෙටියෙන් කියන්න උත්සාහ කළේ, මේ සූත්‍ර විශාල ප්‍රමාණයක් කියන්න තියන නිසා. මේ පින්වතුන්ට අපට කියන්න තියෙන්නේ, දහසක් නයින් තේරුම් ගන්න බලන්න. අපි කියපු අනිත් දේවල් ආශ්‍රයෙන්. මේ කොයිවත් තම තම නැණ පමණින් තේරුම් ගත යුතු ධර්මයක්. තම තමන් කරන බණ භාවනා උගත් දේවල් වලින්ම පමණක් නොවෙයි. තම තමන් භාවනා මාර්ගයේ ඉදිරියට යන්න යන්න අපි මේ කියාපු දේවල් වැටහෙන්න පුළුවන්.

අද දිනත් මේ හැම කෙනෙක්ම මේ ප්‍රතිපදාවට නැඹුරු වෙලා සතිසම්පජඤ්ඤයේ පිහිටලා, යම් උසස් සීලයක පිහිටලා මේ බොහෝ දෙනෙක් අද දවස ගෙව්වා. එබඳු අවස්ථාවක මෙබඳු ධර්මය වඩා පැහැදිලිව තේරෙනවා. ඉදිරියටත් මේක උපකාර කරගෙන අර අපි කියාපු මැදුම් පිළිවෙත ප්‍රායෝගික - සාපේක්ෂක මූල ධර්මය අනුව යෝනිසෝ මනසිකාරය පෙරටු කරගෙන මේ ධර්ම මාර්ගයේ ඉදිරියට යමින් තමන් බලාපොරොත්තු වන උත්තමාර්ථයන් මේ ජීවිතය තුළම සෝවාන් සකදාගාමි අනාගාමි අර්හත් කියන මාර්ග ඵල ප්‍රතිවේධයෙන් ප්‍රත්‍යක්ෂ කිරීමට මේ වචන කීපයත් උපකාර වේවා කියා ප්‍රාර්ථනා කරනවා. අවීචියේ සිට අකනිට්ඨා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් සිටිනවා නම් මේ ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමට, ඒ අනුමෝදන් වීම තුළින් අමා මහ නිවන ප්‍රාර්ථනීය බෝධියකින් සලසාගනිත්වා කියල මේ ගාථා කියා පින්දෙන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

කතු හිමියන්ගේ සිංහල කෘති

සැ.යු.: මෙම කෘති ලේඛනය සරලත්වයට මුල් තැන දුන් අංක අනුපිළිවෙලක් සහිතව සකස්වී ඇති බවත්, ලේඛනයේ අගහරියේ එන කෘති බොහෝ දුරට ගැඹුරු විය හැකි බවත්, පාඨකයින් දැනුවත් කිරීම් වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

- සම්පාදක

1. තිසරණ මහිම
2. හිතක මහිම – 1
3. හිතක මහිම – 2
4. හිතක මහිම – 3
5. දිවි කතරේ සැඳෑ අඳුර
6. කය අනුව ගිය සිහිය
7. හිත තැනීම
8. පින් රුකෙක මහිම
9. අබිනික්මන
10. පිළිවෙතින් පිළිවෙතට
11. කයේ කතාව
12. මා-පිය උවැටන
13. ප්‍රතිපත්ති පූජාව
14. පැවැත්ම හා නැවැත්ම
15. කර්ම චක්‍රයෙන් ධර්ම චක්‍රයට
16. මෙත් සිතේ විමුක්තිය
17. ඇති හැටි දැක්ම
18. තපෝ ගුණ මහිම
19. සක්මනේ නිවන
20. පහන් කණුව ධර්ම දේශනා – 1 වෙළුම
21. පහන් කණුව ධර්ම දේශනා – 2 වෙළුම
22. පහන් කණුව ධර්ම දේශනා – 3 වෙළුම
23. පහන් කණුව ධර්ම දේශනා – 4 වෙළුම
24. පහන් කණුව ධර්ම දේශනා – 5 වෙළුම
25. පහන් කණුව ධර්ම දේශනා – 6 වෙළුම
26. පහන් කණුව ධර්ම දේශනා – 7 වෙළුම
27. පහන් කණුව ධර්ම දේශනා – 8 වෙළුම
28. පහන් කණුව ධර්ම දේශනා – 9 වෙළුම

29. විදසුන් උපදෙස්
30. භාවනා මාර්ගය
31. උත්තරීතර හුදකලාව
32. සසුන් පිළිවෙත
33. චලන චිත්‍රය
34. දිය සුළිය
35. බුදු සමය පුද්ගලයා හා සමාජය
36. නිවනේ නිවීම – පළමු වෙළුම
37. නිවනේ නිවීම – දෙවන වෙළුම
38. නිවනේ නිවීම – තෙවන වෙළුම
39. නිවනේ නිවීම – සිවුවන වෙළුම
40. නිවනේ නිවීම – පස්වන වෙළුම
41. නිවනේ නිවීම – සයවන වෙළුම
42. නිවනේ නිවීම – සත්වන වෙළුම
43. නිවනේ නිවීම – අටවන වෙළු
44. නිවනේ නිවීම – නවවන වෙළුම
45. නිවනේ නිවීම – දසවන වෙළුම
46. නිවනේ නිවීම – එකොළොස්වන වෙළුම
47. නිවනේ නිවීම – පුස්තකාල මුද්‍රණය (1-11 වෙළුම්)
48. පටිච්ච සමුප්පාද ධර්මය – 1 වෙළුම
49. පටිච්ච සමුප්පාද ධර්මය – 2 වෙළුම
50. පටිච්ච සමුප්පාද ධර්මය – 3 වෙළුම
51. පටිච්ච සමුප්පාද ධර්මය – 4 වෙළුම
52. පටිච්ච සමුප්පාද ධර්මය – පුස්තකාල මුද්‍රණය (1-4 වෙළුම්)
53. ස්පර්ශයේ ආශ්චර්යය
54. මනසේ මායාව
55. පැරණි බෞද්ධ චින්තාවේ සංකල්පය සහ යථාර්ථය

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම්

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන

දුරකථනය: 0777127454

knssb@seeingthroughthenet.net

By The Same Author

1. Concept and Reality in Early Buddhist Thought
2. Saṁyutta Nikāya – An Anthology
3. Ideal Solitude
4. The Magic of the Mind
5. Towards Calm and Insight
6. From Topsy-turvydom to Wisdom, Volume I
7. From Topsy-turvydom to Wisdom, Volume II
8. Seeing Through
9. Towards A Better World
10. Nibbāna – The Mind Stilled, Volume I
11. Nibbāna – The Mind Stilled, Volume II
12. Nibbāna – The Mind Stilled, Volume III
13. Nibbāna – The Mind Stilled, Volume IV
14. Nibbāna – The Mind Stilled, Volume V
15. Nibbāna – The Mind Stilled, Volume VI
16. Nibbāna – The Mind Stilled, Volume VII
17. Nibbāna – The Mind Stilled, Library Edition
18. Nibbāna and The Fire Simile
19. A Majestic Tree of Merit
20. The End of the World in Buddhist Perspective
21. The Law of Dependent Arising, Volume I
22. The Law of Dependent Arising, Volume II
23. Walk to Nibbāna
24. Deliverance of the Heart through Universal Love
25. Questions and Answers on Dhamma
26. The Miracle of Contact
27. From The Wheel of Kamma To The Wheel of Dhamma

All enquiries should be addressed to:

Kaṭukurunde Ñāṇananda Sadaham Senasun Bhāraya
Kirillawala Watta, Dammulla, Karandana
Phone: 0777127454
knssb@seeingthroughthenet.net